258 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 258 - இல. 4
Volume 258 - No. 4

2018 පෙබරවාරි 06 වන අඟහරුවාදා
2018 பெப்ருவரி 06, செவ்வாய்க்கிழமை
Tuesday, 06th February, 2018

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රතිඥාව:**

ගරු අහමදුලෙබ්බේ මුහම්මදු නසීර් මහතා

**නිවේදන:**

පාර්ලිමේන්තුව කැඳවීම

2018.02.05 දින පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළැඹි තීරණය

**කල් තැබීමේ යෝජනාව:**

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තා

---

# பிரதான உள்ளடக்கம்

**உறுதிப்பிரமாணம்:**

மாண்புமிகு அகமதுலெப்பை முஹம்மது நசீர்

**அறிவிப்புக்கள்:**

பாராளுமன்றத்தைக் கூட்டல்

05.02.2018 அன்று பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுவில் எடுக்கப்பட்ட தீர்மானம்

**ஒத்திவைப்புப் பிரேரணை:**

திறைசேரிப் பிணைமுறி விநியோகம் பற்றி விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் பாரிய மோசடி, ஊழல் மற்றும் அரச சொத்துக்கள், சிறப்புரிமைகள், அதிகார துஷ்பிரயோகம் தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் அறிக்கைகள்

---

# PRINCIPAL CONTENTS

AFFIRMATION:

Hon. Ahamadulebbe Mohamadu Nazeer

ANNOUNCEMENTS:

Summoning of Parliament

Decision Taken at Committee on Parliamentary Business on 05.02.2018

ADJOURNMENT MOTION:

Reports of Presidential Commission of Inquiry to Investigate and Inquire into the Issuance of Treasury Bonds and Presidential Commission on Serious Acts of Fraud, Corruption and Abuse of Power, State Resources and Privileges

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2018 පෙබරවාරි 06 වන අඟහරුවාදා***
*2018 பெப்ருவரி 06, செவ்வாய்க்கிழமை*
*Tuesday, 06th February, 2018*

---

**පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ප්‍රතිඥාව: ගරු අහමදුලෙබ්බෙ මුහම්මදු නසීර් මහතා
## உறுதிப்பிரமாணம்: மாண்புமிகு அகமதுலெப்பை முஹம்மது நசீர்
## AFFIRMATION: HON. AHAMADULEBBE MOHAMADU NAZEER

***ගරු අහමදුලෙබ්බෙ මුහම්මදු නසීර් මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.***

*மாண்புமிகு அகமதுலெப்பை முஹம்மது நசீர், சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.*

*Hon. Ahamadulebbe Mohamadu Nazeer made and subscribed the Affirmation required by Law, and signed the Book at the Table.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### පාර්ලිමේන්තුව කැඳවීම
### பாராளுமன்றத்தைக் கூட்டல்
### SUMMONING OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුව කැඳවීමේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් දැන් සභාවට කියවනු ලැබේ.

***අනතුරුව පහත සඳහන් ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී.***

*அதன்மேல் பாராளுமன்றச் செயலாளர் நாயகம் பின்வரும் வர்த்தமானி அறிவித்தலை வாசித்தார்;*

*Whereupon the Secretary-General of Parliament read the following Gazette Notification:*



**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**
**අති විශෙෂ**

අංක 2056/15 - 2018 ජනවාරි මස 30 වැනි අඟහරුවාදා - 2018.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

**I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය**

**රජයේ නිවේදන**

කථානායකතුමාගේ නිවේදනය

2018 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාදා පූර්ව භාග 10.30ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 14 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව 2018 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාදා පූර්ව භාග 10.30ට රැස්වන ලෙස පාර්ලිමේන්තුව මා විසින් කැඳවන ලද බව පාර්ලිමේන්තුවේ කථානායක කරු ජයසූරිය වන මම මෙයින් දැනුම් දෙමි.

කරු ජයසූරිය,
කථානායක.

2018 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දී ය.

02- 521

1A - G 27046 — 362 (2018/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## II

### 2018.02.05 දින පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළැඹි තීරණය
### 05.02.2018 இல் பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுவில் எடுக்கப்பட்ட தீர்மானம்
### DECISION TAKEN AT COMMITTEE ON PARLIAMENTARY BUSINESS ON 05.02.2018

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, ඊයේ දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව - CBSL - විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම විමර්ශනය කිරීම -PRECIPAC - සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනාව යටතේ විවාදය පැවැත්වීමට අදාළ කරුණු සාකච්ඡා කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 78හි විධිවිධානවලට අනුකූලව මන්ත්‍රීවරුන් එකිනෙකාට පෞද්ගලිකව අපහාස වන ආකාරයෙන් දෝෂාරෝපණය කර නොගනිමින්, පාර්ලිමේන්තුවේ අභිමානයත්, සියලු මන්ත්‍රීවරුන්ගේ ගෞරවයත් ආරක්ෂා වන ආකාරයට සෑම මන්ත්‍රීවරයෙකුම ඉතාම සංයමයෙන් යුතුව මෙම විවාදයට සහභාගි වන ලෙස ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිමි.

එමෙන්ම, PRECIFAC වාර්තාවට අදාළ සංයුක්ත -CD- තැටිය අද උදෑසන පාර්ලිමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කර තිබෙන බව ද දන්වා සිටින්නට කැමැත්තෙමි.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament and the motion agreed to by Parliament on 08.03.2016, the hours of sitting this day shall be10.30 a.m. to 4.00 p.m. At 10.30 a.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 4.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 10.00 a.m. on Monday, February 19, 2018."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තා
## திறைசேரிப் பிணைமுறி விநியோகம் பற்றி விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் பாரிய மோசடி, ஊழல் மற்றும் அரச சொத்துக்கள், சிறப்புரிமைகள், அதிகார துஷ்பிரயோகம் தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி ஆணைக்குழுவினதும் அறிக்கைகள்
## REPORTS OF PRESIDENTIAL COMMISSION OF INQUIRY TO INVESTIGATE AND INQUIRE INTO THE ISSUANCE OF TREASURY BONDS AND PRESIDENTIAL COMMISSION ON SERIOUS ACTS OF FRAUD, CORRUPTION AND ABUSE OF POWER, STATE RESOURCES AND PRIVILEGES

[පූ.භා. 10.38]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවේ විශේෂ රැස්වීමක් පවත්වනවා. මම කැමැතියි, ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරලා කරුණු පැහැදිලි කරන්න. මේ රැස්වීම කැඳවලා තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තා දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්නයි. එයින් පළමුවැනි එක තමයි, 2015 පෙබරවාරි 1වැනි දා සිට 2016 මාර්තු 31වැනි දා වනතෙක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව සොයා බලන්න පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව. දෙවැනි එක තමයි, රටේ වෙලා තිබෙන බරපතළ වංචා - දූෂණ පිළිබඳව සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව. මේ වාර්තා දෙක තමයි අද ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම මේ පළමුවැනි වාර්තාව -බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව- දෙසැම්බර් 30වැනි දා ජනාධිපතිතුමාට ඒ කොමිසමේ කොමසාරිස්වරු භාර දුන්නා. ඊට පස්සේ ඉල්ලීමක් තිබුණා, මේ සභාව රැස්විය යුතුයි කියලා. එබැවින් ඔබතුමා එක්කත් සාකච්ඡා කරලා මම ලිපියක් එව්වා, ජනවාරි 10වැනි දින මේ සභාව කැඳවන්න කියලා.

ජනවාරි 10වැනි දා මේ සභාව කැඳවූ අවස්ථාවේ විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ නායක, මේ සභාවේ

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, "මේ පිළිබඳව වාද කරන්න නම් වාර්තාව ඉදිරිපත් කළ යුතුයි. ඒ වාර්තාව සභාවට ලැබිලා නැහැ" කියලා ප්‍රශ්නයක් මතු කළා. මම එදා කෙටි ප්‍රකාශයක් කළා. ඒකට බාධා කරපු නිසා, එදා එතැනින් ඒ සාකච්ඡාව අවසන් වුණා.

ඊට පස්සේ, 2018 ජනවාරි 23වැනි දා මේ වාර්තා මේ සභාවට ඉදිරිපත් කළා. ඒ පිළිබඳව පක්ෂ නායකයන් ඔබතුමා එක්ක සාකච්ඡා කළා. පෙබරවාරි 19වැනි දායින් පටන් ගන්න සතිය තුළ මේ වාර්තා පිළිබඳව වාද කරන්න තීරණය කළා. ඒත්, ඊට පස්සේ පැන නැඟුණු තත්ත්වය අනුව ඔබතුමා මට ලිපියක් එව්වා. ඒ ලිපියේ සඳහන් කළේ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර කුමාර දිසානායක මැතිතුමා පාර්ලිමේන්තුව වහාම කැඳවන්න කියා ඉල්ලා සිටිනවා කියලා. මම ඔබතුමාට ඒ රාත්‍රියේම දැනුම් දුන්නා, අපි 8වැනි දා පාර්ලිමේන්තුව කැඳවන්නම් කියලා.

මම දෙපැත්තේම මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් එක්ක ඒ ගැන සාකච්ඡා කරද්දී ඒ මන්ත්‍රීවරු කිව්වා, "7වැනි දා වෙන කල් ඡන්ද රැස්වීම් තිබෙනවා. ඒ නිසා 8වැනි දා රැස්වෙන එක වඩා සුදුසුයි" කියලා. ඒ අවස්ථාවේදී මැතිවරණ කොමිසමේ සභාපතිතුමා දැනුම් දුන්නා, "8වැනි දා පාර්ලිමේන්තුව රැස් වෙනවා නම්, මේ ඡන්දය කල් දාන්න වෙයි" කියලා. විවාදයට තව වැඩි පුර දවස් දෙකක් ඕනෑ නිසා ඡන්දය කල් දාන්න සිදු වෙයි කිව්වා. මම ඒ ලිපිය ඔබතුමාට එව්වේ නැහැ. ඒ වෙනුවට ඔබතුමාට යෝජනා කළා, පක්ෂ නායකයන් මුණ ගැහිලා අපට දින දෙන්න කියලා. පසුව ඔබතුමා මට දැනුම් දුන්නා, "පක්ෂ නායකයන්ගේ එකඟත්වයක් තිබුණේ නැහැ. ඔබතුමාටයි, මටයි සාකච්ඡා කරලා දිනයක් දෙන්න කිව්වා" කියලා. 2වැනි දා -සිකුරාදා- මම කොළඹ සිටියේ නැහැ. විශේෂයෙන්ම 6වැනි දා කැබිනට් මණ්ඩල රැස්වීම නොතිබෙන නිසා මම ඔබතුමාට යෝජනා කළා, 6වැනි දා පාර්ලිමේන්තුව කැඳවන්නම් කියලා. ඒ අනුවයි 6වැනි දා -අද- කැඳවලා තිබෙන්නේ.

පක්ෂ නායකයන්ට මේ ගැන සාකච්ඡා කරන්න වුවමනා වුණා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ දිනය තමයි ප්‍රශ්නය වුණේ. ඇත්ත වශයෙන්ම මට බලය තිබෙන්නේ පාර්ලිමේන්තුව කැඳවන්න විතරයි. කැඳෙව්වාට පස්සේ, දවස් කීයක් -පැයක්ද, දවසක්ද, දවස් දෙකක්ද, හතරක්ද, පහක්ද- පාර්ලිමේන්තුව රැස්වෙනවාද කියන එක පක්ෂ නායකයන්ගේ තීරණයක්.

ඒ අනුව පක්ෂ නායකයන් තීරණය කර තිබෙනවා, අද මේ විවාදය ආරම්භ කරලා, ඊට පසුව නැවත මේ මාසයේ 20, 21 දිනවල විවාදය පවත්වන්න. මා හිතනවා, එම යෝජනාව හොඳයි කියලා. මොකද, මන්ත්‍රීවරුන් ගණනාවක් අද පැමිණ නැහැ. ඒ අය අපට කියලා තිබෙනවා, ඒ අයටත් මෙම විවාදයට සහභාගී වෙන්න අවශ්‍යයි, නමුත් ඡන්ද වැඩ කටයුතු තිබෙන නිසා අද දින සහභාගී වෙන්න විධියක් නැහැ කියලා. ඒ නිසා අද මේ විවාදය ආරම්භ කරලා අපේ අදහස් ප්‍රකාශ කරනවා. අනෙක් අයට පසුව සාකච්ඡා කරන්න අවස්ථාව ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභා වාර්තා පිළිබඳ මා දීර්ඝ වශයෙන් මෙතැන කථා කරන්නේ නැහැ. වුවමනා වුණොත් පසුව ඒ ගැන කථා කරන්නම්. භාණ්ඩාගාර බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් දැනට පියවර අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සාක්ෂි සටහන් කරගෙන තිබෙනවා; උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා; නියෝග අරගෙන තිබෙනවා. සමහර සැකකරුවන් දැන් අත්අඩංගුවේ ඉන්නවා. දෙවනුව පත් කළ කොමිෂන් සභා වාර්තාවට අදාළ පියවර ගන්න තිබෙනවා. මා හිතන විධියට මේ සභාවේ සාමාජිකයන්ව සිටින අයගෙනුත් තිස්ගණනකට පමණ විරුද්ධව චෝදනා තිබෙනවා. විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් වන අධිකරණ ක්‍රියාමාර්ගවලට අමතරව මේ සභාවට සලකා බැලීමට තවත් යෝජනා තිබෙනවා. එකක් තමයි මහ බැංකුවට අදාළ නීති කිහිපයක් සංශෝධනය කිරීම. අපි දැනට අලුත් නීති කිහිපයක් සකස් කරගෙන යනවා. ඊට අමතරව, තවත් වුවමනා ඒවා අපි සකස් කරගෙන යනවා. 2016 සිට බලපාන පරිදි මහ බැංකුව සඳහා අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න බලාපොරොත්තු වන්නේ මූල්‍ය පනතකින් මහ බැංකුවේ ප්‍රතිසංවිධානය ඇති කරන්නයි. ඒක සකස් කරලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් එක්කත් අපි සාකච්ඡා කරන්නම්. මොකද, මුදල් පාලනය පාර්ලිමේන්තුවට අයිති වැඩ කටයුත්තක්. අපි දැන් පොදු මූල්‍ය කමිටුවක් ඇති කරලා අලුත් පනත් කෙටුම්පතක් සකස් කරන්න තිබෙනවා, පාර්ලිමේන්තුවේ අය වැය පරීක්ෂා කිරීමේ කාර්යාලයේ.

දෙවැනි වාර්තාවෙන් පසුව ක්‍රියාත්මක කරන්නත් නීති කිහිපයක් යෝජනා කරලා තිබෙනවා. නීතිවලට අමතරව ව්‍යවස්ථාවේ 81වැනි වගන්තිය සංශෝධනය කරනවාද, නැද්ද කියලා මේ ගරු සභාවට සලකා බලන්න වෙයි. මොකද, ඒ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට පමණයි. ඒක ගැනත් මේ ගරු සභාවේ අවධානයට යොමු කරවනවා. මීට වඩා දීර්ඝ වශයෙන් මා කථා කරන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් ගෙන තිබෙන පියවර ගැනත් මා කියන්න කැමැතියි. ඊට අමතරව කෝප් වාර්තාව පිළිබඳව දැනට නීතිපතිතුමා ගෙන තිබෙන පියවර සම්බන්ධයෙන් මා ඊයේ වාර්තාවක් ඉල්ලුවා. මට ඒක ලැබුණා. ගරු කථානායකතුමනි, මා ඔබතුමාට දැන් ඒකත් භාර දෙන්නම්. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම. ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.44]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපි පොඩි කාලයේ තහනම් වචනය භාවිත නොකොට විවාද කළා. එහිදී තහනම් වචනය ප්‍රකාශ නොකර වෙනත් කථා ගොඩක් කියනවා. මා දැන් දැක්කෙත් ඒ වාගේ දෙයක්. ඒ කියන්නේ, මහබැංකු බැඳුම්කර වංචාව පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේත්, බරපතළ මූල්‍ය වංචා පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේත් ඉතා පැහැදිලි ලෙස සඳහන්ව තිබෙන මේ රටේ මහජනයාගේ දේපොළවලට සිදු වී තිබෙන අලාභ හානිය, ඒවාට ගත යුතු ක්‍රියාමාර්ග, ඒවායේ ප්‍රමාණය, ඒවාට වගකිව යුත්තන් පිළිබඳව යම් සාකච්ඡාවක් මේ පාර්ලිමේන්තුවේ සිද්ධ විය යුතුව තිබුණත්, අගමැතිතුමා බොහොම ප්‍රවේසම් වුණා ඒ තහනම් වචනය පාවිච්චි නොකොට එතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, දැනට පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ බිලියන 12ක් අපි රඳා පවත්වාගෙන තිබෙනවා. ඒ මුදල් තිබෙනවා කියලා රීයේ මහ බැංකුවේ අධිපතිතුමාත් මට කිව්වා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, අපේ රටේ මහජනයාගේ ධනය සොරකම් කිරීම, නාස්ති කිරීම, අවභාවිතාව පිළිබඳව විශාල සංවාදයක් දැන් රටේ මතු වී තිබෙනවා. හැබැයි, එවැනි වංචා, දූෂණවලට එරෙහි සංවාදයක් තිබුණාට කිසි සේත්ම එහි තිබෙන බරපතළකම, එයින් අපේ රටේ සමාජයට ඇති කර තිබෙන බලපෑම, අපේ රටේ ඈත ගම්වල ජීවත්වන දුවා දරුවන්ගේ අධ්‍යාපනයට, රැකියාවට, කෘෂිකර්මාන්තයට, ජන ජීවිතයට ඇති කොට තිබෙන බලපෑම ඒ හා බරින් යුක්තව සාකච්ඡාවට බඳුන් වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ නිසා බැඳුම්කර කොමිෂන් සභා වාර්තා සහ අනෙකුත් වාර්තා පිළිබඳ අවධානය යොමු කරන්නට පෙර, මෙය මොන තරම් අපේ රටේ ආර්ථිකය සහ සමාජ දේහයේ පිළිලයක්ද යන්න කෙරෙහි මා අවධානය යොමු කරන්නට කැමැතියි.

2008 වසරේ පැවැති පාලනය විසින් ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනය පවරා ගත් බව අපි දන්නවා. ඒ හැම එකක්ම කළේ ආර්ථික ප්‍රතිපත්තියක් මත නොවෙයි. පෞද්ගලික හේතූන් මත පවරා ගෙන, 2018 දක්වා මේ ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනය පාලනය කරනවා. මේ අවුරුදු දහය තුළ ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනයේ පාඩුව රුපියල් කෝටි 12,500යි.

ඒ විතරක් නොවෙයි. එයාර් ලංකා ආයතනය VVIP කාමර සහිත ගුවන් යානා හතරක් ප්‍රංශයෙන් මිලදී ගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කොට තිබුණා. ඒ ගුවන් යානා අපට යෝග්‍යද, නැද්ද යන්න වෙනම කථාවක්. ඒ ගිවිසුම් හතර cancel කිරීම සඳහා පසුගියදා එයාර් ලංකා ආයතනය රුපියල් කෝටි 1,800ක් -ඩොලර් මිලියන 115ක්- ගෙවා තිබෙනවා. ඒ, එම ගිවිසුම් හතර cancel කිරීම සඳහා.

ලෝකයේ ආර්ථිකය පිළිබඳව යම් හෝ අවබෝධයක් තිබෙන කෙනෙක් ඒ මොහොතේ ගිහිල්ලා ග්‍රීසියේ බැඳුම්කර මිලදී ගන්නේ නැහැ. හැබැයි, අපේ මහ බැංකුවේ හිටපු අධිපතිවරයකු වන කබ්රාල්, ඩොලර් මිලියන 52ක බැඳුම්කර ග්‍රීසියෙන් මිලදී ගෙන තිබෙනවා. නමුත්, අද සතයකට වෙච්ච දෙයක් නැහැ. එහි පාඩුව මේ වන විට රුපියල් කෝටි 806යි. ඒ වාගේමයි, ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුව. විශේෂයෙන්ම රාජ්‍ය වෙත ලැබී තිබුණු ධනය පෞද්ගලික ආයතනයන්ට පැවරීම හේතුකොටගෙන ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුවෙන් සිදුවූ පාඩුව වන රුපියල් කෝටි 1,140ක් සම්බන්ධයෙන් දැන් මහාධිකරණයේ නඩු ගොනු කරලා තිබෙනවා.

ඊළඟට, තෙල් මිලදී ගැනීම. විශේෂයෙන්ම, පසුගිය අගෝස්තු මාසයේ තෙල් මිලදී ගැනීම පිළිබඳ නියමිත පරිදි ටෙන්ඩරය කැඳවා තිබෙනවා. එම ටෙන්ඩරය නියමිත පරිදි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් නොකොට, ක්ෂණික තෙල් මිලදී ගැනීම් නිසා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ පාඩුව එම ටෙන්ඩරයට අනුව සහ ක්ෂණිකව මිලදී ගත් ඒවා අතර වෙනස රුපියල් කෝටි 1,400යි. ඒ වාගේම, හෙජින් ගිවිසුම හරහා සිදුවී ඇති පාඩුව රුපියල් කෝටි 1,020යි. ඒ වාගේම, දැන් මේ සාකච්ඡාවට බඳුන් වන බැඳුම්කර ගනුදෙනුව නිසා සිදුවී ඇති පාඩුව රුපියල් කෝටි 1,100යි. ඒ කියන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? මේ රට පාලනය කරන ලද මේ පාලක කණ්ඩායම මහජනයාගේ ධනය තමන්ට සිතූ සිතූ පරිදි, රිසි සේ අවභාවිත කරපු; හොරකම් කරපු; නාස්ති කරපු ඉතිහාසයක් තිබෙනවා. මෙහි භයානකම තත්ත්වය මේකයි, ගරු කථානායකතුමනි.

2015 ජනවාරි මාසයේ 8වැනිදා එම මැතිවරණ වේදිකාවේ විශාල ලෙස සාකච්ඡාවට බඳුන් වුණේ, එවකට පැවති පාලනයේ වංචා සහ දූෂණයන් පිළිබඳව; එහි අකාර්යක්ෂමතාව පිළිබඳව; එහි මුදල් අවභාවිතාව පිළිබඳවයි. ඕනෑවටත් වඩා සංඛ්‍යා දත්ත, තොරතුරු, සාක්ෂි සහිතව ඒවා සමාජයේ සාකච්ඡාවට බඳුන් වෙමින් තිබුණා. ගරු කථානායකතුමනි, ඒ නිසාම ජනවාරි මාසයේ 8වැනිදා මේ පාලනයට ලැබුණු ජන වරමේ පිටුපස තිබුණු හරය අන් කවරක්වත් නොවෙයි, මේ වංචනිකයන්ට දඬුවම් දීම, වංචා කරන ලද දේපොළ අත් පත් කර ගැනීම සහ වංචාවෙන් වැළැක්වීමයි. හැබැයි, ආණ්ඩුව ගොඩනහා කෙටි කාලයක් ඇතුළත වංචනිකයන්ට දඬුවම් දෙනවා වෙනුවට, වංචනිකයන් ආරක්ෂා කිරීමේ පිළිවෙතකට තමුන්නාන්සේලා අවතීර්ණ වුණා. වංචා කරපු දේපොළ පවරා ගන්නවා වෙනුවට, ඒ දේපොළවලින් යම් පංගුවක් තමන්ටත් අත් පත් කර ගත හැකිද කියන සාකච්ඡාවට අවතීර්ණ වුණා. ඒ නිසා සමහර අමාත්‍යවරු ඉතාමත් ඍජු ලෙස මැදිහත් වෙමින්, එම වංචා කරන ලද ධනයෙන් කොටසක් තමන් වෙත අත් පත් කර ගැනීම සඳහා, අදාළ පරීක්ෂණ යට ගැන්වීම්, පරීක්ෂණ ඉදිරියට ගෙන යාමට බාධා කිරීම් සිදුවූ බව මේ පාර්ලිමේන්තුවේ ඕනෑවටත් වඩා වැඩියෙන් හෙළිදරව් වී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඇති වුණු විවාදයක් හේතුකොටගෙනම, එම වංචනිකයන් පිළිබඳව ඉදිරිපත් කරන ලද කරුණු මත හිටපු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාට තම අමාත්‍ය ධුරයෙන් පවා ඉල්ලා අස් වෙන්න සිදුවී තිබුණා. ඒ නිසා, වංචාවට දඬුවම් දෙන්න එන අය වංචනිකයන්ගේ දේපොළ පවරා ගන්නවා වෙනුවට වංචනිකයන් ආරක්ෂා කර, වංචා කරන ලද දේපොළ බෙදා ගැනීම සඳහා වූ සාකච්ඡාවකට අවතීර්ණ වුණා.

ඊටත් වඩා භයානකම තත්ත්වය තමයි, තමුන්නාන්සේලාත් මහා පරිමාණ වංචා, දූෂණවලට හවුල් වෙන්න පටන් ගැනීම. ඒකේ සංකේතාත්මක ගනුදෙනුව තමයි, පෙබරවාරි මාසයේ 27වැනිදා සිදුවූ මේ බැඳුම්කර ගනුදෙනුව. බැඳුම්කර ගනුදෙනුව කිසිසේත්ම මේ අවුරුදු තුනක වංචා, දූෂණ ධුරාවලිය නොවෙයි. 2015 පෙබරවාරි මාසයේ 27වැනිදා සිදුවුණු බැඳුම්කර ගනුදෙනුව මෙම වංචා, දූෂණවල සංකේතයයි. නමුත්, මුළු ධුරාවලියම නොවෙයි. ඒ ධුරාවලිය පිළිබඳව වෙනත් දවසක සවිස්තරාත්මකව මෙම පාර්ලිමේන්තුවේ විවාද කරන්න අප ලැහැස්තියි. හැබැයි මේ එහි සංකේතයයි. ගරු කථානායකතුමනි, 2015 පෙබරවාරි මාසයේ 27වැනි දා මේ ගනුදෙනුව සිද්ධ වුණාට පසුව 2015 මාර්තු මාසයේ 9වැනි දා මාධ්‍ය සාකච්ඡා පවත්වා අපි මේ කරුණු හෙළිදරව් කළා.

ගරු කථානායතුමනි, 2015 මාර්තු මාසයේ 17වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මවිසින් 23(2) යටතේ ප්‍රකාශයක් කරලා මේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉල්ලා සිටීමත්, ගනුදෙනුවේ ස්වභාවයත් හෙළිදරව් කිරීමත් කළා. ඒ පිළිබඳව 2015 මාර්තු මාසයේ 17වැනි දින හැන්සාඩ් වාර්තාවේ සඳහන්ව තිබෙනවා. එදින 23(2) යටතේ අවසානයේදී මා අසා සිටි ප්‍රශ්න කිහිපය මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. බැඳුම්කර ගනුදෙනුව සිද්ධ වෙලා දින 20කට පසුවයි මා මේ පිළිබඳව හෙළිදරව් කරන්නේ. 2015 පෙබරවාරි 27වැනි දා බැඳුම්කර ගනුදෙනුව සිද්ධ වුණා. 2015 මාර්තු 17වැනි දා පාර්ලිමේන්තුවේදී මා මේ පිළිබඳව හෙළිදරව් කළා. මේ ගනුදෙනුව සිද්ධ වෙලා

අවුරුදු තුනක් වෙන්න තව පොඩි කාලයයි අඩු. හැබැයි, මේ ගනුදෙනුව සිද්ධ වෙලා දින 20ක් ගියාට පසුව මම මේ පාර්ලිමේන්තුවේදී ඇහුවේ මොකක්ද? ගරු කථානායකතුමනි, 2015 මාර්තු 17වැනි දින හැන්සාඩ් වාර්තාවේ සඳහන් එම කොටස මා උපුටා දක්වන්නම්. එහි මා මෙසේ අසා තිබෙනවා:

01. "2015 පෙබරවාරි මාසයේ 27වැනි දින බැඳුම්කර නිකුතුවේ වටිනාකම දස ගුණයකින් ඉහළ දැමීමට හේතුව කුමක්ද?" බිලියනයක් ඉල්ලා බිලියන 10ක් දක්වා වර්ධනය කිරීමට හේතුව කුමක්ද?

02. "හදිසි මුදල් අවශ්‍යතාවක් වෙනුවෙන් වෙනත් වෙන්දේසියකට අදාළ කොන්දේසි පූර්වයෙන් ප්‍රකාශ කර නැවත කැඳවීමට පියවර නොගත්තේ ඇයි?" මොකද, ආණ්ඩුව කිව්වා, හදිසි මුදල් අවශ්‍යතාවකට මේක වැඩි කරන්න කියලා. ඊට පෙර දිනයේ එවකට අගමැති උපදේශක ලෙස කටයුතු කළ මලික් සමරවික්‍රම මැතිතුමාත්, මුදල් අමාත්‍යවරයාත්, කබීර් හාෂිම් අමාත්‍යවරයා ඇතුළු කණ්ඩායමක් සාකච්ඡාවක නිරත වුණා. ඒ සාකච්ඡාවෙන් එවකට මාර්ග ඉදිකිරීම් සඳහා තිබෙන බිලියන 79ක් ගෙවීම් සඳහා හඳුනාගෙන තිබුණා. ඒක හරි. හැබැයි, ඒ සඳහා මුදල් අවශ්‍යව තිබුණා නම් මා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරනවා, "හදිසි මුදල් අවශ්‍යතාවක් වෙනුවෙන් වෙනත් වෙන්දේසියක් අදාළ කොන්දේසි පූර්වයෙන් ප්‍රකාශ කර නැවත කැඳවීමට පියවර නොගත්තේ ඇයි? මුදල් අවශ්‍ය නම් පූර්ව කොන්දේසි සහිතව ඉතා ඉක්මනින් නැවත වෙන්දේසියක් කැඳවන්න තිබුණා." කියලා. හැබැයි, ඒ වෙන්දේසිය නොකැඳවා බිලියන එක බිලියන 10 දක්වා වැඩි කරගත්තේ ඇයි? තුන්වැනි ප්‍රශ්නයෙන් එදා මම අසා තිබෙන්නේ මෙයයි.

03. "මිලියන 1,000ක් වැනි මුදලක් කල්පිරීම සඳහා අවුරුදු 30ක කාලයක් ලබා දුන්නේ කුමන හේතුවක් මතද? ඒ වෙනුවෙන් සියයට 12.5ක ඉහළ පොලී අනුපාතයක් ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ඇයි?" මිලියන 1,000ක් වැනි මුදලක් අවුරුදු 30ක කල්පිරීමක් සඳහා සියයට 12.5ක පොලී අනුපාතයක්,- එවකටත් බැඳුම්කර ද්විතීයික වෙළෙඳ පොළේ සියයට 9.3ක පොලී අනුපාතිකයක් තිබියදී 12.5 දක්වා ඉහළ අනුපාතිකයක්-ගත්තේ ඇයි කියලා මා අසා තිබෙනවා. ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

04. "පෙබරවාරි 26වැනි දින පැවැති රැස්වීම හා, -ඒ කියන්නේ, මම කලින් කියපු අමාත්‍යවරුන්ගේ රැස්වීම- පසු දින බැඳුම්කර නිකුතුවේ අගය ඉහළ දැමීම අතර සම්බන්ධයක් තිබේද?" මේ රැස්වීම හා මේ බැඳුම්කර ඉහළ දැමීම සඳහා තිබුණු මේ සම්බන්ධය මොකක්ද? ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

05. "බැඳුම්කර නිකුතුවේ අගය ඉහළ දැමීම නිසා ඉහළ පොලී අනුපාතයක් යටතේ වූ ලංසු පිළිගැනීමට සිදු වුයේද? එසේ නම් එමගින් මහ බැංකුවට අලාභයක් සිදු වී තිබේද? එසේ නම් ඒ කොපමණද?" මේ අහන්නේ දින 20කට පසුවයි. පෙබරවාරි මාසයේ 27වැනි දා සිදු වූ සිදුවීම පිළිබඳව 2015 මාර්තු 17වැනි දායි මේ විධියට මා අසන්නේ. ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

06. "පෙබරවාරි මස 27වැනි දින බැඳුම්කර නිකුතුව සඳහා එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රමාණය සහ එක් එක් ආයතනයට බැඳුම්කර නිකුත් කරන ලද ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් සභාවට ඉදිරිපත් කරනු ලබන්නේද?" ඒ මොකවත් සඳහා නොවෙයි, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙත විශේෂ අවස්ථා ලබාදී තිබෙනවා ද කියලා දැන ගන්නයි. ඊළඟට, මා මෙසේ අසා තිබෙනවා.

07. "මේ ගනුදෙනුව පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයක් සාධාරණ හා අපක්ෂපාතී වනු පිණිස මහ බැංකුවේ සභාපතිවරයා තාවකාලිකව ඉවත් කරනු ලබන්නේද?"

ගරු කථානායකතුමනි, මේවා තමයි පෙබරවාරි මාසයේ 27වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මා ඇසූ ප්‍රශ්න. ගරු කථානායකතුමනි, මෙහි අවාසනාවන්ත තත්ත්වය මෙයයි. 2015 මාර්තු මාසයේ 17වැනි දා මේ අසා තිබෙන ප්‍රශ්නවලට 2018 ජනවාරි මාසයේ පළමුවැනි දා බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව නිසි පරිදි ඉදිරිපත් වන තෙක් නියමිත පරිදි පිළිතුරු මේ රටට ලැබුණේ නැහැ. එහි සැලකිය යුතු පංගුවක් "කෝප්" සභාව හරහා ඉදිරිපත් කරලා තිබුණත්, පෞද්ගලික සමාගමක් වන පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මේ මැදිහත්වීම පිළිබඳව මේවාට පිළිතුරු ලබා දුන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ කුමකට ද? සිදුවීම සිදු වන මොහොතේදීම ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරන කොට විශේෂයෙන්ම මහ බැංකුව බාර අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු අග්‍රාමාත්‍යවරයා නිසි බරින් සහ නිසි වගකීමෙන් යුතුව මේ ප්‍රශ්න පිළිබඳව සොයා බැලිය යුතුව තිබුණා. මම නොවෙයි, බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවම සඳහන් කොට තිබෙනවා, අග්‍රාමාත්‍යවරයා මෙහිදී පිළිතුරු ලබාදීමේදී ඒ අවශ්‍ය බර සහ සැලකිල්ල තබා නොගත් බව. ඒකයි පෙන්නුම් කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ විනාශය දික් ඇදෙන්න පෙර, මහජනයාගේ මහා ධනස්කන්ධයක් නාස්ති වෙන්න පෙර වළක්වා ගත හැකිව තිබුණු, අපරාධකරුවන් සොයා ගත යුතුව තිබුණු අපරාධකරුවන්ට දඬුවම් ලබා දිය යුතුව තිබුණු අවස්ථාවක්.

හැබැයි, ඒ අවස්ථාව අවුරුදු තුනක් පස්සට ඇදගෙන ගියේ ඇයි? තමුන්නාන්සේලාගේ යහපාලනය පිළිබඳ සුන්දර වැකි අද වැඩක් නැහැ. අද තමුන්නාන්සේලාගේ සියලු ක්‍රියාමාර්ග අන්තිමට බිත්තියට හේත්තු වුවාට පසුව ගනු ලබන ක්‍රියාමාර්ග. මේ වාගේ ක්‍රියාමාර්ග අපි ඕනෑතරම් දැක තිබෙනවා, ගරු කථානායකතුමනි. මේවා අවසානයේදී බිත්තියට හේත්තුවුවාට පසුව, කර කියාගත නොහැකි තත්ත්වයක් ඇති වුණාට පසුව ගනු ලබන ක්‍රියාමාර්ග. එසේ නැත්නම්, අපේ ගම්වල කියනවා වාගේ කරවටක් ගිලුණු පසු බේරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග. එම නිසා ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කිසිසේත්ම අවංකභාවයෙන් කරන ලද ප්‍රකාශ නොව, වංක භාවය - බිත්තියට හේත්තු වුවාට පසුව ආරක්ෂා වීම සඳහා කරනු ලබන ප්‍රකාශ. එතැන් සිට ඇතිවෙච්ච දියත්වීම් සියල්ල; මාරපන කමිටුව, රවි කරුණානායක උප නායකයා පිළිබඳ තීරණ මේ සියල්ල බිත්තියට හේත්තුවුවාට පසුව ඉන් මිදීම සඳහා දරන ලද ඉතාමත් අසාර්ථක, අසරණ තීරණ. ඇයි, මම එහෙම කියන්නේ? එදා මේ පාර්ලිමේන්තුවේ අගමැතිතුමාගේ ප්‍රකාශය කුමක්ද? මා ඒකත් උපුටා දක්වන්නම්. මම ඉතා පැහැදිලිව කිව්වා, මහ බැංකු අධිපතිවරයා පිළිබඳව මේ ප්‍රශ්නය ඇහුවාය කියා. එතුමා මෙහෙම දෙයක් කියනවා. පිළිතුර; "ඒ ටෙන්ඩර් එක දීලා තිබෙනවා. මහ බැංකු අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියා කරුණු නැහැ. එය සත්‍යයෙන් තොරයි. මම දෙවැනි වරටත් කොමිටියට කිව්වා, 'ආපසු මේ ගැන සොයා බලන්න' කියා. ඔහු ඒ උපදෙස් ලබා දුන්නේ, නියෝජ්‍ය අධිපතිවරුන් දෙදෙනෙක් ඉදිරියේදීයි. මහ බැංකු අධිපතිවරයා ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතුවලට මැදිහත් වූවාය කියන චෝදනාව පදනමින් තොරයි." ගරු කථානායකතුමනි, 2017 මාර්තු මාසයේ 17 වෙනිදායින් දින

[ගරු අනුර දිසානායක මහතා]

විස්සකට පසුව අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට කියනවා නම්, මහ බැංකු අධිපතිවරයාගේ මුළු මැදිහත්වීම සද්භාවයෙන් සහ ඔහුට එල්ල කරන ලද චෝදනා පදනමින් තොරයි කියා මේකට විවාදයක් ඇති වුණේ නැහැ. එතැනින් එහා මේකට කරන්න ක්‍රියාමාර්ගයක් නැහැ. හැබැයි අද බැඳුම්කර කොමිෂන් වාර්තාව මොකක්ද කියන්නේ? ඒ වාර්තාවේ කියනවා, මහේන්ද්‍රන් මහතා රුපියල් මිලියන දහ දහස් පණස් අටක වටිනාකමක් ඇති බැඳුම්කර නිකුත් කරන ලෙසට නියෝග කර ඇති අතර, එමගින් සාවද්‍ය ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට වෙන්දේසියේදී වැඩි අගයක් ලබා ගැනීමට හැකි වී ඇත. පෙබරවාරි 27 වෙනි දින වෙන්දේසියෙන් ලාභ ලැබීම සඳහා මහේන්ද්‍රන් මහතා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අභ්‍යන්තර තොරතුරු ලබා දී ඇත.

අද මොකක්ද කියන්නේ? එදා මේ පාර්ලිමේන්තුවේදී මහේන්ද්‍රන් ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතම කාර්යභාරය අග්‍රාමාත්‍යවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට ඔබතුමා ඉදිරිපත් කළා. ඒක තමයි බැඳුම්කර කොමිසමත් ඔබතුමාගෙන් ප්‍රශ්න කරන්නේ, විශ්වාස තැබීම පිළිබඳ ප්‍රශ්නය. මා කියන්නේ මේක විශ්වාසය නොවෙයි. ගජමිතුරුකමක්ය කියායි මම විශ්වාස කරන්නේ. ගජමිතුරුකමක්.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, තවත් මෙහෙම කියනවා, 2015 පෙබරවාරි මාසයේ 27 වන දින බැඳුම්කර ගනුදෙනුවේදී අර්ජුන මහේන්ද්‍රන් මහතාගේ මැදිහත් වීමේ ඍජු ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රජයට සිදු වී ඇති වළක්වා ගත හැකිව තිබූ පාඩුව මිලියන 688 කි. මෙම පාඩුවට මහේන්ද්‍රන් මහතා වගකිව යුතුය." කොහොමද කියන්නේ? "ඒ විතරක් නොවෙයි, මෙය ඔහුගෙන් අය කර ගැනීමට නිර්දේශ කරමි." කියලත් කියනවා. එසේනම් මොකක්ද වී තිබෙන්නේ? පාර්ලිමේන්තුවේදීම අග්‍රාමාත්‍යවරයා ගනුදෙනුව ආරක්ෂා කිරීම වෙනුවෙන් මහේන්ද්‍රන් මහතා ඍජු ලෙස ආරක්ෂා කොට තිබෙනවා. හැබැයි මාර්තු මාසයේ 17 වෙනිදා අග්‍රාමාත්‍යවරයා මෙම පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය සාවද්‍ය බව මෙම බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව තහවුරු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේකට පිටිපන කමිටුව පත් කළා. ඒ පිළිබඳ ඡේද ගණනාවක් තිබෙනවා. හැබැයි මම ඒ ඡේද ගණනාවම උපුටා දක්වන්නට සූදානම් වෙන්නේ නැහැ. හැබැයි මේ පිටිපන කමිටුව පිළිබඳව අග්‍රාමාත්‍යවරයා විශේෂ අවධානයක් යොමු කරනවා, මේ පිටිපන කමිටුව ඉතාමත් නිරවුල් කමිටුවක්ය කියා. ඒ සඳහා වන එක වගන්තියක් මම ඔබතුමාට උපුටා දක්වන්නම්. "මේ සඳහා ආර්ථික විශේෂඥයින් ඕනෑ කියලා සමහර අය කියනවා. මම අහන්නේ එක ප්‍රශ්නයයි. නඩු දැම්මොත් නඩු අහන්නේ කවුද? අපි ආර්ථික විශේෂඥයින් නඩුකාරයින් කරනවාද? පත් කරන්නේ සාමාන්‍ය නීතිඥවරු. මේකට අපට නඩු දමන්න බැහැ. නැත්නම් ව්‍යවස්ථාව වෙනස් කරලා විශේෂඥයින් ගෙන්වන්න ඕනෑ. නැත්නම් ජූරියකට primary dealers දමන්න ඕනෑ. මතක තියා ගන්න. නඩුවක් දැම්මත් නඩුව අහන්නේ මේ සුදුසුකම් තියෙන අය මිසක් වෙන කවුරුවත් නොවෙයි. මහාධිකරණ, දිස්ත්‍රික් අධිකරණ නඩු අහන්නේ මේ අය. මොකක් හෝ විධියකට නීතිය කඩ කර තිබෙනවා නම්, මේක උසාවි ඉදිරිපත් කරන්න බැහැ.

ඉස්සර වෙලාම ඒ ගැන අහන්න, මේ නීතිඥයන් තුන්දෙනා. ඉන් පස්සේ කටයුතු කරන්න. මේකේ නීතිඥයන් තුන්දෙනා පත් කිරීම ගැන." මේ පිටිපන කමිටුව ගැන එතුමා ප්‍රකාශ කළ ආකාරයයි.

මෙම වංචාව සොයා බැලීම සඳහා තිබෙන ඉතාම විධිමත් සහ පැහැදිලිම කමිටුව පිටිපන කමිටුව බව අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවට පුන පුනා ප්‍රකාශ කළා. හැබැයි, කනගාටුවට කාරණය මේකයි, ගරු කථානායකතුමනි. බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා, පිටිපන කමිටුවට ඊට අවශ්‍ය වන පරිචය හෝ ඊට අවශ්‍ය වන දැනුම හෝ එවැනි කාර්ය භාරයක් කිරීමට සුදුසුකම් නොමැති බව. ජ්‍යෙෂ්ඨ සහ ප්‍රකට නීතිඥවරු තිදෙනෙකුගෙන් යුත් පිටිපන කමිටුවේ සාමාජිකයන් රජයේ සුරැකුම් සහ රාජ්‍ය ණය වැනි සාපේක්ෂ, සංකීර්ණ විෂය පථයක් පිළිබඳව තාක්ෂණික දැනුමක් හෝ ප්‍රායෝගික අවබෝධයක් සහිත වූවන් නොවූ බව එම කොමිසමේ අදහසයි; මෙම කමිටුවට තමන් පරීක්ෂාවට ලක් කරන්නා වූ කරුණේ තාක්ෂණික සහ ප්‍රායෝගික පැතිකඩ පිළිබඳව දැනුම සහ අත්දැකීම් ඇති සාමාජිකයන් සිටියේ නම්, පරීක්ෂණ කමිටුව කාර්යක්ෂම විය හැකිව තිබූ බව කොමිසමේ අදහසයි. එම නිසා පිටිපන කමිටුව, මේ සිද්ධිය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා තිබෙන සුදුසුම හා ශක්තිමත්ම කමිටුව ලෙස එදා අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී වගන්ති ගණනාවකින් තහවුරු කර තිබුණත්, එම කමිටුවට ඒකට කිසිදු සුදුසුකමක් නොමැති බව බැඳුම්කර පිළිබඳව සොයා බැලීමට පත් කළ කොමිෂන් සභාව ඉතා පැහැදිලිව නිර්දේශ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ගනුදෙනුව සිදුවූ මොහොතේ සිට විෂයය භාර අමාත්‍යවරයා හැටියට අග්‍රාමාත්‍යවරයා, එය ආන්දෝලනයට තුඩු දුන්නාට පසුව පාර්ලිමේන්තුවට වග කිවයුත්තා ලෙස අග්‍රාමාත්‍යවරයා, ඒ වාගේම වංචා, දූෂණවලට එරෙහිව 2015 ජනවාරි මාසයේ 8වැනි දා ප්‍රතිඥා දුන් අග්‍රාමාත්‍යවරයා ලෙස එතුමාගේ සමස්ත හැසිරීමම, දූෂිතයාට දඬුවම් දීම හෝ දූෂණ එළිදරවු කිරීම වෙනුවට, ඉතා පැහැදිලිව දූෂිතයා ආරක්ෂා කිරීම සහ දූෂණය වසන් කිරීම දෙසට යොමු වී තිබුණා. එය නොකියා තමයි බැඳුම්කර කොමිසම -මා දන්නේ නැහැ, අගමැතිවරයාට ඒ ඍජු චෝදනාව කරන්න කොමිසම ඒ තරම් ප්‍රබල තැනකට යයි කියා.- හැබැයි, ජනාධිපති කොමිෂන් සභාව ව්‍යංගයෙන්- මා හිතනවා ඒක එහෙම තමයි කියලා. ඒක තමයි සිංහල භාෂාව.- කියනවා, අග්‍රාමාත්‍යවරයා, මහ බැංකුවේ අධිපතිවරයා සහ ඔවුන් විසින් දෙන ලද තොරතුරු මත මුළුමනින්ම විශ්වාසය නොතැබිය යුතුය තිබුණාය කියලා. එයින් කියන්නේ මොකක්ද? ඔවුන් ආරක්ෂා නොකළ යුතුව තිබුණා. මේකේ අනික් පැත්ත. කියන්නේ negative පැත්තයි. Positive පැත්ත මොකක්ද? ආරක්ෂා නොකළ යුතුව තිබුණාය කියන එකයි. ඒකයි මේ කියන්නේ. ඒ නිසා බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව මඟින් විෂයය භාර අමාත්‍යවරයා ලෙසත්, අග්‍රාමාත්‍යවරයා ලෙසත් නිශ්චිත ලෙස එල්ල වී තිබෙන චෝදනා කිසිසේත්ම බැහැර නොකළ යුතු චෝදනාය කියා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ පරීක්ෂණය ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, නීතිපති දෙපාර්තමේන්තුවට,- මා කියන්නේ නැහැ ඒවා කවදාවත් ස්වාධීන ආයතන බවට පත් වෙයි කියලා. ඒවා හැම දාමත් දේශපාලන හස්තයන්ගේ වුවමනාවලට කටයුතු කර තිබෙන ඉතිහාසයක් තිබෙනවා. File ලාච්චු යටට යන විධිය අපි දන්නවා; චෝදනා වෙනස් වන විධිය අපි දන්නවා; චෝදනාවලින් ගැලවෙන්න චෝදනා ගොනු කළ ඉතිහාසයක් තිබෙන බව අපි ඉතා හොඳින් දන්නවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමන්ගේ නිමිත්ත කලින් හොයා ගන්නවා. එක්කෝ දූෂිතයා නම් කර ගන්නවා. දූෂිතයා නම් කරගෙන පරීක්ෂණ පෙළ ගස්වනවා. එක්කෝ නිවැරදිකරු නිමිත්ත කරගෙන පරීක්ෂණ පෙළ ගස්වනවා. එහෙම දේශපාලන ඉතිහාසයක් මේ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබෙන බව අපි විශ්වාස කරනවා. එම නිසා අපිට ඒ පරීක්ෂණ පිළිබඳව සියයට සියයක විශ්වාසයක් නැහැ. හැබැයි, අපි මේ

කාරණය විශ්වාස කරනවා. අපරාධකරුවන්ට, වංචනිකයන්ට දඬුවම් දීම සඳහා අපේ රටේ පාර්ලිමේන්තුව විසින් සකස් කරන ලද නීති සහ පිහිටුවා තිබෙන ආයතන දේශපාලන හස්තයන්ගේ මුළු අධිකාරිත්වයට යට වී තිබෙනවා නම්, අවසානයේදී අපරාධකරුවන්ට, වංචනිකයන්ට දඬුවම් දීම සඳහා විශාලම වගකීම තිබෙන්නේ මේ රටේ ජනතාව අතේයි, ගරු කථානායකතුමනි. ඒ නිසා මේ රටේ ජනතාව තමන් අතේ තිබෙන බලය උපයෝගි කරගෙන මෙම අපරාධකරුවන්ට දඬුවම් දෙයි කියන දැඩි විශ්වාසය අපි තුළ තිබෙනවා. සමාජයවත් අපරාධකරුවන්ට, වංචනිකයන්ට දඬුවම් දීම සඳහා පෙලඹෙන්නේ නැත්නම්, ඒ සඳහා නායකත්වය දුන් අය වංචනිකයන් සහ දූෂිතයන් නම්, ඒ සඳහා තිබෙන ආයතන අකාර්යක්ෂම වෙලා දේශපාලන හස්තයන්ට මැදිවී තිබෙනවා නම්, අවසානයේදී මේ අවනඩුව තිබෙන්නේ කා ඉදිරිපිටද? ගරු කථානායකතුමනි, අවසානයේදී මේ අවනඩුව තිබෙන්නේ මහජනයා ඉදිරිපිටයි. මහජනයා මේ අවනඩුවට හොඳ තීන්දුවක් ගත්තේ නැත්නම් ගරු කථානායකතුමනි අපි මහජනයා ගැනත් කල්පනා කර බලන්න ඕනෑකම තිබෙනවා. භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව අපිට කියන්න තිබෙන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, ඊළඟට බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව මා අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම වාර්තාව ලබා දුන් දින වකවානු සහ ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දින වකවානුත් එක්ක සන්සන්දනය කර බලන විට එම වාර්තා ටිකක් නිද්‍රාශීලීයි; ඒ වාර්තාව එළියට එන්න කලින්ම හමස් පෙට්ටියට ගියාදෝ කියන සැකය අපට ඇති වනවා. මෙතෙක් කාලයක් එම වාර්තාවට සිදු වුණු සිදුවීම් දිහා බැලුවාම අපට එහෙම තමයි හිතා ගන්න වෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව අනුව ආයතන 34ක් පරීක්ෂා කර තිබෙනවා. මේ පරීක්ෂණ 34 තමයි, ඒ වකවානුව පිළිබඳව කරන ලද මහා වංචා දූෂණ 34 කියලා මා කිසිසේත්ම කියන්නේ නැහැ. දැනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සාකච්ඡාවට බඳුන් වන්නට විශාල කරුණු ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම බරපතළ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පරීක්ෂණයට භාජනය වී ගොනු කර තිබෙන නඩු ගණනාවක් තිබෙනවා. එසේම විගණකාධිපති දෙපාර්තමේන්තුවේත් එවැනි පරීක්ෂණ ගණනාවක් තිබෙනවා. ඒ වාගේම විනිමය පාලන පනතට අනුව කොටස් වෙළෙඳපොළේ ඇති කරන ලද "ගේම්" පිළිබඳව පරීක්ෂණයක් සිදු වේ යයි අපි විශාල බලාපොරොත්තුවකින් ඉන්නවා.

විශේෂයෙන්ම තිලක් කරුණාරත්න මහතා කොටස් වෙළෙඳ පොළේ ප්‍රධාන නිලයට පත් වුණාට පසුව එතුමා කාර්යක්ෂමව එම ක්ෂේත්‍රයේ ඇති වී තිබුණු වංචා, දූෂණ සහ "ගේම්" පිළිබඳව පරීක්ෂණ වඩාත් ඉදිරියට ගෙන යයි කියලා අපේ විශාල බලාපොරොත්තුවක් තිබුණා. නමුත් දැන් මා තුළ තිබෙන අවබෝධය අනුව එවැනි කිසිදු පරීක්ෂණයක් සිදු නොවන බව තමයි වාර්තා වී තිබෙන්නේ. එවැනි පරීක්ෂණ සිදු කරන්න බැරි හේතු අපට ඉතා පැහැදිලියි, ගරු කථානායකතුමනි. "කලකදී වහ කලකදී රහ වෙනවාලු." ඒ නිසා 2015ට කලින් වහ වෙලා හිටපු බොහෝ අය 2015 ජනවාරි මාසයේ 08 වැනිදායින් පස්සේ රහ වීමේ ප්‍රතිඵලය නිසා තමයි අද විනිමය පාලන පනත අනුව ඒ දේවල් ඉස්සරහට යන්නේ නැත්තේ. එදා "වහ" අද "රහ" වෙච්ච විධිය, අවශ්‍ය නම් ඒවාට අදාළ නම් ගම්, තොරතුරු ඕනෑම වෙලාවක කියන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙම බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ආයතන 34ක් පරීක්ෂණයට භාජනකොට තිබෙනවා. ඒ ආයතන 34න් රුපියල් මිලියන 3,172ක් අවභාවිතා වී ඇති බව දැනට වාර්තාකොට තිබෙනවා. මහජනයාගේ ධනය රුපියල් කෝටි 317ක්; 317,24,00,000ක් අවභාවිතා වී හෝ නාස්ති වී හෝ සොරකම් වී තිබෙන බවට වාර්තාකොට තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒවා එකින් එක විස්තර කරන්නේ නැති වුණාට, දැන් ආන්දෝලනයට තුඩු දී තිබෙන ස්වාධීන රූපවාහිනියේ ගනුදෙනුව පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා සූදානම් වෙනවා. විශේෂයෙන්ම ස්වාධීන රූපවාහිනී ආයතනයත් එම වකවානුවේදී මෙම දැන්වීම් ප්‍රචාරණය කිරීම, මුළුමනින්ම රූපවාහිනී ආයතනය මැතිවරණය සඳහා උපයෝගී කර ගැනීම ආදී කරුණු හේතු කොටගෙන ඇති වී තිබෙන පාඩුව පිළිබඳව මෙහෙම දක්වා තිබෙනවා. ඒ ජනාධිපතිවරණයේදී මීඩියා ෆැක්ටරි නියෝජිත ආයතනයේ දැන්වීම්වලින් - මම රවුම් අගය කියන්නම්.- රුපියල් මිලියන 101ක්; වික්ටරි ඇඩ්වර්ටයිසින් නියෝජිත ආයතනයේ දැන්වීම්වලින් රුපියල් මිලියන 08ක්, Rate Card මඟින් රුපියල් මිලියන 112ක්, මෛත්‍රීපාල මහත්මයාගේ දැන්වීම් ප්‍රචාරය නොකිරීම පිළිබඳව රුපියල් මිලියන 09ක් ආදී වශයෙන් රුපියල් මිලියන 235ක්; රුපියල් 23,52,00,000ක් ITN නාළිකාවේ මුදල් අවභාවිතා වූ බව සඳහන් වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ITN නාළිකාවට රුපියල් කෝටි 23ක්. ඉතින්, නාළිකාවක් ඉතිරි වෙයි කියලා මම හිතන්නේ නැහැ. එවැනි කුඩා ආයතනයකින් රුපියල් මිලියන 235ක් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මගේ කාලය දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොච්චර වෙලාවක් ගන්නවාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමාගේ කාලය ඔක්කොම ගන්නවා.

ගරු කථානායකතුමනි, මේ පරීක්ෂණ වාර්තාවේ සඳහන් ආකාරයට මේ ආන්දෝලනයට තුඩු දුන් කාරණාව සම්බන්ධයෙන් හය වැනි වගඋත්තරකරුවා ලෙස හිටපු ජනාධිපතිතුමා නම් කර තිබෙනවා. නම් කිරීමට අමතරව මෙසේ සඳහන් කර තිබෙනවා:

> " දැන්වීමලත් පාර්ශ්වය වන මහින්ද රාජපක්ෂ යන අය අල්ලස් පනතේ 70 වන වගන්තියෙහි විස්තර කර ඇති "දූෂණය" වරද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද, දූෂණයට අනුබල දීමේ වරද යන මෙම වැරදි එකක් හෝ ඊට වැඩි ගණනක් සිදු කර ඇති බව මෙම කොමිෂන් සභාවේ තීරණයයි."

[ගරු අනුර දිසානායක මහතා]

හැබැයි, ඊට පස්සේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමක් පිළිබඳව සාකච්ඡාවක් ගොඩනැඟිලා තිබුණා මම දැක්කා. කිසි කෙනෙකුට දේශපාලන "ගේම්" වෙනුවෙන් පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය කිරීමට අපි ඉඩ දෙන්නේ නැහැයි කියලා මම කියනවා.

එය සාධාරණ නැහැ. පාර්ලිමේන්තුව දඬුවම් ලබා දෙන ස්ථානයක් නොවෙයි. මේ පාර්ලිමේන්තුව දඬුවම් දීපු, කැත ඉතිහාසයක් තිබෙනවා. ශිරාණි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමියට එරෙහිව මේ පාර්ලිමේන්තුවේ නඩු අහලා - නඩුකාරයෝ කවුද කියන්නත් දැන් ලජ්ජයි,- දඬුවම් දුන්නා. ඒ වාගේම මීට ඉහත ඉතිහාසයේදීත් නඩු අහලා දඬුවම් ලබා දුන් අවස්ථා අපි දැකලා තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තුව කිසිසේත්ම දඬුවම් දීමේ ආයතනයක් බවට පරිවර්තනය නොවිය යුතුයි. ඒ නිසා දේශපාලන තීරණයකට අනුව තමන්ට අවශ්‍ය අය සොයා බලා දඬුවම් කිරීම සඳහා කෙරෙන ක්‍රියාවලියකට මේ පාර්ලිමේන්තුව යටත් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. එවැනි ක්‍රියාමාර්ගයකට අපේ පාර්ශ්වයෙන් කිසිදු සහායක් ලබා නොදෙනවා පමණක් නොවෙයි, එවැනි ක්‍රියා මාර්ග අපි පරාදත් කරනවා.

ගරු කථානායකතුමනි, මෙම වාර්තාවේ ඉතා පැහැදිලි කථාවක් තිබෙනවා. මේ හරහා කියන්නේ අන් කවරක්වත් නොවෙයි. අපේ රටේ නීතියේ තිබෙන අඩුවක් ගැන කොමිෂන් සභාව පෙන්නුම් කරනවා. කොමිෂන් සභාව මොකක්ද කියන්නේ? දූෂණයට හෝ වෙනත් අපරාධ නඩුවකට අධිකරණයකදී වරදකරු වී දඬුවම් ලැබූ අයෙකු මහජන නියෝජිතයෙකු වශයෙන් තේරී පත්වීම නුසුදුසු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89වැනි ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. ඒ කියන්නේ අවුරුදු දෙකකට නොඅඩු කාලයක් දඬුවම් ලබා දිය හැකි වරදකට මාස හයකට වඩා වැඩි සිර දඬුවමක් ලැබුණොත්, ඔහුට ජනාධිපතිවරණයකට හෝ තෝරා පත් කර ගන්නා මැතිවරණයකට අවුරුදු හතක් ගත වන තෙක් ඉදිරිපත් වෙන්න බැහැ. මේක තමයි දැන් තිබෙන නීතිය. හැබැයි, කොමිෂන් සභාව කියනවා, මෙම නීතිය සාධාරණ නැහැ කියලා. මේ කොමිෂන් සභා වාර්තාවේ 147 වන පිටුවේ එය මෙසේ සඳහන් වනවා:

> "වරදකට වැරදිකරු කිරීමෙන් මහජන නියෝජිතයෙකු වශයෙන් පත් කිරීමට නුසුදුසු වන ඉහත සීමාවන් සලකා බැලීමේදී පෙනී යන්නේ සිර දඬුවම් විඳි දේශපාලනඥයෙකුට වුවද සත් වසරකින් පසුව නැවත මහජන නියෝජිතයෙකු වශයෙන් තේරී පත් වීමට අවස්ථාව ඇති බවයි."

ඒ කියන්නේ දැන් තිබෙන නීතියේ අඩුවක් පෙන්වලා දෙනවා. වංචා කරලා සිර දඬුවම් ලැබූ කෙනෙකුට හෝ අවුරුදු 7කට පසුව නැවත මහජන නියෝජිතයෙකු බවට පත් විය හැකියි.

මෙම වාර්තාවේ 147 වන පිටුවේ වැඩිදුරටත් මෙසේ සඳහන් වනවා:

> "නමුත් මෙම කොමිෂන් සභාවේ අදහස වන්නේ අපරාධ ක්‍රියාවකට විශේෂයෙන් 'දූෂණය' වැනි වරදකට වරදකරු වූ දේශපාලනඥයෙකු සත් වසරකින් පසුව වුවද මහජන නියෝජිතයෙකු වශයෙන් තේරී පත්වීම නුසුදුසු බවයි."

එච්චරයි. ඒක හරි නැද්ද? කවුරු හරි තනි පුද්ගලයෙක් ඉලක්කකොට ගෙන පාර්ලිමේන්තුව දඩයම් කිරීමේ, දඬුවම් කිරීමේ මධ්‍යස්ථානයක් වෙනවාට අපි එකඟ නොවන්නා සේම, මහජනයාගේ දේපළ හොරකම් කිරීම, නාස්ති කිරීම, දූෂණය කිරීමේ වරදට වරදකරුවෙක් වුණොත් ඔහු මහජන නියෝජිතයෙක් හැටියට තෝරා පත් කර යැවීමට තිබෙන අයිතිය මුළුමනින්ම අවලංගු කිරීම සඳහා මෙම කොමිෂන් සභාව ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අපි සියයට 100ක් පක්ෂපාතියි. මේ සංශෝධනය ගෙනෙන්න ලෑස්තිද කියලා මම ආණ්ඩු පක්ෂයෙන් දැන ගන්න කැමැතියි. මෙය සිදු කළ යුතු සංශෝධනයක්.

ගරු කථානායකතුමනි, මහ ජනතාවගේ ධනය තමන් සිතූ සිතූ පරිදි දූ කෙළියේ යෙදවීමට තාවකාලිකව බලයට එන කණ්ඩායමකට අපි ඉඩ ලබා දිය යුතුද? නැවත අවුරුදු හතෙන් එනවා. ඔය තරම් හොරකම් කළාට පසුව තවත් බලයේ ඉන්න බැහැ. කොහොමත් අවුරුදු හතක් විතර එළියේ ඉන්න වෙනවා. නැවත එනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දූෂණය කියන වරදට වරදකරුවෙකු වී සිර දඬුවම් ලබා යළි මහජන නියෝජිතයෙකු හැටියට තෝරා පත් කර ගැනීම සඳහා තිබෙන අවස්ථාව නැති කිරීමේ නීති ප්‍රතිසංවිධානය වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරිපත් කර තිබෙන යෝජනාවට මා යට කී කොන්දේසියට යටත්ව පක්ෂපාතියි. පාර්ලිමේන්තුව දඬුවම් කිරීමේ ආයතනයක් නොවෙයි, පාර්ලිමේන්තුව නීති සම්පාදනය කිරීමේ ආයතනයක් කියන පැත්තෙන් ඒ යෝජනාවට අපි අපේ පක්ෂපාතීත්වය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ බලය ගන්න අය ඒ බලය හසුරුවන්නේ බලයෙන් විඳින්න; බලයෙන් ජොලි කරන්න. රට පිළිබඳව, මහ ජනයා පිළිබඳව, මහ ජනයා විසින් තමන්ගේ දෙවුර මත පටවන ලද වගකීමක් ලෙස නොවෙයි බලය පිළිබඳව ඔවුන් සලකන්නේ. මහ ජනතාව පාර්ලිමේන්තුවට වේවා, ජනාධිපතිවරයෙකුට වේවා මහා බලයක් අත්පත් කර දෙන්නේ කුමක් වෙනුවෙන්ද? ගරු කථානායකතුමනි, එම බලය අත්පත් කර දෙන්නේ මහ ජනයා පිළිබඳවත්, රට පිළිබඳවත් මහත් වගකීමකින් යුතුවයි. හැබැයි, මෑත ඉතිහාසය පුරාම මේ පාලකයන් හැසිරී තිබෙන්නේ ජනතාවගේ බර, රටේ වගකීම තමන්ගේ දෙවුර මත පටවා ගන්නා ලද පාලකයන් ලෙස නොවෙයි. ඔවුන් හැසිරී තිබෙන්නේ තමනට සිතූ සිතූ පරිදි මහජනයාගේ ධනය නාස්ති කරමින්, හොරකම් කරමින්, දූ කෙළියේ යෙදෙන්න පුළුවන්, enjoy කරන්න පුළුවන් බලයක් ඇති කණ්ඩායමක් ලෙසයි. ඒක මෙම කොමිෂන් සභා වාර්තාවේ ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. එය මොන තරම්ද කියා මම පෙන්වන්නම්, ගරු කථානායකතුමනි.

බැසිල් රාජපක්ෂ හිටපු අමාත්‍යවරයා පිළිබඳව මෙම වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුගේ අභ්‍යන්තර ගුවන් ගමන් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ගෙවා තිබෙනවා, රුපියල් මිලියන 155ක්. ඊට පසුව 'ගම නැගුම' ව්‍යාපෘතියෙන් ගුවන් ගමන් සඳහා යොදවා තිබෙනවා, රුපියල් මිලියන 161ක්. ඔහුට නියමිත වාහනවලට වඩා ඔහුගේ අතිරේක වාහන පාවිච්චිය වෙනුවෙන් රුපියල් මිලියන 612යි; ඔහුට නියමිත ආරක්ෂාවට වඩා අතිරේක ආරක්ෂාව වෙනුවෙන් රුපියල් මිලියන 264යි. ඒ නිසා ඔහු සිදු කොට තිබෙන පාඩුව රුපියල් මිලියන 1,200ක් බව මෙම වාර්තාවේ සඳහන් වී තිබෙනවා. රුපියල් මිලියන 1,200ක්! මොකක්ද, මේ පෙන්නුම් කරන්නේ? මෙයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත්ද? ගරු කථානායකතුමනි, මේ ගුවන් වියදම් දිහා බැලුවාම, බොහෝ දුරට එතුමා පොළොවට වඩා වැඩියෙන් උඩ ඉන්න ඕනෑ. පොළොවට වඩා වැඩියෙන් උඩ ඉන්න ඕනෑ, මේ අවුරුදු පහට! ඒ නිසා ගරු කථානායකතුමනි, මහජනයාගේ ධනය රුපියල් මිලියන 1,200ක් තමන්ගේ පෞද්ගලික සුඛවිහරණ වෙනුවෙන්, ජොලි කිරීම වෙනුවෙන්, enjoy කිරීම වෙනුවෙන් වැය කරන පාලන තන්ත්‍රයක් වෙනස් විය යුතු නැද්ද? වෙනස් විය යුතු නැද්ද, එම දේශපාලන සංස්කෘතීන්? ඒක අපි තමුන්නාන්සේලාගෙන් අහනවා.

ගරු කථානායකතුමනි, මේ වාර්තා පළ වෙන වේලාවේ කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරන ලද සාක්ෂි මා දැක්කා.

එම සාක්ෂිවලින් ඉතා මැනවින් පෙන්නුම් කරමින් තිබුණේ මොකක්ද? සමහර නාවික හමුදා සෙබළියන් තබා ගෙන හිටියේ නෝනාගේ හැට්ටේ ආය කටුව ගහන්න; එහෙම නැත්නම් සපත්තු දෙක පොලිෂ් කරන්න, සාරිය අන්දවන්න, පොට හරිද කියලා බලන්න. මේ මොකක්ද, වෙලා තිබෙන්නේ? මේ රටේ මහ ජනයාගේ ධනය තමන්ට සිතු-සිතු පරිදි විනාශ කිරීම සඳහා අවශ්‍ය වන 'ජොලි කිරීමේ' බලයක් තමයි තමුන්නාන්සේලාගේ පාලනය. ගරු කථානායකතුමනි, මෙම කොමිෂන් සභා වාර්තාවේ ඒ පිළිබඳවත් ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, නියමිත පරිදි එක්රැස් කොට තිබෙන, වියදම් කිරීම සඳහා අනුබලය දී තිබෙන ධනය, වක්‍රාකාරයෙන් තමන්ගේ හිතවතුන් වෙත අදින්නේ කොහොමද, හිතවතුන් වෙත මහ ජනයාගේ ධනය ඇදලා දෙන්නේ කොහොමද කියන එක මෙම වාර්තාවේ ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙනවා. ඒක තමයි හම්බන්තොට වරාය විවෘත කිරීමේ උත්සවය.

ගරු කථානායකතුමනි, එක මොහොතකදී තමන්ගේ දේශපාලන කඳවුර මහත් උත්කර්ෂයට නංවන්න, ඒ වෙනුවෙන් පොත-පත ලියන්න, ඒ වෙනුවෙන් චිත්‍රපට හදන්න, ඒ වෙනුවෙන් මහා ප්‍රාඥ වගන්ති කියන්න, ස්තෝත්‍ර ගායනා කරන්න කණ්ඩායම් හදනවා. එම කණ්ඩායම්වල නඩත්තුව මේ ආයතන හරහාම විවිධ ව්‍යාපෘතිවලින් ලබා දෙන බව පැහැදිලියි. එම සිද්ධාන්තයත් මෙම කොමිෂන් සභා වාර්තාවේ පෙන්නුම් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

වරාය අධිකාරිය, හම්බන්තොට වරායේ උත්සව වියදම් - 2010 වර්ෂයේ 08 වැනි මාසයේ 15, 'කරදියවර මංගල්‍යය' සැරසිලි වියදම රුපියල් මිලියන 49යි; නැතහොත් රුපියල් හාරකෝටි අනූදෙලක්ෂයයි. එම උත්සවයේ සංවිධාන වියදම රුපියල් තුන්කෝටි තිස්හතරලක්ෂයයි. 2010.11.18 වැනි දින එම වරාය විවෘත කිරීමේ උත්සවයේ වියදම රුපියල් හයකෝටි හතළිස්ලක්ෂයයි. එම උත්සවයට යෙදවූ වරාය අධිකාරියේ සේවක වැටුප් බිල රුපියල් දෙකෝටි හතළිස්හත්ලක්ෂයයි. ඒ කියන්නේ වරාය අධිකාරියේ හම්බන්තොට වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ වියදම දාහත්කෝටි දාහතරලක්ෂයයි. මම අහනවා, මේ දාහත්කෝටි දාහතරලක්ෂය ඇදෙන්නේ කොහොමද, කියලා. කවුරු වෙතද, මේවා ලබා දෙන්නේ? මේවා තමන්ගේ ස්තෝත්‍ර ගායනා වෙනුවෙන් පෙනී හිටින කණ්ඩායම් වෙත සල්ලි අදින මාවත බව පෙන්නුම් කරනවා, මේ රාජ්‍ය ධුරාවලියේ. එයත් මෙම බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ පෙන්නුම් කරන එක නිදර්ශනයක්. මේ මහජනයාගේ ධනය තමන්ගේ හිතවතුන් වෙත අයථා පාරවලින් අදින්නේ කොහොමද කියන සංඥාව මේකෙන් ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම වංචා, දූෂණවලට ලක් වූ අය කවරාකාරයෙන්ද දේශපාලන බලය සමඟ යැපෙන්නේ, ආරක්ෂා වෙන්නේ කියන පණිවුඩයත් මෙම බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ කොමිෂන් සභා වාර්තාවෙන් ඉදිරිපත් වී තිබෙනවා.

මෙම වාර්තාවේ සඳහන් වෙන ආකාරයට විශේෂයෙන්ම එවකට අම්පාර දිස්ත්‍රික්කයේ නගරාධිපතිවරයා 'දැයට කිරුළ' කියන ව්‍යාපෘතියේ තාවකාලික වැසිකිළි පද්ධතියෙන් පවා - ලජ්ජයි!- මහජනයාගේ මුදල් හොරකම් කරපු කෙනෙක්. ඔහු එවකට පැවති පාලනයේ ඉතාම සුචච, කීකරු, ශක්තිමත් ගෝලයෙක්. හැබැයි, එම ගෝලයාට අද වෙලා තිබෙන්නේ මොකක්ද?

මෙම බැඳුම්කර කොමිෂන් සභා - සමාවන්න! මෙම බරපතළ අපරාධ විමර්ශනය කිරීම පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිගන්නා ලද ජනාධිපතිවරයාගේ ම මාතර නගරාධිපති අපේක්ෂකයා බවට ඔහු පත් වන්නේ කොහොමද? ඒකෙන් පෙන්වන්නේ මොකක්ද? මෙහි ඉතා හොඳ නිදර්ශන තිබෙනවා. බලය තිබෙන පැත්තට "හෝයියා!" කීමෙන් මේ වංචාවලින් සැඟවෙන්න පුළුවන් කොහොමද කියන සංඥාවත් මෙම කොමිෂන් සභා වාර්තාවෙන් දෙනවා. ඒ වාගේම ඇවන්ට් ගාර්ඩ් මුදල් තමන්ගේ මැතිවරණ ව්‍යාපාරයට පාවිච්චි කිරීම සම්බන්ධයෙන් කෝට්ටේ නගර සභාවේ ජනක රණවක කියන ප්‍රධාන අපේක්ෂකයාගේ ක්‍රියා කලාපය පසු ගිය කාලයේ අපි දැක්කා. හැබැයි, හිටි හැටියේ ඔහු වෙනත් දේශපාලන වෙසක් ගන්නේ ඇයි; වෙනත් කඳවුරුවලට එකතු වන්නේ ඇයි? ඒ, ආරක්ෂාව වෙනුවෙන්. දේශපාලන රැකවරණය සඳහා මෙම කණ්ඩායම් පැති හුවමාරු කිරීමේ නිදර්ශන ද මෙම බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවෙන් පෙන්නුම් කරමින් තිබෙනවා. සමාවන්න! බරපතළ වංචා, දූෂණ විමර්ශනය කිරීම පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන්. කොමිසම කිව්වොත්, බැඳුම්කරය ම තමයි මතක් වෙන්නේ. එහෙම නේද? [බාධා කිරීමක්] ඒ ගැන කියල කියලාමයි එහෙම වෙන්නේ. මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක මේ වාර්තාවෙන් පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මෑත කාලයේ මැතිවරණ ව්‍යාපාරය පටන් ගන්න කොටම සිදු වූ දේ අපි දැක්කා. මධ්‍යම පළාත් සභාවේ සිටින නිමල් ප්‍රේමවංශ කියන මන්ත්‍රීවරයා, ඒ වාගේම හිටපු අමාත්‍යවරයකු වන පියසිරි විජේනායක මහතා හිටි හැටියේ ස්ථාන මාරු වෙනවා; සිටින බල කඳවුරෙන් වෙනත් බල කඳවුරකට යනවා. ඇයි ඒ? කොමිෂන් සභා වාර්තාවේ චෝදනා තිබෙනවා. ඒ නිසා දැන් අපට ඉතා හොඳින් පෙන්නුම් කරන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභා වාර්තාවලින් අපේ රටේ මූල්‍ය අපරාධ පිළිබඳව, අපරාධකරුවන් සැඟවීම පිළිබඳව, අපරාධකරුවන් රාජ්‍ය බලය යොදාගෙන මහජන ධනය තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව, ඒ මහජන ධනය තමන්ට ස්තෝත්‍ර ගායනා කරන පුද්ගලයන්ට අදින ආකාරය පිළිබඳව සහ මහජනයාගේ ධනය හොරකම් කරලා ආරක්ෂා වන ප්‍රමාණය පිළිබඳව යම් සාධනීය පැතිකඩක් පෙන්නුම් කරමින් තිබෙනවා. එය ඉතාම හොඳයි කියා අපි කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, කසුන් පලිසේනලා, අර්ජුන් ඇලෝසියස්ලා කොහෙන් යාවිද දන්නේ නැහැ. මම කියනවා, ඊයේ දිනයේ කසුන් පලිසේන හා අර්ජුන් ඇලෝසියස් බලන්න ගිය අයගේ නාම ලේඛනය පොඩ්ඩක් පරීක්ෂා කරන්න කියා. එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මා වගකීමෙන් කියනවා, එය පෙන්වන්න කියා. [බාධා කිරීමක්] අද පෙන්වන්න. අපි කැමැතියි. එවිට අපට දැන ගන්න පුළුවන්, ඒ අය කවුද කියා.

ගරු කථානායකතුමනි, ඉතිහාසය පුරාවටම අපි දැක තිබෙනවා, දූෂණය වංචාව පිළිබඳව කර වටක් හිර වෙන කොට පැති මාරු කළ ඉතිහාසය; බලය පැත්තට පිනුම් ගහපු ඉතිහාසය. ඒ නිසා ඒ පිළිබඳවත් ඉතාම සාධාරණ පැති කඩක්, -මා කියන්නේ නැහැ මෙහි සමස්තය තිබෙනවා කියා- නිදර්ශන ගණනාවක් මෙම කොමිෂන් සභා වාර්තා හමුවේ අපට පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමාන දේශපාලනයේ මහා සක්‍රිය අය තමන්ගේ අමාත්‍යාංශ මෙහෙයවීමේදී ඥාතීන්ට සලකන ලද ආකාරයන්, -කියන්න ලජ්ජයි!- මහ ඇමතිවරුන් මහජන මුදල් අවභාවිත කරපු ආකාරයන්, තමන්ගේ ඥාතිවරුන් "එයාර් ලංකා" එකට දාලා එහි මුදල් තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් උපයෝගී කර ගන්නා ලද ආකාරයන්, තමන්ගේ පළාතේ ඉඩම්

[ගරු අනුර දිසානායක මහතා]

තමන්ගේ හිතවතුන්ට බෙදා දෙන ලද ආකාරයන් පිළිබඳ කරුණු මෙම ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මෙම බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවෙනුත්, මෙම බරපතළ මූල්‍ය අපරාධ විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවලිනුත් පෙන්නුම් කරන්නේ අපේ රටේ දේශපාලනයේ දූෂ්‍යභාවයේ ඉතාම පැහැදිලි පැති කඩක්. එහි ඉතාම පැහැදිලි පැති කඩක් මෙයින් පෙන්නුම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව පිළිබඳ වාර්තාව භාර දී තිබෙන්නේ 2015 ඔක්තෝබර් මාසයේ 16වන දායි. මහියංගන ප්‍රාදේශීය සභාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව භාර දී තිබෙන්නේ 2016 අප්‍රේල් මාසයේයි. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සම්බන්ධ වාර්තාව ගැන මා කලින් කිව්වා. එය භාර දුන්නේ 2016 අප්‍රේල් 28වන දායි. මේ අප්‍රේල්වලට අවුරුදු 2යි. ඊට පසුව සීමාසහිත රක්නා ලංකා ආරක්ෂක සමාගම පිළිබඳ වාර්තාව භාර දී තිබෙනවා, 2016 සැප්තැම්බර් මාසයේ. දැනට අවුරුදු එකහමාරකට කිට්ටුයි. උතුරුමැද පළාතේ හිටපු මහ ඇමති එස්.එම්. රංජිත් මහත්මයා හා සම්බන්ධ වාර්තාව භාර දී තිබෙන්නේ, 2016 ඔක්තෝබර් 27වන දායි. අවුරුදු එකහමාරකට කිට්ටුයි. එහෙම නම් ඒ සමහර වාර්තා බාර දීලා අවුරුදු එකහමාරකට, දෙකකට වඩා වැඩි කාලයක් ගත වී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 23(2) යටතේ අවස්ථා කීපයකදී මා ඉල්ලා සිටියා, මෙම වාර්තා මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියා. හැබැයි මේ වාර්තා මේ පාර්ලිමේන්තුවේ සභාගත කෙරුණේ නැහැ.

ඊට පසුව මේ වාර්තාවලට සෘජු ලෙස වග කිව යුතු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතට මේ වාර්තා ලබා දුන් නිසා පසුගිය අය වැයේ කාරක සභා අවස්ථා විවාදයේදීත් මම එතුමාට දිගින් දිගටම කියා සිටියා, කරුණාකරලා මේ වාර්තා අපට ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, අඩුම තරමේ ඒකට පිළිතුරක්වත් මේ පාර්ලිමේන්තුවේ ලැබුණේ නැහැ. එතකොට අපට සාධාරණ සැකයක් පැන නඟිනවා, මේ වංචා දූෂණයන්ට එරෙහිව තිබෙන විරෝධය යම් දේශපාලන රංගනයක පැතිකඩක් ද පෙන්නුම් කරන්නේ කියලා. ඒකත් අපි නිරාකරණය කර ගත යුතුව තිබෙනවා. මොකද, ඒ වාර්තාව තමන්ගේ අතේ තියාගෙන ඒ දූෂිතයන් එක්ක ආණ්ඩු හදන්න කථා කරනවා නේ. කොහොමද එහෙම වෙන්නේ? අපි අහන්නේ, ඒක කොහොමද වෙන්නේ කියලායි. ඒ නිසා වාර්තාව එළි දැක්වෙන්නේ තමන් සමඟ එකඟතාවකට ආවේ නැතිවුණාම ද කියන සාධාරණ සැකය අපට පැන නඟිනවා. මොකද, ඒ වාර්තාව අතේ තබාගෙන තමයි එකට ඡන්ද කරන්න සාකච්ඡා කළේ. මේ අවංකව අහන්නේ.

ගරු කථානායකතුමනි, අද දූෂණය පමණක් නොවෙයි, දූෂණයට එරෙහි සටන ද දූෂණය වෙමින් තිබෙනවා. ඒකයි මෙහි තිබෙන භයානකම තත්ත්වය. ඒ නිසා ව්‍යාජ දූෂණ විරෝධී කණ්ඩායම් කරළියට එමින් තිබෙන කාලවකවානුවක් බවට මේ මැතිවරණ කාලවකවානුව පත්වී තිබෙනවා. ගරු කථානායකතුමනි, දූෂණයට එරෙහි සටන කිසිසේත්ම දූෂණය වීමට ඉඩ නොදිය යුතුයි කියන ස්ථාවරයේ ජනතා විමුක්ති පෙරමුණේ අපි ඉන්නවා. ගරු කථානායකතුමනි, මේ දූෂණ වළල්ල, මේ දූෂණ යන්ත්‍රණය හුදු තනි පුද්ගලයෙකුගේ, දෙන්නෙකුගේ තනි හිතුවක්කාර ක්‍රියාමාර්ගයක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේක දූෂිත වළල්ලක්. දැන් මේ වළල්ල දශක ගණනාවක් තිස්සේ අපේ රටේ ස්ථාවරව පවතිනවා. ඒ වළල්ල ඇතුළේ දේශපාලන කණ්ඩායමක් ඉන්නවා. මම කියන්නේ නැහැ සියලු දෙනාම කියලා. හැබැයි, ඒ දේශපාලන කණ්ඩායම සියලු දෙනාටම වැඩියෙන් බලවත් කණ්ඩායම. ඒකයි භයානකකම තියෙන්නේ. මැදවච්චියෙන් එන මන්ත්‍රීවරයා එහි හිටියා කියලා, තණමල්විලෙන් එන මන්ත්‍රීවරයා එහි හිටියා කියලා මොකුත් වෙන්නේ නැහැ. හැබැයි, මේ දූෂිත වළල්ලේ හැමදාම ඉන්නේ කවුද? හැමදාමත් පාලන බලය ජනතාව විසින් මැතිවරණයකදී ලබාදී තිබුණත්, ජනතාව විසින් ලබාදෙන ඒ බලය හැම ආණ්ඩුවකදීම තුන් හතර දෙනෙකු අතර කේන්ද්‍රගත වෙනවා. ඒ තුන් හතර දෙනා මේ දූෂණ වළල්ලේ හරි හරියට අනුන්ගත වෙනවා; ස්ථානගත වෙනවා. ඒ එක කණ්ඩායමක්. ගරු කථානායකතුමනි, ආණ්ඩු මාරුවේදී ඒ දූෂිත වළල්ලේ දේශපාලකයන් කණ්ඩායමක් එළියට එනවා. එක්කෙනෙක්, දෙන්නෙක් ඉතුරුත් වෙනවා සහ තව දූෂිත කණ්ඩායමක් ඒකට ඇතුළු වෙනවා. ආණ්ඩු මාරු වෙලා කෙටි වේලාවකදී ඒ දූෂිත වළල්ලේ දේශපාලන කොටස ස්ථාවර වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ දූෂිත වළල්ලට රාජ්‍ය යන්ත්‍රණයේ ඉහළ කණ්ඩායමක් ඉන්නවා. පරිපාලන සේවයේ සිටින්නේ 2,400ක් වුණාට, ඒ 2,400ම නොවෙයි, ඉතා කුඩා කණ්ඩායමක් මේ දූෂිත වළල්ලේ ඉන්නවා. ඒ ගොල්ලන් තමයි මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වෙන්නේ; ඒ ගොල්ලන් තමයි ජනාධිපති ලේකම් වෙන්නේ; ඒ ගොල්ලන් තමයි TRC එකේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බවට පත් වෙන්නේ. ඒ කියන්නේ මොකක්ද? ඒ ගොල්ලන් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙන්නේ නැහැ; කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙන්නේ නැහැ. ඒවා අදාළ වෙන්නේ නැහැ. ඒ අය ඉතා බලගතු තැන්වල ස්ථානගත වෙනවා. ඒ විධියට දේශපාලන ස්ථානගතවීමත් එක්කම නිලධාරි යන්ත්‍රණයත් ස්ථානගත වෙනවා.

ගරු කථානායකතුමනි, මේකට පොලීසිය ඇතුළු ආරක්ෂක වළල්ලක් තිබෙනවා. 84,000ක් වන සමස්ත පොලීසිය නොවෙයි. ඒ ගොල්ලන් ගමේ පොඩි පොඩි දේවල් කරනවා. ඒවා ගණන් ගන්නවත් එපා. එහෙම නොවෙයි. හැබැයි, මේ 84,000ක් සේවයේ නියුතු පොලීසියේ ඉතා වග කිව යුතු කණ්ඩායම් මෙහි හරියට ස්ථානගත වෙනවා. ඒ නිසා තමයි හිටපු පොලිස්පති බාලසූරිය වෙලේ සුදාගෙන් ගෙවල් සහ ඉඩම් කප්පම් වශයෙන් අරගෙන තිබෙන්නේ. මම වගකීමෙන් කියන්නේ. එහෙම නැත්නම් සිටින පොලිස්පති පූජිත ජයසුන්දර මහත්මයාට ප්‍රකාශ කරන්න කියන්න, හිටපු පොලිස්පති බාලසූරිය වෙලේ සුදාගෙන් කැලණියෙන් ගෙවල් සහ ඉඩම් ගත්තේ නැහැ කියලා. ගත්තා. ඒ පොලිස්පතිවරයා කටුනායක වෙඩි තැබීමේ සිද්ධියට පසුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති හැටියට යැවුවා. ජනාධිපතිවරණය එනකොට වහාම ඉලංගකෝන් පොලිස්පතිතුමාට වඩා උඩින් අමාත්‍යාංශයේ ලේකම් කරලා තිබ්බා. ඒ විධියට පොලීසියේ ඉතා කුඩා කොටසක් මේ දූෂිත වළල්ලේ සිටිනවා.

ඊළඟට, හමුදා යන්ත්‍රණයෙත් කුඩා කණ්ඩායමක් සිටිනවා. ලක්ෂ තුනකට අධික හමුදාවේ 50, 60ක කණ්ඩායමක් මෙහි සිටිනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම ව්‍යාපාරික වළල්ලක් ඉන්නවා. ඔවුන් අපේ රටේ කර්මාන්තකරුවන්, අපේ රටේ නිෂ්පාදන වර්ධනය කරන්නන් නොවෙයි. ව්‍යාපාරික වළල්ලක් ඉන්නවා; සුදු කරපටි මංකොල්ල කාරයන් ටිකක් ඉන්නවා. ඒ ගොල්ලන් නිකම් dealersලා. හවසට ලොකු ලොකු හෝටල්වලට ගියාම ඒ අය බලා ගන්න පුළුවන්. ඒ කණ්ඩායම එක එක ඇමතිවරයා වටේ කැරකි කැරකි ඉන්නවා, අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. මේ dealersලාට මොකද වෙන්නේ? මේ අය ව්‍යාපාරිකයන් නොවෙයි. මේ අය ඇවිල්ලා රටේ නිෂ්පාදනය වැඩි කරන, රටේ ආර්ථිකයට මහා දායකත්වයක් සපයන අය නොවෙයි. මහජනයාගේ ධනය එහේට මෙහේට ගනුදෙනු කිරීම හරහා -බ්‍රෝකර් වැඩේ කිරීම හරහා- එක්රැස් කර ගන්නා ව්‍යාපාරික පැළැන්තියක් ඉන්නවා. ඉතා කුඩා කණ්ඩායමක්. ඒ කණ්ඩායමත් මේ වළල්ලේ ඉන්නවා.

ඊට අමතරව, මේ වළල්ලේ පරීක්ෂණ නිලධාරින් ඉන්නවා; අධිකරණ නිලධාරින් ඉන්නවා. ඒ නිසා මේ දූෂිත වළල්ල ශක්තිමත්. ගරු කථානායකතුමනි, ආණ්ඩු පරිවර්තනයකදී මොකක්ද වෙන්නේ? ආණ්ඩු පරිවර්තනයකදී කෙටි කාලයකට මේ දූෂිත වළල්ල බොඳ වෙනවා; අපහැදිලි වෙනවා; එහෙට මෙහෙට චලනය වනවා. හැබැයි, මාස හත අටක් යන විට නැවත ඒ දූෂිත වළල්ල ස්ථානගත වෙනවා. ඒ දේශපාලකයන් වෙනුවට අලුත් දේශපාලකයන් එතැන ස්ථානගත වෙනවා. හිටපු අයගෙනුත් දෙන්නෙක්, තුන්දෙනෙක් එතැන ඉතිරි වෙනවා. හිටපු පොලිස් නිලධාරින් වෙනුවට අලුතින් පොලිස් නිලධාරින් දෙන්නෙක්, තුන්දෙනෙක් එතැනට ඇතුළු වෙනවා. පරණ දෙන්නෙක්, තුන් දෙනෙකුත් එතැන ඉතිරි වෙනවා. හමුදාවේත්, රාජ්‍ය යාන්ත්‍රණයේත්, ව්‍යාපාරික යාන්ත්‍රණයේත් එහෙමයි. අද තමුන්නාන්සේලා හොයලා බලන්න, තමුන්නාන්සේලාගේ ව්‍යාපෘති පිටුපස ඉන්න dealersලා කවුද කියලා. ඒ තැන්වල ඉන්නේ පැරණි අයමයි. ඒ ගොල්ලනුත් හරියටම ස්ථානගත වෙනවා.

ගරු කථානායකතුමනි, මට කියන්න අමතක වුණා. මේ වළල්ලේ මාධ්‍යවේදියෝත්, මාධ්‍ය හිමිකරුවෝත් ඉන්නවා. අවශ්‍ය නම් මම ඒ ගැන සංඛ්‍යා දත්තත් එක්කම, ඒ නම් එක්කම කවදා හරි කියන්නම්. තමුන්නාන්සේලාට අවශ්‍ය නම් කියන්නම්. ඒ අතර මාධ්‍ය හිමිකරුවන් ඉන්නවා. ඒ අයත් ඒ මොහොතේ ඒ වළල්ලේ ස්ථානගත වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, අපේ රටේ මහජනයාගේ ධනය කෝටි-ප්‍රකෝටි ගණනක් හොරකම් කරන නාස්ති කරන, අවභාවිත කරන දූෂිත වළල්ලක් තිබෙනවා. අපි මේ දූෂිත වළල්ල පරාජයට පත් කරන්න ඕනෑ. මේ දූෂිත වළල්ල පරාජයට පත් කිරීම හුදු පුද්ගලයෙකුගේ "ගනු කඩුව-එනු සටනට" කියනවා වාගේ සටනක් නොවෙයි. මේ දූෂිත වළල්ල එහෙම පරාජයට පත් කරන්න බැහැ. ඒක ව්‍යාජයක්. මේ දූෂිත වළල්ල පරාජය කළ හැකි වන්නේ, ඒ දූෂිත වළල්ලට එරෙහිව ප්‍රබල මහජන ව්‍යාපාරයක් ගොඩනැඟීමෙන් පමණයි. එසේ නැතිව මේ දූෂිත වළල්ල පරාජයට පත් කරන්න බැහැ. හැම දාම සිද්ධවෙන දේ තමයි, මේ දූෂිත වළල්ල ඒ ආකාරයෙන්ම ස්ථාපිත වෙලා නව දූෂිතයන්ගෙන් පිරෙන එක. ඒකයි සිද්ධ වෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙහි තිබෙන ඛේදවාචකය මොකක්ද? මෙහි ඛේදවාචකය ගැන අපේ ඈත ගම්වලට ගිහිල්ලා බලන්න. ඒ දරුවන්ට ඉගෙන ගන්න පාසලක් නැහැ; ඒ දරුවන්ට අධ්‍යාපනයක් නැහැ; හරිහමන් ආහාර වේලක් නැහැ; ගමේ පාරේ යන්න විධියක් නැහැ; ගැබිණි මවට පෝෂ්‍යදායී ආහාර වේලක් නැහැ. මුළුමනින්ම ඒ අයගේ සමාජ ජීවිතය කඩා වට්ටලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, මේ දූෂිත වළල්ල මහා අපරාධවලට හවුල් වී තිබෙනවා.

සමාජ අපරාධ පිටුපස දේශපාලකයන් ඉන්නවා යැයි විපක්ෂයේ මන්ත්‍රීවරු කියන කොට, සමෘද්ධි අමාත්‍යවරයා, එස්.බී. දිසානායක අමාත්‍යවරයා නුවරඑළියේදී කියනවා මම පළමුවතාවට දැක්කා, "ඇමති මණ්ඩලයේ අමාත්‍යවරයෙක් තමයි නුවරඑළියට කුඩු ගෙනෙන්නේ" කියලා. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? "අද නුවරඑළියේ ඡන්දවලට විසි කරන්නේ කුඩු සල්ලි" කියලා දැන් රජයේ අමාත්‍යවරයෙකුටම කියන්න සිදු වී තිබෙනවා නම්, කවුරු ගැනද මේ කිව්වේ? මේ කිව්වේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අමාත්‍යවරයා ගැනයි. පසුව දා රාධක්‍රිෂ්ණන් අමාත්‍යවරයා කිව්වා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කුඩු ගෙනෙන්නේ නැහැ" කියලා. ඒකෙන් තමයි අපි දැන ගත්තේ 'මැන්'

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා. ඉතින් මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරයෙක් තව අමාත්‍යවරයෙකුට කියනවා, "ඔහු කුඩු ව්‍යාපාරිකයෙක්. නුවරඑළිය මුළු වතුකරයම කුඩුවලින් ගිල ගත්තා" කියලා. හැබැයි, තමුන්නාන්සේලා ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර මොකක්ද? ඒ අමාත්‍යවරයා කොතැනද ඒ ගැන පැමිණිල්ලක් දාලා තිබෙන්නේ? පරීක්ෂණයක් සඳහා කොතැනටද යොමු කරලා තිබෙන්නේ? එහෙම වෙන්නේ නැහැ. ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එතුමාගේ වේදිකාවේ සිටියා නම් ඔහු එතුමාගේ අතිජාත මිත්‍රයෙක්. අද එතුමාගේ වේදිකාවේ නැති නිසා ඔහු 'කුඩු' ඇමතිවරයෙක්. මේක තමයි සිද්ධ වී තිබෙන්නේ? ගරු කථානායකතුමනි, අපරාධවලට අනුබල දෙන, සමාජ අපරාධ ආරක්ෂා කරන, සමාජ අපරාධවල නියැලෙන දේශපාලන සංස්කෘතියක් තිබෙනවා. මේ දේශපාලන සංස්කෘතිය තමයි අපේ රට විනාශකාරී ගමනකට ඇදගෙන යමින් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ මේකයි. පැවති දශක ගණනාවක කාල පරිච්ඡේදය තුළ මහා විනාශකාරී ලෙස කොල්ලකරුවන්ගේ, රැවටිලිකාරී දේශපාලකයන්ගේ ග්‍රහණයට අපේ රට හසු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, අපේ රටේ ජනතාව පව්! ගරු කථානායකතුමනි, දශක ගණනාවක් අපේ රටේ ජනතාව මේ අපරාධකරුවන්ගේ කොල්ලකරුවන්ගේ, රැවටිලිකාරයන්ගේ ග්‍රහණයට හසු වී තිබෙනවා. මේ රටේ ජනතාව කවදාද ඒ අපරාධකරුවන්ගේ, මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මිදෙන්නේ? ඒ නිසා ජනතාවට සුවිශේෂී වගකීමක් තිබෙනවා, මේ අපරාධකරුවන්ගේ, කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘභූමිය මුදවා ගන්න. නැවක් සෝමාලියාවේ මුහුදු මංකොල්ලකරුවන්ට අහුවුණා වාගේ, ශ්‍රී ලංකාව කියන දූපත හැත්තෑ වසරක් මේ මංකොල්ලකරුවන්ගේ, පාදඩයන්ගේ ග්‍රහණයට හසු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම මංකොල්ලකරුවන්ගෙන් ශ්‍රී ලාංකික දූපත මුදා නොගන්නා තාක්කල් අපට ඇසෙයි, ඈත ගමක කන්න දෙයක් නැතිව කෝවක්කා ගෙඩි කාලා මැරෙන දරුවන් ගැන; ණය ගෙවා ගන්න බැරිව වහ බීලා මැරෙන ගොවියෝ ගැන; මාතර ගඟට ගිහිල්ලා කිඹුලා කාපන් කියලා දරුවෝ විසි කරන අම්මලා ගැන. ගරු කථානායකතුමනි, මෙම ඛේදවාචකය අවසන් කිරීම සඳහා වන මහඟු වගකීමක් අපට තිබෙනවා.

ඒ වගකීම ඉටු කිරීමේදී මේ රටේ පුරවැසියන්ට, සමාජ සංවිධානවලට, මාධ්‍යයට, මේ රටේ දේශපාලන ව්‍යාපාරවලට විශාල කාර්යභාරයක් තිබෙන බව අප විශ්වාස කරනවා. මේ

[ගරු අනුර දිසානායක මහතා]

තත්ත්වය කොතැනකින් හෝ අවසන් කළ යුතුව තිබෙනවා. තවදුරටත් මෙවැනි ඛේදවාචකවලට අපේ රටත්, අපේ රටේ ජනතාවත් ගොදුරු වීමට කිසිසේත්ම ඉඩ ලබා නොදිය යුතුයි. ඒ නිසා ගරු කථානායකතුමනි, දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි අපේ මුළු ව්‍යායාමයම, මුළු බර යොදවමින් තිබෙනවා මේ අපරාධකරුවන්ගේ, මේ කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘ භූමියත්, මේ මාතෘ භූමියේ වෙසෙන ජනතාවත් මුදා ගැනීමට. ඒ සඳහා අපි සාර්ථක පියවරක් අරගෙන තිබෙනවා. සාර්ථක පියවරක්!

ගරු කථානායකතුමනි, අවුරුදු තුනකට පසුව හෝ මේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ කරුණු හෙළිදරව් වී තිබෙනවා. සාමාන්‍යයෙන් සිදු වන දේ තමයි අවුරුදු තුනක් යනකොට කාලයේ වැලි තලාවෙන් මේ කරුණු යට යන එක. හැම දාමත් මෙවැනි අපරාධවලට සිද්ධ වුණේ ඒක තමයි. හැබැයි, මේ බැඳුම්කර ගනුදෙනුවට අවුරුදු තුනක් ගිහිල්ලාත් කාලයේ වැලි තලාවට යට වෙන්න ඉඩ නොදුන්නේ ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි ඒ සඳහා විශාල කාර්ය භාරයක් කළ නිසායි. අපට ඒ ගැන ආඩම්බරයක් සහ සතුටක් තිබෙනවා. අපි විතරක් නොවෙයි, තවත් දේශපාලන පක්ෂ, සමාජ සංවිධාන සහ මාධ්‍ය ව්‍යාපාරත් කාලයේ වැලි තලාවෙන් මෙය යට යන්න ඉඩ නොදී ඉදිරියට ගෙන ඒම සඳහා විශාල ප්‍රයත්නයක් දැරුවා. අපි ඒ හැම දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ, මෙවැනි විවාදයකින් අවසන් වීමෙන් තොරව, මේ කොල්ලකරුවන්ගේ, මේ අපරාධකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘ භූමිය මුදා ගැනීම දක්වා මේ අරගළය, මේ සටන ඉදිරියට දියත් කරමු කියන එකයි. ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න, දායකත්වය සපයන්න කියලා සියලුදෙනාගෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

[පූ.භා. 11.38]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ගැන සහ බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනයකොට කරුණු විමසා බැලීමට පත් කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවල වාර්තා පිළිබඳව වන විවාදයේදී මගේ අදහස් දක්වන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අද පවත්වන මේ විවාදයටත් වඩා වැදගත් වන්නේ, වැරදි කරපු අයට දඬුවම් දෙන එකයි. ඒ වැරදිකරුවන්ට එරෙහිව අධිකරණ ක්‍රියා මාර්ග ශීඝ්‍ර කරලා, අධිකරණ ක්‍රියා මාර්ග ගන්න එක තමයි රටේ පුරවැසියා ඇත්තටම බලාපොරොත්තු වන්නේ. මේ සමහර කරුණු අපි සැහෙන කලක සිට මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරලා තිබෙනවා.

පසුගිය මැතිවරණය අවස්ථාවේදී අපි පොරොන්දු වුණා, විපක්ෂයේ පුද්ගලයෙක් "කෝප්" කමිටුවේ සභාපති කරනවා කියලා. අගමැතිතුමා ඒ දුන්න පොරොන්දුව පාර්ලිමේන්තුව පිහිටෙව්වාට පස්සේ ඉෂ්ට කළා. විශේෂයෙන්ම මේ බැඳුම්කර පිළිබඳ "කෝප්" වාර්තාව නිකුත් වුණාට පස්සේ, 2016 ජනවාරි 01වැනි දා අගමැතිතුමාගේ මහ පෙන්වීම අනුව සභානායකතුමාගේ ලේකම් ඒ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්යාලයෙන් ඒ වාර්තාව යැව්වේ ජනවාරි මාසයේ 26වැනි දා. නීතිපති ජයන්ත ජයසූරිය අත්සන් කරපු, නීතිපති නිල මැදිරියෙන් ලැබුණු ඒ ලිපිය මා ළඟ තිබෙනවා. එම ලිපිය මම **සභාගත*** කරන්න කැමැතියි.

ඒ "කෝප්" වාර්තාව ගැන අපි වහාම ක්‍රියා කළා. අපි කිව්වේ, මේ සම්බන්ධයෙන් ඉක්මනට ක්‍රියා කරන්න කියලායි. නමුත්, ඇත්තටම ඒ ක්‍රියාව සිද්ධ වුණේ නැහැ. ඒක තමයි තිබුණු ගැටලුව. එතකොට, ජනාධිපතිතුමා මේ ගැන ජනාධිපති කොමිසමක් පත් කළා. ඒ ජනාධිපති කොමිසම පත් කළා, 2017 ජනවාරි මාසයේ. ඒ වාර්තාව 2018 ජනවාරි 03වැනි දා තමයි අපට ලැබුණේ. ඒ කොමිෂන් සභාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් දෙදෙනෙක් හිටියා. හිටපු විගණකාධිපතිවරයෙකුත් හිටියා. ඒ නිසා ඒ වාර්තාව ගැන දැඩි විශ්වාසයක් තිබෙනවා කියලා අපි හිතනවා, ඒ පත් කරලා තිබෙන සාමාජිකයන් දිහා බැලුවාම. ඒ වාර්තාවත්අපි එළියට දැම්මා. එම වාර්තාව ගැන සාකච්ඡා වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, හොරු හැම තැනම ඉන්නවා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ "වංචාව" කියන එක අපේ සංස්කෘතියේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. "හොරු" කියන අය හැම තැනම ඉන්නවා. පක්ෂවලත් ඉන්නවා. ඒක ජනතා විමුක්ති පෙරමුණේ අයත් දන්නවා. කලින් කලට ඒවා එළි දැක්වීමයි සිදු වන්නේ. ගරු කථානායකතුමනි, නමුත් දැන් තිබෙන වෙනස මේකයි. පසුගිය කාලයේ වාගේ නොවෙයි. ජනාධිපති කොමිසමක් පත් කළාම ඒ කොමිසමේ වාර්තා අපි සභාගත කරනවා විතරක් නොවෙයි, ඒ වාර්තා අපි මුළු රටටම එළි දක්වනවා. මේ රටේ පුරවැසියන්ට අයිතිය තිබෙනවා, ඒ කොමිෂන් සභා වාර්තාවලින් ඇත්තටම කියා තිබෙන්නේ මොනවාද කියා බලන්න. ගරු කථානායකතුමනි, වෙනස මේකයි.

පසුගිය කාලයේ මේ වාර්තා ඉදිරිපත් වුණාම, චෝදනාවක් තිබෙනකොට කිසිවක් සිදු වුණේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ වාර්තාවල විස්තරවත් ලබා ගන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න මා කැමැතියි. පසුගිය වසර දහය තුළ -2010 වසරේ ඉඳලා- ජනාධිපති කොමිෂන් සභා තිබුණා. අතිගරු ජනාධිපතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, ඒ වාර්තා සියල්ල සභාගත කරලා, ඒ වාර්තා සියල්ල මහජනයාට දෙන්න කියලා. මම මේ ගැන හොයා බලනකොට මට ආරංචි වුණා, ජනාධිපති නිල කාර්යාලයේවත් මේ සමහර වාර්තා නැහැ කියලා. මම කියන්නේ, ඒ ගැනත් අපි හොයා බලන්න ඕනෑ කියලායි. හොයා බලා ඒ වාර්තා සියල්ලම මේ රටේ පුරවැසියන්ගේ දැන ගැනීම සඳහා සභාගත කරන්න ඕනෑ. මේවා වහන්න බැහැ. මේක තමයි ඇත්තටම වෙලා තිබෙන වෙනස.

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බැඳුම්කර සිද්ධිය ගැන පොලිසියේ අපරාධ අංශය B report එකක් ඉදිරිපත් කරලා, දැනටමත් සමහර පුද්ගලයන් අත් අඩංගුවට ගෙන තිබෙනවා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, මේක ප්‍රමාද කරලා, මේක යට ගහන්න වැයමක් තිබෙනවාය කියලා. ඒ, පසුගිය කාලයේදී. මේ රටේ ඉතිහාසය අනුවයි එතුමා කථා කරන්නේ. නමුත් අපට ඊට වඩා බලාපොරොත්තුවක් තිබෙනවා. එම වාර්තාවේම සඳහන් කර තිබෙනවා, 2015 වසරේ ඉඳලා විතරක් නොවෙයි, 2008 වසරේ ඉඳලාම බැඳුම්කරය

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

පිළිබඳව තිබෙන මේ දූෂිත වළල්ල ගැන සොයා බලන්න ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, 2008 වසර තෝරා ගත්තේ ඇයි කියලා මා දන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා කොමිසමක් පත් කරනවා නම්, 1990 වසරටම ගිහිල්ලා මේ ගැන සොයා බලන්න කියලා මා යෝජනා කරනවා. මොකද, මේ ක්‍රියාවලිය දිගින් දිගටම සිදු වෙලා තිබෙනවා. මේවා ගැන දිගටම චෝදනා තිබෙනවා. මහ බැංකුවේ හිටපු ජොෂ්ඨයිනුත් මේවාට සම්බන්ධයි. ඒ නිසා 1990 වසරටම ගිහිල්ලා මේවා ගැන සොයා බලන්න අවශ්‍යයි, ගරු කථානායකතුමනි. දැනට අපි දඬුවම් දෙන්නට ඕනෑ. නමුත් මේ ක්‍රමවේදය ගැන කථා කරනකොට පසුගිය ආණ්ඩුව කාලයේ දී -අවුරුදු දහය තුළ දී- කිසිම ඇමති කෙනෙකුගෙන්, මන්ත්‍රී කෙනෙකුගෙන් ප්‍රශ්න කළාද කියලා මම අහන්න කැමැතියි. සොයා බැලීමක් කළාද? ප්‍රශ්න කළාද? කවුරුවත් අත් අඩංගුවටවත් ගත්තාද? කිසිවකු රිමාන්ඩ් බන්ධනාගාරගත කළාද? ඒ කිසිවක් සිදු වුණේ නැහැ.

අපේ ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරු තිදෙනෙක් චෝදනා තිබූ පමණින්ම අයින් වෙලා තිබෙනවා. විමසුම් අවසන් වෙනකල් අයින් වෙලා තිබෙනවා. මට ඉස්සර වෙලා කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පාර්ලිමේන්තුව අධිකරණයක් නොවෙයි. අපට කවුරුවත් වරදකරුවෙක් විධියට නම් කරන්න බැහැ. ඒක අධිකරණයට අයිති කාරණාවක්. නමුත් අපි ඇති කරලා තිබෙන වෙනස, අපි ඇති කරලා තිබෙන සංස්කෘතිකමය වෙනස බලන්න. අපේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුනුත් අඩියක් පස්සට අරගෙන තිබෙනවා. ඒකයි තිබෙන විශාල වෙනස. ගරු කථානායකතුමනි, එදා අධිකරණයට ඉඩ දුන්නේ නැහැ. මේ රටේ ජනාධිපතිතුමා අධිකරණයට ගියා. ගිහිල්ලා අධිකරණයෙන් උපදෙස් ගත්තා, තමන්ට බලයේ සිටින්න පුළුවන්කම තිබෙන්නේ අවුරුදු පහක්ද, හයක්ද කියලා. අධිකරණය ඒකමතිකව කිව්වා, අවුරුදු පහයි කියලා.

පසුගිය ආණ්ඩුව කාලයේදී හිටපු ජනාධිපතිතුමා ඔය වාගේ ප්‍රශ්නයක් ඇහුවා නම් කොයි වාගේ තීරණයක්ද දෙන්නේ කියලා අපට හිතා ගන්න පුළුවන්. එදා ජනාධිපති යකඩ සපත්තුවට අධිකරණය යට කරලායි තිබුණේ. අපට අද වාගේ මතකයි, එදා ශිරාණි බණ්ඩාරනායක මැතිනිය පාර්ලිමේන්තුවට කැඳවූ සිද්ධිය. එතුමියව පාර්ලිමේන්තුවේ කාරක සභා කාමරයකට කැඳවා, මන්ත්‍රීවරුන් එතුමියගෙන් ප්‍රශ්න කළා.

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමිය පශ්චාත් උපාධියක් තිබෙන කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක්. එතුමිය පසුව තමයි විනිසුරු මණ්ඩලයට ආවේ. ඊට පස්සේ තමයි, එතුමිය මේ රටේ අග විනිසුරුවරිය වුණේ. මේ ප්‍රශ්න කරන අපටවත් එතුමියගෙන් ප්‍රශ්න කිරීම ගැන දැනුමක් තිබුණාද කියලායි එතුමා ඇහුවේ. ඒ විතරක් නොවෙයි. එතුමියට නින්දා අපහාස කරලා එතුමියව නෙරපා දැම්මා. පාර්ලිමේන්තුව අධිකරණයක් හැටියට සලකා එතුමියව නෙරපා දැම්මා. එදා ඒ යකඩ සපත්තුවට තමයි අධිකරණය යටපත් කළේ. ඒ විතරක් නොවෙයි. එදා මොනවාද කළේ? පාර්ලිමේන්තුවත් ඒ යකඩ සපත්තුවට යට කරන්න වෑයම් කළා.

ගරු කථානායකතුමනි, එදා අපි පාර්ලිමේන්තුවට එනකොට අපේ මේස උඩ පොත් රාශියක්ම තිබුණු බව ඔබතුමාටත් මතක ඇති. අපි බැලුවා, ඒ මොනවාද කියලා. එහි තිබුණා, රටේ ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕනෑය කියලා; ජනාධිපතිතුමාගේ ධුර කාල දෙක අහෝසි කරන්න ඕනෑය කියලා. අපි කිව්වා, "මේක ව්‍යවස්ථාව වෙනස් කිරීමක්. ඒ නිසා මේ ගැන වාද විවාද කරන්න කල් දෙන්න" කියලා. ගරු කථානායකතුමනි, අපට වෙලාව දුන්නේ නැහැ. අපට කිව්වා, "තව පැය හයකින් ඡන්දය ගන්නවා. ඡන්දය දෙනවා නම් දෙන්න, නොදෙනවා නම් නොදෙන්න" කියලා. අද අපි සාකච්ඡා කරන්නේත් ව්‍යවස්ථාව වෙනස් කිරීමක් ගැනයි. වසර දෙකකට පාර්ලිමේන්තුවේ කමිටු පත් කරලා ඒ සාකච්ඡාව වසර දෙකක් දක්වා යනවා. ඒ සාකච්ඡාව යනකොට අපට කියනවා, "මෙන්න බලන්න, රට විකුණන්න හදනවා, රට බෙදන්න හදනවා නොයෙකුත් දේ කරන්න හදනවා" කියලා. මේ අය මේවා කියන්නේ දේශ ප්‍රේමීත්වයක් මවාගෙනයි. නමුත්, අපි ඒක කරන්නේ සද්භාවයෙන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා නම්, රට තුළ සාකච්ඡාවක් තිබෙන්න ඕනෑ. එපමණක් නොවෙයි. කවදාවත් සිදු නොවන දෙයක් තිබෙනවා. ඒක පාර්ලිමේන්තුව අනුමත කළත්, ජනතාවටත් අවස්ථාව දෙන්න ඕනෑ. ඒ සඳහා ජන මත විචාරණයක් තබන්න ඕනෑය කියන ස්ථාවරයේ තමයි මුල සිටම අප සිටින්නේ. අපි මේක හංගලා කරන ක්‍රියාවලියක් නොවෙයි. මේක රටේ ශුභ සිද්ධිය සඳහා කරන ක්‍රියාවලියක්. නමුත්, එදා අපට අවස්ථාව දුන්නේ නැහැ. එදා අපට කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැය හයකින් වෙනස් කරන්න ඕනෑය කියලා. ගරු කථානායකතුමනි, ඒවා මේ රටේ ඉතිහාසයේ තිබෙන කළු පැල්ලම්. ඒ වාගේ දේවල් කවදාවත් සිදු වෙන්න ඉඩ දෙන්න බැහැ. ගරු කථානායකතුමනි, එදා තිබුණේ එවැනි පාලනයක්. නමුත්, අද හැම එකක්ම විවෘතව තිබෙනවා. සමහර අයට සැකයක් තිබෙනවා, ඇත්තටම සාධාරණයක් වෙයිද, නැද්ද කියලා. නමුත්, සාධාරණයක් කිරීමට තමයි අපි කටයුතු කර ගෙන යන්නේ.

ගරු කථානායකතුමනි, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව අපට දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභාවේ සාමාජිකයන් කවුද? මේ කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු වන්නේ වැවගේ ප්‍රියසාද් ජෙරාඩ් ඩෙප් මහතා. එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙක්. අද මේ රටේ අග විනිසුරු එතුමායි. එතුමාට විරුද්ධව කවුරුත් වචනයක්වත් කියලා නැහැ. ඒ කියන්නේ එතුමා සුපිරිසිදු පුද්ගලයෙක්. මේ කොමිෂන් සභාවේ ඉන්නවා, අනිල් ගුණරත්න මහතා. ඒත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙක්. ඒ වාගේම මේ කොමිෂන් සභාවේ ඉන්නවා, කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් කුලතුංග මහතා. එතුමාත් උසස් අධිකරණයේ විනිසුරුවරයෙක්. ඊට අමතරව සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මහතා ඉන්නවා. එතුමා විශ්‍රාමලත් විගණකාධිපතිවරයෙක්. මේ අය හැමෝගේම ප්‍රසාදයට ලක් වූ පුද්ගලයන්. ඒ වාගේම අයියතුරෙයි ඥානදාසන් කියන විශ්‍රාමලත් අතිරේක සොලිසිටර් ජනරාල්තුමාත් මේ කොමිෂන් සභාවේ ඉන්නවා. මේ පුද්ගලයන් මේ රටේ හැමෝම දන්නා; හැමෝම පිළිගන්නා පුද්ගලයන්. ජනාධිපතිතුමා විසින් මේ අය තමයි මේ කොමිෂන් සභාවට පත් කළේ. ඔවුන් දැන් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වාර්තාවේ තිබෙන කරුණු බොහොමයි. අගමැතිතුමා සඳහන් කළ ආකාරයට මේ වාර්තාව තුළ මන්ත්‍රීවරු 34දෙනෙක් සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබෙනවා. නමුත්, අපි සඳහන් කළ යුතු කරුණු කීපයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම මැතිවරණවලට එනකොට රාජ්‍ය සම්පත් භාවිතය ගැන අපි සඳහන් කළා. මේ රාජ්‍ය සම්පත් භාවිතය විශාල ලෙස සිදු වුණා. මේක අපි නතර කරන්නට ඕනෑ. මේකට දඬුවම් දෙන්නට ඕනෑ. මේ කොමිෂන් සභා වාර්තාවේම සඳහන් කරනවා, අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රවර්ධන ප්‍රචාරක දැන්වීම් මීඩියා ෆැක්ට්‍රි ආයතනය මඟින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ආයතනය වෙත යොමු කර නොමිලේ විකාශනය කිරීම තුළින් රුපියල් කෝටි 10ක්, නැත්නම් රුපියල් මිලියන 101ක් අවභාවිත වෙලා තිබෙනවා කියලා.

ඊට පස්සේ, 2015 ජනාධිපතිවරණයේදී එතුමායි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි ජනාධිපති ධුරයට තරග වදින විට

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

සමාන අපේක්ෂකයන් දෙදෙනෙකුගෙන් එක් අයෙකුට අසමාන ලෙස සැලකීමට බඳුන් කර වැඩිපුර මුදලක් ස්වාධීන රූපවාහිනී පාලන අධිකාරිය මඟින් ලබා ගැනීමට කටයුතු කිරීම සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට සිදු වී ඇති රුපියල් කෝටි 11ක, -එහෙම නැත්නම් රුපියල් මිලියන 112ක - මූල්‍යමය පාඩුවක් ගැන අනාවරණය වෙලා තිබෙන බව කියනවා. ගරු කථානායකතුමනි, මේ කොමිෂන් සභාවේ සාමාජික හිටපු විගණකාධිපතිවරයා සඳහන් කරලා තිබෙනවා මේවා සම්බන්ධයෙන් අපරාධ නඩු දාන්නට ඕනෑ කියලා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙහි SriLankan Airlines එකේ SriLankan Catering Limited එක ගැන බලය හා අධිකාරිය අයුතු ලෙස පාවිච්චි කිරීම ගැන සඳහන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, SriLankan Airlines එකේ හිටපු සභාපතිතුමාත් හිටපු ජනාධිපතිතුමාගේ නෑදෑයෙක්. මේ රට ඉදිරියට ගන්න නම් අපි මේ පවුල් සම්ප්‍රදායෙන් අයින් වෙන්නට ඕනෑ. මේ රටේ හුඟක් උගතුන් සිටිනවා, වෘත්තීයවේදීන් ඉන්නවා, අපි මේ අයට තැනක් දෙන්නට ඕනෑ; මේ අය ඉදිරියට ගේන්නට ඕනෑ. පාර්ලිමේන්තුව, පළාත් පාලන ආයතන, නගර සභා ඇතුළු සෑම තැනකදීම උගතුන්ට, වෘත්තීයවේදීන්ට ඉදිරියට එන්නට අවස්ථාවක් දෙන්නට ඕනෑ; පවුල් වාදයෙන් අයින් වන්නට ඕනෑ. අපි හුඟක් වෙලාවට ඥාති සංග්‍රහය නිසා වැදගත් තැන්වලට නෑදෑයන්ව පත් කරනවා. ඒකෙන් රටට වන පාඩුව කියලා නිම කරන්නට බැහැ. ඒ පත් කරන්නේ සුදුසු අයත් නොවෙයි. පවුලේ අය වුණත් කමක් නැහැ සුදුසු කෙනෙක් පත් කරනවා නම්. සුදුසු අය නම් ක්‍රමවේදය අනුවවත් පත් කරන්නට පුළුවන්. නමුත් පවුලේ අය පත් කිරීම කොහොමත් නුසුදුසුයි. සුදුසු කෙනෙක් පත් කළත් ක්‍රමවේදය අනුව පත් කළ යුතුයි. කිසිම සුදුසුකමක් නැති අය පත් කළාම රටට වන අවාසිය ගැන හිතලා බලන්න. මෙහිදී ඒ අය වරප්‍රසාද ගත්තා විතරක් නොවෙයි. ඒවා සම්බන්ධව මේ කොමිෂන් සභා වාර්තාවේ පිටු සිය ගණන් තිබෙනවා, ඒවා ඔක්කොම ගැන කියන්නට බැහැ. නමුත් ඒ වරප්‍රසාද පෞද්ගලිකව පාවිච්චි කළා විතරක් නොවෙයි මෙහිදී තවත් කාරණයක් සඳහන් කරනවා.

2014 ජනවාරි මාසයේ 22වෙනි දා මලයාසියාවේ ක්වාලාලම්පූර් සිට කටුනායක දක්වා පියාසර කිරීමට නියමිතව තිබූ UL 319 ගුවන් යානය එතැනින් කෙළින්ම කටුනායකට එවන්නේ නැතිව සිංගප්පූරුව හරහා කටුනායකට එවන්නට නියෝග දීලා තිබෙනවා. ඇයි ඒක ඇරියේ? ගුවන් සභාපතිතුමාගේ පෞද්ගලික ගමනක් සම්පූර්ණ කරන්නට රජයේ, ශ්‍රී ලංකා ගුවන් ආයතනයේ ගුවන් යානයක් හැරෙව්වා කියලා සඳහන් කරනවා. ගරු කථානායකතුමනි, මම මේ කාරණයක් දෙකක් පමණක් උපුටා ගත්තේ ඊට වඩා විශාල ප්‍රශ්නයක් ගැන කථා කිරීමටයි. පෞද්ගලික වරප්‍රසාද ගන්නට පුළුවන්. වාහන අවභාවිතය වාගේ දේවල් හැම තිස්සේම සිදු වෙනවා, ඒවා හරි ගස්සන්නට පුළුවන්. නමුත් හිතලා බලන්න අපේ රටේ ගුවන් යානාවක්, -ගුවන් සේවාව - ගුවන් සමාගමේ සභාපතිතුමාගේ පෞද්ගලික ගමනකට යොදා ගන්නවා. ගරු කථානායකතුමනි, එතකොට හිතලා බලන්න පුළුවන් මේ රටට කොපමණ වැරදි වෙලා තිබෙනවාද කියලා. ඒ විතරක් නොවෙයි මේවා මුදල්වලින් ගණනය කරන්නට බැහැ. ඒ ගුවන් ගමන නිසා සිදු වූ පාඩුව මුදලින් පමණක් ගණනය කරන්නට බැහැ, මේ තුළින් සිදු වුණේ මූල්‍යමය අලාභයක් විතරක් නොවෙයි. ගුවන් සමාගමේ කීර්ති නාමයට වන හානිය ගැනත් හිතන්නට ඕනෑ. එවැනි දෙයක් වුණාම ඉන් පසුව කවුරුන් හෝ ටිකට් පතක් අරගෙන ඔය ගුවන් යානයේ යනවාද? යන්නේ නැහැ. මොකද, ටිකට් පත ගත්තේ ක්වාලාලම්පූර් ඉඳලා කොළඹ එන්න. නමුත් ගුවන් යානය යන්නේ වෙන ගමනක්. එතකොට ටිකට් පතක් ගනීද? මෙවැනි දේවලින් සමාගමේ කීර්තිනාමයට වන හානිය ගණනය කරන්නට බැහැ. එපමණ විශාල පාඩුවක් සිදු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ වාර්තාවේ "නිර්දේශිත නෛතික ක්‍රියාමාර්ග" යටතේ කෙළින්ම කියලා තිබෙනවා, "....වග කිව යුතු පුද්ගලයන්ට විරුද්ධව අපරාධ නඩු පැවරීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව විසින් ගනු ලබන නිර්දේශ..." කියලා. මේ ගැනත් අපි සොයලා බලන්නට ඕනෑ.

මෙම වාර්තාවේ රාජ්‍ය මුදල්, සම්පත්, වරප්‍රසාද අයුතු ලෙස අවභාවිතය කිරීම පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඒ සම්බන්ධයෙන් එක කාරණයක් උපුටා ගෙන කියවන්නට කැමැතියි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් ආදියත් විශාල ලෙස අවභාවිත කර තිබෙනවා. මම උපුටා ගත් කොටසේ අන්තිමට කියලා තිබෙනවා, මේවා පාවිච්චි කළාට පසුව මේවාට ගෙවන්නට ඕනෑ කියලා.

> "තව ද, පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ හා ලුතිනන් යෝෂිත රාජපක්ෂ විසින් ලබාගෙන ඇති ගුවන් ගමන්වලට අදාළ මුදල යුද හමුදාවට අනුයුක්ත සෙබල අංක එස්/553862 ඩබ්.ජේ.ආර්. ඥාණසිරි වන කෝප්‍රල් නිලයෙන් යුත් නිලධාරියෙක් රුපියල් ලක්ෂ 260කට අධික මුදලක් ජනාධිපති කාර්යාලය නමින් ගෙවීමක් සිදු කර ඇති බව."

ගරු කථානායකතුමනි, මම මොහොතකටවත් විශ්වාස කරන්නේ නැහැ, කොමිෂන් සභා වාර්තාවේ මන්ත්‍රීවරයෙකුගේ හෝ ඇමතිවරයෙකුගේ නම තිබෙනවා කියලා ඒ පුද්ගලයා වරදකාරයෙක් කියලා. මේක අධිකරණ ක්‍රියාමාර්ගයක් නොවෙයි. මම ඒක විශ්වාස කරන්නේත් නැහැ. ඒ වාගේම මම ඒක ප්‍රසිද්ධියේ සඳහන් කරන්නත් ඕනෑ. මොකද, එතුමා ඒ ගුවන් යානාවේ ඉඳගෙන සිටියාට එතුමා දන්නේ නැහැනේ වෙන කවුරු හෝ තීරණයක් අරගෙන වැරදි දෙයක් කරනවා කියලා. මේක ඒ වාගේ සිදුවීමක්. ඇමති කෙනෙක් වුණත්, ඒ ඇමතිවරයා යටතේ වැඩ කරන සභාපතිවරු ඉන්නවානේ. ඒ අය වැරදි තීරණ ගන්නවා. ඇමතිවරයා ඒ හැම එකම දන්නේ නැහැ. අපි මේවා දිහා සාධාරණ ලෙස බලන්න ඕනෑ. ගරු කථානායකතුමනි, නමුත් මම මෙතැනදී මතු කරන්නේ වෙනත් ප්‍රශ්නයක්. මේ වාර්තාවේ කියනවා, මුදල් ගෙවන්න කියලා කිව්වාම, ඒ කෝප්‍රල්වරයා ඇවිල්ලා රුපියල් ලක්ෂ 260කට අධික මුදලක් ජනාධිපති කාර්යාලය නමින් ගෙවීමක් සිදු කළා කියලා. මේක මම කියන දෙයක් නොවෙයි. මම කියන්නේ මේ වාර්තාවේ තිබෙන දේවල්. පරීක්ෂණයක් පවත්වන්න කියලා තමයි මේකෙන් කියන්නේ. පරීක්ෂණයක් පවත්වලා එම නිලධාරියාට මෙම මුදල් කෙසේ ලැබුණේද යන්න පිළිබඳව වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු කළ යුතු බවද මෙම කොමිෂන් සභාවේ මතය විධියට සඳහන් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ මේ විධියට විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න පුළුවන් නම්, ඇත්තටම ඒ මුදල් ප්‍රමාණය ගෙව්වේ කොහොමද කියන එක තමයි මේ අහන්නේ. ගරු කථානායකතුමනි, කෝප්‍රල්වරයාට මාසයකට රුපියල් ලක්ෂයක මුදලක් ලැබුණත්, අවුරුද්දකට ලැබෙන්නේ රුපියල් ලක්ෂ 12යි. එතකොට ඔහු අවුරුදු 30ක් වැඩ කළත් රුපියල් මිලියන 30ක්, 40ක් වාගේ මුදලක් තමයි ලැබෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නවලට පිළිතුරු තිබෙන්නට ඕනෑ. මේ පිළිතුරු ගැන අපි සොයා බලන්න ඕනෑ. කොහොමද මේවා සිදුවෙලා තිබෙන්නේ කියලා සොයා බලන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, තව හුඟක් දේවල් තිබෙනවා. ඉඩම් පිළිබඳව හුඟක් ප්‍රශ්න තිබෙනවා. රජයේ ඉඩම් තිබෙනවා. ඒ කියන්නේ මේ රටේ වටිනාම සම්පත. මේ රටේ ජීවත් වන පුරවැසියන්ගෙන් සියයට 80කට ඉඩමක අයිතිය නැහැ. නමුත්, රජයේ ඉඩම් අවභාවිතය සිදු වෙනවා. ගරු කථානායකතුමනි, සමහර විට අපේ නමින්, එහෙම නැත්නම් වෙනත් නම්වලින් අපි යෝජනා කරන පදනම් රාශියක්ම මේ පාර්ලිමේන්තුවට එනවා.

මේක අද-ඊයේ එන එකක් නොවෙයි, වසර ගණනාවක් තිස්සේම සිදුවන දෙයක් ගරු කථානායකතුමනි. ඒකේ වරදක් නැහැ. නමුත්, ඒ සමහර පදනම් විසින් රජයේ ඉඩම් අරගෙන තිබෙනවා. රජයේ ඉඩම් අරගෙන තිබෙන බව මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. රජයේ ඉඩම් අරගෙන ඒවා පදනම්වලට හරවාගෙන තිබෙනවා. මම ඒවා ඔක්කෝම ගැන සඳහන් කරන්න යන්නේ නැහැ. ඒ වාගේම සමහර ඉඩම් අවතක්සේරු කරලා -අඩු වටිනාකමක් පෙන්වලා- අරගෙන තිබෙනවා. එයිනුත් රජයට අවාසියක් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේ විශාල හොර බොරු, වංචා පිළිබඳ තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි අද කථා කරන්නේ දූෂණය ගැනයි. දූෂණය ගැන කථා කරන කොට මූල්‍ය දූෂණය ගැන කථා කරන්න වෙනවා. මම දැක්කා පත්තරේක තිබෙනවා, මේ අත් අඩංගුවට ගැනීම රඟපෑමක් කියලා. ගරු කථානායකතුමනි, ඉතිහාසය ගැන බලන කොට එහෙම අවිශ්වාසයක් තියන්න පුළුවන්. නමුත්, මේ අත් අඩංගුවට ගැනීම රඟපෑමක් නොවෙයි. මේ කටයුතු සිදුවීගෙන යනවා. තව කෙනෙක් සඳහන් කර තිබෙනවා, උදයංග වීරතුංග ඩුබායිවලදී අත් අඩංගුවට ගත්ත එකත් රඟපෑමක් කියලා. ගරු කථානායකතුමනි, මේක විහිළුවක්. ඩුබායි ජාත්‍යන්තර ගුවන් තොටුපල වාගේ ලෝකයේ විශාලම ගුවන් තොටුපළක් හරහා ගමන් කරන කෙනෙකුගේ ගමන නතර කරන්න අපේ රජයට බලයක් තිබෙනවාද? එහෙම නොවෙයි ගරු කථානායකතුමනි, ගුවන් යානයකට නඟින්න යනකොට ජාත්‍යන්තර පොලීසියෙන් - INTERPOL එකෙන් - නතර කරලා ප්‍රශ්න කරලා තිබෙන්නේ ඒ අයට තිබෙන වාර්තා අනුවයි.

ගරු කථානායකතුමනි, මූල්‍ය දූෂණ තිබෙනවා. නමුත්, මිනී මැරුම් තමයි මූල්‍ය දූෂණයට වඩා බරපතළ වන්නේ ගරු කථානායකතුමනි. පසුගිය වසර 10 තුළදී මිනී මැරුම් සිදු වුණා, අතුරුදහන්වීම් සිදු වුණා. මට අද වගේ මතකයි, එදා ලසන්ත වික්‍රමතුංගයන් කිව්වා, මිග් යානා මිලදී ගැනීමේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක් පෞද්ගලික සමාගමකට යාමෙන් දූෂණයක් සිදු වුණාය කියලා. එතුමා ඒ කාරණය සඳහන් කළ නිසා හිටපු ආරක්ෂ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා නඩුවක් දැම්මා. එතකොට ලසන්ත වික්‍රමතුංගයන් මොනවාද කළේ? එතුමා කිව්වා, "හරි, මම අධිකරණයට ගිහිල්ලා මේ විස්තර ඔක්කෝම දෙන්නම්, අධිකරණයෙන් සොයා බලන්න" කියලා සඳහන් කළා. නමුත් ගරු කථානායකතුමනි, ඒ දවස දකින්නට ලසන්ත වික්‍රමතුංගයන්ට අවස්ථාවක් තිබුණේ නැහැ. ඊට දවස් දෙකකට, තුනකට ප්‍රථමයෙන් රත්මලානේදී ලසන්ත වික්‍රමතුංගයන්ව අමු-අමුවේ ඝාතනය කළා. මේවා විහිළු දේවල් නොවෙයි. මේවා මිනිසුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්න. මේවා සාමාන්‍ය මිනිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න. [බාධා කිරීම්] මැති ඇමතිවරුනි, මේවා අහගෙන ඉන්න. මැති ඇමතිවරුනි, මේවා අහගෙන ඉන්න. අපි පිළිගන්න කැමැතියි, ඉතිහාසය කියන්නේ ඉතිහාසය කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද, point of Order එක? ස්ථාවර නියෝග 78 යටතේ එතුමාට කථා කරන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යවරයා මීට පෙර මේ සභාවේදී පවසා තිබෙනවා, ලසන්ත වික්‍රමතුංග ඝාතනය සරත් ෆොන්සේකාගේ හමුදා කණ්ඩායමේ වැඩක් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමාට අවස්ථාව දෙන්න. එතුමාගේ කථාවට ඉඩ දෙන්න. එතුමා ස්ථාවර නියෝග 78 යටතේයි කථා කරන්නේ. Let him continue.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මා කලින් කිව්වා වාගේ, මේ විවාදය ඉල්ලපු නිසා අවාසනාවට ඉතිහාසය මතක් කරන්න සිදුවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි අලුත් පිටුවක් හරවන්න අවශ්‍යයි. මෙය අපේ ඉතිහාසයේ පමණක් කළ යුතුයි. කවුරු මොනවා කිව්වත් අපේ රජය වෙනසක් කරලා තිබෙනවා. දූෂණය පිළිබඳව අපට චෝදනා තිබුණත්, අපේ රජය සර්ව සම්පූර්ණ රජයක් නොවෙයි කියන එක අපි පිළිගන්නවා. නමුත් මිනී මැරුම් සම්බන්ධයෙන් අපේ රජයට විරුද්ධව කිසිම චෝදනාවක් නැහැ. ගරු කථානායකතුමනි, මේ මිනී මැරුම් ගැනත් සොයා ගෙන යනවා. මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වීගෙන, ක්‍රියාත්මක වීගෙන ඉදිරියට ගියොත් තමයි, මේ රටේ මන්ත්‍රීවරුන්ට, කැබිනට් ඇමතිවරුන්ට පළමුවන වතාවට හිරගෙවල්වලට යන්න වෙන්නේ; උසස් නිලධාරින්ට හිරගෙවල්වලට යන්න වෙන්නේ. මේ ක්‍රමවේදය ඉදිරියට ගියොත් සමහර අයට මරණ දණ්ඩනය ලැබෙයි. මා ආඩම්බරයෙන් කියනවා, අද මේ රටේ ස්වාධීන අධිකරණයක් තිබෙනවාය කියලා. ඒ නිසා තමයි, ජනාධිපතිතුමා අහපු ප්‍රශ්නයට වුණත් ඒ අයට ඒකමතිකව තීරණයක් දෙන්න පුළුවන් වුණේ. ගරු මන්ත්‍රීවරුනි, අපි විපක්ෂයේ සිටියත්, ආණ්ඩු පක්ෂයේ සිටියත්, ඇත්තටම අපට සතුටු වන්න පුළුවන් හේතුවක් තමයි ඒක. මේ රටේ වෙනසක් වීගෙන යනවා. ඒ වෙනස අපි ආරක්ෂා කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මේ කරුණු කියන්න සිදු වුණේ මේ අවස්ථාවේදී මූල්‍ය වංචාවන් ගැන කථා කරන නිසායි, ගරු කථානායකතුමනි. අද කථා කරනකොට කිව්වා, මේ ආර්ථිකයේ විශාල ගැටලුමක්, ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. අවුරුදු 50කට පස්සේ අපේ අය වැය තුළ පළමුවන වතාවට ධනාත්මක අතිරික්තයක් තිබෙනවාය, ප්‍රාථමික අතිරික්තයක් තිබෙනවාය කියලා සඳහන් කරන්නට ඕනෑ. කවදාවත් අතිරික්තයක් තිබිලා නැහැ. පළමුවන වතාවට ඇති වී තිබෙන මේ විශාල අතිරික්තයෙන් පෙනෙන්නේ Balance Sheet එක ශක්තිමත් කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! I wish to announce that this House cordially welcomes the Russian Delegation led by Mr. A.M. Cherneckiy, Member of the Organizing Committee of the Eketerinburg World Expo 2025, now present at the Speaker's Gallery. We welcome all of you. Thank you.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, අවුරුදු 15කට ප්‍රථමයෙන් අපේ රටේ තිබුණු අපනයනය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 34යි. අපි රජය භාර ගන්නකොට එය සියයට 12ක්, සියයට 13ක් දක්වා පහළට බැහැලායි තිබුණේ. ගරු කථානායකතුමනි, 2015, 2016 අපි භාර ගත් ඉතා අසතුටුදායක ආර්ථිකය, ක්‍රම-ක්‍රමයෙන් තමයි එදා මුදල් ඇමතිතුමාට හරවා ගන්න සිදු වුණේ. එයට ඉඩකඩක් තිබුණේ නැහැ, විශාල ණය කන්දරාවක් තිබුණු නිසා. නමුත් 2017දී හැරවුම් ලක්ෂණ තිබෙනවා. අපනයනය සියයට 10කින් වැඩි වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි. යුරෝපයේ මත්ස්‍ය තහනම ඉවත් කිරීම නිසා එක අවුරුද්දක් තුළ මත්ස්‍ය අපනයනය පමණක් සියයට 38යි දශම ගණනකින් ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම GSP Plus සහනය දිහා බැලුවොත්, එහි ලාභයත් 2018දී, 2019දී, 2020දී අපට ලබා ගන්න පුළුවන්, ගරු කථානායකතුමනි. සෘජු විදේශීය ආයෝජනය -

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! What is the point of Order? Do not disturb his speech.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා ආර්ථික වර්ධනය ගැන කිව්වා. මේ කාර්තුවේ ආර්ථික වර්ධනයේ ප්‍රමාණය කොපමණද? සියයට 3.3යි. ඉලක්කය සියයට 4.5ක් වශයෙනුයි තිබුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ කාරණය පිළිබඳව ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමා ඒ කාරණය පෙන්වලා දුන්නාට ස්තුතියි. හිතුවාට වැඩිය ආර්ථික වර්ධනය අඩුවෙලා තිබෙනවා. ඒකට හුඟක් හේතු බලපා තිබෙනවා. එක හේතුවක් තමයි, 2017 අවුරුද්දේ ඇති වූ කාලගුණ විපර්යාසය. මේ රටේ දිස්ත්‍රික්ක 25න්, දිස්ත්‍රික්ක 20කට වතුර තිබිලා නැහැ. එම දිස්ත්‍රික්කවල නියඟයක් තිබිලා තිබෙනවා. ඒ වාගේම ජල ගැලීම් තිබිලා තිබෙනවා. ඊට නොයෙකුත් හේතු බලපා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, 2016 අවුරුද්දේ කෝටි 80ක් වූ සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය, 2017 අවුරුද්දත් එක්ක සසඳා බැලුවොත් එය කෝටි 160 දක්වා වැඩිවෙලා තිබෙනවා. අවුරුද්දක් තුළදී සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය දෙගුණයක් වෙලා තිබෙනවා. 2018, 2019 සහ 2020දී සෘජු විදේශීය ආයෝජනය තවත් ඉහළ යනවා කියලා සඳහන් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මම ඒ කිව්වේ ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසය වනතුරු දත්ත පිළිබඳවයි.

ගරු කථානායකතුමනි, ගිය සතියේ ජනශක්ති රක්ෂණ සමාගමේ එක ආයෝජනයකින් ඩොලර් මිලියන 100ක් රටට ලබා ගන්න පුළුවන් වුණා. මූල්‍ය පාලනයක් අද තිබෙනවා. අලුත් ආදායම් බදු පනතක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේක අද යම්කිසි මූල්‍ය පදනමකට අනුවයි ක්‍රියාත්මක වෙන්නේ. නීතිමය පදනමකට අනුවයි අද මෙය ක්‍රියාත්මක වෙන්නේ. පිට රටින් ණය අරගෙන සංවර්ධනය පෙන්වන්න පුළුවන්. නමුත් අපි ඒක ප්‍රමුඛ කරන්නේ නැහැ. අපි ප්‍රමුඛ කරන්නේ ප්‍රාග්ධනය වර්ධනය කිරීමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා.

පියා රියදුරෙක් නම් ඔහු වාහනය පැදවුවේ මඩ පාරේ. ඊට පස්සේ අපට කියනවා, "මේ මඩ පාර සංවර්ධනය කරන්න ඕනෑ. පාරට කොන්ක්‍රීට් ටිකක් දාලා දෙන්න." කියලා. අපි - දේශපාලනඥයන්- ගිහිල්ලා ඒ පාරට කොන්ක්‍රීට් ටිකක් දමනවා. අවුරුදු 15කට පස්සේ පුතාත් රියදුරෙක් වනවා. පුතාත් වාහනයක් පදවනවා. පුතා වාහනය පදවන්නේත් කොන්ක්‍රීට් පාරේ, ගරු කථානායකතුමනි. පියා වාහනය පදවාගෙන ගියේ මඩ පාරේ. පසු ගිය රජය "සංවර්ධනය" කියලා කිව්වේ ඒකටයි, ගරු කථානායකතුමනි. නමුත් අපි "සංවර්ධනය" කියන්නේ ඒකට නොවෙයි. පියා කළේ ගෞරවනීය රැකියාවක්. මොකද, වෙන විකල්පයක් තිබුණේ නැහැ. නමුත් පාරට කොන්ක්‍රීට් දාලා පුතාව රියදුරෙක් කරන්න අපි ලෑස්ති නැහැ. අපිට ඊට වැඩිය ආර්ථික දර්ශනයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

මානව සම්පත ගොඩ නැඟීම තමයි අපේ ආර්ථික දර්ශනය. අපි රට බාර ගන්නකොට අධ්‍යාපනය කප්පාදු කරලා තමයි තිබුණේ. අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.9 වියදම් කළේ. දැන් අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 2.37ක් මංගල සමරවීර ඇමතිතුමා වෙන් කරලා තිබෙනවා. හැම දාම අපි ඇවිල්ලා කථා කරන්නේ විශ්වවිද්‍යාලයට යන ශිෂ්‍යයා ගැනයි. සිසුන් 350,000ක් උසස් පෙළ හදාරනවා. 125,000ක් විශ්වවිද්‍යාලවලට යන්න වරම් ලබනවා. ගරු කථානායකතුමනි, නමුත් අපි විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නේ 30,000ක් වාගේ ප්‍රමාණයක්. අනික් 100,000 ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. අග්‍රාමාත්‍යතුමා කිව්වා, "විශ්වවිද්‍යාලයට යන දරුවාට විතරක් නොවෙයි, හැම දරුවෙකුටම අවුරුදු 13ක අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ"ය කියලා. ඒ නිසා අපි Ceylon-German Technical Training Institute එක වාගේ ආයතන 10ක් පටන් ගන්නවා. එම නිසා තමයි මුදල් ඇමතිතුමා අවුරුදු 13ක අධ්‍යාපනයක් ලබා දෙන්න මුදල් වෙන් කරලා තිබෙන්නේ, ගරු

කථානායකතුමනි. අපි මානව සම්පත ගොඩ නඟන්නේ එහෙමයි. මේ රටේ සිටින අවුරුදු 5 - 19 අතර හැම ශිෂ්‍යයෙකුටම රක්ෂණයක් අපි ලබා දීලා තිබෙනවා. මානව සම්පතට මුල් තැන දෙන රජයක් තමයි අපේ රජය. අපි අනික් අයගේ සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව නොවෙයි කටයුතු කරන්නේ. අපේ රජයට සංවර්ධන න්‍යාය පත්‍රයක් තිබෙනවා. ඒ න්‍යාය පත්‍රයේ අපි ගමන් කරනවා. අපි දූෂණය නැති රටක් හදමු. අපි එකතුවෙලා මේ කටයුත්ත කරමු. වැරදි කරපු අයට දඬුවම් දෙමු. එතකොට අපටත් ප්‍රවේශම් වෙන්න සිදු වනවා. ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

ඊට ප්‍රථමයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தி னின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

[අ.භා. 12.10]

**ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයේදී අදහස් දක්වන්න ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වනවා. මොකද, මේ පැමිණිල්ල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ප්‍රථමයෙන්ම ඉදිරිපත් කරලා, මේ පිළිබඳව යම් මතයක් රට තුළ ගොඩ නඟන්න අපට හැකියාව ලැබුණා. මාර්තු මාසයේ මුලදී අපිට මේ තත්ත්වය පිළිබඳව වාර්තා වුණා. ඒ වාගේම මහ බැංකුවේ නිලධාරීන් කීප දෙනෙකු පෞද්ගලිකවම මාව හමු වෙලා, අවශ්‍ය තොරතුරු ලබා දෙමින් මේ කාරණය මගේ අවධානයට යොමු කළා. මා විශේෂයෙන්ම එතුමන්ලා සියලු දෙනාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වන්න ඕනෑ.

ඉන් අනතුරුව මමත්, ජගත් පුෂ්පකුමාර හිටපු ඇමතිතුමාත්, එරික් වීරවර්ධන මැතිතුමාත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට මේ පැමිණිල්ල අරගෙන ගියා. මේ පැමිණිල්ල අරගෙන යන්න තව කට්ටියට කථා කළාම, මේ අලුතම පත් වෙච්ච ආණ්ඩුවට විරුද්ධව පැමිණිල්ලක් දැමීමට එන්න සමහර මන්ත්‍රීවරුන්ට පොඩි මැළිකමක් තිබුණා. නමුත් එවන් අවස්ථාවක අපි මේ සම්පූර්ණ අවදානම අරගෙන ඒ පැමිණිල්ල ඉදිරිපත් කළා. එතැනින් පස්සේ තමයි රටේ ජනමතයක් ගොඩ නැඟුණේ, මෙහි වංචාවක්, දූෂණයක් සිදු වුණා කියලා. ඒ දිනය වන තෙක් කිසිම කෙනෙකුගෙන්, කිසිම ජනමාධ්‍යයක හෝ පාර්ලිමේන්තුවේ හෝ කිසිම තැනක මේ සම්බන්ධයෙන් කිසිම අදහසක් ප්‍රකාශ වුණේ නැහැයි කියන එක මම ඉතාමත් වගකීමෙන් කියන්න කැමැතියි.

මේ සම්බන්ධව පළමුවැනි වතාවට ජනමාධ්‍යය වාර්තා කළේ, අපි පැමිණිල්ල ගෙන ගිය දවසේ රාත්‍රියේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එතැනින් නිකම් ඉන්නේ නැතුව ඊට පසුව එවකට විපක්ෂ නායකවරයා විධියට හිටපු නිමල් සිරිපාල මැතිතුමා සමඟ එකතු වෙලා අපේ කණ්ඩායම ගිහිල්ලා මහ බැංකුව ඉදිරිපිට විරෝධතා පවත්වමින් ජනතාව දැනුවත් කළා. ඒ එක්කම පාර්ලිමේන්තුවේදී ජනතා විමුක්ති පෙරමුණ මේ පිළිබඳව ප්‍රශ්න ඇහුවා; ඒ වාගේම විවිධ මණ්ඩපවල මේ පිළිබඳව කථා කරන්න ගත්තා; ජනමාධ්‍ය තුළ කථා කරන්න ගත්තා. ඒ වාගේම පසුගිය කාලය තුළ දිගින් දිගටම මටත් චෝදනා එල්ල කළා, "කෝ, පැමිණිල්ලක් කළා. දැන් ආණ්ඩුවට ඇවිල්ලා ඇමතිකම් ගත්තාම කට වැහෙයි. මේ පිළිබඳව ඉදිරියට කටයුතු සිදු වෙන්නේ නැහැ. ආණ්ඩුවේ ඉන්න නිසා ඔතැනින් ඕක යටපත් වෙනවා" කියලා. නමුත් ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ ප්‍රශ්නය දිගටම ගෙන යන්න අපට හැකියාව ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන් අනතුරුව මහ බැංකු අධිපතිවරයා ඉවත් කිරීමේ වැඩ පිළිවෙළ සිදු වුණා. ජනාධිපතිතුමා ඔහු නැවත පත් කිරීමෙන් වැළකුණා. ඉන් පසුව COPE වාර්තාව මේ සභාවට ඉදිරිපත් කළා. COPE එක සොයා ගත්තා, මෙතැන මූල්‍ය වංචාවක් සිදු වුණා කියලා. අපි ලබා දුන්නු තොරතුරු එයින් තවත් තහවුරු කළා. කවුරු හෝ කියන්න යනවා නම් මෙතැන හොරකමක් සිදු වුණේ නැහැ කියලා ඒක සම්පූර්ණ අසත්‍යයක්.

මහ බැංකු බැඳුම්කර සිද්ධිය, මේ රටේ ඉතිහාසයේ සිදුවුණු ලොකුම හොරකම කිව්වොත් ඒක නිවැරදියි. වෙන හොරකම්වල එකතුව ගණන් හදන්න පුළුවන්. නමුත් එක් වතාවකදී, කෙටි කාලයක් ඇතුළත, සිදු වුණු ලොකුම හොරකම තමයි මහ බැංකු වංචාව. මේක ගණන් හදන්න බැහැ. ගණන් විධියට එක එක සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් මූල්‍යමය වශයෙන් ඒ ගණන් පෙන්නුවත් ඊට වැඩිය බරපතළ හානියක් රට තුළ ඇති වෙලා තිබෙන බව අපි හොඳටම දන්නවා. මූල්‍ය වෙළෙඳ පොළේ අස්ථාවරභාවය, ජාත්‍යන්තරයේ විශ්වාසය, ඒ එක්කම පොලී අනුපාත වැඩි වීම ආදිය මේ මහ බැංකු බැඳුම්කර සිද්ධියත් සමඟ විශාල බලපෑමට ලක් වුණා කියන එක අපි පැහැදිලිව කියනවා.

මම එක පැත්තකින් ආඩම්බර වෙනවා, මෙතෙක් තිබුණු සම්ප්‍රදායයන් වෙනස් කරලා අපි කටයුතු කරපු එක ගැන. COPE වාර්තාව ඉදිරිපත් වුණාම ජනාධිපතිතුමා විශේෂ කොමිසමක් පත් කළා, මේ පිළිබඳව සොයා බලන්න. ඒකට හේතුව වුණේ මෙයයි. ප්‍රථමයෙන් නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. ඒ කමිටුව වාර්තාවක් ලබා දුන්නා, ජනාධිපති කොමිසමක් පත් කරලා මේ පිළිබඳව පුළුල්ව විමර්ශනය කරන්න ඕනෑය කියලා. ඒ අනුව පුළුල් විමර්ශනයක් වෙන කොට COPE එකේ හෙළි නොවුණු තොරතුරු විශාල ප්‍රමාණයක් හෙළිදරවු වෙන්න පටන් ගත්තා. මෙතෙක් ඉතිහාසයේ කිසිම ආකාරයක නැති තරම් තොරතුරු ප්‍රමාණයක් මේ කොමිසම විසින් ඉතාම ගවේෂණාත්මකව, පර්යේෂණාත්මකව විමර්ශනය කළා. ඒ පිළිබඳව කොමිසමේ සාමාජිකයන්ටත්, ඒ සඳහා සහාය දැක්වූ සියලුමදෙනාටත් අපේ ප්‍රශංසාව හිමි වෙන්න ඕනෑ.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පළමුවැනි මූල්‍ය වංචාවත් නොවෙයි. මේ වාර්තාවේම සඳහන් වෙනවා, 2008 ඉඳලා මේක සිද්ධ වුණා කියලා. අපි කියන්නේ මේ කාලයේද, ඒ කාලයේද කියන එක ප්‍රශ්නයක් නැහැ; කොයි කාලයේ හෝ වෙලා තිබෙනවා නම් හොරකමට, වංචාවට, දූෂණයට විරුද්ධව කටයුතු කිරීමේ වගකීම අපි සියලුදෙනාටම තිබෙන බවයි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගම්මන්පිල මහත්තයා, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා සඳහන් කළා, 2008 සිට මේ වංචාව මේ විධියටම සිදු වෙලා තිබෙනවා කියලා වාර්තාවේ සඳහන් වෙනවා කියලා. ගරු ඇමතිතුමනි, කරුණාකර සඳහන් කරන්න පුළුවන්ද, එසේ සඳහන් කරලා තිබෙන පිටු අංකය මොකක්ද කියලා?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
එතුමාට උත්තර දෙන්න මට වෙනම වෙලාවක් ඔබතුමාගෙන් හම්බ වෙන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ පිළිබඳව වෙනම විවාදයක් කරමු. [බාධා කිරීමක්] බැඳුම්කර සිද්ධියට අදාළ ජනාධිපති විමර්ශන කමිටුව පත් කළ වෙලාවේ එතුමා පුවත් පතකට කියාපු දෙයක් මා කියන්නම්. "බැඳුම්කර සිද්ධියේ ජනපති කොමිසමට මම විරුද්ධයි". කවුද මේ කියන්නේ? මන්ත්‍රී උදය ගම්මන්පිල. මේ තියෙන්නේ; තවත් බොහෝ අය පත්තරවලට කියාපු ඒවා තිබෙනවා. අවස්ථා ගණනාවකදී මේ වාගේ ඒවා කිව්වා. ඊළඟට, මේ වාර්තාව ඉදිරිපත් කළාමත් එතුමා පුවත් පතකට කිව්වා, "මේ වාර්තාව සියවසේ ලොකුම විහිළුවයි" කියලා. ගම්මන්පිල මැතිතුමා දිගින් දිගටම මේ ගැන හැල්ලු කරමින් කථා කළා. දැනුත් මේ සිද්ධියට අදාළව යම් යම් අය අත්අඩංගුවට ගැනීම පිළිබඳව පවා එතුමා ඉතාමත් සැහැල්ලුවෙන් කථා කරනවා. මට පෙනෙන්නේ නැහැ, එතුමා මොන කඳවුරේද ඉන්නේ කියලා. මට ඒ ගැන පැහැදිලි කර ගන්න ඕනෑ. එතුමා ඉන්නේ යූඑන්පී විරෝධී කඳවුරේද, එහෙම නැත්නම් යූඑන්පී එකත් එක්ක එකතු වෙලා කථාන්දර හදනවාද කියන එක පිළිබඳව මට ප්‍රශ්නයක් තිබෙනවා.[බාධා කිරීම්] කොහොම වුණත්, එතුමා ගන්නේ නැහැයි කියන එක පිළිබඳව මම සතුටු වෙනවා.[බාධා කිරීම්] මගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. මේ මහ බැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධව මේ රටේ ජනතාව තුළත්, රට තුළත් ඇති වුණු මතය පිළිබඳව අපි ආඩම්බර වෙනවා.

ඒ විතරක් නොවෙයි. ජනමාධ්‍ය මේ පිළිබඳව කථා කළා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. අද මේ සිද්ධිය පිළිබඳව වාගේම තවත් සිද්ධීන් ගණනාවක් හෙළිදරවු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2008 සිට බැඳුම්කර සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුයි කියලා වාර්තාවේ සඳහන් වෙනවා. එතුමාට ඒක හොඳට කියවා ගන්න කියන්න. මේ බැඳුම්කර වෙන්දේසිය ආරම්භ වෙලා තිබෙන්නේ 2008 ඉඳලයි. නමුත්, අද දඬුවම් නියම වෙන්නේ, මේ කණ්ඩායම විමර්ශනය කරලා තිබෙන්නේ, 2015 සිදුවීම, එහෙම නැත්නම් මෑත භාගයේ සිදුවීම සම්බන්ධයෙන්ය කියන එක අපි පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා COPE කමිටුවේ සාමාජිකයකු විධියට අවුරුදු ගණනාවක් හිටියා. COPE කමිටුව විවිධ වංචා, දූෂණ හොයා දුන්නා. විජයදාස රාජපක්ෂ මැතිතුමා, ඩිව් ගුණසේකර මැතිතුමා COPE වාර්තා ඉදිරිපත් කළා. ඊට පෙර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේ COPE වාර්තා ගණනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අප සිටි COPE කමිටුවෙන් එක වතාවක් වාර්තාවක් ඉදිරිපත් කළා, රුපියල් මිලියන තිස්දහසක වංචා, දූෂණ සිදු වුණා කියලා. හැබැයි, අද වන තුරු මේ COPE කමිටු වාර්තා කොහේද තිබෙන්නේ කියලා අපි දන්නේ නැහැ. ඒවාට ගත්ත තීන්දුවක් අපි අද වන තුරු දැක නැහැ. ඉතිහාසයේ පළමු වතාවට, COPE වාර්තාවක් හමස් පෙට්ටියට යන්න දෙන්නේ නැතිව, එහි දූවිලි බැඳෙන්න දෙන්නේ නැතිව ජනාධිපතිතුමා ජනාධිපති කොමිසමක් පත් කරලා මේ පිළිබඳව හෙළිදරවු කිරීමක් කළා.

ජනාධිපති කොමිෂන් වාර්තා ගැනත් කථා කළා. මේ රටේ ඉතිහාසයේ ජනාධිපති කොමිෂන් කීයක් පත් කළාද කියලා ඔබතුමන්ලා සොයා බලන්න. අනන්තවත් පත් කළා. ප්‍රශ්නයක් මතු වන කොට, ජනතාව ඒ ගැන කථා කරනකොට, ජනමාධ්‍ය කථා කරන්න ගත්තාම කරන්නේ ජනාධිපති කොමිසමක් පත් කරන එකයි. පසුගිය කාලය පුරාවටම සිද්ධ වුණේ ඒකයි. කොමිසමක් පත් කරනවා. හැබැයි, කොමිෂන් සභා වාර්තාවට වෙච්ච දෙයක් නැහැ. ඒ පිළිබඳව ගත්තු තීන්දුවකුත් නැහැ. නමුත්, ඉතිහාසයේ පළමු වතාවට අද ජනාධිපති කොමිසමක වාර්තාවක් ක්‍රියාත්මක වෙලා විතරක් නොවෙයි, ඒ පිළිබඳව තීන්දු ගන්න මට්ටමටත් ඇවිල්ලා තිබෙනවා. ඒවායේ නම් සඳහන් වන කොට අමාත්‍යවරු අයින් වන තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ වාර්තාව පිළිබඳව ක්‍රියාත්මක වීම අද ආරම්භ වෙලා තිබෙනවා; නීතිපති දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යවා තිබෙනවා. ඒවා පිළිබඳව කිසිම ප්‍රමාදයක් ඇති නොවී කටයුතු කරන්න සූදානමින් ඉන්න බව මම ඉතාම පැහැදිලිව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීන යුද සටන් න්‍යායාචාර්යවරයකු වන සුන් බින්තුමාගේ "සොරුන් ඇල්ලීමට පෙර දොර වසා දමන්න" කියන සංකල්පය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හරියටම කරනවායි කියන එක මට භය නැතිව කියන්න පුළුවන්. එතුමා වංචා, දූෂණවලට එරෙහිව ගෙන යන ක්‍රියාමාර්ගවල කිසිම අඩුවක් නොවෙන්න ඒ වගකීම භාර ගෙන, ඒක ඒ පැත්තේද, මේ පැත්තේද, මොන පැත්තේද කියන එක අදාළ කර ගන්නේ නැතිව, සියලුදෙනාටම දඬුවම් ලබා දෙන්න ගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධව රට තුළ ප්‍රසාදයක් ඇති වෙලා තිබෙනවා. අද සමහරු කියනවා, මේක ටෙලි නාට්‍යයක් කියලා; මේක රංගනයක් කියලා. මේ තරම් හැල්ලු කරලා මේ වාගේ දේවල් කථා කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා. මේක ඡන්දයක් ඉලක්ක කරලා කරන දෙයක් නොවෙයි. මේ විධියට බැලුවොත්, ඡන්දය තියන නිසා තවත් කවරු හෝ ගන්න හිටියත් ගන්න බැහැ. එහෙම නම් මේ කියන විධියට, ඡන්දයෙන් පස්සේ ගන්න ඒවා නවත්වන්න ඕනෑ. ඒ නිසා මේ වාගේ හැම එකම හැල්ලුවෙන් කථා කරන්නේ නැතිව කරන හොඳ වැඩේ අගය කරන්න. වැරැද්ද පෙන්වන්න. වැරැද්ද භාර ගන්න මේ ජනාධිපතිතුමාත්, අපිත් හැම වෙලාවේම සූදානම්. හැම වෙලාවේම අපහාසාත්මකව කථා කරලා මෙය හැල්ලු කිරීමේ ක්‍රමවේදයෙන් බැහැර වෙන්න කියලා, මේ පිළිබඳව කථා කරන සියලුම දෙනාට මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමඟම තව වාර්තාවක් එළිදැක්වුවා. ඒ වාර්තාව සම්බන්ධවත් කියනවා මම දැක්කා, බැඳුම්කර වාර්තාව යටපත් කරන්න අවුරුදු දෙකහමාරක් පහුවුණු වාර්තාවක් හදිසියේම කල එළියට ගෙනාවා කියලා. ගම්මන්පිල මැතිතුමාත් -අපේ මිත්‍රයා- ඒ ගැන කියලා තිබෙනවා. එතුමාගෙන් අහලා බලන්න, එතුමා කී සැරයක් ඒක කිව්වාද කියලා. [බාධා කිරීමක්] ඔබතුමා කිව්වා. ඔබතුමා කිව්වා, මේ කොමිසම හැල්ලු කරන්න - ඒ සම්බන්ධ පුවත් පත් වාර්තා මම ඊයේ රූපවාහිනී විවාදයට අරගෙන ගියා. මම ඔබතුමාට පෙන්වන්නම්.- එහෙම නැත්නම් මෙහි බර අඩු කරන්න තමයි දෙවැනි වාර්තාව වන බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ගෙනැල්ලා ඉදිරිපත් කළේ කියලා. ඔබතුමා එහෙම කිව්වේ නැහැයි කියා දැන් කියපු නිසා, ඒ ගැන ඔබතුමා කරුණු සඳහන් කළ පුවත් පත් වාර්තාව මම ඔබතුමාට එවන්නම්; මම ඒක මාධ්‍යයටත් දෙන්නම්. ඒක මා සතුව තිබෙනවා. ඊයේ රූපවාහිනී විවාදයට මම ඒක අරගෙන ගියා. මට ප්‍රශ්නයක් නැහැ, එතුමාට ඒක කියන්න අයිතිය තිබෙනවා. ඕනෑ දෙයක් කියපුවාවේ. හැබැයි, එහෙම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු දෙකහමාරක් තිස්සේ පරීක්ෂණ කරපු වාර්තාවක් තමයි එළිදැක්වුවේ. ඒ එළිදැක්වූ වාර්තාවේ නම් ගොඩක් තිබෙනවා. ඒ සමහර අය අපට සම්බන්ධ අය වෙන්න පුළුවන්; අපේ හිතවත් අය වෙන්න පුළුවන්; අපේ මිත්‍රයින් වෙන්න පුළුවන්. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි; අපට ඒක අදාළ වෙන්නේ නැහැ. කවුද වංචාව කළේ, කවුද දූෂණයන් සිදු කළේ කියන එක අපට අදාළ වෙන්නේ නැහැ. වැරැද්ද කරලා තිබෙන්නේ අපේ ළඟ ඉන්න කෙනාද, එහා පැත්තේ ඉන්න කෙනාද කියන එක නොවෙයි ප්‍රශ්නය. වැරැද්ද කරපු කෙනාට දඬුවම් ලබා දීම තමයි අපේ බලාපොරොත්තුව. එහෙම නොවුණොත් මේ රට ඉස්සරහට ගෙන යන්න කවදාවත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැයි කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම වාර්තාවේම සඳහන් වෙලා තිබෙන ප්‍රජා අයිතිය අහෝසි කිරීමක් පිළිබඳව මාධ්‍යවලත්, වේදිකාවලත් කථා කරනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්න යනවා; තව කණ්ඩායම්වල ප්‍රජා අයිතිය අහෝසි කරන්න යනවාය කියලා කථා කරනවා. මම ඒ සම්බන්ධව යමක් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කිසිම කෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමක් පිළිබඳව කටයුතු කරන්න අපේ කැමැත්තක් නැහැ. මේ රටේ එහෙම අතීතයක් තිබුණා. මේ පාර්ලිමේන්තුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. ඒ වෙලාවේ ගාමිණී දිසානායක මැතිතුමා ඒ ආණ්ඩුවේ ඉඳගෙන ඒකට විරුද්ධව කථා කළ බව අපි දන්නවා. නමුත්, සාමූහිකව ඒකට කැබිනට් අනුමැතිය දුන්නා. නැවත එතුමියට ප්‍රජා අයිතිය දෙන කොට එතුමා පාර්ලිමේන්තුවේ ඒ පිළිබඳව ප්‍රකාශයක් කළා. එවැනි අමිහිරි අත් දැකීම් අපට තිබෙනවා. හිටපු ජනාධිපතිතුමාගේ හෝ කිසිම කෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කරන යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරනවාට අපේ එකඟතාවක් නැහැ. හොරකම් කරලා තිබෙනවා නම්, වංචා කරලා තිබෙනවා නම්, දූෂණයක් කරලා තිබෙනවා නම්, අධිකරණ පද්ධතිය තුළ දඬුවම් දීමේ අයිතිය ඒ ආකාරයෙන්ම තිබෙනවා. ඒවා වළක්වන්න කියලා අපි කිසිසේත් කියන්නේ නැහැ. ඒ සඳහා දැනට පවතින නීතිරීති ප්‍රමාණවත් නැත්නම්, නීතිරීති පැනවීමේ හැකියාව මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. මේ කාල පරාසය තුළම සිද්ධ වුණු මේ විශාල මුදල් කන්දරාව,- ඒක සිදු වුණේ පසුගිය ආණ්ඩුව කාලයේ වෙන්න පුළුවන්; මේ ආණ්ඩුව කාලයේ වෙන්න පුළුවන්-

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද අමරවීර මැතිතුමා කියපු කාරණය නිවැරැදියි. මෙම බරපතළ වංචා, දූෂණ, විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ, අපරාධ චෝදනා ගොනු කරලා, මහාධිකරණයේ නඩු පවරලා, එසේ නඩු පැවරීමෙන් පස්සේ, වරදට දඬුවමක් විධියට ප්‍රජා අයිතිය අහිමිවීමේ කාල සීමාව දැනට අවුරුදු හතක් වශයෙනුයි තිබෙන්නේ. නමුත්, ඒක ප්‍රමාණවත් නැහැ. එය ජීවිතාන්තය දක්වා කිරීම නිර්දේශ කරන්නට ඒ වෙනුවෙන් අලුත් නීතියක් අවශ්‍යයි කියන එකයි. ඒ කියන්නේ, අල්ලස් පනත සංශෝධනය කරන්න ඕනෑ කියන කාරණයයි. ඒ නිසා ඔබතුමා කියන කාරණය නිවැරැදියි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ නීති පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. නමුත්, පාර්ලිමේන්තුවේ පරණ ක්‍රමවේදයට අපේ තිබෙන අකැමැත්ත පිළිබඳව තමයි අපි කරුණු ඉදිරිපත් කළේ. මොකද, ඒ අමිහිරි අතීතය පිළිබඳව අපි කිසිදු කැමැත්තකින් නොවෙයි ඉන්නේ. ඒ වාගේම, මේ රටේ ජනතාවත් ඒ පිළිබඳව කිසිදු කැමැත්තක් නැහැ.

අනුර දිසානායක මැතිතුමා කිව්වා, බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තා වරින්වර ඉදිරිපත් වුණා; ප්‍රමාද වෙලායි වාර්තාව දුන්නේ කියලා. මම ඒ සම්බන්ධයෙන් යමක් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රමාද වීමක් නොවෙයි. ඒ සම්බන්ධව වෙනම ක්‍රියාත්මක වන ආයතන දෙකක් තිබුණා.

FCID එක තිබුණා. ඒ වාගේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබුණා. ඒවාටත් මේ පැමිණිලි ගියා. ඒවායින් ක්‍රියාත්මක වෙන්න කිසිම බාධාවක් තිබුණේ නැහැ. මේ පැමිණිලි ඉදිරිපත් වුණේ ජනාධිපති කොමිසමට විතරක් නොවෙයි. ජනාධිපති කොමිසම පැමිණිලි එක්දහස් ගණනක් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. එයින් බරපතළම කොටසක් විතරක් තමයි තෝරලා තිබෙන්නේ. සියලුම දෙනාට මේ කොමිසමට පැමිණිලි ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබුණා. හැබැයි, ඒවායින් අවසාන වශයෙන් ඔප්පු වෙන කාරණා ප්‍රමාණයක් තමයි තෝරාගෙන තිබෙන්නේ. ඒවායේත් යම් යම් වංචා තිබෙනවා නම්, දූෂණ තිබෙනවා නම් ඒවාට විරුද්ධව කටයුතු කිරීමේ කිසිම බාධාවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරදක් කරලා තිබෙනවා නම් දඬුවම් දෙන්න ඕනෑ කියන මතයේ තමයි අපි ඉන්නේ.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, දැන් තව කොමිෂන් සභා පත් කරනවා. මේක එක පුද්ගලයෙක්, එක පක්ෂයක් ඉලක්ක කරගෙන කරන කටයුත්තක් නොවෙයි. මම ඒ බව ඉතාමත් පැහැදිලිව කියනවා. සමහර වෙලාවට එක්සත් ජාතික පක්ෂය හිතනවා, "මේ බැඳුම්කර කොමිසම පත් කළේ එක්සත් ජාතික පක්ෂය ඉලක්ක කරගෙනයි" කියලා. එහෙම කථා කරපු අය ඉන්න බව මම දන්නවා. නමුත් එවැනි ආකාරයට කිසිම කෙනෙක් ඉලක්ක කරගෙන නොවෙයි මේ කොමිෂන් සභා පත් කළේ. මේ කොමිෂන් සභා පත් කළේත්, ඒ වාගේම ඒ පිළිබඳ වාර්තා නිකුත් වෙන්නේත්, ඒ පිළිබඳව ඉදිරියේදී ක්‍රියාත්මක වෙන්නේත් අපේ රට ඉලක්ක කරගෙනයි. ඒ වාගේම, ඊට පෙර පත් කරපු කොමිෂන් සභා පිළිබඳව කියනවා, ඒවා පත් කළේ තවත් පාර්ශ්වයක් ඉලක්ක කරගෙනයි කියලා. එහෙම එකකුත් නොවෙයි මෙතැන සිදු වෙලා තිබෙන්නේ.

මේ රටේ සාමාන්‍ය පවුලක ඉපදිලා දේශපාලනයට ප්‍රවේශ වෙච්ච කෙනෙක් විධියට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හිතනවා, "මේ රටේ වංචාවට, දූෂණයට විරුද්ධව ගන්න තිබෙන සියලු ක්‍රියා මාර්ග ගන්න ඕනෑ" කියලා. ඒකට ආණ්ඩු බලය ප්‍රශ්නයක් නැහැ. එතුමාගේ තනතුර ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අපේ තනතුරු ප්‍රශ්නයක් වෙන්නෙත් නැහැ. අපි ඒ වෙනුවෙන් ගන්න තිබෙන සියලුම ක්‍රියා මාර්ග ගන්නවා. ඒ වාගේම මම කියන්න ඕනෑ, මේක මහත් අභියෝගයක් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ කාරණා මේ ආකාරයෙන් එළිදැක්වෙන කොට, ක්‍රියාත්මක වෙනකොට කියනවා, "හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් අත් අඩංගුවට ගන්නේ නැහැ" කියලා. ඒත් ගන්න වෙනවා. ඒක නවතින්නේ නැහැ. එයාට රට ගිහිල්ලා හැංගිලා ඉන්න හම්බවෙන්නේ නැහැ. උදයංග වීරතුංග හැංගිලා හිටියා. ඔහු මිග් යානා ගනුදෙනුවට සම්බන්ධ වෙච්ච කෙනා; රුසියාවේ හිටපු තානාපතිවරයා. ඔහුත් අත් අඩංගුවට ගත්තා. ජාත්‍යන්තරයේ කොහේ හිටියත් අර්ජුන් මහේන්ද්‍රන්වත් අත් අඩංගුවට ගැනීමේ කටයුත්ත අනිවාර්යයෙන්ම සිදු වෙනවා. ඒ සම්බන්ධයෙනුත් දඬුවම්දීම අනිවාර්යයෙන්ම සිදු වෙනවා කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ඊට වැඩිය තව කවුරු හරි සම්බන්ධ නම්, තනතුර අදාළ වෙන්නේ නැහැ. මේ කාරණයේදී තනතුර අදාළ නැහැ. මේ වංචාවට, මේ දූෂණයට සම්බන්ධ වෙලා තිබෙන්නේ කවුද, ඒ කෙනාට අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දෙනවා කියන එක පිළිබඳව අපි ඉන්නේ දැඩි ස්ථාවරයකයි. ඒ වාගේම, තව කාරණා කිහිපයක් පිළිබඳව කිව්වා.

දැන් SriLankan Airlines එක පිළිබඳවත් නැවත කොමිසමක් පත් කරනවා, ඒ පිළිබඳව කටයුතු කරපු ආකාරය ගැන සොයා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SriLankan Airlines ආයතනය අපි පවරා ගත්ත මුල් කාලයේ ලාභ ලැබූ ආයතනයක්. ඒ වෙලාවේ Emirates එකත් එක්ක යන කොට අපේ ආණ්ඩුව රුපියල් කෝටි 600 ගණනක් ලාභ ලැබුවා. ඉන් අනතුරුව මේ ආයතනය පවරා ගත්තාට පස්සේ පසුගිය කාලයේ රුපියල් කෝටි 12,500ක් පාඩු ලැබුවා. ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ. ඒ වාගේම, මේ ආණ්ඩුව ආවාමත් යම් යම් සිදුවීම් පිළිබඳව ජනතාව තුළ සැකයක් ඇතිවෙලා තිබෙනවා. එතකොට පසුගිය ආණ්ඩුවේ වෙච්ච දේයි, මේ ආණ්ඩුවේ වෙච්ච දේයි දෙකම පිළිබඳව සොයා බැලීමේ කටයුතු කරන්න අවශ්‍යයි. ඒ පිළිබඳව ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු වෙනවා. එක කණ්ඩායමක් හෝ එක පුද්ගලයෙක් ඉලක්ක කරගෙන නොවෙයි මේ කටයුත්ත කරන්නේ. ඒ වාගේම, මේක නර්තනයකුත් නොවෙයි; රංගනයකුත් නොවෙයි; ජනතාව ඇන්දවීමකුත් නොවෙයි. අපේ රටේ ජනතාව අන්දවන්න බැරිය කියන එක පසුගිය මැතිවරණ ගණනාවකදීම මේ රටේ ජනතාව ඔප්පු කරලා හමාරයි. ඒ නිසා ගන්න තිබෙන තීන්දු ජනතාව ගන්නවා. ඒ වෙනුවෙන් ඔවුන් සියලුම මැතිවරණවලදී තීන්දු කරාවි කුමක් කළ යුතුද කියලා. ඒ වාගේම, මේ කාරණා සම්බන්ධව ගන්න තිබෙන තීන්දුවලට ප්‍රවේශවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒත් එක්කම මම තවත් කාරණයක් කියන්න කැමැතියි. මේ කාරණා සම්බන්ධව කටයුතු කරනකොට වෙනම සන්ධානයක් ගොඩ නැඟෙනවා. ඒ සන්ධානය තමයි, හොරු-හොරු එකතු වෙන සන්ධානය. ඒක තමයි බරපතළම සන්ධානය. මේ කාරණය සම්බන්ධයෙන් අපේ රටට මහා හානිකර සන්ධානයක් දැන් ගොඩනැඟිලා තිබෙනවා. ඔය අලුතින් පිහිටුවා ගත්ත පක්ෂයේ දෙවැනි සාමාජිකයා පසුගිය දිනවල එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල පුද්ගලයෙක් හම්බවෙනවා. අපි ඒ පිළිබඳව ඉදිරියේදී හෙළිදරව් කරනවා. පසුගිය දිනවල බොරැල්ලේදී මුණ ගැසීමක් සිද්ධ වෙනවා. මේ පිළිබඳව අපි ඉදිරියේදී අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරනවා. මොකක්ද මෙතැන කථා වෙන්නේ? මෙතැන කථා වෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා හොරු ඇල්ලීමේ වැඩ පිළිවෙළ දියත් කරනවා;

ඒ වෙනුවෙන් ගන්න තිබෙන තීන්දු ගන්නවා. එතකොට අපි දෙගොල්ලටම වදිනවා. ඒ නිසා ඔහු දුර්වල කරන්න අපි එකතු වෙන්න ඕනෑය කියන සාකච්ඡාවක් තමයි මෙතැන වෙන්නේ. මේකට මේ රටේ ජනතාව එකඟ වෙනවාද? මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව ඒකද? එළියේදී කෑ ගැහුවාට වැඩක් වෙන්නේ නැහැ, වෙනම හමුවෙලා මේ වාගේ සාකච්ඡා තියනවා නම්. ඒ වාගේම, ගම්පහ ප්‍රදේශයේ ඉන්න තව දේශපාලනඥයෙක් -ඒත් එහා පැත්තේම ඉන්න කෙනෙක්- එක්ක තවත් හමුවීමක් සිද්ධ වෙනවා. මෙයට හොඳම නිදර්ශනයක් තමයි, සමහර නඩු. ඒ පැත්තේ ඉන්න සමහර අයගේ නඩු මාස දෙක තුන ඈතට දින දානවා. අපට ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

මහින්දානන්ද මන්ත්‍රීවරයාගේ නඩුව ගැන මම දන්නවා. එතුමා ඊයේත් ඒ ගැන රූපවාහිනී ආයතනයකදී කිව්වා. ඒ නඩුව එක දිගට අහනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ නඩුව අහන්න ඕනෑ. එතුමා වරදක් කළා නම් දඬුවම් දෙන්න ඕනෑ. ඒ පිළිබඳව නොවෙයි ගැටලුව තිබෙන්නේ. හැබැයි, තව සමහර නඩු තිබෙනවා, අවුරුදු ගණන් කල් යන ඒවා. අවුරුදු ගණන් කල් යන නඩු තිබෙනවා. මේවා වෙන්නේ කොහොමද? රූපවාහිනියට ගියාම, රැස්වීමකට ගියාම මෛත්‍රීපාල ජනාධිපතිතුමාටයි ඒ අය බණින්නේ. ඒ අය බණින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. ඒ අය කථා කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව. එහෙම කථා කරන අයගේ නඩු අවුරුදු ගණන් කල් යනවා. අර අනෙක් අයගේ නඩු එක දිගට අහගෙන යනවා; දඬුවම් ලබාදීම් සිද්ධ වෙනවා. මේ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මේ පිළිබඳව අපි කථා කරන්න ඕනෑ. මම හිතන හැටියට ඒ පැත්තේ ඉන්න පිරිසිදු මන්ත්‍රීවරු ඉදිරිපත් වෙන්න ඕනෑ මේවා හොයා බලන්න. එතුමන්ලා මේවා වෙනුවෙන් කථා කරන්න ඕනෑ. [බාධා කිරීමක් ]දෙපැත්තේම ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ඉන්නවා, එක්සත් ජාතික පක්ෂයේත් ඉන්නවා. ඔබතුමන්ලාගේ ඒකාබද්ධ විපක්ෂයේත් ඉන්නවා පිරිසිදුවට දේශපාලනය කරන්න කැමැති අය; වංචාවට, දූෂණයට විරුද්ධ අය. ඒ වාගේම, මේ රට ගොඩ නඟන්නට වුවමනාවක් තිබෙන අයත් ඉන්නවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අවංකව මේ හොරුන්ට, වංචා කරපු අයට විරුද්ධව ක්‍රියාත්මක වෙන්න යන මේ මොහොතේ, බොරුවට මඩ ගහන්නේ නැතිව, එක දේශපාලන කෝණයකින් බලන්නේ නැතිව, ඡන්ද ලැබෙන්නේ කොහොමද කියලා බලන්නේ නැතිව ඒ සියලුදෙනා එකතුවෙලා එතුමාට ඒ හයිය ලබා දෙන්න ඕනෑ; පාර්ලිමේන්තුවේ ශක්තිය ලබා දෙන්නට ඕනෑ; ඒ අවශ්‍ය අණපනත් අපි සම්මත කර දෙන්න ඕනෑ.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, එතුමන්ලා ඒ අණපනත් සම්මත කරන්නට කැමැතියි කියලා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපිත් බලාගෙන ඉන්නවා, අත් දෙකම උස්සලා ඒවා සම්මත කර දෙන්න. අපට අවශ්‍ය නැහැ පුද්ගලයෙක් ඉලක්ක කරගෙන කටයුතු කරන්න. ඒ වාගේම, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම කෙනෙක් ආරක්ෂා කරන්නත් අපට අවශ්‍ය නැහැ; අපේ එහෙම බලාපොරොත්තුවකුත් නැහැ.

මේකෙන් මොකක්ද අපේ පක්ෂයට වෙන හානිය, එසේ නැත්නම් මෙයින් අපේ අයට වෙන හානිය පිළිබඳව කල්පනා කරන්නේ නැතිව අපි අවංක වෙමු, රටට. අපි අවංක වෙමු, ජනතාවට. අපට ඕනෑතරම් මඩ ගහන්න පුළුවන්. හැම කෙනෙකුටම මඩ ගහන්න පුළුවන්. හැබැයි මඩ ගහන දේශපාලනයෙන් ඔබ්බට ගිහින් මේ රටේ වංචාවට දූෂණයට විරුද්ධව අපි පෙළ ගැසෙමු. ඒකට පක්ෂ භේද ඕනෑ නැහැ. සියලු පක්ෂ භේද අමතර කරලා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න, හොරකමට දූෂණයට වංචාවට විරුද්ධ කණ්ඩායම් එකතු වෙලා ඒ සටන ආරම්භ කරමු. ඒ සඳහා එන බාධක, ඒ සඳහා එන විවිධ අභියෝග ජය ගන්න අපි එකතු වෙමු. ඒකයි මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව.

මම තව එක කාරණයක් කියලා මගේ කථාව අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ජනාධිපතිතුමා ගත් මේ තීන්දු, මේ රජය ගත් තීන්දු නිසා අනාගතයේදී මේ රටේ බලයට පත් වන කිසිම රාජ්‍ය නායකයෙක්, කිසිම ආණ්ඩුවක් එක වරක් දෙවරක් නොවෙයි, සත් වරක් සිතාවත් වංචාවක් දූෂණයක් කරන්න භය වෙනවා. අද ඒ තරමට වංචාවට දූෂණයට විරුද්ධව ජනතා පෙළ ගැස්මක් ඇතිවෙලා තිබෙනවා. ඒවා ගැන රටේ හෙළිදරව් වෙනවා. ඒ වාගේම ඒවා වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වෙනවා. අධිකරණ පද්ධතියත් ඒ වෙනුවෙන් කැප වෙනවා. ඒ පිළිබඳව අපට තිබෙන්නේ ඉමහත් ආඩම්බරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.35]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ සිදුවූවායැයි සඳහන්වන සියලු වංචා තරාදියක එක පැත්තකටත්, මහ බැංකු බැඳුම්කර වංචාව විසින් සිදු කරන ලද අලාභය තරාදියේ අනෙක් පැත්තටත් දැම්මොත් ඔබතුමා දන්නවා, මේ බැඳුම්කර වංචාවෙන් වෙච්ච බලපෑමේ බර විශාල වශයෙන් වැඩි බව. මේක සැලසුම් සහගත හොරකමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය සැලසුම් සහගත හොරකමක් බව කියන්න අද වන විට ඕනෑ තරම් කරුණු අනාවරණ වෙලා තිබෙනවා. ඒ සැලසුම් සහගත හොරකම විසින් මේ රටේ ආර්ථිකය හිරිවට්ටලා තිබෙනවා. බැංකු පොලී අනුපාතය ඉහළ අගයකට ගෙන ගිහින් තිබෙනවා. බැංකු පොලී අනුපාතය ඉහළ අගයකට ගෙන යෑම විසින් මිනිසුන් බැංකුවලින් ණය අරගෙන වියදම් කරන, ආයෝජනය කරන, එහෙම නැත්නම් තමන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මුදල් යොදවාගන්නා ප්‍රවණතාව බිඳ වැටිලා තිබෙනවා. සල්ලි තිබෙන මිනිහා බැංකුවට සල්ලි දමලා ඒ සඳහා ලැබෙන අධික පොලියෙන් ජීවත් වෙන්න පුරුදු වෙලා තිබෙනවා. ඒ අනුව බැංකු ලාභ ලබනවා. මහජනයා අතේ තිබෙන සල්ලි බැංකුවල තිබෙන්නේ. රටේ මුදල් සංසරණය හීන වෙලා තිබෙනවා. ඒ නිසා ව්‍යාපාරිකයා කියනවා,"මිනිසුන් අතේ සල්ලි නැහැ, බිස්නස් නැහැ" කියලා. සමස්ත ආර්ථික දේහයටම බලපෑ ප්‍රමුඛතම, බරපතළම හොරකම ගැනයි අද අපි මේ සාකච්ඡා කරන්නේ.

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වෙච්ච හොරකම් ගැන කෙනෙක් කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැන හොරකමක් වෙලා තිබෙනවා නම්, ඒකේ බලපෑම තිබෙන්නේ ඒ සමාගමේ සීමාවට පමණයි. නමුත් මේ කාරණය එහෙම නොවෙයි. මේක සමස්ත ආර්ථික දේහයටම බලපෑවා; සාමාන්‍ය ජන ජීවිතයට බලපෑවා. මේක මිනිසුන්ගේ අගහිඟකම් වැඩිවෙන්න හේතු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න යන මේ කාරණය ගැන ඔබතුමාත් දන්නවා. මේක මම නොවෙයි කියන්නේ. ඉන්දියානු හමුදාවේ ජනරාල් කල්කට් කියන නිලධාරියා ලංකාවේ යුද්ධය ගැන පොතක් ප්‍රකාශයට පත් කළා. ඒ පොතේ ඔහු කියනවා, ශ්‍රී ලංකාව යුද්ධය සඳහා අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් වියදම් කළා කියලා. ඇමෙරිකන් ඩොලර් බිලියන 6ක්! මේක සුළුපටු ගණනක් නොවෙයි. ඒ අතරම ඔහු ඒ පොතේ සඳහන් කරනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා අවුරුද්දකට ඩොලර් බිලියන 6ක්වූ ඒ වියදම නැති කරගත්ත නිසා තමයි ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යද්දී, ලෝක ආර්ථිකය කඩා වැටෙද්දී ශ්‍රී ලංකා ආර්ථිකය දක්ෂ ලෙස හසුරුවාගන්න සමත් වුණේ; එතුමාට ආර්ථිකය කළමනාකරණය කරගන්න පුළුවන් වුණේ කියලා. අපි නොවෙයි එහෙම කියන්නේ. ජනරාල් කල්කට් මහත්මයා ලියපු පොතේ තමයි එහෙම සඳහන් වන්නේ.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතුමන්ලාට බලය ලැබෙන කොට යූඑස් ඩොලර් බිලියන 6ක් වියදම් කරන්න ඕනෑ වුණේ නැහැ. මොකද, ඒ වනවිට යුද්ධය අවසාන නිසා. ඒ නිසා ඒ ගණන ඉතුරුයි. ඒ වාගේම, ලෝක වෙළෙඳ පොළේ ඩොලර් එකසිය ගණනට නැඟලා තිබුණු තෙල් බැරලය ඩොලර් 27, 30 දක්වා පහළ බැස තිබුණා. ඒ නිසා තෙල්වලට ඒ අසීමිත විදේශ විනිමය ගලායෑමත් නතර වුණා. ඒ ඔක්කොම පහසුකම් ලැබිලාත් ඇයි මේ ආර්ථිකය මේ විධියේ කඩා වැටීමකට ලක් වුණේ? ඇයි සියයට 3.7ක වර්ධන වේගයක් ඇති වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට ප්‍රමුඛතම හේතුව මේ මහ බැංකු බැඳුම්කර හොරකමයි. මේ බැඳුම්කර හොරකම වුණේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා හොරු ඇල්ලීමේ කමිටුවේ, ජාතික විධායක සභාවේ සාමාජිකයකු හැටියට ප්‍රමුඛ කාර්යයක් කරමින් සිටින වෙලාවෙයි. "රාජපක්ෂලා හොරු" කියාගෙන ආපු කට්ටිය තමයි මේ හොරකම කළේ. අද වන විට මේ ආණ්ඩුවට අවුරුදු තුනක් ගත වෙලා තිබෙනවා. තිබුණු ආණ්ඩුවට විරුද්ධව කොමිෂන් සභා වාර්තාවක තිබෙන මොකක් හෝ නිර්දේශයක් ගැන කියනවා ඇරෙන්න, හැම දාම කියපු බොරු ටික කියනවා ඇරෙන්න, අවුරුදු තුනක් ඇතුළත තමුන්නාන්සේලා කියපු කිසි චෝදනාවක් ඔප්පු කර පෙන්වා නැහැ. තමුන්නාන්සේලාගේ අතේයි බලය තිබෙන්නේ; තමුන්නාන්සේලාගේ අතේයි ආණ්ඩුව තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනික් කොමිෂන් සභා වාර්තාවේ තිබෙන්නේ අවභාවිත පිළිබඳ බොහෝ උදාහරණ.

[ගරු විමල් වීරවංශ මහතා]

ඒකයි මේකයි සමාන කරලා, සංසන්දනය කරලා බැඳුම්කර හොරකමින් වුණු බලපෑම සුළු කොට තකන්න හදනවා නම්, ඒ තරම් තක්කඩිකමක් තවත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ හොරකම වුණේ කොහොමද? මේක නිකම් වුණු හොරකමක්ද? බලය අරගෙන දවස් 20කදී වුණු හොරකමක් මේක. මේ හොරකම නිකම් වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳටම දන්නවා මේ හොරකම වෙන්නේ ඉතාම සැලසුම් සහගතව බව. මලික් සමරවික්‍රම මැතිතුමා අද අමාත්‍යවරයෙක්. එතුමා එක්සත් ජාතික පක්ෂයේ සභාපති. උපනායක රවි කරුණානායක -එතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා- ලේකම් කබීර් හාෂිම් කියන අය හදිසි මුදල් අවශ්‍යතාවක් පිළිබඳව මහ බැංකුවේ අධිපතිවරයා සමඟ සාකච්ඡා කරන්න මහ බැංකුවට ගියා. මේවා මම කියන දේවල් නොවෙයි, කොමිසමේ පරීක්ෂණවලදී අනාවරණ වූ දේවල්. ඇයි එහෙම සාකච්ඡාවකට යන්නේ? මොන ආණ්ඩුවක් මේ රටේ බලයට ආවත් එහෙම කරන්න ඕනෑ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ සභාපති මහ බැංකු අධිපතිට උපදෙස් දෙන්න යන්න ඕනෑ නැහැ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, එවකට මුදල් ඇමති හැටියට තමුන්නාන්සේ එතැනට ගිය එකේ යම්කිසි තර්කයක් තිබෙනවා කියමු. හැබැයි තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ නොවෙයි මහ බැංකුව ගැසට් කළේ. ඉතිහාසයේ හැම දාම මහ බැංකුව ගැසට් කළේ මුදල් අමාත්‍යාංශය යටතේ. ඇයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට අග්‍රාමාත්‍යවරයාට අයත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු කියන අමාත්‍යාංශය යටතේ මහ බැංකුව ගැසට් කර ගත්තේ? මොකක්ද, ඒකේ රහස? මොකක්ද, ඒකට හේතුව? ඒ ගැසට් නිවේදනයෙන් හැමදාම මුදල් අමාත්‍යාංශය යටතේ තිබුණු මහ බැංකුව අගමැතිවරයා යටතට ගෙනාවේ මේ හොරකමේ, සැලසුමේ මූලාරම්භක පියවර ලෙසයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කරනවා, මම බලාගෙන සිටියා. එතුමා මේ කරුණු මොකුත් කියන්නේ නැහැ. පසු ගිය ආණ්ඩුවේ සිල් රෙද්දක් ගැන හරි මොකක් හරි ගැන ටිකක් උස්සලා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හේතුව මේකෙන්ම පැහැදිලියි. මහ බැංකුව තමන් යටතේ ගැසට් කර ගත්තා. පක්ෂ සභාපති මලික් සමරවික්‍රම, ලේකම් කබීර් හාෂිම්, උප නායක රවි කරුණානායක, - මට මතක හැටියට එතුමා ඒ වෙලාවේ මුදල් ඇමති වෙන්න පුළුවන්. - ගිහිල්ලා මහ බැංකු අධිපතිත් එක්ක සාකච්ඡා කළා. ඊළඟට, මෙතෙක් කලක් මහ බැංකුව බැඳුම්කර නිකුත් කළ ක්‍රමවේදය වෙනස් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුවෙන් පොලී අනුපාතය සියයට 1ක වෙනසක් වුණොත් ඒකෙන් වන බලපෑම බිලියන 40කට වඩා වැඩියි. ඒ කියන්නේ මත්තල ගුවන් තොටුපොළ වාගේ ඒවා කීයක් හදන්න පුළුවන්ද? හම්බන්තොට වරාය වාගේ වරායවල් කීයක් හදන්න පුළුවන්ද? අධිවේගී මාර්ග කීයක් හදන්න පුළුවන්ද? ඒ නිසා පොලී අනුපාතය සියයට 1ක් නොවෙයි වෙනස් වුණේ. සියයට 1කින් නොවෙයි වෙනස් වුණේ. සියයට 1ක වෙනසේ බලපෑම බිලියන 40කට වැඩියි. එතකොට මේක වෙන්නේ කොහොමද? අග්‍රාමාත්‍යවරයා යටතේ ගැසට් වෙනවා. පක්ෂයේ සභාපති, ලේකම්, උප නායකලා ගිහින් මහ බැංකු අධිපතිට උපදෙස් දෙනවා. ඊට පස්සේ ඒ උපදෙස් අනුව මහ බැංකු අධිපති එතෙක් කල් බැඳුම්කර නිකුත් කළ ක්‍රමවේදය වෙනස් කරනවා. ඊට පස්සේ බැඳුම්කර වෙන්දේසියේදී පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අධික පොලියට මුදල් දෙන්න රුපියල් බිලියන 10ක් ලංකා බැංකුව එක මොහොතින් ලබා දෙනවා; තත්පරයෙන් ලබා දෙනවා. එහෙම වගකිව යුතු ක්‍රමවේදයකින් තොරව පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට රුපියල් බිලියන 10ක් දෙන්න ලංකා බැංකුවට පුළුවන්කමක් නැහැ. දෙන්නේ කොහොමද? මුදල් ඇමතිතුමා හැටියට එතුමා දන්නවා ඇති, දීපු ක්‍රමය. රවි කරුණානායක හිටපු ඇමතිතුමා දන්නවා ඇති, දීපු ක්‍රමය. ඒ විධියට රුපියල් බිලියන 10ක් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට දෙනවා. මේක තමයි සැලැස්ම. මේක සැලසුම් සහගතවයි සිදු වුණේ.

ඒ විතරක් නොවෙයි, විදේශ පුරවැසියෙක් වුණු අර්ජුන මහේන්ද්‍රන්ව මහ බැංකු අධිපති කළේ මොකටද? ඔහු විදේශ පුරවැසියෙක්. මේ රට වෙනුවෙන් වැඩ කරනවාය කියලා දිවුරුම් දුන්නේ නැහැ. තමන්ගේ ගජ මිත්‍රයා; අගමැතිතුමාගේ ගජ මිත්‍රයා. 2015 ජනවාරි 08 වැනිදා සිදුවුණු බල පෙරළියට එදා තිබුණු ආණ්ඩුවෙන් පැනපු කට්ටිය සිංගප්පූරුවට ගිහිල්ලා අර්ජුන මහේන්ද්‍රන්ගේ ගෙදර තමයි සාකච්ඡා කළේ. මුදල් හුවමාරු වුණේ ඒ ගෙදරදීයි. ඒ නිසා අර්ජුන මහේන්ද්‍රන් කියන්නේ එදා ඇති වුණු බල පෙරළියටත් තිරය පිටුපස ඉඳගෙන සල්ලි පොම්ප කරපු කෙනෙක්. ඊට පස්සේ අර්ජුන මහේන්ද්‍රන් කියන විදේශිකයාව ගෙනැල්ලා මහ බැංකුවේ අධිපති කළා. තමන්ගේ ගජ මිතුරාව මහ බැංකුවේ අධිපති කළා; අගමැතිතුමාගේ ගජ මිතුරාව මහ බැංකුවේ අධිපති කළා. ඒ විතරක් නොවෙයි, මේ නව ක්‍රමවේදය හඳුන්වා දුන්නා. නව ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න අගමැතිතුමා නියෝග කළාය කිව්වා. නව ක්‍රමවේදය නිසා තමයි පොලී අනුපාතය කෘත්‍රිම ලෙස ඉහළ දමලා, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අධික ලාභයක් ලබා ගන්න පුළුවන් වුණේ. පැරණි ක්‍රමවේදයට ගියා නම් මේ හොරකම කරන්න බැහැ. පැරණි ක්‍රමවේදයට ගියා නම් මේ අලාභය කරන්න බැහැ. පැරණි ක්‍රමවේදයට ඒක කරන්න බැරි නිසා තමයි හොරකමට හරියන අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දුන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මේ හොරකම ගැන කාරණා මතු වුණා. දැන් බලාගෙන ගියාම මහින්ද අමරවීර ඇමතිතුමා තමයි මේ හොරකම ගැන මුලින්ම අනාවරණය කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළාට කිසි පරීක්ෂණයක් වුණේ නැහැ. මොකක්වත් වුණේ නැහැ. අඩු ගණනේ ඇයි මේ පරීක්ෂණ නොකරන්නේ කියලා අහන්නවත් එතුමා නැවත ගියේ නැහැ. අද කොමිෂන් සභා වාර්තාව ගැන කථා කරන නිසා එතුමා මෙතැනට ඇවිල්ලා වීර කථාවක් කරලා ගියා. මම කියන්නේ මේකයි. ඊට පස්සේ රටේ විරෝධය ආවා, මේ තොරතුරු හෙළි වුණා. මහජන විරෝධය එන කොට අගමැතිතුමා මොකක්ද කළේ? එක්සත් ජාතික පක්ෂයට හිතවත් නීතිඥයෝ තුන් දෙනෙක් දමලා "පිටිපන කමිටුව" කියලා කමිටුවක් හැදුවා. "මෙතැන යම් කිසි දෝෂයක් සිදු වී ඇත" කියලා පිටිපන කමිටුවෙන් දුන්නා, බොහොම සුළුකොට තකන වාර්තාවක්. අග්‍රාමාත්‍යතුමා 2015 මාර්තු 17වැනිදා අර්ජුන මහේන්ද්‍රන් ආරක්ෂා කරමින් මේ සභාව තුළ කථා කළා. අනුන්ට දොස් පවරමින් කථා කළා. අර්ජුන මහේන්ද්‍රන් ගැන වගකීම තමන් ගන්නවාය කිව්වා. අර්ජුන මහේන්ද්‍රන් දක්ෂ කළමනාකරුවෙක් කියලා කිව්වා. ඊළඟට, ඩිව් ගුණසේකර මැතිතුමා කෝප් කමිටුවෙන් මේ පිළිබඳව විමර්ශන වාර්තාවක් සකස් කළා. ඩිව් ගුණසේකර මැතිතුමා කෝප් කමිටු වාර්තාව සකස් කරලා එළිදක්වන්න දවසක් තිබෙද්දී පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ කෝප් කමිටු වාර්තාවට අත්සන් කරන්න කියලා එදා කෝප් කමිටුවේ හිටපු සභාපති ඩිව් ගුණසේකර මැතිතුමා එදා කෝප් කමිටුවේ සාමාජිකයකු වුණු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටියාම, එතුමා කෑගල්ලේ රැස්වීමකට යන්න තිබෙනවාය කියලා ඒකට අත්සන් තබන එකෙන් කොහොම හරි සීරු මාරුවට ඇත් වුණා.

මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා. සිදු වුණු දේයි මම මේ කියන්නේ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඒ වේලාවේ කෝප් එකේ සාමාජිකයෙක්. ඩිව් ගුණසේකර මහත්මයාගේ "කෝප්" වාර්තාව එළියට එන්න දවසකට කලින් පාර්ලිමේන්තුව විසුරුවා හැරලා රටේ ජනාධිපතිවරයා ඒ "කෝප්" වාර්තාව එළියට එන එක වැළැක්වූවේ නැත්නම්, මේ තොරතුරු මීට කලින් අනාවරණය වෙලා දෙවැනි, තෙවැනි වතාවටත් බැඳුම්කරවලින් සිදු කරපු මහා පරිමාණ හොරකම් නතර කරන්න තිබුණා. හොරකම නතර කරන්න සැබෑ වුවමනාවක් තිබුණා නම්, එදා පාර්ලිමේන්තුව විසුරුවා හරින්නේ නැහැ. ඒ වාර්තාව එළි දැක්වූවාට පස්සේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්න තිබුණා. නමුත්, එම වාර්තාවෙන් මේ හොරකමේ දිග පළල, බරපතළකම, විමර්ශනයේ කරුණු හරි හැටි අනාවරණය වුණු නිසා තමයි වාර්තාව එළියට එන්න කලින් පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ. එමඟින් මේ හොරකම නිසි මොහොතේ දී අනාවරණයකොට, එය වළක්වාලීමට ගත යුතු පියවර නොගෙන ඒක ආරක්ෂා කරන්න, රටේ ජනාධිපතිවරයාත් පියවර ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි මේ වන විට මේ ප්‍රශ්නය ඉතා බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ඩිව් ගුණසේකර මහත්මයාගේ කෝප් වාර්තාව ප්‍රසිද්ධියේ සාකච්ඡා කිරීම වළක්වන්න සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අධිකරණයට ගිහින් වාරණ නියෝගයක් ඉල්ලුවා. එම "කෝප්" වාර්තාව පිළිබඳව ප්‍රසිද්ධියේ සාකච්ඡා කරන එක වළක්වන්න වාරණ නියෝගයක් ඉල්ලුවා. ඒ විතරක් නොවෙයි, බැඳුම්කර වංචාව සුද්ධ කරමින් සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා පොතකුත් ලිව්වා. බැඳුම්කර වාර්තාව සුද්ධ කරමින් ඒ ගැන පොතකුත් ලිව්වා. එහෙම හොරකමක් සිදු වෙලා නැහැ කියලා කිව්වා. ඒ පොත ලිව්ව නිසාම, ඊළඟ පාර්ලිමේන්තු වාරය ආරම්භ වෙලා, අලුත් "කෝප්" එක පත්වෙලා මේ ගැන විමර්ශනය ආරම්භ වුණාට පසුව එහි හිටපු යූඇන්පී මන්ත්‍රීවරයකු ඉල්ලා අස්කරවලා සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාව "කෝප්" එකේ සාමාජිකයකු හැටියට පත් කළා. අර සුදුසුකම නිසා. මේ සල්ලි හතර අතට විසිදුණා. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම අධික ලාභ සෙව්වා. ඒකෙන් විශාල ධනයක් විශාල පිරිසක් අතරේ බෙදී ගියා. එම නිසා හැමෝම මේ හොරකම ආරක්ෂා කරන්න එකතු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් දන්නවා ඇති, අර්ජුන මහේන්ද්‍රන් මහත්මයාව දෙවැනි වතාවට මහ බැංකු අධිපති තනතුරට පත් කිරීමෙන් වැළැකුණාට පසුව, අග්‍රාමාත්‍යතුමා එතුමාගේ අමාත්‍යාංශයේ විශේෂ උපදේශකයකු හැටියට, රැකියා දසලක්ෂයේ ව්‍යාපෘතියේ උපදේශකයා හැටියට අර්ජුන මහේන්ද්‍රන් මහත්මයාව තියාගෙන සිටි බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සියලු දෙයින් පෙනෙනවා මෙය තවත් කොහේ හෝ සිදු වුණු හොරකමක් පෙන්වලා වහන්න පුළුවන් කථාවක් නොවෙයි කියලා. පසුගිය ආණ්ඩුවේ හොරකම් තිබුණා නම්, තමුන්නාන්සේලාට බලය තිබෙනවා නීත්‍යානුකූල ක්‍රියා පටිපාටියට අනුව ඒවා ගැන හොයන්න; හොයලා ඔප්පු කරලා පෙන්වන්න; වැරැදි කරලා තිබෙනවා නම් නීතියේ ක්‍රමවේදයට අනුව දඬුවම් කරන්න. ඒකට තමුන්නාන්සේලාට අයිතිය තිබෙනවා; බලය තිබෙනවා. ඒක වළක්වන්න අපට පුළුවන්කමක් නැහැ. ඒක කරන්න. හැබැයි, ඒවා ගැන කියමින්, කථා කරමින්, ඒවා පතුරු ගහමින් ඒවා මේ මහා පරිමාණ හොරකම වහන සළුව බවට පත් කර ගන්න තමුන්නාන්සේලා අද කටයුතු කරනවා. ඒකයි තිබෙන තක්කඩිකම. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා කොහොමත් දන්නවා, මේ හොරකමේ දිග පළල කොහොමද කියලා. 2015 ජූනි මාසයේ 03වැනි දින තමයි මහ බැංකු අධිපති ලෙස අර්ජුන මහේන්ද්‍රන් පත් කරන එකට විරෝධය පාලා ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායම් නායකතුමා; දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ගරු සභාවේ කථා කළේ. 2015 ජූනි මාසයේ 3වැනි දින.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන විරෝධයත් එක්ක ජනාධිපතිවරයාට සිදුවුණා, මේ ගැන කොමිසමක් පත් කරන්න. කොප් එකේ වාර්තාව ආවා. ජනාධිපතිවරයාට කොමිසමක් පත් කරන්න සිදු වුණා. "කෝප්" එකෙනුත් මේකේ මහ මොළකරු කවුද කියලා හැඳින්වූවේ නැහැ. කොමිෂන් වාර්තාවෙනුත් මේකේ මහ මොළකරු කවුද කියලා හඳුන්වන්නේ නැහැ. රවි කරුණානායක මැතිතුමා පිටින් මේ ඔක්කොම පව් ටික යවලා මහ මොළකරුවෝ අත සෝදා ගන්න උත්සාහ දරන බවක් තමයි දැන් අපට නම් පෙනෙන්නේ. එහෙම හිතනකොට එතුමා ගැන දුකකුත් ඇති වෙනවා, අම්මපා!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක සැලසුම් සහගත සොරකමක්. මේක සැලසුම් සහගත හොරකමක්. මේක සිද්ධ කළේ සැලසුමකට අනුවයි. මලික් සමරවික්‍රම, කබීර් හාෂිම්, රවි කරුණානායක යන අමාත්‍යවරුන් මහ බැංකුවට ගිහින් මහ බැංකු අධිපති එක්ක කථා කළේ ඒක ගැන. මහ බැංකු අධිපතිව ගෙනාවේ ඒකටයි. ඒකෙන් මේ රටේ ආර්ථිකයට හෙන ගැහුවා වාගේ වුණා. මේ හොරකමින් ඇති වුණු පාඩුවේ බලපෑම ගැන තමුන්නාන්සේ දන්නවා. මේ අවභාවිත වූ මුදල් ඉතුරු කර ගන්න ලැබුණා නම්, මේ රටේ එක පවුලකට කාර් රථය බැගින් දෙන්න පුළුවන්කම ලැබෙනවා. මේ රටේ එක පවුලකට කාර් රථය බැගින් දෙන්න පුළුවන්. ඒ තරම් අතිවිශාල ධනයක් මේකෙන් ගසා කාලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් ඇති වුණු බලපෑම අති විශාලයි. රුපියල අවප්‍රමාණ වෙන්න මේක බලපෑවේ නැද්ද? මූල්‍ය වෙළෙඳ පොළ ගැන සැක සංකා මතු වුණේ නැද්ද? කොටස් වෙළෙඳ පොළේ මුදල් ආයෝජනය කරපු විදේශ ආයෝජකයෝ දමලා යන්න පටන් ගත්තේ නැද්ද? ඩොලර් හිඟයක් ඇති වුණේ නැද්ද? එමඟින් රුපියල අවප්‍රමාණ වුණේ නැද්ද? එමඟින් විදේශ රටවලින් ගෙනෙන භාණ්ඩවල මිල ඉහළ ගියේ නැද්ද?

මුළු මහත් ආර්ථිකයම කඩා වැටීමට මේ හොරකම ප්‍රධාන බලපෑම් ඇති කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේක වෙනත් හොරකම් එක්ක සංසන්දනය කරලා මේ මහා පාපයෙන් ගැලවෙන්න තමුන්නාන්සේලාට බැහැ. බැඳුම්කර හොරකමේ සල්ලි තමයි අද රූපවාහිනී නාලිකාවල එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක දැන්වීම් හැටියට යන්නේ. රූපවාහිනී නාලිකාවල දැන්වීම් පුරවාගෙන ප්‍රචාරක කටයුතු කරන්නේ බැඳුම්කර හොරකමෙන් උපයන ලද සල්ලිවලින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හොරකම මේ රටේ ජන ජීවිතය කඩා වැට්ටුවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල අහිංසක දරුවෙක් බඩගින්න ඉවසා ගන්න බැරිකමට කෝවක්කා ගෙඩියක් කෑවා. කෝවක්කා ගෙඩිය කාලා, ඇඟේ සීනි මට්ටම නැති වෙලා එම දරුවා මියැදෙනවා. අද මේ රටේ ගම්බද දරුවන්ට කෝවක්කා ගෙඩි කාලා මැරෙන්න සිද්ධ වෙලා තිබෙනවා. කිලිනොච්චියේ, අම්මා කෙනෙක් ණය ගෙවා ගන්න බැරුව අයිස්ක්‍රීම්වලට වස දමා දරුවන්ටත් කවලා, අම්මාත් කාලා දරුවොත් එක්ක මැරෙනවා; තාත්තා වෙනම මැරෙනවා. දැන් තමුන්නාන්සේලා අර්ජුන ඇලෝසියස්වයි, තව පලිසේනද, කවුද සේන කෙනෙකුයි අත් අඩංගුවට අරගෙන තිබෙනවා. අත් අඩංගුවට අරගෙන ඔන්න සජීවී එක රූපවාහිනී නාලිකාවක මේක පෙන්වාගෙන යනවා. අත් අඩංගුවට ගත්තා. 10 වැනිදාට මෙහා තමුන්නාන්සේලා මෙහෙම දෙයක් කරලා පෙන්වන්න ඕනෑ. එහෙම නොකළොත් පටි රෝල් කියලා සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දීලා තිබෙනවා. ජනාධිපතිවරයාගේ

[ගරු විමල් වීරවංශ මහතා]

පැවැත්ම ආරක්ෂා කර ගන්නත්, එක්සත් ජාතික පාක්ෂිකයා ඡන්ද පොළට ගෙනෙන්නත් මේ මහා හොරකටම එරෙහිව පියවර ගත් බව පෙන්වන්න තමුන්නාන්සේලාට සිද්ධ වෙලා තිබෙනවා. මට ආරංචි විධියට නම් රවි කරුණානායක මන්ත්‍රීතුමාගෙනුත් අහලා තිබෙනවා, "ටික දවසකට රිමාන්ඩ් එකේ ඉඳලා 10 වැනිදායින් පසුව එන්න පුළුවන්. කැමැතිද?" කියලා. මා දන්නා විධියට ඔබතුමා "අකමැතියි" කිව්වා. "ඇමතිකමත් අත හැරියා. මට ඊට වඩා නම් කැප වෙන්න බැහැ" කියලා ඔබතුමා කිව්වා කියලයි මට ආරංචි. බැලුවේ, ඔබතුමාවත් පටලවා දමන්නයි. මේක ඇත්ත කථාව. මහ මොළකරුවාව මේකේදී ඉලක්ක කරන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා මේ ගරු සභාවේදී කථා කළා, මහ මොළකරුගේ මේකට තිබෙන සම්බන්ධය ගැන වචනයක් කිව්වේ නැහැ. මේ අග්‍රාමාත්‍යවරයා තමන්ගේ බලය මේ හොරකම සඳහා පාවිච්චි කරපු විධිය කොහේවත් සඳහන් කළේ නැහැ. කොමිෂන් සභා වාර්තාවේත් කියලා නැහැ. ඇච්චෝ-පැච්චෝ ටික නිකම් හිරේ දමලා තමුන්නාන්සේලාට අත සෝදා ගන්න බැහැ. ඇච්චෝ-පැච්චෝ හිරේ දමා අත සෝදා ගන්න බැහැ. මේ රටේ දරුවන්ට කෝවක්කා ගෙඩි කාලා මැරෙන්න වුණේ මේ හොරකමින් මේ රටේ ආර්ථිකය වට්ටපු හින්දායි. දරුවන්ට කෝවක්කා ගෙඩි කාලා මැරෙන්න වෙලා තිබෙන්නේ මේ හොරකමින් මේ රටේ ආර්ථිකය වට්ටපු හින්දායි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි එකහමාරක, දෙකක පමණ කාලයක් තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ගණනේ මට තව විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව විතරක් නොවෙයි, මෙතැනින් එහාට වෙන්නේ මොකක්ද? මේකේ මහ මොළකරු ප්‍රකාශයක් දෙන්න කොමිෂන් සභාවට යන කොට, එදාට ප්‍රශ්න කරන්න නීතිපතිතුමා යනවා. එතැන හිටපු අනෙක් සොලිසිටර් ජනරාල්ලා -යසන්ත කෝදාගොඩලා, දප්පුල ද ලිවේරලා- නැහැ. දැන් ඒ ගොල්ලන් මේ ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන් අයින් කරලා. නීතිපති දෙපාර්තමේන්තුවේ එම එඩිතර නිලධාරින් මේකෙන් එළියට දමලා. ඒ වෙනුවට එන්නේ නීතිපතිතුමා. නීතිපතිතුමා පත් කරන්නේ ජනාධිපතිතුමා. ඉතින් නීතිපතිතුමා බොහොම අහිංසක විධියට එක ප්‍රශ්නයක්, දෙකක් අහලා, 'බයනැති-අගමැති'ව එළියට එවනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වගකිව යුත්තා කවුද කියලා කථා නොකර, එහෙන් මෙහෙන් ඇච්චෝ-පැච්චෝ ටිකක් අල්ලා හිර කූඩුවේ දමා හරියන්නේ නැහැ. පර්පචුවෙල් ට්‍රෙෂරීස්වලට ගත් අධික ලාභය ගියේ කාගේ අතටද, ඒක පසුගිය මහ මැතිවරණයේදී මොන-මොන අපේක්ෂකයන්ටද බෙදුවේ, අගමැති ගාව කීයක් තිබෙනවාද, එම සල්ලි බෙදා ගත් අනෙක් ඇමතිලා කවුද? ගෙවල් අරගෙන දීලා, ඒවා හෙළි වී තිබෙනවා. ඒවාට විරුද්ධව නීතිමය පියවර කෝ? වාහන අවභාවිත කළාය කියලා තමුන්නාන්සේලා මාව මාස තුනක් හිරේ දමා ගෙන හිටියා. දැන් ඔය කියන මහා පරිමාණ හොරකමේ වගකිව යුතු කිසිවෙකුට දඬුවමක් නැහැ. කාටද තමුන්නාන්සේලා නීතිය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ? පලිසේනයි, පර්පචුවෙල් ට්‍රෙෂරීස්කාරයායි, ඇච්චෝ-පැච්චෝයි දමලා හරි යන්නේ නැහැ. ලජ්ජාවක්, බයක් තිබෙනවා නම් මේකේ මහ මොළකරුගේ සිට තනතුරුවලින් ඉල්ලා අස් වෙන්න ඕනෑ. බය නැත්නම් මේ රටේ නීතියට, අධිකරණමය ක්‍රියාමාර්ගයට ඉදිරිපත් වෙන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මලික් සමරවික්‍රම මහත්මයා, පක්ෂයේ සභාපති හැටියට තමුන්නාන්සේට මහ බැංකු අධිපති හම්බ වෙන්න යන්න අයිතියක් නැහැ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I rise to a point of Order.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මගේ වෙලාව ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මලික් සමරවික්‍රම මැතිතුමා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I was summoned by the Bond Commission as a witness. I gave evidence. The Commission very clearly said that there was no discussion about issuing a Bond at that meeting.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
බොරු කියන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වෙලාව ලබා දෙන්න.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නිකම් බොරුවට කෑ ගහන්න එපා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට මේවා දීලා විපක්ෂ සංවිධායකයා ආම්බාන් කර ගන්න පුළුවන් වුණාට, - [බාධා කිරීමක්] -අපිව ආම්බාන් කර ගන්න බැහැ. මේවා දීලා විපක්ෂ සංවිධායකයාව ඔබතුමාට

ආම්බාන් කර ගන්න පුළුවන්. ඔබතුමාගේ නමවත් එතුමා කියන්නේ නැහැ.

එතුමා ඔබතුමාගේ නමවත් කියන්නේ නැහැ. අපි නම කිව්වාම ඔච්චර කිපෙන්න එපා. එතුමාව ආම්බාන් කර ගත්තාට මේවා දීලා අපව ආම්බාන් කරගන්න බැහැ. [බාධා කිරීමක්] දන්නවා නම් නීතිය මාර්ගයෙන් යන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි අල ගිය, මුල ගිය, වැල ගිය තැන් එළිවෙලා ඉවරයි. බොරු කරන්න අයිතියක් නැහැ. "Footnote" කල්ලිය ඉන්නවා. "Footnote" කල්ලිය ගිහින් සල්ලිවලට නොවෙයිද footnotes දැම්මේ; COPE එකේ රැස්වීමේදී කලබල කළේ? ඊයේ රූපවාහිනී සංවාදයකදී COPE එකේ සභාපති හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා පිළිගත්තා කථානායකතුමා මහ බැංකු අධිපති COPE එකට ගෙන එන්න එපා කියා ඉල්ලීම කළ බව. ඒවා පිළිගත්තා. ඕනෑ නම් එතුමාගෙන් අහන්න. මේ හැමෝම මේ හොරකම වහන්නයි හැදුවේ. නමුත් වහන්න බැරි වුණා. තමුන්නාන්සේලා පටන් ගත්තේ ඉංග්‍රීසියෙන් හොරකම් කරන්නයි. මහ බැංකු බැඳුම්කරය හොරකම් කළාම මිනිසුන්ට තේරෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේක ඉංග්‍රීසියෙන් කරපු හොරකමක්. මේකෙන් මේ රටේ ආර්ථිකය පතුලටම වැටුණා. මේ රටේ දරුවන් කෝවක්කා ගෙඩි කාලා මැරෙන තත්ත්වයට පත් කළා. ඒ නිසා මේ හොරකම කරපු අයට එරෙහිව නීතිය නිවැරදිව ක්‍රියාවට නංවන්න. ඇච්චෝ-පැච්චෝ හිරේ දාලා "ඉන්න අපි වැඩේ දුන්නා" කියලා තමුන්නාන්සේලා සිහිනි ආතල් ගන්න ගියාට මේ රටේ ජනතාව ඒකට රැවටෙන්නේ නැහැ කියන එක අපි අවධාරණය කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා. එතුමාගේ කතාවට කලින් කිව යුතු දෙයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන කොට ඒ අය මෙහි නැත්නම් ඒ අයට කතා කරන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන කොට ඒ කොටස් හැන්සාඩ් වාර්තාවලින් ඉවත් කරන්න වෙනවා. ඒ වාගේම සාධාරණ අවස්ථාවක් දෙන්නත් පුළුවන්, ඒ අයට නැවත ඇවිල්ලා ඒ පිළිබඳ ප්‍රකාශයක් කරන්න ඉඩ දීම තුළින්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ මන්ත්‍රීවරුන් අද මේ ස්ථානයට ඇවිත් නැත්නම්, තවත් දවස් දෙකක් මේ විවාදය පැවැත්වෙන නිසා මේ වැදගත් විවාදයේදී ඔවුන්ට පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, පුළුවන්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා ඒ Reportsවල තිබෙන නම් ගම් මෙතැනදී සඳහන් කරන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම්, මෙතැන විවාදයක් කරන්න බැරි වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාරණය පැහැදිලියි.

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 12.59]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Malik Samarawickrama, you were away when your name was mentioned.

**ගරු මලික් සමරවික්රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමාගේ නමවත්, මගේ නමවත් මේ බැඳුම්කරයට කිසිසේත් සම්බන්ධ වෙලා නැහැ. ඒ වාර්තාවේ එවැන්නක් කිසිසේත් නැහැ. මඩ ගහනවා පමණයි. බොරුවට ඒ ගැන කතා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

සාක්ෂි දීලා නැද්ද?

**ගරු මලික් සමරවික්රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

සාක්ෂි දීලා - ඒ සාක්කියේ කියා තිබෙනවා ඒ සාකච්ඡාවේ බැඳුම්කරය ගැන කතා කළේවත් නැහැ කියා. ඒක නේ එහි කියා තිබෙන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මගේ වෙලාව. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා. [බාධා කිරීමක්] Order please! The Hon. (Dr.) Harsha De Silva is on his feet. Let him speak.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි. මම අද "DailyMirror" පුවත් පතේ "Business" Section එකේ මුල පිටුව **සභාගත*** කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙහි කියනවා, "EPF gets zero returns from majority of private equity investments" කියා; සේවක අර්ථ සාධක අරමුදලේ 2014 වන කල් කරපු ආයෝජනවලින් ලැබී තිබෙන return එක "0" කියා. මා කියවන්නම් මෙය. මෙහි මෙසේ සඳහන් වනවා:

> "According to a Right to Information disclosure the Central Bank made to Mirror Business - following significant delays in processing the inquiry, due to the scope of the data requested - the pension fund had provided in total Rs. 10.8 billion in private equity funding to seven firms during the period in question."

It further states, I quote:

> "…. (EPF), which is under the custodianship of the Central Bank, has to this day not generated any returns for the Rs. 9.3 billion in private equity investments made up to 2014."

මෙන්න මේක තමයි වැදගත්. 2014 වන කල් වූ මඟඩිය පිළිබඳව සොයන්න අවශ්‍යයි කියන තැනට අප එන්න ඕනෑ.

It goes on to state, I quote:

> "The figure in comparison is a little more than the moneys the state is said to have lost during the infamous treasury bond scams in 2015 and 2016."

මොකක්ද මේ කියන්නේ? මා අහගෙනයි, කවුදෝ - ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාද කොහේදෝ - අහනවා, "2015 වර්ෂයට කලින් මේ මඟඩිය වෙලා තිබෙනවා. එහි අලාභය - පාඩුව - මේ අලාභයට වඩා වැඩියි කියා කියන්නේ කවුද?" කියා. තොරතුරු දැනගැනීමේ පනත හරහා මහ බැංකුවෙන් ලබාගත් තොරතුරු අද "DailyMirror" පුවත් පතෙහි වාර්තා කර තිබෙනවා. ඒ තොරතුරුයි මේ තිබෙන්නේ. මෙහි කියනවා, මහ බැංකු ගනුදෙනුවෙන් වූ පාඩුවට වඩා විශාල පාඩුවක් මේ වෙළඳ පොළ හරහා, transactions 7කින් පමණක් සිදු වෙලා තිබෙනවා කියා. මා සභාගත කළ ලිපියේ ඒ බව සඳහන් කර තිබෙනවා. පසුව ඒ පිළිබඳව සාකච්ඡා කරමු.

අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ මැතිතුමා ඊයේ අධිකරණයට ඉදිරිපත් කරපු යෝජනා අද "ඩේලි නිවුස්" පත්තරයේ ඉදිරිපත් කරලා තිබෙනවා. එහි මෙසේ සඳහන්ව තිබෙනවා.

I quote:

> "Meanwhile, ASG Kodagoda explained that this magisterial inquiry was not solely based on the Bond Commission report but a complaint made by Central Bank Governor Indrajith Coomaraswamy."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් ගම්‍ය වන්නේ මේ වෙලා තිබෙන ගනුදෙනුව සම්බන්ධයෙන් කමිටු වාර්තාවක් ඉස්සෙල්ලා ඉදිරිපත් වුණා; පිටිපන කමිටු වාර්තාව. COPE එක ඒ දිහා බැලුවා. COPE වාර්තාවේ 10 වන පිටුවේ තිබෙනවා, "ඉහත කරුණු පදනම් කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් නිසි රාජ්‍ය අධිකාරියක් මඟින් පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු බව ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් පත් කරන ලද ඉහත කී ත්‍රි පුද්ගල කමිටුව විසින් ද නිගමනයකොට තිබුණි." කියලා. එතකොට COPE වාර්තාවෙත් පිළිගන්නවා, අගමැතිතුමා නියම කරපු ආකාරයට මේ පිළිබඳව පූර්ණ අධීක්ෂණයක් කළ යුතුයි කියලා මේ කමිටුව මඟින් නියම කරලා තිබෙන බව.

ඊළඟට, Naufel Abdul Rahman, Secretary to the Leader of the House of Parliament, in November 2016 writes to the Attorney General, Jayantha Jayasuriya and says, "Hon. Prime Minister has directed me to forward the undermentioned documents for your information and necessary action". අවශ්‍ය කටයුතු සඳහා අපි මේක යොමු කරනවා කියලා. මොකක්ද යොමු කරන්නේ? Report of the Committee on Public Enterprises - COPE - Parliament Series No. 109 tabled on 28th October, 2016. ගරු නියෝජ්‍ය

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කථානායකතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ මෙතැන යම්කිසි හුටපටයක් තිබුණු බව, වංචාවක් තිබුණු බව ඒ අවස්ථාවේදීම අපට සාක්ෂිවලින් ඔප්පු වුණේ නැති වුණත් පිටිපන වාර්තාව හා ඊටපස්සේ COPE වාර්තාවෙන් ලැබුණු නිර්දේශ අනුව වහාම නීතිපතිවරයාට දන්වලා තිබෙනවා, "විමර්ශන පටන් ගන්න." කියලා. ඒ වාගේම අපි සතුටු වෙනවා, නීතිපතිවරයා විසින් නඩු ගොනු කරලා අර්ජුන් ඇලෝසියස් සහ කසුන් පලිසේන අත්අඩංගුවට ගන්නා ලෙස කරපු ඉල්ලීම ගැන. ඒ අය අත්අඩංගුවට ගන්න අධිකරණයෙන් නියෝගය ලැබිලා තිබෙනවා. ඔවුන්ව අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

තව කාරණයක් මම කියන්න කැමතියි, සමහරු කියනවා, අර්ජුන් මහේන්ද්‍රන් පිළිබඳව ඉල්ලීමක් කරලා නැහැ, ඔහුට නිදැල්ලේ ඉන්න පුළුවන් කියලා. නමුත් මෙහි සඳහන්ව තිබෙනවා, "ඉහත නම් සඳහන් පළමුවෙනි සැකකරු ලක්ෂ්මන් අර්ජුන් මහේන්ද්‍රන් මේ වන විට සිංගප්පූරුවේ පදිංචිව සිටින බවට බුද්ධි තොරතුරු ලැබී ඇත. ඉහත සඳහන් අපරාධ වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කිරීමට අවශ්‍යයි. එසේ හෙයින් ඔහුව ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට අවශ්‍යතාවක් පවතී. එබැවින් ජාත්‍යන්තර පොලීසිය -INTERPOL- හරහා ඔහුට බාරදීම පිණිස 2018.02.15 දිනට පෙර ශ්‍රී ලංකාවට පැමිණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කරන ලෙසට නිවේදනයක් ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන්න." කියලා. එහෙම නම් කිසි කෙනෙක් ඉවත් කරලා නැහැ. කවුද කිව්වා වාගේ තෝරු මෝරු ඇරලා පොඩි හාල්මැස්සන් අල්ලන්න නොවෙයි, උත්සාහ කරන්නේ. වරදක් වෙලා තිබෙන බවට දැන් සාක්ෂි තිබෙන නිසා ඔවුන්ව අත්අඩංගුවට අරගෙන නිසි පිළිවෙළට අධිකරණයට ඉදිරිපත් කරලා වැඩකටයුතු ආරම්භ කරන්න කියලා රජය විසින් නීතිපතිවරයා හරහා අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ පළමු වතාවට තමයි COPE වාර්තාවක් මෙච්චර දුර ගිහිල්ලා තිබෙන්නේ. මේ COPE වාර්තාවෙන් සියලුම වැරදිකරුවන්ට දඬුවම් කරන්න නිර්දේශ කරලා තිබෙනවා. ඒකත් ඉස්සරහට අරගෙන යනවා. මා හිතන්නේ ලොකු පරිශ්‍රමයක් දරලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් කිසිම විධියක දේශපාලන න්‍යාය පත්‍රයකට හෝ පෞද්ගලික න්‍යාය පත්‍රයකින් තොරව මේ වැඩ කටයුත්ත කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඉස්සෙල්ලාම මේ පුද්ගලයන්ට මේ පිළිබඳව දැනුවත් කරන්න අපි 2012දී කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇලෝසියස්ලාත් එක්ක කිසිම විධියකට අල්ප මාත්‍රයකින්වත් සම්බන්ධකමක් අපට නැහැ, අපි දැකලත් නැහැ, කිසිම දවසක කථා කරලත් නැහැ කියලා මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි. ඒවා මේ වාර්තාවල සක්සුදක් සේ පැහැදිලි වෙනවා. අපි පෞද්ගලිකවම ප්‍රතිපත්තිගරුක දේශපාලනයක් තමයි කරන්නේ. නිවැරදි දේට නිවැරදි කියන්නත්, වැරදි දේට වැරදියි කියන්නත් අපට ශක්තිය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ සම්බන්ධයෙන් කොයි ආකාරයට ද හැසිරිලා තිබෙන්නේ කියලා මම විනාඩි කිහිපයක් අරගෙන මේ රටට පෙන්වන්න කැමතියි. COPE වාර්තාවේ 53 වන පිටුවේ මෙහෙම සඳහන් වෙනවා:

> "...එවකට මහ බැංකුවේ අධිපතිව සිටි අර්ජුන මහේන්ද්‍රන් මහතා මැදිහත්වීමක් හෝ බලපෑමක් සිදු කළ බවට සාධාරණ සැකයක් ඇති විය හැකි ආකාරයේ සාක්ෂි හා කරුණු කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බවට කාරක සභාව නිරීක්ෂණය කරයි..."

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "අර්ජුන මහේන්ද්‍රන් කිසි විධියකට බැඳුම්කර ගනුදෙනුවට මැදිහත්වීමක් වෙලා තිබුණේ නැහැ." කියලා අගමැතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා කියලා. එතුමා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි සටහනක් ඉදිරිපත් කරමින් කියලා තිබුණේ, අර්ජුන මහේන්ද්‍රන් සහ එවකට හිටපු නියෝජ්‍ය අධිපතිවරුන් තුන්දෙනා වන බී.ඩී.ඩබ්ලිව්. ආනන්ද සිල්වා, ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ සහ පී. සමරසිරි කියන නිලධාරින් තුන්දෙනා එතුමාව දැනුවත් කරපු ආකාරයටයි. නමුත්, ඒ වෙලාවේ නොතිබුණු සාක්ෂි COPE එකේදී අපට අනාවරණය වුණා. ඒ නිසා තමයි COPE එකේ සියලුම සාමාජිකයන් වාගේම සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමා ඇතුළු අපි සියලු දෙනාම ඒ වෙලාවේ ඒ දේ කිව්වේ.

ඒකෙන් අර්ථකථනය වන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් යම් වෙලාවට තිබුණේ නැති සාක්ෂි පසුව ලැබෙනකොට, පසුව ලැබුණු සාක්ෂි අපි පාවිච්චි කරලා කළ යුතු දේ මොකක්ද කියලා නිර්දේශ කරලා, ඒ අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE එකේ සාමාජිකයෙක් හැටියට මම කාරණයක් කියන්න කැමැතියි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමක් හිටියා. මේ මන්ත්‍රී කණ්ඩායම අපට කිව්වා, "COPE එක වංචාකරුවන් ආරක්ෂා කරන්න උත්සාහ කරලා තිබෙනවා." කියලා. මම කැමැතියි මෙම ජනාධිපති පරීක්ෂණ කොමිසන් වාර්තාවෙන් ඉදිරිපත් වෙන නිර්දේශවලින් මෙහි ඇත්ත වශයෙන්ම එවැනි දෙයක් සිදු වෙලා තිබෙනවාද කියලා පෙන්වන්න. ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාවේ 656 සිට 672 වන පිටුවල ඔය කියන පාදසටහන් ගැන සඳහන් වෙලා තිබෙනවා. එහි 671 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "... this Commission of Inquiry has found that, the Footnotes made by nine members of COPE .....are, in the main, limited to factual observations and that these Footnotes are not incorrect or unreasonable. We also note that, these ... members of COPE .... have recommended, by way of Footnote 26, that, an investigation is held to ascertain whether Perpetual Treasuries Ltd has made large profits by the sale of Treasury Bonds in the Secondary Market to the EPF or other State owned institutions."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාව අනුව සමස්තයක් විධියට මෙම පාදසටහන් අසත්‍ය හෝ අසාධාරණ නොවන බවයි. එසේම මෙම පාදසටහන් මඟින් මෙම පරීක්ෂණය තවදුරටත් පුළුල් කරන්න ඉල්ලා තිබෙන බව මෙම ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාවේ සඳහන් කරනවා.

සමහරු මඩ ගැසීම සඳහා පාවිච්චි කරන බොරුවට වඩා ඇත්ත මොකක්ද කියන එක ගැන මම විනාඩි කිහිපයක් අරගෙන ජනතාව දැනුවත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ පාද සටහන් 32ක් තිබෙනවා. මෙන්න මෙහෙමයි ඒ සම්බන්ධයෙන් කියා තිබෙන්නේ. පාද සටහන් අංක 1, 2, 3 කෝප් වාර්තාවේ 4.1.1, 4.1.2 යන ඡේද සමඟ සම්බන්ධ වේ. මෙම පාද සටහන් මඟින් කර තිබෙන නිරීක්ෂණ නිවැරදි බව කොමිසමට ලැබුණු සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 4, 5, 6 කෝප් වාර්තාවේ 4.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම නිරීක්ෂණ නිවැරදි බව කොමිසමට ලැබුණු සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 7 කෝප් වාර්තාවේ 4.6 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම පාද සටහන මඟින් කර තිබෙන නිරීක්ෂණ නිවැරදි බව සාක්ෂි අනුව සනාථ වී ඇති බව කොමිසම සඳහන් කරයි. පාද සටහන් අංක 8 කෝප් වාර්තාවේ 5.1.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම නිරීක්ෂණ නිවැරදි බව සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 9 කෝප් වාර්තාවේ 5.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. කෝප් වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් වන්නේ,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

බැඳුම්කර නිකුතු දිනයට පෙර සතියේ ද්විතීයික වෙළෙඳ පොළ තුළ වසර තිහක බැඳුම්කර සඳහා 9.48ක සාමාන්‍ය ඵලදා අනුපාතයක් පැවැති බවයි. ජනාධිපති කොමිසම පවසා තිබෙන්නේ, මෙම සටහන මඟින් එය නිවැරදිව නිරීක්ෂණය වන බවයි. පාද සටහන් අංක 10, 11, 12 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. පාද සටහන් මඟින් කර තිබෙන නිරීක්ෂණ නිවැරදි බව කොමිසමට ලැබුණු සාක්ෂි අනුව සනාථ වී ඇත. පාද සටහන් අංක 14 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම පවසා තිබෙන්නේ, හත්වන පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව විසින් කෙටුම්පත් කළ අතුරු වාර්තාවේ උපුටනයක් ලෙස එය පෙනෙන බවයි. පාද සටහන් අංක 15 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම සඳහන් කරන්නේ, ප්‍රධාන කෝප් වාර්තාවේ මේ සම්බන්ධයෙන් තිබෙන කොටස නිවැරදි නොවන බවයි. මේ නිසා පාද සටහන නිවැරදි නොවන බව කොමිසම පෙන්වා දී ඇත. ඒ කියන්නේ, කෝප් වාර්තාවේ ගැටලුවක් තිබෙනවා කියන එකයි මේ කොමිසමෙන් ඉදිරිපත් කරන්නේ. ඒක පාද සටහනේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක වාර්තාවේ තිබෙන ගැටලුවක්. පාද සටහන් අංක 16 කෝප් වාර්තාවේ 5.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. මේ සම්බන්ධයෙන් කෝප් කමිටුවට සාක්ෂි නොතිබුණු බව සඳහන් කරනවා. පාද සටහන් අංක 17 මඟින් කරන නිරීක්ෂණ නිවැරදි බව කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 18 කෝප් වාර්තාවේ 5.7 ඡේදය සමඟ සම්බන්ධ වේ. එම පාද සටහන මඟින් කරන නිරීක්ෂණ නිවැරදි බව කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 19 කෝප් වාර්තාවේ 6 වන ඡේදය සමඟ සම්බන්ධ වේ. ජනාධිපති කොමිසම පවසා තිබෙන්නේ, මෙම පාද සටහනේ තිබෙන්නේ, මෙම ප්‍රශ්නය පිළිබඳව සලකා බැලීමේදී ආචාර්ය අසීම් ලබා දුන් සාක්ෂි වැදගත් බවයි; නිවැරදි බවයි. පාද සටහන් අංක 20 කෝප් වාර්තාවේ 6.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහනේ ඇතුළත් වන්නේ, අවාසිය ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිත කළ හැකි හෝ යුතු බව උපකල්පනය කිරීම නිවැරදි නොවන බවයි. එතැනදී ගැටලුවක් මතු වෙනවා. මොකද, direct placement කරන්න කාලයක් තිස්සේ සිට මොවුන්ට official sanction එකක් තිබුණේ නැති වුණත්, 2008 වසරේ ඉඳලා 2014 වසර වෙනකල් සෘජු ක්‍රමය - direct placement - පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක තමයි කොමිසම කියා තිබෙන්නේ, 2008 වසරේ ඉඳලා මේ ගැන හොයන්න කියලා.

පාද සටහන් අංක 21 කෝප් වාර්තාවේ 6.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහන නිවැරදි බව සඳහන් කර ඇත. පාද සටහන් අංක 22 කෝප් වාර්තාවේ 6.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම විසින් සඳහන් කර තිබෙන්නේ, අදාළ කාරණාව මෙම පාද සටහන මඟින් නිවැරදිව නිරීක්ෂණය කර තිබෙන බවයි. පාද සටහන් අංක 23 කෝප් වාර්තාවේ 6.3 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහන නිවැරදි බව කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 24 කෝප් වාර්තාවේ 8.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. කෝප් කමිටුව ඉදිරියේ මේ සම්බන්ධව ඉදිරිපත් වූ සාක්ෂි පිළිබඳව කොමිසම දැනුවත් නැති බව මෙහිදී සඳහන් කර තිබේ. පාද සටහන් අංක 25 කෝප් වාර්තාවේ 8.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. මෙම සටහන මඟින් බැඳුම්කර නිකුතුව පිළිබඳව, 2016 මාර්තු 29 වනදා නිකුතුව පිළිබඳව, සවිස්තරාත්මක පරීක්ෂණයක් අවශ්‍ය වන බව නිවැරදිව කාරක සභාවට පෙනී යන්නේ යයි සඳහන් වන බව ජනාධිපති කොමිසම සඳහන් කර ඇත. පාද සටහන් අංක 26 කෝප් වාර්තාවේ 8.1 ඡේදය සමඟ සම්බන්ධ වේ.

කොමිසම පවසා තිබෙන්නේ, පර්පෙචුවෙල් ට්‍රෙෂරීස් සමාගම ද්විතීයික වෙළෙඳ පොළේ විශාල ලාභයක් ලබා ගත් බව මෙම පාද සටහන මඟින් නිවැරදිව සඳහන් කර තිබෙන බවයි. ඊට අමතරව, අධික පොලියක් සහිත බැඳුම්කර ද්විතීයික වෙළෙඳ පොළේදී පර්පෙචුවෙල් ට්‍රෙෂරීස් සමාගම මිලදී ගත්තේ රජයට අයිති සේවක අර්ථ සාධක අරමුදල වැනි අරමුදල්වලින් ද යන්න සොයා බැලීම සඳහා පුළුල් පරීක්ෂණයක් කළ යුතු බව දන්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හරහා තමයි මේ මුළු මගඩියම එළියට ආවේ. මේක ඉතාමත්ම වැදගත්. මම ඒ 26 වන පාද සටහන ගැන නැවත කියන්න කැමැතියි. මේ 26 වන පාද සටහනේ තමයි, වැදගත්ම කාරණාව තිබෙන්නේ. ඒ ගැන තමයි බැඳුම්කර නිකුතුවට අදාළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 671 වන පිටුවේ මෙසේ සඳහන්ව තිබෙන්නේ. I quote:

> "... have recommended, by way of Footnote 26, that, an investigation is held to ascertain whether Perpetual Treasuries Ltd has made large profits by the sale of Treasury Bonds in the Secondary Market to the EPF or other State owned Institutions."

සමහර වෙලාවට මේවායේ තිබෙන කාරණා සම්බන්ධයෙන් නොදැනුවත්ව සමහර අය නොයෙකුත් කථා කියනවා. නමුත්, මේ රුපියල් බිලියන 8.5ක වංචාව පිළිබඳව සඳහන් වන මේ පාද සටහන හරහා තමයි කෝප් වාර්තාව නිවැරදි වෙලා තිබෙන්නේ කියලා කොමිසම ඉදිරිපත් කරන නිර්දේශවල තිබෙනවා. වෙන කවුරුත් මේක දැකලා නැහැ.

27වන පාද සටහන 8.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. කොමිසම සඳහන් කර තිබෙන්නේ මෙම පාද සටහන මඟින් 2008 සිට 2016 දක්වා සිදු වූ බැඳුම්කර නිකුතු ගැන පරීක්ෂණයක් කළ යුතු බවත්, සාක්ෂි විමසීමේදී ව්‍යෝහාරික විගණනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා තිබෙන බවයි.

මෙන්න මේ පාද සටහනට තමයි විපක්ෂයේ සමහර අය භය වෙලා තිබෙන්නේ. මම ඊයේ-පෙරේදා දැක්කා, රාජපක්ෂලාගේ කට්ටිය කරපු ප්‍රකෝටි ගණන් හොරකම් හොයන්න ජනාධිපතිවරයාත් ඉතාම තදින් ක්‍රියාත්මක වනවා කියලා කියනවා. ඒ මේ පාද සටහන නිසායි.

28වන පාද සටහන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ 8.2 ඡේදය සමඟ සම්බන්ධ වේ. එම පාද සටහන අදාළ කාරණාව නිවැරදි නිරීක්ෂණය කර තිබෙන බව කොමිසම සඳහන් කර ඇත.

29වන පාද සටහන, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ 9.1 ඡේදය සමඟ සම්බන්ධ වේ. ජනාධිපති කොමිසම සඳහන් කර තිබෙන්නේ සේවක අර්ථසාධක අරමුදල සතු අරමුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජනය කිරීම ගැන විශේෂ ප්‍රතිපාදන සකස් කළ යුතු බව මෙම පාද සටහන මඟින් කියා තිබෙන බවයි. එසේ කියා මේක අනුමත කරනවා. බලන්න, ඇත්ත වශයෙන්ම අපි එකතු කරලා තිබෙන වැදගත් කාරණා මේවා තමයි.

30වන පාද සටහන ගැන කියා ඇත්තේ වෙන්දේසිය ගැන ප්‍රකාශයට පත් කළ දැන්වීමේ 12.5% පොලී අනුපාතය සඳහන් කර තිබුණේ යම් සමීක්ෂණයක් සඳහා සමීකරණයක් අනුව බව මහ බැංකු නිලධාරින් විගණකාධිපතිවරයාට පවසා තිබූ බව මෙම සටහනේ ඇතුළත් වන බවයි. එය අනුමත කර තිබෙනවා.

31වන පාද සටහන 9.4 ඡේදයට අදාළවයි. 9.4 ඡේදයේ මාතෘකාව වෙනස් කිරීම ගැන අදහස් පළ කර තිබෙනවා. එය පිළිගෙන තිබෙනවා. 32වන පාද සටහන නිවැරදි බව ජනාධිපති කොමිසම පිළිගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කථාව කිව්වේ, මේ ජනාධිපති කොමිෂන් වාර්තාව නොකියවා සමහර පුද්ගලයෝ මේ

පිළිබඳව නොයෙකුත් මත සමාජගත කරන්න උත්සාහ කරන නිසායි. මේ වාර්තාවේ පාද සටහන් එකක් හෝ දෙකක් හැරෙන්න -පිළිනොගැනීමටත් හේතු දීලා තිබෙනවා,- අනික් කරුණු සියල්ල ජනාධිපති කොමිසම පිළිගෙන තිබෙනවා. එහෙම නම්, අපට කියන්න වෙන්නේ මේ කොමිසම පිළිගෙන තිබෙන්නේ මේ සියලු පාද සටහන් සහිත වාර්තාව බවයි.

එතැනදී මම තව එක දෙයක් කියන්න කැමැතියි. ජනාධිපති කොමිෂන් වාර්තාවේ 657 වන පිටුවේ සඳහන් වන පරිදි කෝප් එකේ සභාපති වූ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීවරයාගෙන් කොමිසම මෙසේ විමසනවා:

> "In this connection, when the Commission of Inquiry asked Mr. Handunnetti, whether there were different opinions ["*මත*"]', ...."

එතුමාගෙන් අහනවා, "මේ පාද සටහන්වලින් අදහස් කරන්නේ මොකක්ද, මත පිළිබඳව වෙනසක්ද තිබෙන්නේ?" කියලා. එතකොට හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මෙසේ උත්තර දෙනවා. මා එම කොටස කියවනවා:

> "ඇත්තටම ගරු සභාපතිතුමනි, ඒකේ මත වලට වඩා පැහැදිලි කිරීම්වල වෙනස්කම තිබුනෙ.".

ඒ පිටුවේම මෙසේත් සඳහන් වෙනවා:

> "Mr. Handunnetti emphasized that all 24 members of COPE who actively participated in the inquiry, unanimously agreed to all the Recommendations set out in the Report."

මොකක්ද මේ කියන්නේ? මේකේ කියනවා, එක්සත් ජාතික පක්ෂය කියලා නොවෙයි, අනික් පක්ෂය කියලා නොවෙයි, මේකට සම්බන්ධ වුණු 24දෙනාම ඒකමතිකව කියලා තිබෙන බව "මේ වැරදි කරපු කට්ටියට දඬුවම් දෙන්න" කියලා. අර්ජුන මහේන්ද්‍රන් මහත්තයා මැදිහත් වෙලා තිබෙනවා; බලපෑම් කරලා තිබෙනවා; ඔහු වැරැද්දක් කරලා තිබෙන බව මේකෙන් පෙනෙනවා; එම නිසා ඔහුට දඬුවම් කරන්න කටයුතු කළා කියලා ඒකමතිකව මේකේ කියලා තිබෙනවා.

මෙතැන ඉතාමත්ම වැදගත් කාරණාව තමයි, සමහරු එල්ල කළ විවේචනවලට මේ ජනාධිපති කොමිෂන් සභාවේ හිටපු විනිශ්චයකාරවරුන් දෙදෙනා සහ retired Deputy Auditor-General මාස ගණනාවක් සාකච්ඡා කරලා උත්තර දීලා තිබීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම "Report of The Commission of Inquiry to Investigate, Inquire and Report on the Issuance of Treasury Bonds During the Period from 1st February 2015 to 31st March 2016"හි පාද සටහන් සම්බන්ධයෙන් ඇති අංක 661 සිට 671 දක්වා පිටු **සභාගත*** කරනවා.

එහෙම නම් කාටවත් කියන්නට බැහැ අපි හොරු රකින්නට උත්සාහ කළා කියලා. අපිට හොරු රකින්නට කිසිම අවශ්‍යතාවක් නැහැ. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ හොරු රකින එක නොවෙයි; හොරුන්ට දඬුවම් දෙන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළේ 2012 ඉඳලා.

මම 2012 පෙබරවාරි මාසයේ "Sri Lanka BRIEF" වෙබ් අඩවියට කළ ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමායි, වසන්ත සමරසිංහ මැතිතුමායි, මමයි Laugfs Holdings එක manipulate කළ හැටි ගැන කොහොමද කියලා තිබෙන්නේ කියලා බලන්න. වසන්ත සමරසිංහ මැතිතුමා අපිත් එක්ක ඉන්න වෙලාවේ කියූ දේ ඉහත වාර්තාව සඳහන් කළේ, “He also charged that the share price of Laugfs Holdings was also manipulated…” යනුවෙනුයි. උදේ 10.00ට එහි share price එක රුපියල් 38ට තිබුණා. උදේ 11.00 වන විට රුපියල් 48ට ගියාම කොටස් ලක්ෂයක් වික්කා. ඒක එක පුද්ගලයෙක් ගත්තා. ඒ නම මෙතැන සඳහන් වෙනවා. ඒ ගත්තේ රුපියල් 48 ගණනේ. ඉන් පසුව හවස 2.00 වන විට ඒක ආයෙත් රුපියල් 40ට අඩු වුණා. මේ පුද්ගලයා අර්ථ සාධක අරමුදලට රුපියල් කෝටි ගණනක අලාභයක් වන විධියට මේ වැඩසටහන ක්‍රියාත්මක කළා. ඒ වෙලාවේ අජිත් නිවාඩ් කබ්රාල්ගෙන් මාධ්‍යවේදියා අහන විට එතුමා කියලා තිබෙනවා, "කිසිම ප්‍රශ්නයක් නැහැ, අර්ථ සාධක අරමුදල ඉතාමත්ම හොඳට කළමනාකරණය වෙනවා" කියලා.

මම 2012 ජූනි මාසයේ 28වෙනි දා අර්ථ සාධක අරමුදලේ රුපියල් බිලියන 12ක වංචාවක් සම්බන්ධව කථා කළා. මේ බිලියන 12 හැදුණු හැටි කියා තිබෙනවා, the largest losses are from the investments in Laugfs, රුපියල් බිලියන 1.8යි; in Vallibel One, රුපියල් මිලියන 740යි; in Lighthouse Hotels, රුපියල් මිලියන 87යි; in LOLC and Browns, රුපියල් බිලියන 1.9යි; in Ceylon Grain Elevators, රුපියල් මිලියන 713යි; in Galadari Hotel, රුපියල් මිලියන 470යි. නමුත් එදා මේවා ගැන කිසිම පරීක්ෂණයක් කළේ නැහැ.

2012 නොවැම්බර් මාසයේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සහ මම කොයි ආකාරයටද මේ හොරකම් සිද්ධ වෙන්නේ කියලා කළ සාකච්ඡාවක්, blatant manipulations ගැන තවත් ලේඛනයක් මම **සභාගත*** කරනවා.

ඊළඟට, 2014 මැයි 31වෙනි දා "The Island" පුවත් පතට මම කියනවා, “I am very disappointed with the Public Accounts Committee” කියා. මොකද එදා Public Accounts Committee එකට - COPA එකට - බැරි වුණා අර්ථ සාධක අරමුදල වෙනුවෙන් මහ බැංකුවේ අධිපතිවරයාව අවුරුදු 6ක් යනකම්ම, -2007 ආවාට පසුව 2013 වෙනකම්- ගෙන්වා ගන්නට. එදා මහ බැංකුවේ පුද්ගලයන් අර්ථ සාධක අරමුදල හූරාගෙන කාලා, දූෂණය කරලා, වංචා කරලා COPE එකට ආවේවත් නැහැ; COPA එකට ආවේවත් නැහැ. එහෙමද මේ වැඩ කටයුත්ත වෙන්නට ඕනෑ? එහෙම නොවෙයි. එදා වැන්දා. මෙතැනදී එම පුවත් පතට මම තවදුරටත් මෙහෙම කියනවා. I quote:

> “After one and half years the Public Accounts Committee (PAC) has failed to summon the Governor of the Central Bank and the Secretary of Labour (Ministry) following the abrupt adjournment of the EPF examination by the Committee on February 6, 2013”.

ඊට පස්සේ 2013 පෙබරවාරි 06වෙනි දා Committee එකට ඇවිල්ලා ටික වෙලාවකින් නැඟිටලා ගියා. ඉන් පසුව එම වාර්තාවේම තවදුරටත් කියනවා, “I have initiated more than a dozen reminders” යනුවෙන් මා සඳහන් කළ බව. 12 වතාවකට වඩා මම මේ පාර්ලිමේන්තුවට දන්වලා තිබෙනවා මහ බැංකුවේ අධිපතිවරයාට කථා කරන්නට කියලා. නමුත් මේ පාර්ලිමේන්තුවට එදා බැරි වුණා පටන් ගත්ත meeting එක මාස

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

13ක් යනකම් ඉවර කරන්න. එහෙමයි එදා රාජපක්ෂලා මේ පාර්ලිමේන්තුව, -ගරු එරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා වාගේ- යකඩ බූට් එකට යට කරගෙන හිටියේ. එදා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වාගේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් COPE එකේ සභාපති හැටියට හිටියේ නැහැ. එතුමාට අපේ ලොකු ගරුත්වයක් තිබෙනවා. එතුමා ඒ වැඩ කටයුත්ත හරියට කරගෙන ගියා. යම් යම් අවස්ථාවල එතුමාටත් ආතතියට මුහුණ දෙන්නට සිදු වුණා; ප්‍රශ්න පැන නැඟුණා; නොයෙකුත් හේතූන් ඇති වුණා. නමුත් ඊට කලින්, කිසිම විධියකට ඒ කට්ටිය ගැන සොයන්නට බැරි වුණා.

ඔය ඇලෝසියස්ලා ගැන මම 2017 ජූනි මාසයේ 5වැනි දා පාර්ලිමේන්තුවේදී කථා කරලා තිබෙනවා. මම කියනවා, Ceylon Grain Elevators එකේ රුපියල් 50ට තිබුණු කොටස රුපියල් 250 දක්වා උස්සලා EPF එකට රුපියල් 187ට අතහැරියේ කොයි ආකාරයෙන්ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් එදා කිසිම විධියකට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න අපට හැකියාවක් තිබුණේ නැහැ. දේශපාලනඥයන්ගේ බලය අපි දැන් ජනතාවට ලබාදී තිබෙනවා. එදා දේශපාලනඥයන්ට පුළුවන් වුණා, අයුතු ලෙස බලය පාවිච්චි කරලා තමන්ට ඕනෑ විධියට වැඩ කරන්න. 2015 ජනවාරි 08වැනි දා ඇති වුණු වෙනසින් මොකක්ද සිද්ධ වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ බලය ජනතාවට හම්බවෙලා තිබෙනවා. ජනතාව තමයි දැන් ඒ බලය පාවිච්චි කරන්නේ. ජනතාවට පුළුවන්, හරි දේ කරන්න කියලා පාර්ලිමේන්තුවට බල කරන්න; නීතිපතිවරයාට බල කරන්න; අධිකරණයට බල කරන්න; ජනාධිපතිවරයාට බල කරන්න. එම නිසා තමයි දැන් මේ කට්ටිය භයවෙලා මේ බලය නැවත උදුරාගන්න උත්සාහ කරන්නේ. අපි අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරලා තිබෙනවා. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවට අනුව පරණ හොරුත් අල්ලන්න වෙනවා. ජනාධිපතිතුමාට ඒක ඉතාමත්ම ඕනෑකමින් කියන්න අපට සිද්ධ වෙනවා. මිනිස්සු අපෙන් අහනවා, "අවුරුදු 3ක් පොල් ගෑවාද, ඇයි හොරු අල්ලන්නේ නැත්තේ" කියලා. පරණ හොරුන්ට දඬුවම් දෙන්න කියලා අපි නැවතත් ඉල්ලනවා. අපි පසුගිය කාලයේ දිගින් දිගටම ඉල්ලුවේ ඒකයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කළේ නැත්නම් අපටත් තීරණයක් ගන්න වෙනවා. ඒ හොරු අල්ලන්න බැරි නම්, මේ ජනාධිපතිවරයා, අගමැතිවරයා ඇතුළු මේ රජය ගැන අපටත් තීරණයක් ගන්න වෙනවා, මොකක්ද අපි කරන්නේ කියලා. මොකද, හොරු අල්ලන්න තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ. හොරු ඇල්ලීම සඳහා අපි සියලු වැඩ කටයුතු කරලා තිබෙනවා. අපි කිසිම හොරෙක්, වංචනිකයෙක් ආරක්ෂා කරන්න කිසිම තැනක වැඩ කරලා නැහැ. නොයෙකුත් කට්ටිය නොයෙකුත් මඩ ප්‍රචාර අරන් ගියාට ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ සටහන්වලිනුත් පෙන්වා දී තිබෙනවා, අපි කිසිම කෙනෙක් සෝදන්න ගිහිල්ලා නැහැ, එම නිසා මෙම වාර්තාව තව දුරටත් ශක්තිමත් වෙලා තිබෙනවා කියලා. බලන්න, මේ PRECIFAC වාර්තාවේ තිබෙනවා, "හොරු, පට්ටපල් හොරු කොයි ආකාරයටද හොරකම් කළේ" කියලා. දූෂණය නමැති හොරකම ගැන කථා කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දූෂණය නමැති හොරකම පිළිබඳව හිටපු ජනාධිපතිවරයාටත් චෝදනා එල්ලවෙලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂට චෝදනා එල්ලවෙලා තිබෙනවා. ඒ වාගේම අපට විරුද්ධව ඡන්දය ඉල්ලන කෝට්ටේ හිටපු නගරාධිපති ජනක රනවකලාට, දෙහිවල - ගල්කිස්ස හිටපු නගරාධිපති ධනසිරි අමරතුංගලාට විරුද්ධවත් දූෂණය පැත්තෙන් බොහෝ චෝදනා එල්ලවෙලා තිබෙනවා. ඔවුන්ට දඬුවම් ලබාදෙන්න කියලා නිර්දේශ කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය දැන් අවසන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට ලැබුණු කාලය අවසන් නිසා මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා.

අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, දූෂණය නමැති වරදට වරදකාරයෙක් වුණොත් වසර 7කට පසු නැවත පාර්ලිමේන්තුව නියෝජනය කරන්න බැරි වන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ඔවුන් එකඟයි කියලා. කවුරුත් ඒ යෝජනාවට එකඟයි. එදා කළා වාගේ දේශපාලන හේතූන් නිසා පුද්ගලයෙකුට විරුද්ධව තීන්දු ගන්න, ඔවුන් වැරදිකාරයන් කරන්න පාර්ලිමේන්තුවට බැහැ. එදා ශිරානි බණ්ඩාරනායක ගෙදර යැව්වා වාගේ එහෙම කරන්න බැහැ. ඒකට අපිත් විරුද්ධයි. මහින්ද රාජපක්ෂ වෙන්න පුළුවන්, ගෝඨාභය රාජපක්ෂ වෙන්න පුළුවන්, ඔවුන්ට පාර්ලිමේන්තුවෙන් දඬුවම් දෙන්න බැහැ. ඒකට අපි විරුද්ධයි. නමුත් කවුරු හෝ කෙනෙක් වැරදිකරුවෙක් කියලා අධිකරණයෙන් ඔප්පුවෙලා තිබෙනවා නම්, අවුරුදු 7කට නොවෙයි, ජීවිත කාලයටම ඡන්දය ඉල්ලන්න බැරි විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81, 87 සහ 89 ව්‍යවස්ථා සංශෝධනය කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව සහ බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ වාර්තාව පිළිබඳව විවාදයට ගැනෙන මේ අවස්ථාවේ ඊට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මගේ ප්‍රාර්ථනය -පැතුම- නැවත වතාවක් අපේ රටේ මෙවැනි විවාද නොපැවැත්වේවා කියලායි. ඒ මට්ටමට මේ රට තුළ කටයුතු කිරීම අද මේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන වගකීම විධියට මා පෞද්ගලිකව දකිනවා.

අපි බලන්න ඕනෑ, අලුත් හොරුද, පරණ හොරුද කියන එක නොවෙයි, වැරැද්ද, වංචාව හා දූෂණය පිළිබඳවයි. මෙතැනදී අලුත්ද, පරණද කියන එක අදාළ විය යුතු නැහැ. වංචාව, වැරැද්ද, දූෂණය සදහටම මේ රටින් තුරන් විය යුතුයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපට ඒ පිළිබඳව අම්හිරි අත්දැකීම් තිබෙනවා. මා ඇතුළුව අද ආණ්ඩුව තුළ සිටින අපේ පක්ෂයේ බොහෝ පිරිසකුත් 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වෙනුවෙන් තමයි කටයුතු කළේ. විශේෂයෙන්ම අපේ පක්ෂයේ සභාපතිවරයා වූ එතුමා වෙනුවෙන් එදා අපි පෙනී සිටියා. නමුත් මේ රටේ ජනතාව එදා එතුමා ප්‍රතික්ෂේප කළා. ඒ ප්‍රතික්ෂේප වීම පිළිබඳව විවිධ අය විවිධ අර්ථකථන කරනවා. නමුත් අපි එදා පරාජයට ලක් වුණේ ඇයි කියන එක පිළිබඳව වර්තමානයේදී පක්ෂයක් විධියට අපි ස්වයං විවේචනයක් කරලා තිබෙනවා. එසේ පරාජයට ලක් වීමට හේතු එක පිරිසකට විතරක් සීමා වන්නේ නැහැ. කොටස්කරුවන් විධියට අපිත් ඒ හේතුවලට සම්බන්ධ වුණාය කියන එක නිහතමානීව අපි පිළිගන්නවා.

පසුගිය රජය මඟින් එදා අපි දැවැන්ත සංවර්ධනයක් කරලා තිබුණා. මේ රටේ යුද්ධය නිම කරලා සාමය ඇති කරන්න දේශපාලන නායකත්වය ලබා දුන්නා. විරෝදාර රණ විරුවන් ජීවිත පූජා කරලා ඒ කටයුතු කළත්, මේ රටේ ජනතාව එදා ලබා දුන් ප්‍රතිඵලය, ඒ පාඩම පක්ෂයක් විධියට අපි අද ඉතාම හොඳින් ඉගෙන ගෙන තිබෙනවා. එම නිසා තමයි අපේ පක්ෂයේ වර්තමාන සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ විධායක ජනාධිපතිවරයා විධියට ඒ තත්ත්වය නැවත වතාවක් අපේ පක්ෂයටත්, මේ රටටත් ඇති නොවිය යුතුයි කියන තැන ඉඳගෙන වංචාවට, දූෂණයට විරුද්ධව අද ඒ දැඩි ක්‍රියාමාර්ග ගන්න ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිනවල විවිධ දේශපාලන පක්ෂ සමීක්ෂණ කරනවා. මේ රටේ පොදු සංවිධාන, ස්වේච්ඡා සංවිධාන ජන මතය විමසනවා. එහිදී අහන ප්‍රශ්නවලදී, "ඔබ මේ තීරණය ගන්නේ ඇයි?" කියන ප්‍රශ්නයට සෑම සමීක්ෂණ වාර්තාවලම වැඩිම ප්‍රතිශතයක් ලැබී තිබෙන්නේ, "වංචාවට, දූෂණයට විරුද්ධව තමයි" කියන පිළිතුරට බවයි ඒ ලැබී තිබෙන තොරතුරු අනුව අනාවරණ වෙලා තිබෙන්නේ. අද මුළු රටේම පක්ෂ භේදයකින් තොරව -සියලු භේදවලින් තොරව- වංචාවට, දූෂණයට විරුද්ධව කටයුතු කිරීම පිළිබඳව ප්‍රසාදයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා වංචාවලට විරුද්ධව ගෙන යන කටයුතුවලදී අපටත් විශාල යුතුකමක්, වග කීමක් තිබෙනවා. මේ අවස්ථාවේදී මේ ක්‍රියාදාමය තුළ අපි මොනම ආකාරයකටවත් දේශපාලන වාසි අපි ලබා ගත යුතු වන්නේ නැහැ. ඒ දේශපාලන වාසි ලබා ගැනීම කුමන හෝ පාර්ශ්වයක් විසින් සිදු කරනවා නම්, එය මේ රටේ වංචාවට, දූෂණයට විරුද්ධව සැබෑ ලෙස කටයුතු කිරීමක් විධියට මා දකින්නේ නැහැ.

වංචාවට, දූෂණයට විරුද්ධව ගන්නා වූ ක්‍රියාමාර්ග ගැන විවිධ මාධ්‍ය තුළින් විවිධ දේවල් අපට දකින්න ලැබෙනවා. සමහර ඒවා ගැන කනගාටුයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා දෙකකින් විමර්ශනය කරලා, ඩිව් ගුණසේකර මැතිතුමාත්, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාත් වාර්තා ලබා දුන්නා. ඒ කාරක සභා දෙකෙහිම මමත් ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් සිටියා. මා හිතන හැටියට මේ වන විට මේ නිම වුණු සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වගකීම ඉටු කරලා අවසානයි.

දැන් පාර්ලිමේන්තුවට තිබෙන වගකීම මෙයයි. නැවත වතාවක් මේ රටේ මෙවැනි දේවල් ඇති නොවීම සඳහා පාර්ලිමේන්තුව තුළින් ඉටු විය යුතු කටයුතු අපි අනිවාර්යයෙන්ම ඉටු කළ යුතුව තිබෙනවා. ඒ වගකීම අපි අවබෝධ කර ගත යුතුයි.

අතිගරු ජනාධිපතිතුමා මේ බැඳුම්කර කොමිසම පත් කරපු දිනයේ මාධ්‍යවල පළ වූ දේවල් පිළිබඳව මම සොයා බැලුවා. ඒ වෙලාවේදී බොහෝ දේශපාලන පක්ෂවල අය කිව්වේ, "ප්‍රශ්නය යට ගහන්න මේ බැඳුම්කර කොමිසම දානවා" කියලායි. මේ කොමිසමේ විනිසුරුවන්ට සැබෑ ලෙස, අවංකව මේ පරීක්ෂණය කිරීමේ අවශ්‍යතාවක් තිබුණු නිසා ඔවුන් අවස්ථා තුනකදී කල් ඉල්ලුවා. කල් ඉල්ලපු දවසට පසුව දා මාධ්‍ය සාකච්ඡා තියලා කිව්වේ, "කාලය දිගු කරලා මේ ප්‍රශ්නය යට ගහන්න උත්සාහ කරනවා" කියලායි. නමුත් ඒ වාර්තාව එළි දැක්වුවා. වාර්තාව එළි දැක්වූවාට පස්සේ මේ වාර්තාවේ පිටු පිළිබඳව විශාල සංවාදයක් මේ රට තුළ ඇති වුණා. වැරැදිකරුවන් අත්අඩංගුවට ගන්නේ නැහැ කිව්වා. නමුත් මීට සම්බන්ධ වැරැදිකරුවන් අත්අඩංගුවට ගත්තා. වැරැදිකරුවන් අත්අඩංගුවට ගන්න දින කීපයට පෙර ඉඳලාම ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වමින් කිව්වා, "ඉතාම හොඳ ටෙලි නාට්‍යය මේ මැතිවරණයට පෙර ක්‍රියාත්මක වේවි" කියලා. මේ ආකාරයේ අදහස් සහ යෝජනා,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මහතා නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අත් අඩංගුවට ගැනීම හෙළා දැකලා තමයි විශේෂයෙන්ම කටයුතු කළේ. එම නිසා අපි ඉතාම කාරුණිකව මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. අපි සැබෑ ලෙස වංචාවට, දූෂණයට විරුද්ධව කටයුතු කරනවා නම්, මේ ආකාරයෙන් පටු දේශපාලන වාසි ලබා ගැනීම වෙනුවෙන් අදහස් සහ යෝජනා ඉදිරිපත් කළ යුතු වන්නේ නැහැ. මම සියලු දේශපාලන පක්ෂවලින් අවංකව, හදවතට එකඟව ඉල්ලීමක් කරනවා, නැවත වතාවක් මෙවැනි විවාද මේ පාර්ලිමේන්තුව තුළ ඇති නොවන්නට මේ රට තුළ අවශ්‍ය පරිසරය ගොඩ නැඟීම සඳහා අපි සියලු බේද අමතක කරලා කටයුතු කළ යුතුයි කියලා. එලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාව තමයි අද මේ රට හමුවේ තිබෙන්නේ කියන කාරණය අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

මේ බැඳුම්කර සිද්ධිය පිළිබඳව තවමත් අපේ රටේ ජනතාව හරි හැටි දන්නේ නැහැ කියලා කියන්න පුළුවන්. අපිටත් මේ පිළිබඳව හරි අවබෝධයක් නැහැ කියලා කියන්න පුළුවන්. නමුත් මේ

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ක්‍රියාවලිය තුළ වංචාවක් සිද්ධ වුණාය කියලා අපි කවුරුත් -ඕනෑම කෙනෙකු- දන්නවා. මේ වංචාව මොකක්ද? විශේෂයෙන්ම අපේ රටට අවශ්‍ය මුදල් අපි කලින් හොයා ගත්තේ භාණ්ඩාගාර බිල්පත්වලින්. 1997දී ආසියාවේ ඇති වුණු තත්ත්වය එක්ක බැඳුම්කරවලින් මුදල් සොයා ගැනීමේ ක්‍රමය හඳුන්වා දුන්නා. 2008 අවුරුද්දේ ප්‍රථම වතාවට මේ බැඳුම්කර ක්‍රමය යටතේ අපේ රටේ රජයට අවශ්‍ය මුදල් ලබා ගැනීම ආරම්භ වුණා. ක්‍රම දෙකක් යටතේ මේ මුදල් ලබා ගැනීම සිද්ධ කරන්න පුළුවන්. එයින් එකක් සෘජු ක්‍රමය. අනික් එක වෙන්දේසි ක්‍රමය. පෞද්ගලික අංශයේ තිබෙන මුදල් පාඩුවක් නොවන පරිදි ආණ්ඩුවට ලබා ගැනීම සඳහා තමයි වෙන්දේසි ක්‍රමය මේ බැඳුම්කර නිකුත් කිරීමේදී භාවිත කරන්න නියමිතව තිබුණේ. මේ කථා බහට ලක් වෙලා තිබෙන පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම 2013 වර්ෂයේ මහ බැංකුවේ බැඳුම්කර ගනුදෙනුවලට සම්බන්ධ වීමට ලියාපදිංචි වුණා. ලියාපදිංචි වුණු දවසේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ප්‍රාග්ධනය මිලියන 300යි.

මේ වාර්තාවේ තිබෙනවා, 2015 මාර්තු 31වැනි දාට ලාභය බිලියන පහයි; 2016 මාර්තු 31ට ලාභය බිලියන 6යි දශම ගණනයි; මේ අවුරුදු දෙකේ ශුද්ධ ලාභය බිලියන 12යි කියලා. මේ ලාභය ලබා තිබෙන්නේ වෙනත් ගනුදෙනු කරලා නොවෙයි. මේ පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම බැඳුම්කරවලට අදාළ ගනුදෙනු කරලා තමයි මෙච්චර ලාභයක් මේ කෙටි කාලයක් තුළදී ලබාගෙන තිබෙන්නේ. වෙන්දේසි ක්‍රමය තිබෙන්නේ පෞද්ගලික අංශයේ මුදල් ලබා ගන්න. මේ, පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම කළේ මොකක්ද? සේවක අර්ථසාධක අරමුදල්, රජයේ බැංකුවල අරමුදල් ලබාගෙන ආණ්ඩුවටම ණය දුන්නා. ඒ ආයතනවලටත් විශාල පාඩුවක් සිදු වුණා. රජයටත් විශාල පාඩුවක් සිදු වුණා. මේකේ පාඩුව හරි හැටි ගණන් කරන්න පුළුවන්කමක් නැහැ. ඒක ඇත්ත. දැවැන්ත ආර්ථික ප්‍රශ්න, ගැටලු ගණනාවකටම මුහුණ දුන්නා. මිලියන 300කින් ආරම්භ කරපු පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම අවුරුදු දෙකක් තුළ ප්‍රකාශයට පත් කළ ශුද්ධ ලාභය විතරක් බිලියන 12යි. එම බිලියන 12ත් ඔවුන් උපයා ගත්තේ රාජ්‍ය ආයතනවල තිබෙන සල්ලිවල අතරමැදියෙක් විධියට කටයුතු කිරීම තුළින් පමණයි. ඒ අය මේ ලාභය ලබා ගන්න නීත්‍යානුකූල ක්‍රමවලට පරිබාහිරව විශාල වශයෙන් විවිධ දේශපාලන වාසි, මහ බැංකුවේ අධිපතිවරයාගේ තිබුණු සම්බන්ධතාවන් උපයෝගී කර ගත්තා. මහ බැංකු අධිපතිවරයාගේ සම්බන්ධතාවන් මතින් තොරතුරු ලබා ගෙන, මහ බැංකුවේ තිබුණු නීති-රීති සියල්ලක්ම පසෙක තබලා; සම්ප්‍රදායයන් පසෙක තබලා, අයථා වාසි අරගෙන තමයි මේ මුදල් උපයා ගෙන තිබෙන්නේ. මේක තමයි සිදුවුණු ක්‍රියාවලිය. විශේෂයෙන්ම රටක් විධියට නැවත මෙවැනි ආකාරයේ තත්ත්වයන් ඇති නොවීම සඳහා අප වග බලා ගත යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් මේ කොමිෂන් සභාවේ නිර්දේශයන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිර්දේශයන් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි.

පාර්ලිමේන්තුවටත් මේ පිළිබඳව යම් යම් වග කීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. දැනට තිබෙන නීති-රීති අනුව කටයුතු සිදු කළ යුතු වාගේම, ඒ සඳහා නව නීති-රීතිත් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නව නීති-රීති අවශ්‍ය වෙලා තිබෙන්නේ, පෙර සිදු වුණු සිද්ධීන්වලට අවශ්‍ය දඬුවම් ලබා දීමටත්, නැවත මෙවැනි තත්ත්වයක් මේ රට තුළ ඇති නොවීම සඳහාත් කියන කරුණු මුල් කරගෙනයි. ඒ අනුව මේ පාර්ලිමේන්තුව ඒ වග කීම ඉටු කළ යුතුව තිබෙනවා. එම නිසා අපි එම වග කීම ඉටු කළ යුතුයි.

අපි වර්තමානයේ දී මේ සෑම දෙයක් පිළිබඳවම සුබවාදීව දැකිය යුතුයි. මේ දිනවල මැතිවරණයක් පැවැත්වෙනවා. මේ මැතිවරණ ක්‍රමය තුළ හොඳ ලක්ෂණ විශාල ප්‍රමාණයක් තිබෙනවා. තමන්ගේ කොට්ඨාසයේ අය සම්බන්ධ වෙලා අනවශ්‍ය ගැටීම් නැතුව අද මේ මැතිවරණ ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අද රාජ්‍ය දේපළ අයථා විධියට මේ මැතිවරණයට යොදවා ගන්නේ නැහැ. රටක් විධියට ගත්තාම, මෙවා ඇති විය යුතු හොඳ ලක්ෂණ. විශේෂයෙන්ම වංචාව, දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් අද මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ අපි තව තවත් මේ වැඩ පිළිවෙළවල් ශක්තිමත් කරමින් කටයුතු කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම විගණන පනත් කෙටුම්පත කඩිනමින් මේ පාර්ලිමේන්තුවට ගෙන ආ යුතුව තිබෙනවා. ඒක රටක් විධියට අවශ්‍යයි. කිසිදු පාර්ශ්වයක් එයට බිය විය යුතු වන්නේ නැහැ. දේශපාලනඥයන්වත්, නිලධාරින්වත් ඒකට බිය වෙන්න දෙයක් නැහැ. අපි හරියට වැඩ කරනවා නම්, ඕනෑම නීතියක් අනුව, ඕනෑම දෙයක් කරන්න අපට පුළුවන්කමක් තිබෙනවා. එම නිසා විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ඒම ගැන අද මේ රටේ විවිධ පාර්ශ්වයන් විශාල අපේක්ෂාවකින් කථා කරන මාතෘකාවක් වාගේම, එය අවශ්‍ය දෙයක් බවට පත් වෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාත් මේ පාර්ලිමේන්තුවේ දී පොරොන්දු වුණා, විගණන පනත් කෙටුම්පත කඩිනමින් පාර්ලිමේන්තුවට ගෙනෙනවා කියලා.

එම නිසා මෙම මැතිවරණය අවසන් වුණු වහාම අපිත් ඒ වෙනුවෙන් පෙනී සිටිනවා; කටයුතු කරනවා. අපි සියලුම දෙනාම එකතු වෙලා විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කඩිනමින් සම්මත කරලා මෙවැනි ආකාරයේ සිද්ධීන් මේ රට තුළ ඇති නොවීම සඳහා අනිවාර්යයෙන්ම වගබලා ගත යුතුව තිබෙනවා.

මහ බැංකුවේ සිද්ධිය සම්බන්ධයෙන් වාගේම අනෙකුත් බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙනුත් නීතිය, සාධාරණත්වය ඉටු විය යුතුයි. ඒ පිළිබඳව අපේ මොනම ආකාරයකවත් මතවාදයක් නැහැ. වංචාවට, දූෂණයට පැරණි, අලුත් කියලා වර්ග දෙකක් නැහැ. වර්තමාන, අනාගත කියලාත් නැහැ. වංචාව, දූෂණය නම් වංචාව, දූෂණයම තමයි. එම නිසා අතිගරු ජනාධිපතිතුමා අද වංචාව, දූෂණයට විරුද්ධව එතුමාට ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම අවංකව ගන්නවා. රජය විධියට, පාර්ලිමේන්තුව විධියට අපි අපේ සහයෝගය, දායකත්වය එතුමාගේ ක්‍රියාදාමය වෙනුවෙන් ලබා දීම තමයි මහජන නියෝජිතයන් විධියට අපට පැවරී තිබෙන යුතුකම සහ වගකීම කියන එක අපි අනිවාර්යයෙන්ම අවබෝධ කරගත යුතුව තිබෙනවා.

විගණන පනත ගෙනෙනවා වාගේම, මේ ක්‍රියා දාමය තුළ රාජ්‍ය අංශයත් තව තවත් ශක්තිමත් කළ යුතුව තිබෙනවා. නවීන තාක්ෂණය භාවිත කරලා, නිලධාරින්ට අවශ්‍ය කරන පුහුණුව ලබා දීලා, නිලධාරින්ගේ ගුණාත්මකභාවය ඉහළ දැමීමට කටයුතු කළ යුතුයි. මේ කොමිෂන් සභා වාර්තාව අධ්‍යයනය කළාම එම ක්‍රියාවලිය තුළ අඩු පාඩුකම් විශාල ප්‍රමාණයක් තිබුණු බව අපට පෙනී ගියා. මහ බැංකුවේ තිබුණු නීති රීති සංශෝධනය කළ යුතුව තිබෙනවා. නව නීති රීති හඳුන්වා දිය යුතුව තිබෙනවා. මේ ආකාරයෙන් ඒ අදාළ අංශ ඉතාම අවංකව කටයුතු කළ යුතුව තිබෙනවා.

මේ කොමිෂන් සභාවේ හිටපු විනිසුරුවරුන් සහ නිලධාරින් අද මේ රටේ කාගේත් විශ්වාසයට පාත්‍ර වෙලා තිබෙනවා. කිසිදු භේදයකින් තොරව, අපක්ෂපාතීව මේ පරීක්ෂණ කටයුතු සිදු කිරීම පිළිබඳව අපි ඒ අයට අපේ ගරුත්වය පිරිනමන්න ඕනෑ. අනෙකුත් සියලුම නිලධාරිනුත් ඒ ආදර්ශය ලබා ගත යුතුව තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ, අධිකරණ ක්ෂේත්‍රයේ, පොලීසියේ

මේ සෑම නිලධාරියකුම මේ ආදර්ශය අනිවාර්යයෙන්ම ලබා ගත යුතුව තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ආදර්ශය ලබා ගෙන අතීතයේ සිදු වුණු සිද්ධීන් සඳහා සාධාරණය, යුක්තිය ජනතාවටත්, රටටත් ඉටු කළ යුතුයි. ඒ වාගේම මින් ඉදිරියට නැවත වතාවක් මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අප සියලු දෙනාම ඒක රාශී වෙලා කටයුතු කරමුයි කියන ආරාධනය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු රවි කරුණානායක මහතා.

[අ.භා. 1.50]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවක මට කථා කරන්න ලැබීම මා ඉතා අගය කොට සලකනවා.

මහජනතාවට හා රටට අහිමි වෙමින් පැවති ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස හා ආර්ථික දියුණුව ස්ථාපිත කරන්න ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ දේශපාලනඥයකු හැටියටත්, ඒ වෙනුවෙන් මහා පරිත්‍යාගයක් කළ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත්, ඒ වාගේම 2015 ජනවාරි මාසයේ අලුත් ජනාධිපතිවරයකු, 2015 අගෝස්තු මාසයේ සම්මුතිවාදී, යහපාලන ආණ්ඩුවක් බිහි කරන්න මුල්වූ කෙනෙකු හැටියටත් අද මේ ගරු සභාව අමතා මට කථා කරන්න ලැබීම සතුටක්.

තෝරා ගත් යම් දූෂණ කිහිපයක් පිළිබඳව කරන ලද විමර්ශන පදනම් කරගෙන ඉදිරිපත් කර ඇති කොමිෂන් සභා වාර්තා දෙකක් පිළිබඳව අපි අද විවාදයට ගෙන තිබෙනවා. කුමන තත්ත්වයක් යටතේ වුවත් මෙසේ යහපාලන මූලධර්ම අඩු පාඩු සහිතව හෝ ක්‍රියාත්මක වීම ගැන මා සතුටු වෙනවා.

මා මුලින්ම මේ ගරු සභාවේ අවධානයට ලක් කරන්න කැමැතියි, අප සිටින මේ සමාජයේ අර්බුද නිර්මාණය වීම ගැන වාගේම යහපාලනයක අවශ්‍යතාව පිළිබඳව. 1971 - 1989 කාලය තුළ දකුණේ අර්බුද වාගේම 1983 ඉඳලා අවුරුදු 30ක් උතුරේ අර්බුදවලට ලක් වෙලා සමස්ත සමාජයම භයානක තත්ත්වයකට පත් වුණා. මේ නිසා සමාජය තුළ ප්‍රචණ්ඩත්වය, දූෂණය, වංචාව, නාස්තිය, අපේක්ෂා භංගත්වය, අවිනිශ්චිතභාවය වාගේම සමාජයට අහිතකර බොහෝ දේවල් සමාජගත වුණා. හිංසනය, ප්‍රචණ්ඩත්වය සමාජයේ කොටසක් බවට පත් වුණා.

මේ යුගය තුළ මහ ජනතාවගේ දුප්පත්කම නැති කරන්න, රටේ ආර්ථික සමෘද්ධිය ඇති කරන්න, යටිතල පහසුකම් බිහිකරන්න තිබූ වටිනා අවස්ථා අපට අහිමි වුණා. මේ තත්ත්වය සමඟ පටු දේශපාලන චින්තනයන් හා ක්‍රියාකාරිත්වයන් බලවත් වෙලා සමාජය ඉතාම භයානක හා විනාශකාරී තත්ත්වයකට පත්වෙලා තිබුණා. ඒ වාගේම, අපි නොහිතපු විධියට අපේ මැතිවරණ ක්‍රමයත්, ඒ තුළ ඇතිවූ අනවශ්‍ය වියදම් වාගේම තරගයත් අපේ සමාජය තවදුරටත් නරක තැනකට ගෙන ආවා. යුද ජයග්‍රහණ සමඟ නිර්මාණය වූ ඒකාධිපති හා පවුල් පාලනය මේ තත්ත්වය තවදුරටත් භයානක හා නරක තැනකට ගෙන ගියා. මේ තත්ත්වය වෙනස් කරන්න අභීත නායකත්වයක් වාගේම ජීවිත පූජාවෙන් අරගල කරන්න අවශ්‍ය වුණා. අපි එහි පුරෝගාමීන් වුණා. එය පහසු කටයුත්තක් වුණේ නැහැ. ඒ දුෂ්කර අරගලය අවසානයේ අපි ජයගත්තා.

මේ සමාජය තුළ යුක්තිය හා සාධාරණත්වය ඇතිකරන්න, සංහිඳියාව ඇති කරන්න, දූෂණ හා වංචා නැති කරන්න, අර්ථිකය දියුණු කරලා රටේ කීර්තිනාමය ගොඩනඟන්න අපි නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරන්න 2015 ජනවාරි මාසයේ 8 වැනිදා අත්තිවාරම් දැම්මා. ඒ ගැන අපි අතිශයින්ම සතුටු වෙනවා. එය මුල් පියවර පමණයි. අප විසින් ඉටුකළ යුතු බොහෝ දේවල් තිබෙනවා. එම ජනතා අපේක්ෂා අපි කෙසේ හෝ ඉටුකළ යුතුයි. අඩුම වශයෙන්, පොරොන්දු වූ දේ ඉටු කිරීම ජනතාව අපේක්ෂා කරන යහ පාලනයයි. එය අප ක්‍රියාවෙන් ඉටුකළ යුතුයි.

ගරු ජනාධිපතිතුමා, -මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- 70වන නිදහස් දින සමරුවේදී ඉතාමත් වැදගත් ප්‍රකාශයක් කළා. දූෂණ විරෝධී මත ශක්තිමත් කිරීම හා ඒ මතය ක්‍රියාත්මක කිරීම රටක අනාගත සංවර්ධනයේ ආත්මාරක්ෂාව බවත්, මූල්‍ය විනයක් ඇතිකිරීමට පුළුල් ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වී තිබෙන බවත් එතුමා ජාතිය අමතා තවදුරටත් ප්‍රකාශ කළා.

සෞභාග්‍යයේ නිදහස අත් පත් කර ගැනීම සඳහා දූෂණය, අල්ලස, හොරකම සහ නාස්තිය පිටුදැකීමට තම මාතෘ භූමිය පෙළගස්වමින් සිටින බවද එතුමා ප්‍රකාශ කළා. මමත්, ඒ වාගේම අපේ පක්ෂයත් මේ ප්‍රකාශය ඉතා ඉහළින් අගය කරනවා.

මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුවත් එයමයි. අවුරුදු 70ක් පුරා මේ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් සිටින්නේ, බොරුව රජකරවන දේශපාලනය වෙනුවට, ඇත්ත දිනවන, සාධාරණත්වය දිනවන දේශපාලනයක්. ඒ සඳහා ජනාධිපතිතුමා ප්‍රකාශ කළ විධියට, රට දිනවන සමාජ ව්‍යාපාරයක් බිහි කරන්න අපි සියලුදෙනා එකතුවෙලා කටයුතු කරන්න අවශ්‍ය වෙනවා.

බැඳුම්කරය පිළිබඳ ගැටලුව මේ ආණ්ඩුවේ හෝ පසුගිය ආණ්ඩුවේ ගැටලුවක් නොවේ. මා කලින් පැවසූ හේතු නිසා, දූෂණය සංස්කෘතියක් වූ රටක් වෙනස් කිරීම පිළිබඳ අර්බුදයකි.

**යහපාලනය ක්‍රියාත්මක වීම:**

ඒ වාගේම මම සතුටු වෙනවා, රාජපක්ෂ සමයේ සිදුවූ බරපතළ ගණයේ දූෂණ, වංචා පිළිබඳ සෙවීමට අදාළ කොමිෂන් වාර්තාවට සීමා නොවී, යහ පාලන ආණ්ඩුව වෙත එල්ලවූ චෝදනාවක් සම්බන්ධව ජනාධිපති කොමිසමක වාර්තාවක් ඉදිරිපත් කරමින් විවාද කිරීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදයක් ලබාදීමට හැකිවීම ගැන; ඒ වාගේම භාවිතය තුළ එය ඔප්පු කිරීමට හැකිවීම ගැන. කොහොම නමුත්, මේ බැඳුම්කර අර්බුදය මැතිවරණ සමයකදී පවා රට එක තැනක නවත්තන්න, පල්කරන්න යොදා ගන්න සිදුවීම සැබවින්ම කනගාටුදායක තත්ත්වයක්. ඇත්තටම අවුරුදු තුනක් බැඳුම්කර ගනුදෙනුවකට රට නැවතුණා වාගේ බවකුයි පෙනෙන්න තිබෙන්නේ. බිලියනයට හරි ට්‍රිලියනයට හරි බිංදු කීයද කියලා

[ගරු රවි කරුණානායක මහතා]

නොදන්නා අය පවා අද බැඳුම්කරයේ සිදුවූ පාඩු ගැන බිලියනවලින් හා ට්‍රිලියනවලින් කියවනවා. ඒ සමහරු බැඳුම්කරයක් කියන්නේ මොකක්ද, මොකක්ද ඒ ක්‍රියාවලිය, එහි රජයේ කොටස මොකක්ද, ප්‍රාථමික වෙළෙඳ පොළ හැසිරෙන්නේ කොහොමද, ද්විතීයික වෙළෙඳ පොළ තුළ සිදුවන්නේ මොකක්ද, මේ වාගේ මූලික කාරණා පවා නොදන්නා බව පැහැදිලියි.

මම පැහැදිලිව කියනවා, දූෂණ තිබෙනවා නම්, බැඳුම්කරයේ පමණක් නොවෙයි සියලු දූෂණ ගැන හොයන්න ඕනෑ, දඬුවම් කරන්න ඕනෑ. ඒක නොවෙයි අර්බුදය. මේ සියලු මාධ්‍ය සංදර්ශනවලින් අපි ලබාගන්නේ කුමක්ද කියලායි.

දූෂණවලට එරෙහිවීම පසුගිය මැතිවරණවල ලංකාවේ පමණක් නොව දියුණු නැති බොහෝ රටවල ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේත් පසුගිය දශක කිහිපයක්ම ප්‍රධාන මාතෘකාව වුණේ දූෂණය. නමුත්, දූෂණය දිගටම තිබෙනවා. ඒත් හැමෝම, හැම මට්ටමින්, හැමවිටම දූෂණ ගැන පමණක් කථා කරලා, ඒ මත අපේ දේශපාලනය කරන එකයි අර්බුදය. ඒ තුළ නිර්මාණය කරනු ලබන මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයයි ගැටලුව.

දූෂණ ගැන කථා කරලා පමණක් යහ පාලනය ලබා ගන්න, සංහිඳියාව ඇතිකරන්න, යටිතල පහසුකම් ලබාදෙන්න, රැකියා උත්පාදනය කරන්න, සෘජු ආයෝජන - FDIs - ලබාගන්න, ජාත්‍යන්තරය දිනාගන්න, ආර්ථික සමෘද්ධිය ලබාගන්න බැහැ.

හැබැයි දූෂණ අඩු කරන එක යහ පාලනයයි. එය මේ සියලු දේ ලබා ගන්න වැදගත් වනවා. හැබැයි දූෂණ නැති කළ පමණින් රටේ සියලු ගැටලු විසඳන්න බැහැ. අපි දූෂණ හොයන එක ඒ අදාළ ආයතනවලට භාර දීලා, මේ අපේ දුක් විඳින මිනිසුන්ගේ ගැටලු විසඳන්න, 70 වසරක් අපි මුහුණ දුන් අර්බුද විසඳා ගන්නේ කොහොමද කියලා හොයලා බලන්න ඕනෑ. ඒ වාගේම සමාජය මෙතරම් ප්‍රචණ්ඩ ඇයි, දූෂිත ඇයි කියලා, ඒවාට හේතු හොයලා පිළියම් යොදන්න ඕනෑ. එහෙම නැතිව "දූෂණ, දූෂණ" කියලා කථා කර කර හිටියාට මේ අර්බුද විසඳන්න බැහැ. මේකට විද්‍යාත්මක වූ කළමනාකරණ ප්‍රවේශයක් අවශ්‍ය වෙනවා.

**සාධනීය දේශපාලන ප්‍රවේශයක්:**

පසුගිය මාසයේ පත්තර, රූපවාහිනී බලන්න. මොනවද කථා කරලා තිබෙන්නේ? මොනවාද සාධනීය constructive දේවල් කථා කරලා තියෙන්නේ? අපට නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කර ගන්න ඕනෑ වෙලා තිබෙනවා. මේ destructive politicsවලට තිත තියන්න ඕනෑ. අලුතෙන් හිතන්න ඕනෑ. සංවර්ධනය පිළිබඳ ප්‍රවේශයක් අවශ්‍යයි. නායකයින් විනාශ කරන කුහක දේශපාලනය වෙනුවට නායකයින් තනන යහපත් දේශපාලනයක් බිහි කරන්න ඕනෑ. කොටින්ම constructive political approach එකක් - සාධනීය දේශපාලන ප්‍රවේශයක් - අද අපට අවශ්‍ය කර තිබෙනවා. මන්ත්‍රීවරයෙක් හැටියට, පුද්ගලයෙක් හැටියට මට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ විශාල අර්බුදයකටයි. ඒ තමයි මේ විනාශකාරී දේශපාලනය තුළ ලංකාවේ ඉන්න එකම පව්කාරයා, එකම අපරාධකාරයා බවට මාව පත් කරන්න හදන දේශපාලනයක් පසුගිය කාලයේ ක්‍රියාත්මක වීම. එය අදටත් ක්‍රියාත්මක වෙන්න හදනවා. යහ පාලන සම්මුති ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශ්වකරුවකු ලෙස එක්සත් ජාතික පක්ෂයටත් මේ තුළින් පහර දෙන්න කුමන්ත්‍රණ සිදු වෙලා තිබෙනවා. මට කොතරම් මඩ ගැහුවත්, එක්සත් ජාතික පක්ෂයට කොතරම් අවලාද නැගුවත් මම හිතනවා, මේ තත්ත්වය මොන අඩු පාඩු තිබුණත් යහ පාලනය වෙනුවෙන් අපි ගත් උත්සාහයේ ප්‍රතිඵල කියලා. මේ තුළ රටේ දේශපාලකයින්, රටේ නිලධාරින් වාගේම ජනතාව යහපාලනය වෙත වඩාත් නැඹුරු වෙනවා. වැරදි කරපු අයට දඬුවම් ලැබෙනවා. වැරදි කරන්න භය වෙනවා. ඒ වාගේම වැරදි අඩු පාඩු වාගේම හොරකම් කරන්න අමාරු වෙන පද්ධති හා ක්‍රමවේද සකස් කරන්න අපි සියලුදෙනා උත්සාහ ගන්නවා.

**බැඳුම්කර අර්බුදය:**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කොමිසම් වාර්තා දෙකම ගැන අපි කථා කළ යුතු වෙනවා. මුලින්ම බැඳුම්කර කොමිසම ගැන හා ඒ තුළ මා සම්බන්ධ කර ගැනීම ගැන කථා කරන්න කැමතියි. බැඳුම්කර කොමිසමේ කටයුතුවලට මාගේ නම පටලවපු දවසේ සිට මෙම කොමිසමේ වාර්තාව ද එළි දකිනතුරු මම සිටියේ නොඉවසිල්ලෙන්. මම නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරමින් ඇමතිකමින් ඉල්ලා අස් වුණේ මේ රටේ දේශපාලනයට නව ප්‍රවේශයක් ලබා දෙන්නයි. බොහෝ අය මෙවැනි අවස්ථාවල බලවතුන්ගේ රැකවරණය ලබා ගෙන පක්ෂ මාරු කරලා ආරක්ෂා වෙනවා. මගේ ප්‍රවේශය වුණේ අභියෝගයට මුහුණදීමයි. සත්‍ය කවදා හෝ ජය ගන්නවා. බොරුවට ආයුෂ නැහැ. ඒ හින්දා මම තනිවම මේ යුක්තිය වෙනුවෙන් සටන් කරන්න තීරණය කළා. අද එහි යම් ජයග්‍රහණයන් අපි ලබා ගනිමින් සිටිනවා. සත්‍ය යම් පමණකට හෙළිදරව් වෙමින් පවතිනවා. මම එකින් එක ඒ ගැන පෙන්වා දෙන්නම්. ජනාධිපතිවරයා විසින් ප්‍රශ්නගත බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසම පත් කරනු ලැබුවේ 2017 ජනවාරි 27වන දා. එහි විමර්ශන කටයුතු එම වසරේ පෙබරවාරි මාසයේ ආරම්භ කෙරුණා. පසුව එම කොමිසම මාස 10ක පමණ කාලයක් සිදු කළ විමර්ශන කටයුතුවලින් අනතුරුව සකස් කළ වාර්තාව, 2017 දෙසැම්බර් මස 30වන දින ජනාධිපති වෙත බාර දෙනු ලැබුවා. එම වාර්තාව ඇසුරෙන් සකස් කළ කෙටි වාර්තාව -විශේෂයෙන් මා දේශපාලන වශයෙන් විනාශ කිරීමට ඉලක්ක සහිත මේ වාර්තාව- 2018 ජනවාරි මස 3වැනි දින ජනාධිපතිවරයා විසින් ජාතිය අමතා ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ විශේෂ ප්‍රකාශයක් ලෙස කියවනු ලැබුවා. මේ ප්‍රකාශය පිළිබඳව මමත්, මගේ පවුලත්, හිතවත් පාක්ෂිකයිනුත් අතිශය විමතියට හා කම්පාවට පත් වුණා. ඒ සමඟම අපට මේ විකෘති කළ කරුණු පරදවලා සත්‍ය ජය ගැනීමට සටන් කරන්න පුදුම ශක්තියක් ලැබුණා. මේ අනුව මේ වාර්තාවේ නිර්දේශ හා උක්ත ප්‍රකාශය අතර පරතරය පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුවත් කළා. ඊළඟට, මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න උත්සාහ කළා. එයත් කිසියම් නොපෙනන බලවේගයක් වැන්නක් හමුවේ වැළකී ගියා.

**ජනාධිපතිතුමාගේ ප්‍රකාශය:**

ජනාධිපති ජාතිය අමතා කළ එම ප්‍රකාශයෙහි මා සම්බන්ධව කරන ලද කොටස තුළ මෙසේ සඳහන් වෙනවා:

"ඇලෝසියස් පවුලට අයත් වන ඔවුන්ගේ පාලනයට නතුව තිබූ වෝල්ට් ඇන්ඩ් රෝ සමාගම විසින් පෙන්ට් හවුස් තට්ටු නිවසකට කුලිය ගෙවීම පිළිබඳව හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා වෙත වගකීම වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත යටතේ නඩු පැවරිය යුතු බවත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ කොමිෂන් සභාවට ඔහු අසත්‍ය සාක්ෂි දීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බවත් මෙම වාර්තාවේ සඳහන් වෙනවා."

මූලික කරුණු කිහිපයක් එම වාර්තාවේ අඩංගු වෙනවා. "නිවසකට කුලිය ගෙවීම පිළිබඳව හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා වෙත වගකීම" යනුවෙන් ද වාර්තාවේ

සඳහන් වෙනවා. "ඔහුට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත යටතේ නඩු පැවරිය යුතු බවත්, ඔහු අසත්‍ය සාක්ෂිදීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බවත්" මෙම වාර්තාවේ ඇතුළත් වෙනවා. එම නිසා මෙම වාර්තාව පිළිබඳ සත්‍ය තත්ත්වය දැනගන්න මට ඕනෑ වුණා. තොරතුරු අයිතිය යටතේ මෙම වාර්තාවේ පිටපතක් ඉල්ලුවා. ඒ නිසා මා විසින් 2018 ජනවාරි මස 5 වන දින තොරතුරු අයිතිය යටතේ මෙම කොමිෂන් සභා වාර්තාව ජනාධිපති කාර්යාලයෙන් ඉල්ලා සිටියා. ඒ අනුව 2018 ජනවාරි මස 17 වන දින මා හට ජනාධිපති කාර්යාලයෙන් මෙම වාර්තාවේ පිටපතක් ලබා ගන්නට හැකි වුණා.

වාර්තාවේ සඳහන් කරුණු මොනවාද කියා අපි බලමු. මුදල් ඇමති ලෙස රාජ්‍ය බැංකුවලට උපදෙස් දීමේදී කිසිදු වරදක් කර නොමැති බව බැඳුම්කර කොමිසම පිළිගෙන තිබෙනවා. බැඳුම්කර ගනුදෙනුවලදී මා මුදල් ඇමති ලෙස කටයුතු කරමින් රාජ්‍ය බැංකුවලට උපදෙස් දීමෙන් රජයට විශාල පාඩුවක් කළ බවට සමහර දේශපාලනඥයින් හා මාධ්‍ය විසින් විශාල ප්‍රචාරයක් ගෙන ගියා. කරුණාකර බලන්න, කොමිෂන් සභා වාර්තාව ඒ ගැන කියා ඇති දෙය. මම එම වාර්තාවේ පිටු අංක 838 වෙත ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

මගේ මිත්‍ර ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මෙතැන සිටිනවා. එතුමා මෙම වාර්තාවේ පිටු අංක 838 වෙත අවධානය යොමු කළොත් අවබෝධ වේවි කොමිෂන් සභා වාර්තාවේ මා නිදොස් කර තිබෙන බව.

එහි මෙසේ සඳහන් වෙනවා:

"We have earlier, concluded that, in view of the undesirably high Yield Rates which then prevailed, it was reasonable and justifiable for Hon. Ravi Karunanayake, MP, the then Minister of Finance, to wish to bring these Yield Rates down at these Treasury Bond Auctions. We have also taken the view that, since successive Governments have been known to use the state-owned People's Bank, National Savings Bank and Bank of Ceylon to implement some policy measures and it is not per se irregular for a Government to do so, we cannot find fault with Hon. Ravi Karunanayake, MP, the then Minister of Finance for convening these meetings and giving the aforesaid instructions to the three State Banks."

මේ මඟින් මුදල් ඇමති ලෙස මා අනුපාත අඩු කිරීම සාධාරණ හා නීත්‍යනුකූල බව කොමිසම මෙන්න මෙහෙම පිළිගෙන තිබෙනවා.

" .....it was reasonable and justifiable for Hon. Ravi Karunanayake, MP, the then Minister of Finance, to wish to bring these Yield Rates down at these Treasury Bond Auctions."

මීට පෙර තිබූ රජයෙන්ද මෙම ප්‍රතිපත්තිය ලෙස ගෙන ඇති බව කොමිසම තවදුරටත් පිළිගෙන තිබෙන බැවින් මගේ කිසිදු වරදක් නොමැති බව කොමිසම මේ ආකාරයෙන් තහවුරු කර තිබෙනවා.

" ....to implement some policy measures and it is not *per se* irregular for a Government to do so, we cannot find fault with Hon. Ravi Karunanayake .."

එමෙන්ම මා හෝ මුදල් අමාත්‍යාංශය මේ ගනුදෙනුවලදී මහ බැංකුවට උපදෙස් දුන් බවට කිසිදු සාක්ෂියක් නොමැති බවත් කොමිසම පිළිගෙන තිබෙනවා.

"However, we have also earlier concluded that, there is no evidence before us which suggests that, Hon. Ravi Karunanayake, MP or the Ministry of Finance advised the Central Bank of Sri Lanka that the aforesaid instruction had been given to the three State Banks."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම වාර්තාවේ 838 පිටුවේ මහ බැංකුව සහ බැඳුම්කර ගනුදෙනුව මා යටතේ ක්‍රියාත්මක වන හෝ මගේ බලපෑම් යටතේ ඇති ආයතනයන් නොවන බව පිළිගෙන තිබෙනවා. මහ බැංකුව මා යටතේ තිබුණේ නැහැ. අගෝස්තු මාසයෙන් පසුව වාණිජ බැංකුත් මා යටතේ නොවෙයි තිබුණේ. ඒ අනුව මගේ නීතිඥයන් විසින් මෙම වාර්තාව පරිශීලනය කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන නිගමනවලට එළඹී තිබෙනවා.

පර්පෙචුවල් ට්‍රෙෂරීස් හෝ වෙනත් අයකුට බැඳුම්කර මිලදී ගැනීම හා විකිණීම මඟින් ලාභ ගැනීම සම්බන්ධයෙන් මගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව බැඳුම්කර කොමිසම තහවුරු කර ඇති බව;

මහ බැංකුව විසින් බැඳුම්කර විකිණීම හෝ ප්‍රාථමික වෙළෙඳුන් විසින් බැඳුම්කර මිලදී ගැනීමේදී කිසිදු ආකාරයක නීති විරෝධී හෝ නුසුදුසු ක්‍රියාවක මා නිරත වී වරදකරුවකු වී ඇති බවට කිසිදු සාක්ෂියක් බැඳුම්කර කොමිසම වාර්තා කර නොමැති බව දැනුවත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වාර්තාවේ පරිච්ඡේද 33 නිර්දේශවලට වෙන්කොට තිබෙනවා. එහි පිටු අංක 911 සිට 922 දක්වා නිර්දේශ 30ක් දක්වා තිබෙනවා. ඉන් නිර්දේශ අංක 24 හා 25 පිටු අංක 920-921 මා හා සම්බන්ධයි. ඒ තුළ ඉංග්‍රීසි භාෂාවෙන් පහත දැක්වෙන නිර්දේශ 24 හා 25 තිබෙනවා. මා පිටු අංක දුන්නේ, මෙය අධීක්ෂණය කරන්නට පහසු වෙන්නටයි. පිටු අංක 920හි මෙසේ සඳහන් වෙනවා:

"As stated earlier in Chapter 24, we recommend that, the Commission to Investigate Allegations of Bribery or Corruption should consider whether Hon. Ravi Karunanayake, MP, while he was Minister of Finance, derived a substantial benefit from the Lease Payments made by Walt and Row Associates (Pvt.) Ltd [ which is an Associate Company of Perpetual Treasuries Ltd and which is owned and controlled by the same persons who own and control Perpetual Treasuries Ltd] for the lease of apartment occupied by Hon. Ravi Karunanayake, MP and his family and, if so, determine whether appropriate action should be taken against Hon. Ravi Karunanayake,..."

එහි සිංහල පරිවර්තනය මෙසේයි:

24වැනි පරිච්ඡේදයේ කලින් ප්‍රකාශ කර ඇති පරිදි, මන්ත්‍රී ගරු රවි කරුණානායක මුදල් ඇමතිවරයාව සිටියදී ඔහු සහ ඔහුගේ පවුල පදිංචිව සිටි නිවාසය සඳහා බදු මුදල් ගෙවීම පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම හිමි සහ පාලනය කරන පුද්ගලයන්ටම අයත් අනුබද්ධිත සමාගමක් වන වෝල්ට් සහ රෝ ඇසෝෂියේට්ස් (පෞද්ගලික) සමාගම විසින් සිදු කිරීම මඟින් ගරු රවි කරුණානායක මන්ත්‍රීවරයාට සැලකිය යුතු ප්‍රතිලාභයක් අත්වූයේ දැයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සලකා බැලිය යුතු බවට අපි නිර්දේශ කර සිටින අතර, ගරු රවි කරුණානායක මන්ත්‍රීවරයාට එවැනි සැලකිය යුතු ප්‍රතිලාභයක් අත් වූයේ නම්, අල්ලස් පනත යටතේ ඔහුට එරෙහිව සුදුසු පියවර ගත යුතු දැයි තීරණය කරන ලෙසටද නිර්දේශ කර සිටිමු.

නිර්දේශ අංක 25, පිටු අංක 921 සඳහන් වෙනවා:

"As stated earlier in Chapter 24, we also recommend that, the Hon. Attorney General and other appropriate authorities consider whether some of the evidence given by Hon. Ravi Karunanayake,

[ගරු රවි කරුණානායක මහතා]

MP before us is shown to have been incorrect and, if that is the case, whether Mr. Karunanayake should be prosecuted under Section 179 and/or Section 188 of the Penal Code or other relevant provision of the Law, read with Section 9 of the Commission of Inquiry Act No. 17 of 1948;"

එහි සිංහල පරිවර්තනය මෙසේයි:

24වන පරිච්ඡේදයේ කලින් ප්‍රකාශ කර ඇති පරිදි, ගරු රවි කරුණානායක මන්ත්‍රීවරයා අප ඉදිරියේ ලබාදුන් සාක්ෂිවලින් සමහර සාක්ෂි සදොස් සහිත බව පෙනී යන්නේ දැයි ගරු නීතිපතිවරයා සහ අනෙකුත් අදාළ බලධාරින් සලකා බැලිය යුතු බවට අපි නිර්දේශ කර සිටින අතර, එම සමහර සාක්ෂි සදොස් සහිත බවට පෙනී යන්නේ නම්, දණ්ඩනීති සංග්‍රහයේ 179 සහ/හෝ 188 යන ඡේද අනුව හෝ අන් කිසියම් නීතිමය ප්‍රතිපාදන, සහ 1948 අංක 17 දරන විමර්ශන කොමිෂන් සභා පනතෙහි 9වැනි ඡේදය හෝ යටතේ රවි කරුණානායක මහතාට එරෙහිව නීතිමය පියවර ගත යුතු දැයි තීරණය කරන ලෙසටද නිර්දේශ කර සිටිමු.

ඉහත අංක 1 ලෙස මේ ප්‍රකාශයේ මා දක්වා ඇති ජනාධිපතිවරයාගේ විශේෂ ප්‍රකාශයේ මා පිළිබඳව කරන ලද සිංහල භාෂාවෙන් සඳහන් කිරීමට පදනම් විය යුත්තේ, කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ අඩංගු ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිච්ඡේද 33 හා විශේෂයෙන් එහි අංක 24 හා 25 විය යුතුයි.

ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරයාගේ මෙම ප්‍රකාශයට පදනම් වූ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් වාර්තාවේ සඳහන් වන්නේ අංක 24, 25 අංක දරන ඡේද තුළ පමණයි. එම ඡේදයන්හි මාහට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම යටතේ නඩු පැවරිය යුතු බව හෝ අසත්‍ය සාක්ෂි දීමක් සම්බන්ධව නඩු පැවරිය යුතු බව කිසිම තැනක සඳහන් වී නැහැ. ඒ වාගේම මා සඳහන් කරන්න කැමැතියි, ජනාධිපතිවරයා විසින් කොමිසම පත් කිරීමට අදාළව නිකුත් කළ අභිනියෝගය -mandate එක-අනුවත් මේ කාරණා කොහෙත්ම අදාළ නැති බව. නමුත් අපට කොමිසමෙන් කැඳවනු ලැබුවා. යහපාලන සම්මුති ආණ්ඩුවේ නියම උරුමක්කාරයන් ලෙස අපි ඊට සම්පූර්ණ සහයෝගය දැක්වූවා. අපි කිසි විටෙකත් කොමිසමට බලපෑම් කළේ නැහැ. සම්පූර්ණ සහාය දුන්නා. ඒ අපි වැරැදි කරලා නැති නිසායි. ඒකයි අපි බය නැතිව ඉදිරියට ගියේ.

ඒ අනුව ඔප්පු වන්නේ කුමක්ද?

එනම්, ජනාධිපතිවරයාගේ ප්‍රකාශයේ සඳහන්, "ඇලෝසියස් පවුලට අයත් සහ ඔවුන්ගේ පාලනයට නතුව තිබූ වෝල්ට් ඇන්ඩ් රෝ සමාගම විසින් පෙන්ට්හවුස් තට්ටු නිවසකට කුලිය ගෙවීම පිළිබඳව හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා වෙත වගකීම වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත යටතේ නඩු පැවරිය යුතු බවත්, දණ්ඩ නීති සංග්‍රහය යටතේ කොමිෂන් සභාවට ඔහු අසත්‍ය සාක්ෂි දීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බවත් මෙම වාර්තාවේ සඳහන් වෙනවා." යනුවෙන් සඳහන් වූ කොටස සම්පූර්ණයෙන් සත්‍යයෙන් තොර බවයි මට කියන්න තිබෙන්නේ. ඒ වාගේම පැහැදිලි වන කරුණක් තමයි, මෙතරම් විශාල වාර්තාවක් දින තුනක් වැනි කෙටි කාලයක් තුළ හැදෑරීම සඳහා ජනාධිපතිවරයාට කාලයක් නොමැති බව. එවැනි පසු බිමක සත්‍යයෙන් තොර, විකෘති ප්‍රකාශ එතුමාගේ ප්‍රකාශයට ආවේ කොහොමද? ජනාධිපති කියන්නේ මේ රටේ රාජ්‍ය නායකයායි. ඒ රාජ්‍ය නායකයා, ඔහු විසින්ම පත් කළ කොමිසමේ නිර්දේශ ඇතුළත් වාර්තාවක කරුණු මේ ආකාරයට විකෘති කර ඉදිරිපත් කිරීමේ අපේක්ෂාව මොකක්ද? ජනාධිපතිතුමා මේ විධියට හිතුමතේ කාරණා ප්‍රකාශ කර නැති බව මම හොඳින්ම දන්නවා. මේක කරන්න බලපෑම් කළේ කියන කවුද එක තමයි තිබෙන ප්‍රශ්නය.

ඒ කෙසේ වුවත්, මේ මොහොතේ මට කියන්න තිබෙන්නේ, ජනාධිපතිතුමා විසින් කරනු ලැබූ මෙම ප්‍රකාශය මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මාගේ කීර්තිනාමයට, දේශපාලන ජීවිතයට, අතිශය හානි සිදු වී තිබෙන බවයි. විශේෂයෙන්ම මා කෙරෙහි විශ්වාසය තැබූ ජනතාවට, ඒ වෙනුවෙන් මට ඉඩ හසර විවර කළ ආදරණීය එක්සත් ජාතික පක්ෂයට විශාල හානියක් සිදුව තිබෙනවා.

මා මේ අවධාරණය කරන්නේ හුදු හිතලුවක් නොවෙයි. හේතු ඇතිවයි මා මේ කාරණයත් මතු කරන්නේ. ඒ වෙනුවෙන් බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව මෙතෙක් සිදු වූ සාකච්ඡා පිළිබඳව ඔබේ අවධානය යොමු කරවමි.

අගමැතිතුමා විසින් පත් කරන ලද පිටිපන කොමිසමේදීත්, ඉන් පසුව ඩිව් ගුණසේකර මහතා යටතේ කෝප් කමිටුවේ මේ පිළිබඳව කරුණු විභාග කෙරුණා. ඉන්පසුව නැවත මේ පිළිබඳව සුප්‍රීම් උසාවියේ කරුණු විභාග කෙරුණා. පසුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හමුවේ නැවත වතාවක් විභාග කෙරුණා. අනතුරුව සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සභාපතිත්වයෙන් යුත් කෝප් කමිටුවෙහි මෙම බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව විමර්ශනයක් සිදු වුණා. මේ එකදු අවස්ථාවක හෝ මාගේ නම සම්බන්ධ වුණේ නැහැ. ඉන්පසුව නැවතත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසම හරහා මෙම ගනුදෙනුව ගැන විමර්ශන කටයුතු ආරම්භ කෙරුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන් සිට මෙම පරීක්ෂණවල තත්ත්වය වෙනස් වුණා. මේ සම්බන්ධයෙන් කරුණු විමර්ශනය කළ අවස්ථා පහේදීම නොතිබුණු මගේ නම මේ ප්‍රශ්නයට ඇදී ආවා. මීට ඉහත මේ සම්බන්ධ පරීක්ෂණ කළ ආයතන මා මේ ගැටලුවට සම්බන්ධ කර නොගත්තේ මහ බැංකුව මා යටතේ තිබූ ආයතනයක් නොවූ බව පැහැදිලි ලෙස දැන සිටීම නිසායි.

පසුගිය පරීක්ෂණ සිදු වුණු විවිධ ආයතන, විවිධ පැතිවලින් මෙම ගනුදෙනුව පිළිබඳව පරීක්ෂණ පැවැත්වූවා. ඒ සියලුම ආයතන කිසිදු අයුරකින් මගේ නම සම්බන්ධ කර නොගෙන තිබුණත් පැත්තක තිබූ මගේ නම ජනාධිපති කොමිසම හමුවේ, මේ ගනුදෙනුවට සම්බන්ධ කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාස දහසක් තිස්සේ මටත්, පවුලේ උදවියටත්, එක්සත් ජාතික පක්ෂයත් පච්චකාරයා ලෙස සලකා ගල් ගැසුවේ මේ ටික කියන්නද? මාව පච්චකාරයා කරලා, කුරුසිය කරේ තියලා, කල්වරි කන්ද නඟගන විධියට මාධ්‍ය සංදර්ශන පැවැත්වූයේ මේ ටික කියන්නද? ඇත්තටම මේ තුළ සිදුව ඇත්තේ, "කන්දක් විළි ලා මීයෙක් වැදුවා" වැනි දෙයක් නොවේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය පුදුම එළවන ප්‍රකාශයක් නොවේද? මොවුන් මාස 10ක් බලා සිටියේ මේක කියන්නද?

I believe resurrection is after crucifixion. අනෙක් අතට මා කොමිසමට සහාය දැක්වීමට ස්වේච්ඡාවෙන් ගොස් පැය දෙකහමාරක් පුරා සාක්ෂි ලබා දුන්නා. නමුත් මා සාක්ෂි දුන් පසු චෝදනා ඉදිරිපත් කළ පාර්ශ්වයෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමකට

ඉඩ දුන්නේ නැහැ. එවැනි පසුබිමක මෙසේ අභූත චෝදනා කිරීම තේරුම් ගැනීමට අපහසුයි. මේ තුළ තිබෙන හාස්‍ය ජනක කරුණක් වනුයේ මට එරෙහිව සාක්ෂියක් කර ගන්න ගෙන ආ කාන්තාවට රජයේ ප්‍රභූ ආරක්ෂකයින් හයදෙනකු ලබා දීම, ඒ වාගේම ඇයගේ සහෝදරයා වෙත ප්‍රභූ ආරක්ෂකයින් දෙදෙනකු ලබා දීමයි. එහෙත් යහ පාලනය ගෙන ඒම වෙනුවෙන් කැපවීම් කර ඒ නිසාම බැට කමින් සිටින මේ කථා කරන මා හට කිසිදු ආරක්ෂකයකු ලබා දී නැහැ. තිබුණු ඒවාත් මම භාර දුන්නා. ඒ වාගේම මම කියපු බොරු සාක්ෂි මොනවාද කියා දැන ගන්න මට අයිතියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට, කරුණු විමසා බලා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසම හමුවේ බොරු ප්‍රකාශයක් කළා නම් Commissions of Inquiry Act එකේ Section 10 යටතේ ඒ අවස්ථාවේදීම මට එරෙහිව කටයුතු කිරීමට කොමසාරිස්වරුන්ට හැකියාවක් තිබුණා. ඒ සඳහා බලයක්ද ඔවුන් සතුව තිබුණා. නමුත් මාස 5ක් ගත වී, ඊට අදාළව කිසිදු පියවරක් නොගෙන මෙසේ මා හට චෝදනා නැඟීම තේරුම් ගන්නේ කොහොමද? මා ඒ පිළිබඳව නැවතත් අවධාරණය කරන්නේ මේ දේශපාලන කුමන්ත්‍රණයක් බවයි. ඒ විතරක් නොවෙයි, නීතිපති දෙපාර්තමේන්තුවේ අය බොහොම සටන්කාමී ස්වරූපයකින් තමයි එතැන සිටියේ. ඒක මාස පහකට පස්සේ ඒ අයට කියන්න අවශ්‍යතාවක් නැහැ. එතැන බොරු සාක්ෂි කියනවා කියලා තිබුණා නම්, ඊට පසුවදා ගන්න තිබුණා. මම මේ අභියෝගය කරන්නේ මෙතැන පුදුමාකාර තත්ත්වයක් ඇති වී තිබෙන නිසායි.

ඇත්ත වශයෙන්ම මා දුන් සාක්ෂි හරිද, වරදිද තීරණය කරන බලයක් එම කොමිසමට තිබුණා. ඒවා නිවැරදිද සෙවීමට යන්ත්‍රණයක් ඒ කොමිසමට තිබුණා. ඒ කිසිවක් සිදු නොකොට අද මෙවැනි තීරණයක් නැති ප්‍රකාශයක් වාර්තාවට ඇතුළත් කරන්නේ කාගේ වුවමනාවටද? නමුත් මේ කටයුතු හරහා මාව දේශපාලනිකව ඝාතනය කිරීමට කවරෙකුට හෝ තිබූ වුවමනාව ඉතා හොඳින් පෙනී ගියා. එසේම එය අදටත් සිදු වන බව මේ සිදුවීම් පෙළ කියා පානවා.

අන්තිමේදී මෙම කොමිසමට ප්‍රශ්නයක්ව ඇත්තේ, මාගේ දියණිය කුලියක් ගෙවීම පිණිස ලබා ගෙන ආපසු ගෙවූ රුපියල් මිලියන 11 ගැන පමණද? මම අද ඒ කුමන්ත්‍රණකාරයන්ගෙන් අහනවා, "මේකද, බැඳුම්කරයේ ලොකුම චෝදනාව?" කියා. අන්තිමට ඒ චෝදනාවටත් මොකද වුණේ?

මීළඟට මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා, බැඳුම්කර නිකුතුව සම්බන්ධ ජනාධිපති කොමිෂන් වාර්තාවේ Chapter 24, page 827 වෙත.

මුදල් ප්‍රතිපූරණය -reimbursement- පිළිබඳ රිසිට් පත්වලට අවධානය යොමු නොකිරීම ගැනයි මා මේ පෙන්වා දීමට සූදානම් වන්නේ.

වෝල්ට් ඇන්ඩ් රෝ ඇසෝසියේට්ස් සමාගමට මාගේ පවුල විසින් මුදල් ප්‍රතිපූරණය -reimbursement- කළ බව, එනම් ලබා ගත් මුදල් ආපසු ගෙවූ බව මා හට ඔප්පු කිරීමට නොහැකි වූ බව, එනම් කිසිදු සාක්ෂියක් පෙන්වීමට නොහැකි වූ බව - "...Mr. Karunanayake did not produce any evidence to show that any such reimbursements had,..." - කොමිසම් වාර්තාවේ පිටු අංක 827හි දක්වා තිබෙනවා.

එහෙත් පිටු අංක 832දී දක්වා ඇති පරිදි මාගේ පිළිතුරේදී, "I got the receipt here that the reimbursement has taken place" යනුවෙන් "ප්‍රතිපූරණය සිදුවූ බව පෙන්වන රිසිට් පත් මෙන්න" යනුවෙන් ප්‍රකාශ කළ බව වාර්තාවේ සඳහන් වෙනවා.

එම රිසිට් පත් එදා එලෙස ඉදිරිපත් කළත්, එය බැලීමට හෝ ඒ පිළිබඳ තවදුරටත් සොයා බැලීමට කිසිදු උත්සාහයක් එදා ගෙන තිබුණේ නැහැ. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා. ඒ කොහොම වුණත් අදාළ රිසිට් පත් ඉදිරිපත් කරන විට ඒ ගැන නොසලකා සිට දැන් මෙලෙස චෝදනා නැඟීම ඉතාම කනගාටුදායකයි. මම දන්නේ නැහැ, මේ ජනාධිපති කොමිසමක විධියද කියලා. ඒත් කොමිසමේ විධිය මේක නම් මගේ දියණිය විසින් ප්‍රතිපූරණය කළ, මා විසින් කොමිසම හමුවට ඉදිරිපත් කළ රිසිට් පත් පිළිබඳ අවධානය යොමු නොකොට කටයුතු කිරීම නිසා මට අගතියක් වූ බව සඳහන් කරන්න ඕනෑ.

එදා යහ පාලන සම්මුති ආණ්ඩුව වෙනුවෙන් මම තීරණයක් ගත්තා. මම එවකට දරපු සියලු අමාත්‍ය ධුරවලින් ඉල්ලා අස්වුණා. මම එදා පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් සිදු කරමින් සඳහන් කළා, ඉතිහාසය සහ කාලය මට හිමි තැන තීරණය කරනු ඇති බව.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මේ වාර්තාව දිහා බැලුවාම එකක් ඉතා පැහැදිලියි. ඒ, අපි 2015 දුන් පොරොන්දු ඉටු වී නොමැති බව. අපි කිසිදාක හොරු අල්ලන්න බාධා කළේ නැහැ. කොහොම හරි තෝරා ගත්ත හොරු ටිකක් අල්ලාගෙන තිබෙනවා. ඒ අය අතර රජයේ නිලධාරින් තමයි වැඩිපුර ඉන්නේ. ඒ වාගේම තෝරා ගත්ත හොරු ටිකක් ප්‍රජාතන්ත්‍රවාදය රිසි ලෙස නමන්න ආරක්ෂා කරගෙන ඉන්න බවත් අපට දකින්නට පුළුවන්. මෙහෙම යහ පාලනය ස්ථාපිත කරන්න අමාරුයි.

යහපාලනය යනු සිය දේශපාලන බලය හා මාධ්‍ය බලය පාවිච්චි කරලා බොරුව ඇත්ත කරලා දේශපාලන ඝාතන කිරීම නොවෙයි. දෛවයේ සරදමකට වාගේ යහ පාලනය වෙනුවෙන් සටන් කරපු අපට මෙසේ සිදු වීම කනගාටුදායකයි. මම හිතනවා, විරුද්ධ පක්ෂයේ අයටවත් මෙලෙස කටයුතු නොකළ යුතු බව. යහ පාලනය කියන්නේ සාධාරණ දේශපාලනයක් කරන්න සමබිමක් නිර්මාණයකොට සැමට අවස්ථාව ලබා දීමයි.

එදා ප්‍රජාතන්ත්‍රවාදය තුළ නිර්මාණය වුණේ නායකයින්; දක්ෂ නායකයින්. ඒත් මේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවත් සමඟ අද බිහි වෙලා තිබෙන්නේ මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයක්. ඒ තුළ දක්ෂ නායකයන් වෙනුවට ජනප්‍රිය පුද්ගලයින්, රටේ නායකත්වයට, පාර්ලිමේන්තුවට එනවා. මේක යුරෝපයේත් අද සිදු වෙනවා. ඒ එක්කම නව මාධ්‍ය සංස්කෘතිය තුළ, සමාජය තුළ ලෝකයේ යථාර්ථයන් යම් විකෘතියකට ලක් වෙලා සමාජගත වෙනවා. මේ මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේත්, නව මාධ්‍ය භාවිතයේත් ගොදුරක් බවට මාව පත් කරන්න බලය වාගේම මුදලුත් පසුගිය කාලයේ යොදා ගත්ත බව මම මේ ගරු සභාවට කියන්න ඕනෑ. අතීතයේ ඉඳලා අපේ නායකයෝ විනාශ කරන්න කටයුතු කළා. එදා තුවක්කුවෙන්, බෝම්බයෙන් අපේ නායකයන් විනාශ කළා. අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහතාට එරෙහිව පිස්තෝලය යොදා ගත්තා. ජනාධිපති ප්‍රේමදාස මහතාට එරෙහිව බෝම්බ පත්තු කළා, ගාමිණී දිසානායක මහතාට එරෙහිව බෝම්බ පත්තු කළා, ලලිත් ඇතුලත්මුදලි මහතාට එරෙහිව බෝම්බ පත්තු කළා. ඒ හැම අවස්ථාවකම මඩ ගහන්න මාධ්‍යයත් යම් ප්‍රමාණයකට යොදා ගත්තා.

එදා තුවක්කුවෙන්, බෝම්බයෙන් කළ දේට වඩා භයානක ලෙස දේශපාලකයින් විනාශ කරන්න මාධ්‍ය නිදහසත්, මාධ්‍ය සංදර්ශනත් යොදා ගන්නවා. මට මේ සියල්ලටම වඩා වෙනස් අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙලා. බැඳුම්කර කොමිසම් වාර්තාවේ මා සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳව සොයා බලා

[ගරු රවි කරුණානායක මහතා]

වාර්තා කිරීමට පත් කළ මාරපන කමිටුව කැකිල්ලේ තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඔවුන් බැඳුම්කර වාර්තාවට අනුව එක්සත් ජාතික පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙකු වරදක් කර නැති බව පවසනවා. ඒ සමඟම මා සම්බන්ධව කරුණු සොයා බලා කටයුතු කරන ලෙස කියා ඇති නිර්දේශ උපුටා දක්වමින් එම පරීක්ෂණ කවදා හෝ අවසන් වනතුරු මාගේ දේශපාලන කටයුතු අඩාළ කරන්න යෝජනා කර තිබෙන බවට මා දැනුවත් කර තිබෙනවා. මෙය මොන තරම් විහිලුවක්ද?

ඉදිරියේදී අපේ පක්ෂයේ නායකයන්ට කිසියම් හෝ කොමිසමකින් හෝ වෙනත් ආයතනයකින් චෝදනා එල්ල කළහොත් මා සම්බන්ධයෙන් මාරපන කමිටුවේ නිර්දේශ ඒ සියලුදෙනා සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු යැයි ඔබ සිතනවාද? එසේ නම් අපේ පක්ෂයේ ඉදිරි ගමන නැවැත්වීමට විපක්ෂය කළ යුත්තේ ඉතා සුළු කටයුත්තයි. ඒ, අපේ පක්ෂ නායකයින්ට එරෙහිව බොරු චෝදනා ඉදිරිපත් කිරීම පමණයි. මෙය කොතරම් යුක්ති සහගතද? සාධාරණද?

මේ රටේ දේශපාලනඥයින්ට නරක ජාතික පුරුද්දක් තිබෙනවා. ඒ තමයි තමන්ට එරෙහිව කිසියම් චෝදනාවක් එල්ල වුණාම, ජනාධිපති පස්සේ ගිහින් හෝ පක්ෂ නායකයා පස්සේ හැංගිලා ඒ චෝදනාවන්ගෙන් බේරෙන එක. ඒක රාජපක්ෂ පාලනය යටතේත් සිදුවුණා; අදත් සිදු වෙන බව පෙනෙනවා. ඒකේ හංගන්න දෙයක් නැහැ. කොහොමටත් ඉවුර බිඳින්නේ ගඟ නම්, අපිට වැලි කොට්ටවලින් ලොකු වැඩ කරන්න විධියකුත් නැහැ.

තවමත් කරන්න ආව දේ නොකර අපේ ඇඟේ එල්ලි-එල්ලී ගොඩ යන්න හදන අයට කියන්න දෙයක් තිබෙනවා. අද මේ ජනාධිපති පස්සේ හැංගීම නිසා නඩු නැතිව ඉන්න, එහෙත් දූෂණ වංචාවලට නම කියැවුණු කී දෙනෙක් ඉන්නවාද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිසා නඩු නැති කී දෙනෙක් ඉන්නවාද? ඒකාබද්ධ විපක්ෂයේ සිටියත් පක්ෂය balance කරන වැඩේට මුවා වෙලා කී දෙනෙක් කිසිම ප්‍රශ්නයක් නැතුව ඉන්නවාද? අද ඒ හැමෝම එක පෙළට තියලා මම මෙහෙම කියනවා. "රවි කරුණානායකගේ පොතේ ඔය දේවල් කරලා හැංගිලා බේරෙන තියරියක් නැහැ. රටේ අධිකරණයට, සමාජ යුක්තියට වෙට්ටු දමන වැඩ අපි ළඟ නැහැ. ඉස්සරහට කරන්නේත් නැහැ. මොකද, හැංගෙන්න ඕනෑ වැරදි කරපු අය විතරයි. වැඩිය එපා, ඔය අද කපුරුහාමිලා වාගේ ඉන්නා සමහරු 2015 ජනවාරි 08වැනි දා රාජපක්ෂ වේදිකාවේ ඉඳගෙන කරපු කථා ටික අහන්න. ඒ එක්කම අද කියන කථා ටික අහන්න. ඔය කපුරුහාමිලාගේ වචන විතරයි, වැඩ අන්තිමයි." එදා අපේ ජනාධිපති පොදු අපේක්ෂක, මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති බවට පත් කරන්න කොතරම් අමාරුවක් තිබුණාද? ඒ අය ඒ වේදිකාවේදී කිව්වේ මොනවාද, අද කියන්නේ මොනවාද කියන එක ගැන තමයි අපට දුක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා වැනි පෘථග්ජන පුද්ගලයෙකුට මෙහෙම දේ සිදුවීම ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. මොකද, බුදුරජාණන් වහන්සේටත් මේ වාගේම වුණා. එදාත් නගර සෝභිනියක් වූ චිංචි මානවිකාවගේ කුසේ දරමිටියක් බැඳලා එව්වා. චිංචි මානවිකාවත් කිව්වා, කුසේ ඉන්නා දරුවා බුදුන් වහන්සේගේ කියලා. අද වාගේම එදාත් ඇතැමුන් බුදුන්ව අවිශ්වාස කළා. තවත් අය බුදුන්ව විශ්වාස කළා. තවත් අය සිදු වන්නේ කුමක් දැයි නිහඬ විශ්මයෙන් යුතුව බලාගෙන සිටියා. නමුත් එදා ශක්‍ර දෙවියන් පැමිණ දරමිටිය ලිහා නිවැරදි බව ඔප්පු කළා. නමුත් අද ශක්‍ර දෙවියන් නැහැ. ඒ නිසාම කොමිසමත් හරි ලස්සනට කියනවා, මේ ලිහා පෙන්නපු දරමිටිය -ඇස් ඉදිරිපිට තිබෙන දරමිටිය- ඇත්තටම දරු ගැබක්ද කියලා පරීක්ෂා කරන්න කියලා. දරමිටිය දරු ගැබක් නම්, ඊට අදාළ පියාට එය භාර දෙන්න කියනවා. ඒ තල්ලුවෙන් ආණ්ඩුව බිඳ වට්ටන්න මාන බලන චිංචි මානවිකාවන් තවදුරටත් ඒ සෙල්ලම ඉස්සරහට ගෙනියන්න හදනවා.

"යහ පාලනය" තිබෙන්නේ සත්‍ය කුමක්දැයි සෙවීමට මිස, බොරුව ඇත්ත කිරීමට නොවන බව ජනතාව හොඳින් දන්නවා. එයට ජනතාව නිසි පිළිතුරු ලබා දෙන බව අපේ විශ්වාසයයි. පාලනයක් සිදු කරනවිට, වැරදි, අඩු පාඩු සිදු වෙන්න පුළුවන්. අපි ඒ වැරදි සහ අත් දැකීම් ගුරුවරුන් කර ගන්න ඕනෑ. තවදුරටත් බාල ජනප්‍රිය දේ සඳහා ජනතා ආකර්ෂණය ලැබෙයි කියලා හිතන්න නරකයි. මම කියන දේ අපේ ආණ්ඩුව බරපතළ විධියට ගත යුතුයි. බොරු නම් ඒ ඇත්ත නැත්ත මැතිවරණ ප්‍රතිඵල හරහා ලැබෙයි. ඒ නිසා ඡන්ද ප්‍රතිඵලයෙන් පසුවවත් අපි ආපසු හැරිලා බලමු. මේ ජනවරම තිබෙන්නේ 2015 ජනවාරි මාසයේ 08වැනි දා ලබා දුන් පොරොන්දු ඉටු කරන්නයි. ඒ සඳහාම පමණයි. බලගතු ශ්‍රී ලංකාවක්, පොහොසත් රටක් හදන්න නොහැකි වුණොත් මේ බලය අපට නැති වෙනවා. ඒ නිසා දැන්වත් අපි වැඩ කරමු; මේ රට හදමු; රටේ සංවර්ධනයට, මූල්‍ය ප්‍රතිපත්තියට අවශ්‍ය නීති නැත්නම් අලුත් නීති ගෙනෙමු. එයයි කළ යුත්තේ. එයයි අපේ වගකීම, එයයි අපි ජනවරමට ලබාදෙන වගවීම.

මගේ දරුවන්ට, පවුලට වාගේම මම ආදරය කරන්නේ අපේ පක්ෂයට; මේ රටට බොහෝ යහපත් දේ දායාද කළ එක්සත් ජාතික පක්ෂයට. අපේ නායකයින්ට -ඩඩ්ලි සේනානායක අගමැතිතුමාට, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස වැනි ජනපතිවරුන්ට, ලලිත්, ගාමිණී වාගේ නායකයින්ට, අපේ වත්මන් නායක රනිල් අගමැතිතුමාට- හැම විටම මේ කුහක මිනිසුන් වැරදි චෝදනා කළා. එහෙත් කවදාවත් ඒ චෝදනාවලින් ඒ ඇත් රාජයන්ට හානි කරන්න බැරි වුණා. අද මේ වෙනත් ස්වරූපයකින් කරන්නේත් එදා කළ දේමයි. අද අපිට අවශ්‍ය වන්නේ නායකයින් විනාශ කිරීම නොව, බිහි කිරීම බව අපේ පාක්ෂිකයින් තේරුම් ගෙන තිබෙනවා.

අවසානයේදී, මා රටේ සිටින අපේ යූඑන්පී පාක්ෂිකයන්ගෙන් ආදරයෙන් ඉල්ලන්නේ, 2018 පෙබරවාරි මාසයේ 10වන දින උදෙන්ම ඡන්ද පොළට ගිහින් ඔබේ ගම, ප්‍රදේශය දියුණු කළ හැකි යූඑන්පී ප්‍රාදේශීය සභාවක්, නගර සභාවක් පත් කරන්න, එමඟින් එක්සත් ජාතික පක්ෂය දිනවන්න, යහපාලන ආණ්ඩුව ශක්තිමත් කරන්න ඔබේ වටිනා ඡන්දය පාවිච්චි කරන්න කියලායි.

අපේ පොදු අපේක්ෂක ජනාධිපතිතුමාටත්, අපේ අගමැතිතුමාටත්, එක්සත් ජාතික පක්ෂයටත්, සත්‍යයට යුක්තියට කැප වන ජනතාවටත් ජය වේවා! සත්‍යය සැඟවිය හැක්කේත්, පරාජය කළ හැක්කේත් කෙටි කාලයකට පමණයි. කවදා හෝ සත්‍යය හෙළිදරවු වනු ඇත; ජය ගනු ඇත. අප සැම උත්සාහ කළ යුතු වන්නේ සත්‍යය ඉක්මනින් ජයග්‍රහණය කරවීමටයි. සත්‍ය මේව ජායතේ! බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා.

[අ.භා. 2.27]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරු අල්ලන්න ආ ආණ්ඩුව 2015 ජනවාරි 09වන දා බලයට පත් වෙලා හරියටම දින 49කින් මහ බැංකුවේ මහා කොල්ල කෑම 2015 පෙබරවාරි 27වන දා සිදු කළා. එතැන් පටන් මේ වංචාව දිගින් දිගටම සිදු වූ බව තමයි මේ

වාර්තාවෙන් පැහැදිලි වන්නේ. මෙවැනි මහා අපරාධයක් කරන්න විදේශිකයකු වූ අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකාවට ගෙනැල්ලා මහ බැංකුවේ අධිපති තනතුරෙහි වාඩි කරවන්නේ අගමැතිතුමායි. ඉතිහාසය පුරා මුදල් අමාත්‍යවරයාට හිමි වූ මහ බැංකුව අගමැතිවරයා යටතේ ගැසට් කරවාගන්න කටයුතු කරන්නේ අගමැතිතුමායි. ඒ අනුව මේ මහා මංකොල්ලය සැලසුම් කරන්නේ අගමැතිතුමායි කියන කාරණය ඉතාම හොඳින් තහවුරු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය මා විතරක් නොවෙයි කියන්නේ. ජනාධිපතිතුමා ම ප්‍රකාශ කරනවා, "මම මේකට විරුද්ධ වුණා. ඒ අවස්ථාවේ 'මේ පත්වීම පිළිබඳ වගකීම මම භාර ගන්නවා' කියා අගමැතිතුමා එම වගකීම භාර ගත්තා" කියලා. එහෙම නම් මේ මහා මංකොල්ලය සැලසුම් කළ මහා මොළකරු අගමැතිතුමා නොවන්නේද යන ප්‍රශ්නය අපට මතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ ප්‍රථම වතාවට තමයි මෙවන් දෙයක් රටේ අගමැතිවරයාගේ මැදිහත් වීමෙන් සිද්ධ වන්නේ. මා හිතනවා එය ගිනස් වාර්තාවක් බවටත් පත් වෙලා ඇති කියා. අපට මතකයි අගමැතිතුමා ප්‍රකාශ කළා, "අර්ජුන මහේන්ද්‍රන් කියන්නේ විශ්වාසවන්ත පුද්ගලයෙක්; මගේ හිතවතෙක්. සිංගප්පූරුවේ විවාහ උත්සවයකට ගියේත් මගෙන් අහලායි. ඕනෑම අවස්ථාවක මට ඔහු ගෙන්වා ගන්න පුළුවන්" කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අධිකරණයට අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා ඕනෑ වෙලා තිබෙනවා. එහෙම නම් ජනාධිපතිතුමා දැන් තමන්ගේ අගමැතිවරයාට අණ කරන්න ඕනෑ සිංගප්පූරුවට ගිහින් හෝ වහාම අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට අරගෙන එන්න කියා. ඒ වාගේම එතුමා අණ කරන්න ඕනෑ ඔහු අරගෙන එන්න බැරි නම් ඔබතුමා සිංගප්පූරුවේ ම නතර වන්න කියා. එහෙම වුණොත් ජනාධිපතිතුමාගේ නව අගමැතිවරයකු පත් කරගැනීමේ සිහිනයත් සැබෑ කරගන්න පුළුවන් වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැඳුම්කර පිළිබඳ ජනාධිපති කොමිසම ආවරණය කරන්නේ 2015 පෙබරවාරි 01වන දා ඉඳන් 2016 මාර්තු 31 දක්වා සිදු වූ වංචා සොයා බැලීමයි. නමුත් අර්ජුන මහේන්ද්‍රන් තවත් මාස තුනක් -ඒ කියන්නේ 2016 ජුනි මාසයේ 30වන දා දක්වා- මහ බැංකු අධිපති විධියට කටයුතු කළා. එහෙම නම් 2016 අප්‍රේල් 01වන දා සිට 2016 ජුනි 30 දක්වා අර්ජුන මහේන්ද්‍රන් කළා වූ ක්‍රියාකාරකම් පිළිබඳව මේ වාර්තාවෙන් ආවරණය වන්නේ නැහැ. ඒ නිසා මම හිතනවා, මහ බැංකුවේ සිදු වූ මේ මහා වංචාවේ දිග හැරුම ගැන අවබෝධයක් ලබා ගන්න නම් ජනාධිපතිතුමා එම කාලය ද ආවරණය වන පරිදි දෙවන ජනාධිපති විමර්ශන කොමිසම අනිවාර්යයෙන්ම පත් කළ යුතුය කියා. වඩාත් හොඳයි 2016 අප්‍රේල් 01වන දා සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය ම ආවරණය වීමට දෙවන ජනාධිපති කොමිසම පත් කරනවා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වාර්තාවට හසු නොවන කාලය තුළදී 2016 අප්‍රේල් මාසයේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය ලැබූ ලාභය රුපියල් මිලියන 4,120යි; මැයි මාසයේදී රුපියල් මිලියන 790.8යි; ජුනි මාසයේදී රුපියල් මිලියන 409.4යි. මෙවැනි අසාමාන්‍ය ලාභයක් ලැබීමට නම් අනිවාර්යයෙන්ම වංචාව මාර්තු 31න් නොනැවතී ඉදිරි කාලයටත් ක්‍රියාත්මක වී තිබිය යුතුයි. ඒ නිසා දෙවන ජනාධිපති කොමිසම පත් කිරීමෙන් පමණමයි, මේ යුගයේ මෙවැනි අසාමාන්‍ය ලාභ ලැබීමට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට පුළුවන් වුණේ කෙසේද, ඒ සඳහා රජයේ ඉහළ තනතුරු දරන එක් එක් පුද්ගලයන්ගේ දායකත්වය කුමක්ද කියන එක සොයා ගැනීම කරන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මා ඉදිරිපත් කරන ඉලක්කම්. අපි කියන විධියට ඒ මාස තුනට රුපියල් මිලියන 5,320ක ලාභයක් ලබා තිබෙනවා. මාස තුනට රුපියල් මිලියන 5320ක්! මේ ඉලක්කමත් නිවැරදිද, ඊටත් වඩා වැඩිවිය හැකිද කියන කාරණය පිළිබඳව මූල්‍ය පාලන අධිකාරිය හැටියට මේ පාර්ලිමේන්තුව මහ බැංකුවෙන් සහතිකයක් ලබාගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට වචන හරඹ කරන්න පුළුවන්. අද හැමෝම කරුණු මතු කරනවා, එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තු මැතිවරණයේදී නොමසුරුව වියදම් කළේ මේ බැඳුම්කර වංචාවෙන් උපයාගත් ලාභය කියලා. එහෙම නම් ඒ මාස තුනේදී උපයා තිබෙන රුපියල් මිලියන 5,200ට අධික ලාභය මේ පුංචි මැතිවරණයේදීත් එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය තහවුරු කිරීම සඳහා සෑම තැනම වියදම් වෙනවා වෙන්න පුළුවන්. ඒ නිසා වහාම මේ මුදල් රජයට පවරා ගැනීමට යුහුසුළුව ක්‍රියාත්මක වීමේ වගකීම පාර්ලිමේන්තුවටත්, සැබෑ යහ පාලනයක් බලාපොරොත්තු වන සෑම දෙනාටත් තිබෙනවාය කියන එක මම මේ ගරු සභාවට සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 ජනවාරි 03වන දා ජාතිය අමතමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, මේ වාර්තාවේ පිටු 1,257ක් තිබෙන බව. අන්තර්ජාලයට මුදා හැරි අවස්ථාවේ මා ගණන් කළාම පිටු තිබුණේ 1,154යි. මුද්‍රිත වාර්තාවේ තිබෙන්නේ 1,152යි. ඒ අනුව පිටු 103ක් හෝ 105ක් අතුරුදහන් වෙලාය කියලා අපි රට ඉදිරියේ කිව්වාම, ආණ්ඩුවේ ඇමතිවරු කිව්වා, ජාතිය නොමඟ යවන්න එපා කියලා. නමුත් මා කී දේ නිවැරදියි, ඇමතිවරු වැරදියි කියා අතිගරු ජනාධිපතිතුමන් පිළිගෙන, තිබෙන සංවේදීභාවය, රහස්‍යභාවය සලකා එතුමා විසින් යම් යම් ලේඛන ප්‍රමාණයක් ඉවත් කළ බව සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට CD තැටියක් ලැබුණා. ඒ CD තැටියේ අන්තර්ගතය මොකක්ද කියලා ලේබලයක්වත් අලවා නැහැ. සමහරු අපට කියනවා, ජනාධිපතිතුමා විසින් සඟවාගත් ලේඛන ටික තමයි එහි තිබෙන්නේ කියලා. ඒක එහෙමද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. අපට ඒක කියවන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා මේ විවාදයේදී ඒ ගැන කථා කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ CD පටය අධ්‍යයනය කිරීමෙන් පසු මෙහි අන්තර්ගත ගැන, මෙතෙක් සඟවාගෙන තබා සිටි, අප විසින් මහත් පරිශ්‍රමයෙන් හෙළිකර ගත් ඒ ලේඛන පිළිබඳ තවත් පාර්ලිමේන්තු විවාදයක් පැවැත්විය යුතුයි කියා අපි යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කොමිෂන් සභා වාර්තාවේ 860වන පිටුවේ සඳහන් වෙනවා, පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගම පිළිබඳව මහ බැංකුව මඟින් සිදු කරන ලද විමර්ශන වාර්තාවක්. ඒ වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ Report of the Examination of Perpetual Treasuries Limited. ඒ වාර්තාව අංක 01 ලෙස නම් කරමින් මම **සභාගත*** කරනවා.

එම වාර්තාවේ 10වන පිටුවේ 'ඩී' කොටසේ අර්ජුන් මහේන්ද්‍රන් තම බලතල භාවිත කරමින් තම බෑණා වන අර්ජුන් ඇලෝසියස්ගේ සමාගමට මහ බැංකුවේ දෛනික ද්‍රවශීලතා පහසුකම් අවභාවිත කරමින් රුපියල් බිලියන 41.98ක මුදලක් ලබාදී තිබෙන බව සඳහන් වෙනවා. Sir, let me quote Item (d) (ii) on page No. 10 of the Report:

> "On 01.04.2016 PTL participated at the OMO auction to borrow Rs.22 bn at 8% to cover the shortfall to settle the T bonds received (Rs.36 bn) at the auction for settlement on 01.04.2016. Further PTL used the Intra Day Liquidity Facility (ILF) to borrow Rs.19.98 bn throughout the day (01.04.16). However, the company was unable to provide the required securities to secure the funding from the OMO auction amounting to Rs.11.1 bn. and was fined a penalty of Rs.7.6 mn........"

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙහි ඉතා පැහැදිලිව සාක්ෂි සඳහන් වනවා, මාමා විසින් මහ බැංකු අධිපති තනතුර තමන්ගේ බෑණාගේ සුගතිය වෙනුවෙන් කොහොමද පාවිච්චි කළේ කියලා. දෙවැනි කොමිසමක් පත් කළොත්, අනිසි ලෙස උපයාගත් ලාභය රජයට අය කර ගැනීමට පමණක් නොවෙයි, මේ මහා වංචාව සම්බන්ධයෙන්ද අනිවාර්යයෙන්ම දඬුවම් ලබාදීමට කටයුතු කරන්න පුළුවන් වන බව අපි කල්පනා කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ 19 වන පිටුවේ 2 වගන්තියේ මෙසේ කියනවා:

> "Outright Dealings of PTL with Perpetual Capital Holdings (Pvt) Ltd"

මේ මහ බැංකු වංචාව පිළිබඳ ජනාධිපති කොමිසම විසින් ගණනය කරන ලද, පර්පෙචුවෙල් ට්‍රෙෂරීස් උපයා ගත්ත ලාභය කියන එක ඇත්තෙන්ම අවතක්සේරු කරන ලද ලාභයක්. එහෙම වෙන්නේ, පර්පෙචුවෙල් ට්‍රෙෂරීස් අපූරු වැඩක් කරන නිසා. ඔවුන් මිලදී ගන්නා බැඳුම්කර ඔවුන්ගේ මව් සමාගමට ලාභයක් රහිතව, පාඩු පිට විකුණනවා. ඉන්පසු මව් සමාගම ඒ බැඳුම්කර ඉහළ මිලකට විකුණලා ලාභ ලබනවා. දැන් මේ ලාභය තිබෙන්නේ පර්පෙචුවෙල් ට්‍රෙෂරීස්වල නොවෙයි, පර්පෙචුවෙල් ට්‍රෙෂරීස්වල මව් සමාගමේ. එතකොට, මේ බැඳුම්කර සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමට ඒ මුදල හෙළි වෙන්නේ නැහැ, මේ කියන ආකාරයට. This is what Item 2(i) on page 19 states:

> "PTL has carried out sell and buy deals with its holding company, Perpetual Capital Holdings (Pvt) Ltd (PCHL) which has resulted in capital gain of Rs. 323.6 million to PCHL during the period from 01.06.2015 to 31.05.2016."

මේ වංචනික ක්‍රියාවලිය පිළිබඳව දෙවන ජනාධිපති කොමිෂන් සභාවේ අවධානය යොමු කරනු ඇතැයි කියා අපි බලාපොරොත්තු වනවා.

මේ වාර්තාව මහ බැංකු අධිපතිවරයාට ලැබෙන්නේ 2015 දීයි. දැනට මේ වාර්තාව ලබා දීලා වසර දෙකකට වැඩියි. මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳව වත්මන් මහ බැංකු අධිපතිවරයා මේ ගරු සභාවට ගෙන්වලා ප්‍රශ්න කරනු ඇතැයි කියලා අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාර්තාවේ මගහැරුණු පිටු ගැන කථා කරද්දී, පර්පෙචුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ අධිපති අර්ජුන් ඇලෝසියස් සමඟ අසාමාන්‍ය ආකාරයෙන් දුරකථනයෙන් රහසේ උකුළු මුකුළු කරපු මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් වුණා. මම කැමැති නැහැ ඒ නම් සඳහන් කරන්න. මොකද, එතුමන්ලා වැරදිකරුවන් නොවී එතුමන්ලාට ප්‍රශ්නයක් ඇති කරන්න මම කැමැති නැහැ. නමුත්, අද සමාජයේ ප්‍රබල මතයක් තිබෙනවා එම මන්ත්‍රීවරුන්ට වාහන, ඉඩම්, නිවාස ලැබුණාය කියලා. ඒ පිළිබඳ විස්තරද ජනාධිපතිතුමා විසින් රඳවා තබා ගත්තාද කියන කාරණය මම දන්නේ නැහැ. පළමුවෙනි කොමිසමෙන් ඒ පිළිබඳ විමර්ශනයක් සිදු නොවුණා නම්, ඒ මන්ත්‍රීවරුන්ටත් සාධාරණයක් වෙන්න, ඊටත් වඩා මේ මුදල්වල සැබෑ අයිතිකරුවන් වන රටේ ජනතාවට සාධාරණයක් වෙන්න, පාද සටහන් යොදපු, දුරකථන ඇමතුම් ගත් මන්ත්‍රීවරුන්ට එරෙහිව එන චෝදනා පිළිබඳව විමර්ශනයක් දෙවැනි කොමිසම විසින් සිදු කිරීම අනිවාර්යෙන්ම විය යුතුයි කියලා අපි කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ජුන් මහේන්ද්‍රන්ගේ නිල කාලය තුළදී කරන ලද වියදම් පිළිබඳ සම්පූර්ණ අභ්‍යන්තර විගණන වාර්තාවක් වත්මන් මහ බැංකුවේ අධිපතිතුමාට 2016.08.01 වන දා භාර දෙනවා. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - Internal Audit Department - හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන්ගේ විදේශ ගමන් ඇතුළුව අනෙකුත් වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව -"Review of the Procedures Adopted on Foreign Travel and Other Expenses of the Former Governor" - අංක 02 යනුවෙන් සඳහන් කරමින් මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව අනුව අවස්ථා 163කදී රාජ්‍ය මුදල් අවභාවිත කරමින් රුපියල් මිලියන 66.28ක වංචාවක් අර්ජුන් මහේන්ද්‍රන් සිදු කළ බවට ඔහුගේම යටතේ තිබුණු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වාර්තා කරලා තිබෙනවා. මේ වාර්තාව දෙන්නේ 2016 අගෝස්තු මාසයේ 01 වන දා, මීට මාස 16කට කලින්. වර්තමාන මහ බැංකු අධිපතිතුමා මාස 16ක් පුරාවට මේ වාර්තාව පිළිබඳ ගත් පියවර මොනවාද කියන එක ඔහු විසින් රටටත්, මේ ගරු සභාවටත් හෙළි කළ යුතුමයි. එහෙම නැත්නම් දූෂණයක් යටපත් කිරීම, දූෂණයට අනුබලදීම සම්බන්ධයෙන් වත්මන් මහ බැංකු අධිපතිවරයාද නීතිය ඉදිරියට ගෙන යෑමට සිදු වන බව අපි එතුමාට ඉතාම කනගාටුවෙන් සඳහන් කරනවා. මොකද, එතුමාත් අපේ අගමැතිතුමාගේ පන්තියේ හිටපු මිත්‍රයෙක් වාගේම, අපේ හිතවත් මලික් සමරවික්‍රම ඇමතිතුමාත් සමඟ එකට රගර් ක්‍රීඩාවේ යෙදුණු මිත්‍රයෙක් බවට තමයි අපට ආරංචි තිබෙන්නේ. එම නිසාද දන්නේ නැහැ, වයස අවුරුදු හැටඅටක් වෙලත් එතුමාට මහ බැංකු අධිපති තනතුර ලැබුණේ.

ඒ විතරක් නොවෙයි, අද වන තුරු පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව ඉදිරියටවත් එතුමා පැමිණ නැහැ. එතුමාට එම විශේෂ වරප්‍රසාදය ලැබුණේ, අගමැතිතුමාගේ සමීප මිතුරෙක් වීම නිසාද, ඒ වාගේම අපි සඳහන් කරන මේ වංචාව පිළිබඳව කිසිම පියවරක් නොගෙන සිටින්නේත් ඒ නිසාද? අප වාගේම සමස්ත ජාතියම, තමන්ගේ අරමුදල්වලට මොකද වෙන්නේ කියලා සාතිශය කම්පාවට පත් වෙලා ඉන්න මේ රටේ බහුතර ජනතාවම එම ප්‍රශ්නය නඟනවාය කියන එක මෙම ගරු සභාවට මා සිහිපත් කරවන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ගැනත් පොඩ්ඩක් ප්‍රශ්න සහිතව නේ අපි මේ වැඩේ පටන් ගන්නේ. කුප්‍රකට, අපරාධ සම්බන්ධයෙන් ඉහළ නමක් දරන රාජ් රාජරත්නම්ගේ Galleon Research Services Limited කියන සමාගමේ ආරම්භක අධ්‍යක්ෂවරයෙක් තමයි ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා. ඒ බව සනාථ කරන්නට, සමාගමේ අධ්‍යක්ෂවරයෙක් විධියට එතුමා - ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා- අත්සන් කරලා, ඒ සමාගම ඇමෙරිකා එක්සත් ජනපදයේ සක්‍රිය සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කරන මෙන් දන්වා යවපු, "DS01: Striking off application by a company" කියන ලියවිල්ල අංක 03 ලෙස නම් කරමින් **සභාගත*** කරනවා.

ඒ වාගේම එතුමා එතැන සේවය කරන කාලයේ - යුතු අයුතු කෙසේ වුවත් - දැවැන්ත ධනයක් උපයලා, එංගලන්තයේ ඉතාම අධික වටිනාකමකින් යුතු නිවසක් මිලදී ගන්නවා. එම, 1A Elm Tree Court, Elm Tree Road, London, England, NW8 9JT. දරන නිවස මිලදී ගැනීම තුළ විදේශ විනිමය විශුද්ධිකරණය වීමක් සිදු වී තිබෙන බවට බරපතළ සැකයක් මතු වන නිසා මේ පිළිබඳව

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

විමර්ශනයක් පැවැත්විය යුතුයි. හැබැයි විදේශ විනිමය පාලක සිටින්නේ එතුමා යටතේ නිසා "හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ" දෙයක් බවට එය පත් වේදැයි කියන සාධාරණ බිය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු මුදල් රාජ්‍ය අමාත්‍ය, ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා ප්‍රසිද්ධියේ සඳහන් කළ ආකාරයට මෙම මහා වංචාවෙන් ආර්ථිකයට සිදු වුණු පාඩුව රුපියල් බිලියන 1,000ක්. ඒ කියන්නේ රුපියල් ට්‍රිලියනයක්. ට්‍රිලියනය කියන්නේ මේ රටේ ජනතාව මේ වංචාවට කලින් අසා තිබුණු ඉලක්කමක් නොවෙයි. ට්‍රිලියනය කියන්නේ ලක්ෂයේ ඒවා නම් කෝටියක්; කෝටියේ ඒවා නම් ලක්ෂයක්. අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ගණන් බැලීම අනුව ඒක ට්‍රිලියන දෙකටත් වඩා වැඩියි. ඒ කෙසේ වෙතත් ජාතියට මේ මහා වංචාව, මේ දැවැන්ත හානිය සිදු කිරීම පිළිබඳ වගකීම අගමැතිතුමා භාර ගත යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩු පක්ෂයෙන් කියැවෙන්නේ මේ වාර්තාවේ අගමැතිතුමාට කිසිම චෝදනාවක් නැහැ, එතුමා නිදොස් කරලා තිබෙනවා කියලායි. එහෙම වෙන්න ඉඩ තිබෙනවා. ඇයි ඒ? අපි දන්නවා, මේ සිදු වීමේදී අගමැතිතුමා කොමිසම ඉදිරියට ගිය දවසේ ඉතාම දක්ෂ ලෙස, ඉතාම තීක්ෂණ ලෙස හරස් ප්‍රශ්න අසමින් සිටි අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ඉවත් කරලා, ඒ වෙනුවට ප්‍රශ්න ඇසීම සඳහා නීතිපතිවරයාව යොමු කළා. ඒ පිළිබඳව මේ ගරු සභාවේදී මම ප්‍රශ්න කළාම අපේ ගරු සභානායකතුමා සඳහන් කළේ, "ඒක තමයි සම්ප්‍රදාය, අගමැතිවරයා එනවා නම් නීතිපති තමයි ප්‍රශ්න කරන්නේ" කියලායි. මම උගත් නීතිය අනුව අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) අනු ව්‍යවස්ථාවේ සඳහන් වනවා, "නීතිය ඉදිරියේ සියලු දෙනා සමානය" කියලා. අගමැතිට එක ක්‍රමයකුත්, අනෙක් අයට තවත් ක්‍රමයකුත් තිබෙන්න බැහැ. විශේෂයෙන්ම අගමැතිතුමාගෙන් ප්‍රශ්න අහන්න තෝරා ගත් නීතිපතිවරයා, ජ්‍යෙෂ්ඨයන් ගැන නොසලකා අගමැතිතුමා විසින්ම නීතිපති තනතුරට පත් කර ගත් කෙනෙක්. අගමැතිතුමා ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු විධියට වත්මන් නීතිපතිවරයා පත් කර ගැනීම සඳහා සහාය පළ කළ බව මුළු රටම දන්නා කාරණයක්. ඉතින් එවැනි අනිසි සම්බන්ධයක් තිබේද්දී, බැඳියාවන් අතර ගැටුමක් තිබේද්දී, නීතිපතිතුමා තමයි එතුමාගෙන් හරස් ප්‍රශ්න ඇහුවේ.

මුදල් අමාත්‍යාංශය යටතේ තිබිය යුතු මහ බැංකුව අගමැති යටතට ගත්තේ ඇයි? ඊළඟට, විදේශිකයකු බව දනිමින් අර්ජුන මහේන්ද්‍රන් මේ තනතුරට යෝජනා කළේ ඇයි? ගරු අගමැතිතුමනි, අමාත්‍ය මණ්ඩලය විසින් විරෝධතාව පළ කරද්දී, අර්ජුන මහේන්ද්‍රන්ට මේ තනතුර දෙන්න එපා කියද්දී, "ඒ පිළිබඳව වගකීම මා භාර ගන්නවා" යනුවෙන් ඔබතුමා ප්‍රකාශ කළාද? එසේ ප්‍රකාශ කළා නම්, එයින් ඔබතුමා අදහස් කළේ කුමක්ද? වංචාව හෙළි වීමෙන් පසුව ඒ පිළිබඳ වගකීම භාර ගත් පුද්ගලයා විධියට, වගකීම භාර ගැනීමේ ප්‍රතිඵලයක් විධියට ඔබතුමා ගත් ක්‍රියා මාර්ගය කුමක්ද?

සාමාන්‍යයෙන් වගකීම දැරූ කෙනා ඉල්ලා අස්වනවා නේද? ඊළඟට ජනාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, එතුමාට පාර්ලිමේන්තුව හදිසියේ විසුරුවා හරින්න සිදු වුණේ, ඩිව් ගුණසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු "කෝප්" එකේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන එක වළක්වා ගන්න අගමැතිතුමා කළ ඉල්ලීම මතයි කියලා. ඔබ එවැනි ඉල්ලීමක් කළාද? ඇයි, වාර්තාව එනවාට භය වුණේ? මේ කිසි ප්‍රශ්නයක් කොමිසම ඉදිරියේ මතු නොවුණු නිසා කොමසාරිස්වරුන්ට අගමැතිවරයා සම්බන්ධයෙන් ගත යුතු නිගමනය ගැනීමේ අවස්ථාව අහිමි වුණා. එම නිසා අසාධාරණ විධියට විමර්ශනය සිද්ධ කරලා අගමැතිතුමා නිර්දෝෂී වුණාය කියලා සඳහන් කිරීම ඒ කොමසාරිස්වරුන්ට කරන අසාධාරණයක් විධියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුවට අලි ගහලා මේ වනකොට අවුරුදු 3යි. අවුරුදු 3ක් තිස්සේ අපි මේ ගැන කථා කළා; සංවාද කළා; උද්ඝෝෂණ කළා; සම්මන්ත්‍රණ පැවැත්වූවා; පෙළපාළි ගියා. ගරු අගමැතිතුමනි, ඔබතුමා "කවුද, හොරා" කියලා මේ ගරු සභාවේ ඇහුවාම, මුළු රටම දැන් දන්නවා, "කවුද, හොරා" කියන එක. එම නිසා මේ ගැන කථා කරමින් සිටීමෙන් ඵලක් නැහැ. අදටත් මහ බැංකුව හොරා කාපු අය ඒ මහා මුදල කිසි හිරිකිතයක් නැතිව ප්‍රසිද්ධියේ භුක්ති විඳිමින් සිටිනවා. හොරු අල්ලනවා කියන නාඩගමක් පමණක් රට ඉදිරියේ දකින්න ලැබෙනවා. වෙනත් අය බිලිදීමෙන් සැබෑ හොරුන්; වංචාවේ මහා මොළකරුවන් සඟවා ගැනීමට, යටපත් කිරීමට මේ රටේ ජනතාව ඉඩ දෙන්නේ නැහැ. අමරවීර ඇමතිතුමා සඳහන් කළා, මේක මාධ්‍ය සන්දර්ශනයක් නොවෙයි, ජනාධිපතිතුමා ගැන විශ්වාසය තබන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
හොඳයි. එහෙම නම්, මම ඉතිරි ටික වේගයෙන් කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එතුමා කෙරෙහි විශ්වාසය තබන්න බැරි බව අපි දන්නවා. වැටක් පැනලා පොල් ගෙඩි දෙකක් හොරකම් කළාම අල්ලා ගෙන ගිහිල්ලා රක්ෂිත බන්ධනාගාරයේ දමනවා. පොල්ලකින් ගහලා අඹ ඉත්තක් කඩා ගත්තාම අල්ලා ගෙන ගිහිල්ලා රක්ෂිත බන්ධනාගාරයේ දමනවා. මේ බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධ වරදට පළමුවෙනි පුද්ගලයා අත් අඩංගුවට ගන්න අවුරුදු තුනක් ගත වුණා. මෙවැනි අපරාධයක් මීට කලින් වාර්තා වෙලා තිබෙනවාද? ජනාධිපතිතුමා මුල් යුගයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ මේ සඳහාය කිව්වා. රටේ ඉල්ලීමක් තිබුණා, මහ බැංකු අධිපති ඉවත් කරන්න කියලා. නමුත්, ඔහුගේ ධුර කාලය අවසන් වන තුරු ඒ ඉල්ලීම ඉටු වුණේ නැහැ. එම නිසා ජනාධිපති කොමිසම දිහා සැකයෙන් බලන්න අපට අතිශයින්ම සාධාරණ හේතු තිබුණා.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මා කියන්න ඕනෑ. ජනාධිපතිතුමා දැන්වත් හරියට කඩුව වනා හොරුන්ට දඬුවම් නොකළොත්, මේ රටේ ජනතාව පෙබරවාරි 10 වැනිදා හොරුන්ට වාගේම ජනාධිපතිතුමාටත් දඬුවම් කරන්න කඩු වනාගෙන; කඩු අමෝරාගෙන බලාගෙන සිටිනවා කියන එක සිහිපත් කරවන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන විනාඩියේ මේ කාරණයත් මා සඳහන් කරන්න ඕනෑ. චෝදනා 34ක් තිබෙන බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ කිසිම මුදල් සොරකමක් පිළිබඳව නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව වාගේ සැලසුම්සහගතව මුදල් සොරකම් කිරීමක් පිළිබඳව මේ චෝදනා 34ම නැහැ. මෙහි තිබෙන්නේ අයථාකාරී ආකාරයෙන් සිදු වුණාය කියන ගනුදෙනු පිළිබඳව චෝදනා. හැබැයි, මා නීතිඥයකු විධියට මේ වාර්තාව ලිව්වාය කියන

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

විනිශ්චයකාරවරුන්ගේ නඩු තීන්දු කියවා තිබෙනවා. එම නඩු තීන්දුවල තමන් නිගමනයට එළඹීමට හේතුව ලිඛිත හා වාචික සාක්ෂිවලින් උපුටා දැක්වීමක් සිදු කරනවා. හැබැයි, මේ වාර්තාවේ එහෙම කිසි දෙයක් නැහැ. චෝදනාව විස්තර කරනවා. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් අදාළ නීතිය විස්තර කරලා, ඒ නීතිය යටතේ නඩු පැවරීමට සලකා බලන මෙන් නිර්දේශ කරනවා. හැබැයි, මහ බැංකු බැඳුම්කර වාර්තාවේ ලිඛිත සහ වාචික සාක්ෂි උපුටා දක්වමින් තමන්ගේ නිගමනයට හේතු දක්වනවා. ඕනෑම නඩු තීන්දුවක් එහෙමයි. උගත් විනිසුරුවරු ඒ වාර්තාව ලිව්වා නම්, එතුමන්ලාගේ පරිචය අනුව අනිවාර්යයෙන්ම ලියන්නේ එහෙමයි. එම නිසා මට සාධාරණ සැකයක් තිබෙනවා, විනිසුරුවරුන් ලිවූ වාර්තා වෙනුවට ව්‍යාජ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවාද කියලා. මා උදාහරණ කීපයක් දෙන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මේ කරුණ ඉතා වැදගත්.

දැන් බලන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමාට චෝදනාවක් තිබෙනවා, ස්වාධීන රූපවාහිනියේ දැන්වීම්වලට රුපියල් මිලියන 102ක මුදලක් ගෙව්වේ නැහැයි කියලා. හැබැයි, මේ කොමිසම ඉදිරියේ යම් කරුණක් හෙළිවනවා. මට ඒ දිනය පොඩ්ඩක් බලාගන්න ඕනෑ. ජනාධිපති නීතිඥ ගාමිණී මාරපන මැතිතුමාගේ හරස් ප්‍රශ්නවලදී පිළිගන්නවා, ITN ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තාව බරපතළ ලෙස අඩු පාඩු තිබෙන වාර්තාවක් කියලා. නමුත්, ඒ ගැන සඳහනක් නැහැ. ඒ වාගේම මේ දැන්වීම් ලබා දුන් කෙනා වන Media Factory (Pvt) Limited කියන ආයතනය -වැරදිකරු වනවා නම්, විය යුතු කෙනා- සඳහන් කරනවා, "අපි මිලියන 65ක් දැන්වීම්වලට ගෙව්වා. මිලියන 65ක් දැන්වීම්වලට ගෙවපු නිසා තමයි අපට තවත් දැන්වීම් ප්‍රමාණයක් නොමිලේ ලැබුණේ" කියලා.

දත් බුරුසුවක් ගන්න ගියාමත් කියනවා නේ, "Buy one and get one free." කියලා. මිලියන 65ක් ගෙවලා දැන්වීම් දැමීමෙන් ඒ අයට දැවැන්ත මුදලක් ලැබුණ නිසා, අපටත් නොමිලේ ප්‍රසාද දැන්වීම් ලැබිලා තිබෙනවා පෞද්ගලික නාලිකාවලින්. ඒ Media Factory (Pvt) Limited ආයතනය කියනවා, "අනෙක් ආයතනවලට වඩා අඩුවෙන් තමයි අපට ප්‍රසාද දැන්වීම් ලැබුණේ." කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මේ කාරණය කිසිසේත්ම වාර්තාවේ සඳහන් වෙන්නේ නැතුව එක පාරට කියනවා. අවසාන වාක්‍ය බලන්න. Media Factory (Pvt) Limited ආයතනය කොමිසමට දැනුම් දෙනවා, "තව ගෙවීමට ඇත්තේ මිලියන 10ක්." කියලා. මිලියන 10යි ගෙවන්න තිබෙන්නේ කියලා ITN ආයතනය දැනුම් දුන් බව Media Factory (Pvt) Limited ආයතනය ලිඛිත සාක්ෂි සහිතව කොමිසම ඉදිරියේ හෙළි කර තිබේද්දී මේ කරුණු යටපත් කරලා, ශතයක්වත් ගෙවන්නේ නැතුව මිලියන 102ක දැන්වීම් දා ගත්තාය කියන චෝදනාව ඉතාම අතාර්කිකයි. එය මා දන්නා ඒ උගත් විනිසුරුවරුන් ලිවිය නොහැකියි. මේ වාර්තාවේ තිබෙන චෝදනා 34 ගැනම ඒ ආකාරයෙන් පැහැදිලි කරත හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය නොමැති නිසා අවසාන වශයෙන් මා කියන්නේ, මේ රටේ ජනතාවගේ මුදල් වංචාවෙන්, දූෂණයෙන් සොරකම් කර තිබෙන අයට වසර තුනක් පුරාවට නිසි පිළිතුරු, නිසි දඬුවම් ලබා දීම අධිකරණයෙන් සිදු නොවුණ නිසා, ජනතා අධිකරණයෙන් දඬුවම් ලබා දිය යුතුයි කියලා. ඒ යෝජනාව කරමින් මා නිහඬ වනවා. බොහොම පින්.

[අ.භා. 2.53]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. එතුමා අද උදෑසන ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කථා කරන වෙලාවේ ඉතා වලංගු ප්‍රශ්නයක් ඇහුවා. ඒ තමයි, 2008 සිට 2014 දක්වා කාලය තුළ එනම්, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරය සහ මුදල් ඇමතිකම දරපු, ඒ වාගේම මහ බැංකුව මහින්ද රාජපක්ෂ මැතිතුමා යටතේ තිබුණු, ඒ වාගේම අජිත් නිවාඩ් කබ්රාල් මහ බැංකුවේ අධිපති ධුරය දරපු කාල සීමාව තුළ අයථා ලෙස බැඳුම්කර ගනුදෙනු සිදු වූ බවට කොහේද තිබෙන්නේ කියලා අභියෝගයක් කිරීම. ගරු මහින්ද අමරවීර මැතිතුමා ඒ වෙලාවේ ඒකට පිළිතුරක් දුන්නේ නැහැ. එතුමා කිව්වා, "මම දන්නවා. දැන් කියන්න බැහැ." කියලා. මම කියනවා වාර්තාවේ 447 වන පිටුවේ 3 වන ඡේදයේ පැහැදිලිව තිබෙනවා, "2008 සිට 2015 දක්වා කාල සීමාව තුළ බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි - adequate evidence - තිබෙනවා, අයථා ලෙස මේ ගනුදෙනු සිදු වුණා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව නිර්දේශ කරනවා, "මෙම කාලයට අදාළව forensic audit එකක් කරලා තවත් ඉස්සරහාට යන්න." කියලා. ඒ කියන්නේ, මේ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා - [බාධා කිරීමක්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට කථා කරන්න ඉඩ දෙන්න කෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා, කාරණය කියන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා මගේ නම සඳහන් කරමින් යමක් සඳහන් කළා. මම දැන් තවත් රැස්වීමකට සහභාගී වෙන්න පිටත් විය යුතු නිසා මෙකට උත්තරයක් දීලා යන්න ඕනෑ. නැත්නම් හැන්සාඩ් වාර්තාවට අසාධාරණයක් වනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, වාර්තාවේ ඔබතුමා කියපු 3වන ඡේදය මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

"In these circumstances, there is adequate evidence to form the view that, there is a likelihood that some irregularities have taken place in the acceptance of Direct Placements, prior to 2015."

තුන්වන ඡේදය ඒක නේද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
එතකොට දැන් ගරු අගමැතිතුමා වේදිකාවේ කියනවා වාගේ, මෙතැන බිලියන 4,000ක කතන්දරයක් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක නොවෙයි ප්‍රශ්නය.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මෙතැන කියන්නේ, දැන් මේ හෙළි වෙලා තිබෙන කරුණු අනුව, - [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ වෙලාව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කථාව කරන්න අවස්ථාව දෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
එහෙම නම් එළියේදී තමයි - [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එළියට ඇවිල්ලා කථා කරන්න දෙයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ වෙලාව. මේවා වේදිකාවල පදනමක් නොමැතිව කියන තවත් කථා පමණයි. 2008 සිට 2015 දක්වා වූ ගනුදෙනු පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙක් සහ හිටපු විගණකාධිපතිතුමා සාමාජිකත්වය දරන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවකින් විස්තරාත්මකව විශ්ලේෂණය කරලා, පැහැදිලිව නිගමනය කරලා, අවසානයේ කියනවා, "අයථා බැඳුම්කර පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇත." කියලා. ඒ කියන්නේ, ඒ කාලයේ; අජිත් නිවාඩ් කබ්රාල්ගේ කාලයේ සිදු වූ බවට. ඒක නිසා, ඒ පිළිබඳව වෝහාරික විගණනයක් කළ යුතුයි කියලා. මේක තමයි අපි කෝප් කමිටුවේ කිව්වේ; මේක තමයි අපි පාර්ලිමේන්තුවේ කිව්වේ. මේ හොරකම 2008 ඉඳලා 2015 වනතෙක් ආවා. 2015න් පස්සෙත් දිගට ආවා. ඒක තමයි අපි කිව්වේ. මේ හොර කණ්ඩායමට දේශපාලනයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙතැන වෙලා තිබෙන දේ මේකයි. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ මතය තමයි 2015න් එහා පැත්ත සුදුයි, 2015 පහු වුණු ගමන් කළුයි කියන එක. මෙච්චර වෙලා කිව්වේ, "ඔහොම පිටුවක් නැහැ, එහෙම එකක් නැහැ"යි කියලා. එතුමාට ඉංග්‍රීසි තේරෙනවා. එතුමා රෙද්ද ඇන්දාට ඕස්ට්‍රේලියාවේ ඉගෙන ගත්ත, සුදු ජාතික ව්‍යාපාරිකයන් සමඟ ව්‍යාපාරික කටයුතු කරපු, හොඳට ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, දේශපාලන විද්‍යාව, නීතිය දන්න මහත්තයෙක්නේ. එතුමාට මම 447වෙනි පිටුව පෙන්වලා කියලා දුන්නාම 2008 ඉඳලා 2015 දක්වා මහ විශාල හොරකමක් තිබෙනවා කියලා, දැන් එතුමා කියනවා, "ඔය කියපු තරම් ගණනක් නැහැ"යි කියලා. උදුසන අපේ අහිංසක ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට අභියෝග කළේ කොහොමද? "එහෙම එකක් නැහැ"යි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම වාර්තාවෙන් උපුටා අරගෙන ඡේදය සමඟ කියන විට කියනවා, "නැහැ, ඔය තරම් ගණනක් නැහැ"යි කියලා. මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව, මේ රටේ ජාතිය නොමඟ යවන මේ වැඩ පිළිවෙළ?

හොරකමක් තිබෙනවා. එදාත් හොරකම් වුණා, අදත් හොරකම් වෙනවා. ඒක තමයි ප්‍රශ්නය. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ. එදා හොරකමක් නැහැයි කියලා මේක පටන් ගත්තොත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. ඒක තමයි තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම එතුමාට තවත් පිළිතුරක් දෙන්නට ඕනෑ. එතුමාත්, හිටපු අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමාත් පුරුද්දට වාගේ කියාගෙන යනවා "කෝප්" එකේ එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් නව දෙනා "කෝප්" එකෙන් කළ පරීක්ෂණ වාර්තාවට පාද සටහන් තබලා හොරු ආරක්ෂා කළා කියලා, තවම කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙක් සහ හිටපු විගණකාධිපතිවරයෙක් එකතු වෙලා අවුරුද්දකට වැඩි කාලයක් සාක්ෂි විභාග කරලා හදපු මේ වාර්තාව මොකක්ද කියන්නේ? මේ පාද සටහන් එකින් එක, එකින් එක විශ්ලේෂණ කරලා කියනවා, -ගරු ආචාර්ය හර්ෂද සිල්වා මැතිතුමා ඒවා විස්තර කළා- සමස්තයක් වශයෙන් ගත් කල පාද සටහන් සාක්ෂිවලට අනුකූලය; පාද සටහන් නිවැරදිය; පාද සටහන් නීත්‍යානුකූලය; පාද සටහන්වලින් සිදු කර ඇත්තේ වඩාත් නිවැරදි නිගමනයකට එළැඹීමට "කෝප්" එකට උපකාර වීමය කියලා. ඒ අනුව මේ කොමිෂන් සභාව කියනවා "කෝප්" එකේ සියලු දෙනාම එකඟ වුණු නිගමනයන්, -නිගමනයන් ගැන පරස්පරතාවක් නැහැ- සලකා බැලිය යුත්තේ පාද සටහන්ද එකතුවය කියලා. ඒ වාගේම විගණකාධිපතිතුමා විසින් ආර්ථික විද්‍යාව අනුව යම් යම් කාරණා වැරදියි කියලා කියන විට, අපි පෙන්වලා දුන්නා ඒවා වැරදියි කියලා. විගණකාධිපති වැරදි නම් වැරදියි. ඒ වාගේම "කෝප්" එකේ හිටපු නීතිය සහ ආර්ථික විද්‍යාව පිළිබඳව එපමණක් නොදන්නා ගරු මන්ත්‍රීතුමන්ලා වැරදි කරුණු කියන විට අපි ඒවා වැරැදියි කියලා පෙන්වලා දුන්නා. අපි කිව්වේ නැහැ හොරකමක් වුණේ නැහැයි කියලා. අපි කිව්වේ, හොරාව අල්ලද්දී හරියට අල්ලන්න, හරි ගණන කියන්න කියලා. මේ හොරකමට වග කිව යුතු පුද්ගලයන්ට දඬුවම් කරන්නට මේ තිබෙන සාක්ෂි හොඳටම ඇති. සත්‍ය තත්ත්වය කිව්වාම හොඳටම ඇති. හැබැයි මේ අය උත්සාහ කළේ හොරු වෙනුවට දේශපාලන වශයෙන් ඉලක්කයන් කරා යන්නට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අද මොකක්ද කියන්නේ? අද ගරු විමල් වීරවංශ මැතිතුමාත්, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමාත් කියනවා, මේ වාර්තා පිළිබඳව විශ්වාසයක් නැහැ කියලා. මේ රටේ පවතින නීතිය අනුව ගරු ජනාධිපතිතුමා, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරලා, රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

දෙදෙනෙකුගෙන් සමන්විතව ඒ කමිටුව පත් කරලා මේ රටේ පිළිගත් නීතිය සහ කාර්ය පටිපාටිය අනුව සාක්ෂි විභාග කරලා තීන්දුවක් දුන්නාට පස්සේ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා කියනවා, "අපිට ඒක විශ්වාස කරන්න බැහැ" කියලා. ගරු විමල් වීරවංශ මැතිතුමාත් කියනවා, "අපිට ඒක විශ්වාස කරන්න බැහැ" කියලා. එතකොට කාවද විශ්වාස කරන්නේ? කාවද විශ්වාස කරන්නේ? පළමුවෙනි වතාවටයි විස්තරාත්මක, විශ්ලේෂණාත්මක, නීත්‍යානුකූලව අවශ්‍ය කරුණු මැනවින් අධ්‍යයනය කරන ලද වාර්තාවක් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ කොමිෂන් සභාව පත් කිරීමේදී තිබුණු චේතනාව කුමක් වුණත් අවසානයේ දී අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් සහ විගණකාධිපතිවරයෙකුගෙන් සමන්විත කොමිෂන් සභාවක් විසින් සම්පාදනය කළ මේ වාර්තාව තුළින් අගමැති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිසිදු වරදකට වරදකරු නොවන බව සඳහන් කරලා තිබීම ගැන. අද ඒක ඔවුන් පිළිගන්නට ලැහැස්තියි. හැබැයි කියනවා, "එහෙම වෙලා තිබෙන්නේ මෙහෙම මෙහෙම නිසා" කියලා. කලින් කිව්වේ එහෙම එකක් නැහැයි කියලා. අද පිළිගන්නවා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිවැරදියි, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කිසිම චෝදනාවක් නැහැයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන් පසුව අද ගරු කබීර් හාෂිම් ඇමතිතුමාගේත්, ගරු මලික් සමරවික්‍රම මැතිතුමාගේත් නම් සඳහන් කරලා අයථා චෝදනා ඉදිරිපත් කළා. බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා ගරු කබීර් හාෂිම් මැතිතුමාත්, ගරු මලික් සමරවික්‍රම මැතිතුමාත් සහභාගි වුණු උදෑසන රැස්වීම ඉතාම නීත්‍යානුකූල මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය වන මුදල් ලබා ගැනීම උදෙසා වූ සාකච්ඡාවක් පමණයි;

බැඳුම්කර නිකුතුව හෝ ඒ හා සම්බන්ධ කිසිම දෙයක් කථා වුණේ නැහැ; ඒ සාකච්ඡාව රහස් සාකච්ඡාවක් නොවෙයි; ඒක ඉහළ නිලධාරින් සියලුදෙනාම සහභාගී වුණු විවෘත සාකච්ඡාවක්. එය හෙළිදරව් වෙලා, ඒ පිළිබඳව කොමිෂන් සභාව නිගමනය කරලා, කොමිෂන් සභා වාර්තාව නිකුත් කළාට පස්සේ, කොමිෂන් සභා වාර්තාව මේස උඩ තියාගෙන අද කියනවා, "එහෙම නොවෙයි." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාටද මේ කථාව කියන්නේ? මේ රටේ ජනතාව තවත් දිගින් දිගටම නොමඟ යවන්නයි මේ උත්සාහ කරන්නේ.

මේ කොමිෂන් සභාව පත් කිරීම ගැන අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා. එක්සත් ජාතික පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයත් මේ බැඳුම්කර ගිවිසුම පිළිබඳ කිසිදු ආකාරයක වග කීමක් නොමැති බව මේ කොමිෂන් සභාව මඟින් ඉතාමත් පැහැදිලිව දක්වා තිබෙන බව අපි වග කීමෙන් කියනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කරුණු හොයලා බලලා, සියලුම සාක්ෂි විශ්ලේෂණය කරලා, අදාළ නීතිය හා ආර්ථික විද්‍යාව පිළිබඳ මූල ධර්ම අධ්‍යයනය කරලා, COPE එකේ ක්‍රියාකාරිව සහභාගී වෙච්ච මන්ත්‍රීවරුන්ට ඉතාම බරපතළ විදියට මේ සභාවේදීත්, ඉන් පිටතදීත් අපහාසවලට මුහුණ දෙන්න සිදු වුණා. මොකක්ද කිව්වේ? අපි හොරු ආරක්ෂා කළාය කිව්වා. දැන් බැඳුම්කර කොමිෂන් සභාවේ වාර්තාව කියනවා, "අනෙක් සාමාජිකයන්ට වඩා නීතිය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ මූල ධර්ම කාරණා පිළිබඳව නිවැරදිව විශ්ලේෂණ ඉදිරිපත් කරලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු නවදෙනා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉතාම විශේෂ සිද්ධියක් පිළිබඳව සඳහන් කරන්නට ඕනෑ. ඒ විශේෂ සිද්ධිය පුවත් පත්වලත් වාර්තා වුණා, "ලොකු විවාදයට ලක් වෙලා, බොහොම උණුසුම් තත්ත්වයක් COPE එකේ ඇති වුණා." කියලා.

විගණකාධිපතිවරයාගේ ගණන් මිනුම්වල වැරදි අපි පෙන්වා දෙනකොට විගණකාධිපතිට වැරදෙන්න බැහැ. විගණකාධිපති කියන දේ එලෙසම පිළිගන්න ඕනෑය කියලා ලොකු තර්කයක් ඇති වුණා. අපේ මිත්‍ර හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, "එහෙම බැහැ. විගණකාධිපති කිව්වොත් කිව්වා." කියලා. අපි කිව්වා, "එහෙම නොවෙයි. විගණකාධිපතිට වැරදිලා නම්, ඒක වැරදිලා." කියලා. මොකද, විගණකාධිපතිවරයා කලින් පිළිඅරගෙන තිබුණා, ඔහුට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයට ආර්ථික විද්‍යාව පිළිබඳව විශේෂඥතාවක් නැහැ. ඔවුන්ට සුදුසුකම් තිබෙන්නේ ගණකාධිකරණය පිළිබඳවයි; විගණනය පිළිබඳව පමණයි කියලා. ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් ඇති, ආචාර්ය උපාධිය හෝ වෙනත් පශ්චාත් උපාධි සුදුසුකම් සහිත කිසිවෙක් ඔවුන්ගේ නිගමනවලට දායක වුණේ නැහැයි කියලා ඔවුන් පිළිගත්තා. එය ඔවුන්ගේ වාර්තාවට ඇතුළත් කරලා තිබුණා. ඒ නිසා ඔවුන් පිළිගත්තා, ඔවුන්ට වැරදීමක් වෙලා තිබෙනවා කියලා. හැබැයි ඒ අවස්ථාවේදී, ඒ වාර්තාව එලෙසම තිබිය යුතුයි; දැන් කළ හැකි යමක් නැහැ කියන ස්ථාවරය මතු වුණා. අපි කිව්වා, "අපේ ඒ වෙනස් අදහස වාර්තා කරන්න." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ 662වන පිටුවේ ඉතාමත් පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා, අජිත් පී. පෙරේරා හා ගරු අශෝක් අබේසිංහ ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ COPE එකේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු මේ අලාභ ගණනය පිළිබඳ ඒ ආර්ථික විද්‍යා මූල ධර්මය නිවැරදියි. ඒක තමයි මේ ගණනය කිරීම් පිළිබඳව තිබුණු හරය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්මා හෝ තාත්තාවත් මේ තරම් පිරිසිදු චරිත සහතික අපට දෙන්නේ නැහැ. කට තිබුණු පළියට මිනිසුන්ගේ චරිත ඝාතනය කරන්න තැන් තැන්වල කියවන විචේචකයන්ට මම කියනවා, පාර්ලිමේන්තුවේ අපි වගකීම් ඉෂ්ට කරනකොට කිසිම දවසක හොරු ආරක්ෂා කරන්න කටයුතු කරලා නැහැ. කිසිම දවසක හොරු වෙනුවෙන් අපි පෙනී ඉඳලා නැහැ. අපි හැම වෙලාවේම පෙනී ඉඳලා තිබෙන්නේ, හොරුන්ට එරෙහිවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අර්ජුන ඇලෝසියස්ට එරෙහිව COPE එකේදී කිසිදු නිගමනයකට එළඹෙන්න සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමා හෝ ඔවුන් සමඟ එකඟ වෙච්ච අනෙක් මන්ත්‍රීවරු කිසිවෙකු කටයුතු කළේ නැහැ. ඔවුන්ගේ ස්ථාවරය වුණේ, ඇලෝසියස්ට එරෙහිව සාක්ෂි නැහැ කියන එකයි. මමයි ඉදිරිපත් කළේ, ඇලෝසියස්ට එරෙහිව අපරාධ පරීක්ෂණයක් කළ යුතුයි; පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂකවරුන්ට එරෙහිව අපරාධ පරීක්ෂණ කළ යුතුයි කියලා. ඒ ස්ථාවරය මමයි ඉදිරිපත් කළේ. බහුතරයක විරෝධතාව නිසා ඒ ස්ථාවරය ඇතුළත් කර ගන්න අපට බැරි වුණා.

අන්තිමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හරහා, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නියමය පිට පොලිස් පරීක්ෂණ කරලා තමයි මේ කටයුතු අනාවරණය කර ගන්න පුළුවන්කම ලැබුණේ. හැන්සාඩ්ගත වීම සඳහා මම ඉතා වග කීමෙන් කියනවා, මේ කමිටුවට ක්‍රියාකාරිව, සත්‍යවාදීව හා නිවැරදිව, නිවැරදි නීතිය මත, නිවැරදි ආර්ථික විද්‍යා මූල ධර්ම මත සහභාගී වෙච්ච එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු COPE එකේ සාමාජිකයන් නවදෙනාගේ ක්‍රියාව සියයට සියයක් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව අනුමත කරලා තිබෙන බව. අපට ඉතා ඉහළ චරිත සහතිකයක් ලබා දීලා තිබෙනවා. ඉතුරු මන්ත්‍රීවරුන් ගැන අපේ අගෞරවයක් නැහැ. නමුත්, අපි ඔවුන්ට කියනවා, ඔබතුමන්ලා වගකීම් විරහිතව ක්‍රියා කළා. කමිටුවෙන් නැඟිටලා ගියා. සාක්ෂි විශ්ලේෂණය ප්‍රතික්ෂේප කළා. ඒකයි සිදු වූ දේ.

සත්‍ය ලෙස බැලුවා නම්, ඉදිරිපත්ව ඇති සාක්ෂි විශ්ලේෂණය කළා නම්, මීට කලින් මේ හොරුන්ට එරෙහිව නඩු පැවරිය හැකිව තිබුණා. එදායින් පසුව ගරු අගමැතිතුමා මේ පිළිබඳව නඩු පැවරීම

සඳහා COPE වාර්තාව සමඟ නීතිපතිතුමා වෙත වාර්තා කළා. ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයා පියවර ගත්තා. නමුත්, නඩු පැවරීම ප්‍රමාද වුණේ මෙම බැඳුම්කර කොමිසම පත් කරපු නිසයි. මෙතරම් ප්‍රමාදයක් සිදුවීම ජනතාවගේ පැත්තෙන් බලන විට අසාධාරණ බව පෙනුණත්, මේ ක්‍රියාවලිය දීර්ඝව ගත වුණු නිසයි මේ ප්‍රමාදය සිදු වුණේ. ඊළඟට, අපි හදන දූෂණ විරෝධී මහාධිකරණ තුන ක්‍රියාත්මක කරලා, ළඟ ළඟ දිනවල නඩු අහලා -එක දිගට නඩු අහලා- එම අධිකරණ හරහා මේ රටේ පරණ හොරුන්ටත්, අලුත් හොරුන්ටත් දෙගොල්ලන්ටම නීතිය ක්‍රියාත්මක කරන බව අපි වග කීමෙන් කියනවා. ඔවුන්ට නියමිත තැන සිපිරි ගෙයයි. ඒ සිපිරි ගෙයට ගෙනයෑම සඳහා වූ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑමට එක්සත් ජාතික පක්ෂය හැටියටත්, රජය හැටියටත් අපි කටයුතු කරනවා. පෞද්ගලිකවත් අපි ඒ වෙනුවෙන් මහන්සි වෙනවා, කැප වෙනවාය කියන කාරණය අපි ජනතාවට කියන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකු බැඳුම්කර කාරණය ගැන මම ඊට වඩා කියන්න උත්සාහ කරන්නේ නැහැ. බැඳුම්කර කොමිසම පත් කිරීම ගැනත්, එයට ඉතා දක්ෂ හා ප්‍රවීණ විනිශ්චයකාරවරුන් සහ විගණකාධිපතිවරයකු පත් කිරීම ගැනත් මම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මතභේදයට තුඩු දී ඇති ඒ එක් එක් කාරණා පිළිබඳව ඒ හරහා ඔවුන් විසින් නිගමනයන්ට එළැඹීම පිළිබඳවත්, ඒ හරහා එක්සත් ජාතික පක්ෂයත්, ඒ ශ්‍රේෂ්ඨ අභිමානවත් පක්ෂයේ ගෞරවයත් ආරක්ෂා කිරීම පිළිබඳවත් මගේ බලවත් කෘතඥතාව පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදය ගම්මන්පිල මහත්මයා ඔහුගේ කථාවේදී, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පිළිබඳව සඳහන් කරමින් කියනවා, එතුමාගේ නායකයා,- පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ කියලා තමයි මේ වාර්තාවේ සඳහන් වෙන්නේ. අපි කවුරුත් දන්නවා, පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාට කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 6වන වගඋත්තරකාරයා, ඒ 6වන වගඋත්තරකාර මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන සඳහන් කරනකොට මේ වාර්තාවේ විශේෂයෙන් සඳහන් කරනවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, PCI/95/2015 කියන පරීක්ෂණය පිළිබඳවයි මම කථා කරන්නේ. එහි 6වැනි වගඋත්තරකාරයා තමයි කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ, හිටපු ජනාධිපති. ලිපිනය තමයි අංක 117, විජේරාම පාර, කොළඹ 7. එතුමා තමයි අපි දන්නා මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඔහුට තිබෙන චෝදනා මොනවාද? අනුර සිරිවර්ධන යන අය නීති විරෝධී ලෙස ස්වාධීන රූපවාහිනියේ සභාපති හැටියට පත් කිරීම. ඊට පස්සේ නීති විරෝධී ලෙස පත් කරපු අනුර සිරිවර්ධන සමඟ එකතුවෙලා රුපියල් 101,700,000ක් පාඩු කිරීම, රුපියල් 2,467,000ක් පාඩු කිරීම, රුපියල් 8,663,000ක් පාඩු කිරීම. ඒ වාගේම රුපියල් 112,900,000ක් පාඩු කිරීම. මේ කාරණා පිළිබඳව තිබෙන නිගමනය මොකක්ද? මොකක්ද කියන්නේ? අපේ මිත්‍ර උදය ගම්මන්පිල මහත්මයාට මෙවා තේරෙන්නේ නැහැ. "6වන දැන්වීම් ලත් පාර්ශ්වය වන මහින්ද රාජපක්ෂ යන අය අල්ලස් පනතේ 70වන වගන්තියේ විස්තර කර ඇති දූෂණය නැමැති වරද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද, දූෂණයට අනුබල දීමේ වරද යන මේ වැරදි එකක් හෝ වැඩි ගණනක් සිදු කර ඇති බව මේ කොමිෂන් සභාවේ තීරණයයි." කවුද මේ තීරණය ගන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තීරණය ගන්නේ සාමාන්‍ය පුද්ගලයෝ නොවෙයි; අපි වාගේ දේශපාලනඥයෝ නොවෙයි. කවුද මේ තීරණය ගන්නේ? ගරු ජනාධිපතිතුමා විසින් පත් කරපු ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව තමයි මේ තීරණය ගන්නේ. මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන්නේ කවුද? ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා, අභියාචනාධිකරණ විනිශ්චයකාරතුමා.

අමේන්ද්‍ර සෙනෙවිරත්න මැතිතුමා-මහාධිකරණ විනිශ්චයකාර, ගිහාන් කුලතුංග මැතිතුමා-මහාධිකරණ විනිශ්චයකාර, අතුල කළුආරච්චි මැතිතුමා-මහාධිකරණ විනිශ්චයකාර, පී.ඒ. ජේමතිලක මැතිතුමා- විශ්‍රාමික විගණකාධිපති යන අය කොමිෂන් සභාවේ සාමාජිකයන් වනවා. ඉතාම ඉහළ, ඉතාම ශ්‍රේෂ්ඨ, නීති ක්ෂේත්‍රයේ ඉතාම ගෞරවයට ලක්වුණු ඉහළම මට්ටමේ විනිශ්චයකාරවරුන් සහ විශ්‍රාමලත් විගණකාධිපතිවරයෙක් තමයි මේ ක්‍රියාවලියට සම්බන්ධවෙලා තිබෙන්නේ; මේ තීරණ ගෙන තිබෙන්නේ. මොකක්ද, ඒ තීරණය? පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ, 6 වන වගඋත්තරකරු -6 වන දැන්වීම්ලත් පාර්ශ්වය- දූෂණය නමැති වරදට වරදකරු කියලා තීරණය කර තිබෙනවා. එතුමා කියනවා, ඒ දූෂණය නමැති වරදට වරදකරු කිරීම පිළිබඳ හේතු මේ වාර්තාවේ නැහැයි කියලා. එතුමාට උදේ CD තැටියක් දුන්නාය කිව්වා නේ. අන්න ඒ CD තැටියේ තිබෙනවා, ඒ පිළිබඳ අතුරු වාර්තාව. සාක්ෂි විශ්ලේෂණය කරලා, එකින් එක ගෙන මහින්ද රාජපක්ෂ රුපියල් තිස් කෝටියකට අධික දැවැන්ත මුදලක් රටට අහිමි කිරීම සහ දූෂණය කිරීමේ වරද සිද්ධ කරලා තිබෙන්නේ කුමන හේතු මතද කියලා ඒ අතුරු වාර්තාවේ තිබෙනවා. එතුමා මහෙස්ත්‍රාත් උසාවියක හෝ මහාධිකරණයක රාජකාරි කරපු නීතිඥ මහත්මයෙක් නොවෙයි. එතුමා අභියාචනාධිකරණයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්මයකු සමඟ කාලයක් වැඩ කළා. එතුමාට අපි ගරු කරනවා. හැබැයි හොරකම කියලා කියන්නේ, කොහෙන් හෝ මුදලක් හොරකම් කරගෙන පැනලා යන එක විතරක් නොවෙයි. බැඳුම්කර වංචාව කියන්නේ එහෙම එකක්ද? ඒ වාගේම තමයි, බැලු බැල්මට රජයට අත්වෙන්න තිබුණු රුපියල්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කෝටි ප්‍රකෝටි ගණන් මුදල් අහිමි කරපු එක. එච්චරයි මේ වාර්තාවේ තිබෙන්නේ. මෙහි වැදගත්කම මෙයයි. පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා, 6 වන දැන්වීම්ලත් පාර්ශ්වය, කරලා තිබෙන වරද මොකක්ද? තමන්ගේම ආත්ම ලාභයට තමන් අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වී සිටි ජනාධිපතිවරණයෙන් තමන්ට අයුතු ලාභයක් ලබා ගන්නත්, තමන්ගේ විරුද්ධවාදියා වන මෛත්‍රීපාල සිරිසේන, එවකට ජනාධිපති අපේක්ෂකතුමාට අයුතු පාඩුවක් සිදු කරන්නත් තමයි මේ ක්‍රියාවලිය සිද්ධ කරලා තිබෙන්නේ. "අපි නොදැන", "වෙන කෙනෙක්", "අපේ සේවකයෙක්" එහෙම කථාවක් කියන්න බැහැ. කුමන්ත්‍රණය එතැන තිබෙන්නේ. ඒ නිසා කිසිම ගැලවීමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කවුරුත් දැනගෙන සිටියා, එතුමාගේ පාලනය දූෂිතයි කියලා. අපි කවුරුත් දැනගෙන සිටියා, එතුමාගේ සහෝදරයන් දූෂිතයි කියලා. අපි කවුරුත් දැනගෙන සිටියා, එතුමාගේ නිලධාරින් දූෂිතයි කියලා. හැබැයි කවුරුත් මීට කලින් පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා පෞද්ගලිකව දූෂිතයකු බවට නිගමනය කරලා තිබුණේ නැහැ. අර්ධ අධිකරණමය බලයක් ඇති, -අපි කියනවා, quasi-judicial කියලා- විශිෂ්ට වූ විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත ආයතනයක් විසින් තමයි මේ 6 වන වගඋත්තරකාර, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දූෂිතයකු බවට තීරණය කරලා තිබෙන්නේ.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බැසිල් රාජපක්ෂ දූෂිතයකු බවට මේ වාර්තාවේ තීරණය කරලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ දූෂිතයකු බවට මේ වාර්තාවේ තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම නාමල් රාජපක්ෂ දූෂිතයකු බවට මේ වාර්තාවේ තීරණය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ සභාවේ මන්ත්‍රීතුමෙක් ඉන්නවා. එතුමා මේ වෙලාවේ නිදි. එතුමාත් දූෂිතයකු බවට තීරණය කරලා එතුමාගේ නමත් මෙහි තිබෙනවා. මා එතුමාගේ නම කිව්වේ නැහැ. ඔබතුමාට තේරෙනවා, ඒ මන්ත්‍රීතුමා කවුද කියලා. දැන් එතුමා අවදියෙන් ඉන්න බව පෙනෙනවා. අපි එතුමාට ස්තුතිවන්ත වනවා, අඩු ගණනේ අපි කියන දේවල් අහගෙන ඉන්නවත් එතුමා මේ සභාවේ සිටීම ගැන. මොකද, සමහරුන්ට මේවාට මුහුණ දෙන්නවත් ශක්තියක් නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා සම්බන්ධයෙන් මේ කොමිෂන් සභාව තීරණය කරලා තිබෙන්නේ මොකක්ද? "මෙතැන බරපතළ වරදක් වෙලා තිබෙනවා. අල්ලස් පනතේ 70 වන වගන්තියට වැටෙන දූෂණය යන වරද සිද්ධ කරලා තිබෙනවා. ඒ නිසා එතුමාට විරුද්ධව මහාධිකරණයේ නඩු පවරනු" කියලා සඳහන් කර තිබෙනවා. ඒ පළමුවන කාරණයයි.

ඊට පස්සේ කොමිසම තව ඉදිරියට විශ්ලේෂණය කරනවා. ඒ වාර්තාවේ කියනවා, මෙවැනි වරදකට වරදකරු වුණොත් ලැබෙන සිර දඬුවමට අමතරව අවුරුදු 7ක සිවිල් අයිතිවාසිකම් -ප්‍රජා අයිතිවාසිකම්- අහිමි වනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ බොහොම පැහැදිලිව කාරණා කිහිපයක් සඳහන් වනවා. මොකක්ද, ඒ කියන්නේ? මා එය උපුටා දක්වන්නම්. මේ කාරණා සඳහන් පිටුව මේ වාර්තාවේ තිබෙනවා. දැන් style එකට වාගේ අහනවා, "පිටුව තිබෙනවාද?" කියලා. "පිටුව තිබේද?" කියන එක දැන් අලුත් කථාවක්. මේ කොමිෂන් සභා වාර්තාවේ 148 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"මෙම පරීක්ෂණයට අදාල සිද්ධියේදී 6 වන දැන්වීම්ලත් පාර්ශ්වකරු ...."

ඒ කියන්නේ මහින්ද රාජපක්ෂ.

"... විසින් පත් කරන ලද සභාපතිවරයා වන 1 වන දැන්වීම් පාර්ශ්වකරු...."

අනුර සිරිවර්ධන.

"...100%ක් රජයේ කොටස් ඇති ස්වාධීන රූපවාහිනී ආයතනය තමන්ගේ පුද්ගලික දේපලක් ලෙස සලකා රජයට පාඩු කරමින් මෙම දූෂණය නමැති වරද සිදු කර ඇති බව පෙනියයි."

මේ, වෙන කවුරුවත් ගැන කියනවා නොවෙයි. මේ කියන්නේ, අපේ හිටපු ජනාධිපති, වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රීතුමා ගැනයි.

මේ වාර්තාවේ 148 සහ 149 වන පිටුවල තවදුරටත් මෙසේ සඳහන් වනවා:

" 6 වන දැන්වීම්ලත් පාර්ශවය ද ඒ ආකාරයෙන්ම දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද සිදු කර ඇත. 3 සහ 4 වන දැන්වීම්ලත් පාර්ශවයන් ද දූෂණය නමැති වරද සහ දූෂණයට අනුබලදීමද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමද, විවිධ අවස්ථා යටතේ සිදු කර ඇති බව පෙනී යයි. මෙවැනි වැරැදි සිදු කළ අය රට වෙනුවෙන් සහ රටේ ජනතාව වෙනුවෙන් සේවයක් සිදු කෙරෙතැයි අපේක්ෂා කළ නොහැක."

මේ කොමිෂන් සභාවේ, විනිශ්චයකාරවරු මේ කියන්නේ කවුරු ගැනද? මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඇතුළු මේ වගඋත්තරකරුවන් හය දෙනා ගැනයි මේ කියන්නේ. මොකක්ද, කියන්නේ? "මෙවැනි වැරැදි සිදු කළ අය රට වෙනුවෙන් සහ රටේ ජනතාව වෙනුවෙන් සේවයක් සිදු කෙරෙතැයි අපේක්ෂා කළ නොහැක."

එම වාර්තාවේ 149 වන පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් කරනවා:

"ඒ අනුව වසර 07 කින් පසුව හෝ එවැනි වරද වලට වරදකරු වූ දේශපාලනඥයින්ට...."

මේ කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන.

"... ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන් වශයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් වශයෙන් පත්වීමට අවස්ථාව ලබා දීම නුසුදුසු බව මෙම කොමිෂන් සභාවේ අදහසයි."

මේක එතුමාගේ විරුද්ධ පක්ෂයේ ඉන්න අපි හෝ එතුමාට පෞද්ගලිකව අහිතවත් අය හෝ කියන කථාවක් නොවෙයි. මේ, ගරු ජනාධිපතිතුමාගේ නියමයෙන් පත් කරපු වර්තමානයේ ධුර දරන අභියාචනාධිකරණයේ සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සහ විගණකාධිපතිවරයෙකුගෙන් සමන්විත උත්තරීතර වූ විනිශ්චය මණ්ඩලයක් විසින් තමයි මෙහෙම කියන්නේ. මොකක්ද, කියන්නේ? මෙවැනි අයට තවදුරටත් ධුර දරන්න දෙන්න එපා කියලා කියනවා. එය මේ වාර්තාවේ මෙසේ සඳහන් වනවා:

" ඒ අනුව මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබන්නේ ඉහත ව්‍යවස්ථාවල දක්වා ඇති ලෙසට වැරදිකරුවන් වූ අය එසේ වරදකරු කිරීමෙන් පසු කිසිම අවස්ථාවක ...."

ඒකයි ජීවිත කාලයටම කියලා මේ මාධ්‍යයවල පළ වන්නේ.

"... මහජන නියෝජිතයින් වශයෙන් පත්වීම හෝ මහජන නියෝජිතයන් වශයෙන් පත්වීම සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වීම...."

ඒ කියන්නේ, අපේක්ෂකයෙකු වෙන්නත් දෙන්න එපා කියන එක.

"... නුසුදුසු බවට වන නීති සම්පාදනය කිරීම අවශ්‍ය බවයි."

අද උදෑසන මහින්ද අමරවීර මැතිතුමා කිව්වා, "සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි කළා වාගේ අපි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි කරන්න දෙන්නේ නැහැ" කියලා. ඇත්ත වශයෙන්ම අපි එතුමා

සමඟ එකඟ වනවා. ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීම සඳහා වූ මාර්ගය. ඒ කියන්නේ, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් පරීක්ෂා කරලා, නිගමනවලට එළැඹිලා, ඒ නිගමන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුව සම්මත කරලා, පාර්ලිමේන්තුව හරහා ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීම කියන ක්‍රියාදාමය තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හා සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය. අපි විශ්වාස කරන්නේ නැහැ, ඒ ක්‍රියාමාර්ගය. ඒක සුදුසු අවස්ථා තිබෙන්න පුළුවන්. නමුත් මේ අවස්ථාවේදී අපි එය පාවිච්චි කරන්නේ නැහැ. අපේ -එක්සත් ජාතික පක්ෂයේ- ස්ථාවරය මෙයයි. මේ කාරණා සම්බන්ධව අද ඉතාම පැහැදිලිව සාක්ෂි ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඉතාම පැහැදිලිව නිර්දේශ ඉදිරිපත් වෙලා තිබෙනවා. වරදකරු කියලා ඉර හඳ වාගේ පෙනෙන විධියට අභියාචනාධිකරණයේ සහ මහාධිකරණ විනිශ්චයකාරවරු මණ්ඩලයක් විසින් නිශ්චිත නිගමන ඉදිරිපත් කරලා තිබෙනවා. එවැනි අවස්ථාවක දැන් කළ යුතු වන්නේ වහාම අපි අලුතින් පිහිටුවන දූෂණ විරෝධී මහාධිකරණයෙන් ළඟ ළඟ දිනවල මේ නඩු අහලා, මේ නඩුව විභාග කරලා තීන්දුවක් දෙන එකයි. එතුමා අහිංසක නම් නිදහස්; වරදකරු නම් සිර දඬුවම්. මේ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. දේශපාලනඥයෙකු වාගේම රජයේ නිලධාරියෙකු මේ ආකාරයෙන් දූෂණය වරදකට වරදකරු නම් වසර හතකට ඔහුගේ සිවිල් අයිතිවාසිකම් අහිමි කිරීම ප්‍රමාණවත් නැති බව අපිත් පිළිගන්නවා. දූෂණ වරදකට දේශපාලනඥයන් වරදකරු වනවා නම් ඔහු ජීවිත කාලයම මහජන ධුරයක් දැරීමෙන්, දේශපාලනයෙන් ඈත් කර තැබිය යුතුමයි. ඒ සඳහා අල්ලස් පනත සංශෝධනය වෙන්න ඕනෑ. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සුදුසු ප්‍රතිපාදන සංශෝධනය වෙන්න අවශ්‍යයි.

ඒ අනුව අපි මෙහෙම යෝජනා කරනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන හිතලා නොව, එවැනි බොහෝ දෙනෙක් සිටින නිසා, එවැනි අය අනාගතයේ බිහි වන්න පුළුවන් නිසා, ඒ සියලු දෙනාටම අදාළ වන පරිදි, එවැනි වරදකට අසු වුවහොත් අවුරුදු හතක කාලයක් සඳහා නොව ජීවිත කාලය දක්වාම ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීම සඳහා වූ නව නීති පැනවීමට මේ පාර්ලිමේන්තුව වහාම කඩිනමින් කටයුතු කළ යුතුය කියලා අපි කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතැන තව ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන ලොකු චෝදනාවක් තිබෙනවා. මේ චෝදනාව එල්ල වන්නේ රාජපක්ෂ කෙනෙකුට විරුද්ධව නම්, ඒ චෝදනාව එල්ල වන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය ගැනයි. ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුව සම්බන්ධව ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ වරදකරු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ගෝඨාභය සහ මහින්ද රාජපක්ෂ දෙදෙනාට විරුද්ධව අපරාධ චෝදනාවක් එල්ල වනකොට නීතිය අමුතුයි; නීතිය නැවෙනවා. ගෝඨාභය රාජපක්ෂ අනිවාර්යයෙන්ම අත් අඩංගුවට ගන්න කියලා මේ රටේ නීතිපතිවරයා ඉතාම සැලකිල්ලෙන් යුතුව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ රටේ කවුරුත් දන්න කෙනෙක්. එතුමා මේ රටේ ඉහළ ධුරයන් දරපු කෙනෙක්; ඒ වාගේම මේ රටේ දේශපාලන ක්‍රියාදාමය තුළත් ඉතා වැදගත් චරිතයක්. කවදාවත් නීතිපති දෙපාර්තමේන්තුව එතුමා සම්බන්ධව නිගමනයක් ගනිද්දී නොසැලකිල්ලෙන් නිගමනයක් ගන්නේ නැහැ.

වහාම අත් අඩංගුවට ගන්න කියලා නීතිපතිවරයා, රටේ පොලිස්පතිවරයාට නියම කරලා තිබෙද්දී නීතිය නැවෙනවා. සාමාන්‍ය අත් අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් -වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාටත්- එහෙමයි. අපේ ගම්මන්පිල මැතිතුමා කියලා තිබුණා, හිටපු ජනාධිපතිවරයාට රටේ අපරාධ නීතිය අදාළ වෙන්නේ නැහැ කියලා. මට එතුමාට මේවා තේරුම් කරලා දෙන්න නම්, අපරාධ නීතිය ඉගෙන ගන්න නීති විද්‍යාලයේ පළමුවැනි වසරේ සිට යවන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයෙක් ධුර දරන කාලය තුළ ඔහුට විරුද්ධව නඩු පවරන්න බැහැ. නමුත් ධුර දරන කාලය තුළ වැරැද්දක් කළොත් ධුරය අහිමි වීමෙන් පස්සේ හෝ දෝෂාභියෝගයෙන් අයින් කළාට පස්සේ හෝ ධුරයෙන් ඉවත් වුණාට පස්සේ හෝ ඒ කරපු වරදට ඔහුට විරුද්ධව රටේ නීතිය අනුව දඬුවම් කරන්න පුළුවන්. සිවිල් සහ අපරාධ කියන වග කීම් දෙකම පැවරෙනවා.

මීට කලින් චෝටර්ස් එජ් සිද්ධිය සම්බන්ධ නඩුවේදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය පිළිබඳව මේ ප්‍රශ්නය සාකච්ඡාවට ලක් වුණා. ඒ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය හා සම්බන්ධව අපරාධ පරීක්ෂණ කරන්න අවශ්‍යයි කියලා. එතුමියට විරුද්ධව නඩු පැවරුවේ නැහැ. එතුමියට විරුද්ධව සාක්ෂි තිබුණා නම් ඒ අවස්ථාවේ නඩු පවරනවා. ඒ නිසා හිටපු ජනාධිපති වුණත් වරදක් කරලා තිබෙනවා නම්, ඒ වරදට නිසි ලෙස දඬුවම් ලැබිය යුතුමයි. මේ රටේ අදහසක් තිබෙනවා, රාජපක්ෂවරුන් සම්බන්ධව විශේෂයෙන්ම ගෝඨාභය සහ මහින්ද රාජපක්ෂ යන දෙදෙනා සම්බන්ධව නීතිය ක්‍රියාත්මක වීමේදී යම් ආකාරයක ආපස්සට ඇදිල්ලක් තිබෙනවා කියලා. මම බොහොම වග කීමෙන් කියනවා, එහෙම ආපස්සට ඇදිල්ලක් තිබෙනවා නම් ඒ ඇදිල්ලට එක්සත් ජාතික පක්ෂයවත්, අගමැතිතුමාවත්, නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාවත් කිසිම සම්බන්ධයක් නැහැ කියලා. එහෙම ඇදිල්ලක් තිබෙනවා නම් තිබෙන්නේ වෙනත් තැනකිනුයි. ඒ නිසා මේ රටේ ජනතාව ඒක තේරුම් ගත යුතුයි. මේ රටේ ජනතාව මේ අපරාධකරුවන් කවුද කියන ප්‍රශ්නය තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිග් යානා සිදුවීම සම්බන්ධව වග කිව යුතු, කට්ටි පනිමින් ඉන්න ප්‍රධාන පුද්ගලයා අද වෙන කොට අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඔහු මේ ගනුදෙනුවේ අතරමැදියා. යුක්රේනයේ අධ්‍යාපනය ලබපු, යුක්රේනයේ ලිපිනය තිබෙන, යුක්රේනයේ පුරවැසිකම තිබෙනවාය කියන ඒ සම්බන්ධව වග කිව යුතුම පුද්ගලයා අපට අද එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී අත් අඩංගුවට ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ, අපේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ඥාතියා. ඒ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඥාතියා. අද රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. රටේ නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ඒ රෝද කරකැවෙනවා. හැබැයි, අපේ ලසන්ත වික්‍රමතුංග ජීවිතය පිදුවේ, ලසන්ත වික්‍රමතුංග මහා පාරේ, මහ දවල් මරලා දැම්මේ ඔය මිග් යානා වංචාව පිළිබඳව එළිදරව් කරපු නිසා. ඒක තමයි සත්‍ය තත්ත්වය. රුසියාවේ හිටපු තානාපතිවරයා තමයි මේ සිදුවීම පිළිබඳව අතරමැදියා. ඔහු තමයි මේකේ මොළකාරයා. ඒ නිසා ඔහුව අත් අඩංගුවට ගත්තාට පස්සේ ලසන්තගේ මිනීමැරුම පිළිබඳවත් නිවැරදි තොරතුරු, සත්‍ය තොරතුරු අපට එළිදරව් කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කිසිම අපරාධකරුවෙකුට ලෝකයේ සැඟවී ඉන්න පුළුවන්කමක් නැහැ. එක් පැත්තකින්,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නීතියේ ක්‍රියාදාමය ක්‍රියාත්මක වෙනවා. අනෙක් පැත්තෙන්, මොන තරම් අඩු පාඩු තිබුණත්, කොච්චර ප්‍රමාද වුණත් එදා අපි 2015 වෙච්ච පොරොන්දුව වන නීතිය සැමට එක ලෙස ක්‍රියාත්මක වෙනවා කියන කාරණය අපි පෙන්නුම් කරලා තිබෙනවා. රටේ ඉහළම ධුර දරන නිලධාරින් අධිකරණ ක්‍රියාදාමයට අවනත බව පෙන්නුම් කරලා තිබෙනවා. ඒ නිසා දැන් අපි කළ යුතු වන්නේ, මේ රටේ අපරාධ හා සම්බන්ධව ඉන්න දේශපාලනඥයන්, දේශපාලනඥයන් නොවන පුද්ගලයන්, ව්‍යාපාරිකයන් ඒ සියලු දෙනාම නීතිය ඉදිරියට ගෙනැල්ලා ඒ සියලු දෙනාටම නීතියෙන් දඬුවම් පමුණුවන එකයි. ඒක නිසා අපි මේ bond සිද්ධිය සම්බන්ධව සොයා බැලීමට පත් කළ කොමිසමේ වාර්තාවට වාගේම ප්‍රමාණවත් වැදගත්කමකින් මේ බරපතළ අපරාධ, දූෂණ සොයා බැලීමට පත් කළ කොමිසමේ වාර්තාව පිළිබඳවත් කටයුතු කළ යුතු වෙනවා. තමන්ගේ අය මෙතැන ඉන්නවා, තමන්ගේ යාළුවෝ, එකට කාපු-බීපු මිනිස්සු කියලා බලන්නේ නැතුව ඒ සියලු දෙනාටම විරුද්ධව එක හා සමානව නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි දැඩි ලෙස කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ නිසා මේ කාරණය කිසිම ආකාරයකින් පසු පසට අදින්න අපි ඉඩ දෙන්නේ නැහැ.

මේ ආණ්ඩුවේ ප්‍රධාන පංගුකාර පක්ෂය අපි. මේ රටේ නායකත්වය, මේ රටේ ජනවරම අපටයි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ජනවරම ලබා දුන්නු මේ රටේ ජනතාව එක දෙයක් දන්නවා. මේ රට තුළ යහපාලනයක් ඇති කරන්න එක්සත් ජාතික පක්ෂයේ කැප වීම පිළිබඳව මේ රටේ ජනතාවට විශ්වාසයක් තිබෙනවා. අද මේ මොහොතේ ක්‍රියාකාරී දේශපාලනය තුළ ප්‍රතිපත්ති ගරුක, ප්‍රතිපත්තියක් තිබෙන, එක ස්ථාවරයක ඉන්න, කට කැපුවත් බොරු කියන්නේ නැති නායකයෙක් ඉන්න පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය. ඒ එක්සත් ජාතික පක්ෂයට අද ගම් මට්ටමේ, බිම් මට්ටමේ දැවැන්ත බලයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒ දැවැන්ත බලය හරහා, ඒ මහජනතාවගේ අනුමතිය හරහා මේ රටේ යහපාලන ක්‍රියාදාමය තවත් ශක්තිමත් කරලා, ආර්ථිකය ශක්තිමත් කරලා මේ රට ගොඩගන්න අපි ක්‍රියා කරනවා. ඒ වාගේම මේ රටේ දුප්පත් පොඩි මිනිහා වාගේම මධ්‍යම පාන්තිකයා ඇතුළු සියලු දෙනාගේම අපේක්ෂාව නීතිය ඉක්මනින් ක්‍රියාත්මක කිරීමයි.

අපි කනගාටු වෙනවා, සිදු වී ඇති ප්‍රමාදයන් පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ ආධිපත්‍යය නොමැතිව තිබූ රටක, නීතියේ ආධිපත්‍ය ඇති කරන එක ලෙහෙසි වැඩක් නොවෙයි. ඒ හොරකම්වලට සම්බන්ධ මිනිස්සු මේ රටේ ඉහළ ධුර දරන කොට, හොරකමට සම්බන්ධ මිනිස්සු මේ රටේ දේශපාලන බලඅධිකාරිය තුළ ඉහළ තැන්වල ඉන්න කොට නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කරන රජයේ නිලධාරින්ට, නීතිපතිතුමාට, විනිශ්චයකාරවරුන්ට ඇතිවෙන පීඩනය අපට තේරුම් ගන්න පුළුවන්.

නමුත්, මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අවශ්‍ය කරන වාතාවරණය, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට නිර්භීතව ප්‍රශ්න කරන්නට, පැමිණිලි මෙහෙයවන්නට අවශ්‍ය කරන වාතාවරණය අපි අද වන විට ඇති කර තිබෙනවා. මේ රටේ විනිශ්චයකාරවරුන්ට ස්වාධීනව තීන්දු දෙන්නට අවශ්‍ය පසුබිම ඇති කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ පුරවැසියාට භය නැතිව ඇවිල්ලා මේ රටේ ඕනෑම තරාතිරමක කෙනකුට විරුද්ධව කථා කරන්න අවශ්‍ය පසුබිම ඇතිකර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මාධ්‍ය නිදහස අපි තහවුරු කර තිබෙනවා. සමහර වෙලාවට අපට හිතෙනවා, මාධ්‍ය නිදහස ඕනෑවට වඩා වැඩිද කියලා. සමහර වෙලාවට අපි කෙරෙහි අසාධාරණ විවේචන කරනවා. එසේ වුවත්, අපි ඒවා ගැන උපේක්ෂාවෙන් බලමින් අද සිදු වී ඇති ආකාරයටම සත්‍යය කවදා හෝ හෙළිදරවු වනවායි කියන ප්‍රතිපත්තිය මත ක්‍රියා කළ නිසා අද අපට හොඳ කලක් ඇවිල්ලා තිබෙනවා. බැඳුම්කර කොමිසම මඟින් එක්සත් ජාතික පක්ෂයත්, අපේ නායකයින්වත් සියයට සියයක් නිදහස් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. බරපතළ වංචා, දූෂණ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මඟින් පසුගිය ආණ්ඩුවේ හිටපු, අද ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න බොහෝ දෙනකුගේ අවසාන නවාතැන සිපිරි ගෙය බවට පත් කරන තැනට අද මේ පාර විවෘත කර තිබෙනවා. ඒ නිසා මා ජනතාවට කියන්නේ බලාපොරොත්තු තබාගෙන ඉන්න, බලාපොරොත්තු සහගතව ඉන්න කියලායි. අපි ජනතාවට 2015දී පොරොන්දු වූ දේ ප්‍රමාද වූ නමුත් ඉටු කරන බවත්, ඒ වෙනුවෙන් අපි පෙනී ඉන්න බවත් වගකීමෙන් කියමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 33ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.28]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වීමේ වරප්‍රසාද පාවිච්චි කරලා අපට ඕනෑම ජාතික වීරයකුට, ඕනෑම මනුෂ්‍යයකුට පහර දෙන්න පුළුවන්. ඒක දියුණු, ශීලාචාර පාර්ලිමේන්තුවක සිද්ධ වන දෙයක් නොවෙයි. අපි 1815දී කන්ද උඩරට ගිවිසුමෙන් බ්‍රිතාන්‍යයන්ට යටත් වුණා. සුද්දන් විසින් අපේ රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, සදාචාරය, මනුස්සකම කියන මේ සියල්ල නාය යැව්වා. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ නායක ඩී.එස්. සේනානායක මැතිතුමා ප්‍රමුඛ විවිධ ජාතිකවාදී බලවේග විසින් අධිරාජ්‍ය විරෝධී සටන ආරම්භ කළා. ඒ අවස්ථාවේදී හික්කඩුවේ ශ්‍රී සුමංගල හාමුදුරුවෝ, වැලිවිටියේ සෝරත හාමුදුරුවෝ, කොල්ලුපිටියේ දීපදුත්තාරාමයේ වැඩසිටි මීගෙට්ටුවත්තේ ගුණානන්ද නායක හාමුදුරුවෝ, අනගාරික ධර්මපාලතුමා වැනි අය ජාතික ප්‍රබෝධය සඳහා ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරන විට අමද්‍යප ව්‍යාපාරයේ නායකයන් ලෙස කටයුතු කළේ ඩී.එස්. සේනානායක, එෆ්.ආර්. සේනානායක වැනි සේනානායකවරුනුයි.

ඊළඟට, 1915දී -හරියටම අවුරුදු සියයකට පස්සේ- මුස්ලිම්, සිංහල කෝලාහලයක් ඇති වුණා. ඒ කෝලාහලයට මේ නායකයින් කවුරුත් සම්බන්ධ නැහැ. කෝලාහලයට මේ නායකයින් සම්බන්ධ නැති වුණත් මේ සියලුම නායකයින් එදා සුද්දන් විසින් යටත් කරලා වැලිකඩ බන්ධනාගාරයට යැව්වා. ඩී.එස්. සේනානායක, එෆ්.ආර්. සේනානායක, පියදාස සිරිසේන කොළඹ නගරයේ ආරක්ෂාව භාරව සිටි හෙන්රි පේද්‍රිස්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ සීයා වන ජාකෝලිස් රාළහාමි යන අය සිර භාරයට ගත්තා චෝදනා දාලා. මේවා ඉංග්‍රීසිකාරයින් පුවත් පත්වල පළ කළා. ඊට පස්සේ හෙන්රි පේද්‍රිස්ව වෙඩි තියලා මරලා පුටුව ගෙනැවිත් ඩී.එස්. සේනානායක මැතිතුමාට පෙන්වා කිව්වා, "මේ ලේ තැවරුණු විදියටම උඹලාවත් යවනවා" කියලා. නමුත්,

Privy Council එකේ තීන්දුවක් අනුව සේනානායක මැතිතුමා වැනි අය නිදහස් වුණා. අනගාරික ධර්මපාලතුමාවත් අවුරුදු හයකට සිර කළා. හෙන්රි පේද්‍රිස් වීරයා සිය දිවි පිදුවා. Havelock Town එකේ ඉසිපතනය ළඟ හෙන්රි පේද්‍රිස් පිළිරුවක් තබා තිබෙනවා.

ඊට අවුරුදු සියයකට පස්සේ -2015දී- තමයි මේ ගැහිල්ල පටන් ගත්තේ. 1815දී අපි යටත් වුණා. ඊට පස්සේ අවුරුදු සියයකට පස්සේ -1915දී- අනගාරික ධර්මපාලතුමා, සේනානායක මැතිතුමන්ලා වැනි අය සිර කළා. ඊළඟට, 2015 ඉඳන් දැන් මේ යන්නේ, රට බේරා ගත්ත, රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව සිංහල, දෙමළ, මුස්ලිම් සියලු මිනිසුන්ට ජීවත් වීමේ අයිතිය ලබා දුන්නු, ජනතාව මරණයෙන් බේරා ගත්ත සේනාධි නායක මහින්ද රාජපක්ෂ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුළු හාමුදුරුවරුන්ට, බුද්ධි අංශයේ නිලධාරීන්ට එළවා එළවා පහර දෙන යුගයයි. දැන් ඒ යුගය තමයි ඉතිහාසයට එකතු වන්නේ. මේ ගැන ඒ තරම් පුදුම වෙන්න දෙයක් නැහැ. මේක අවුරුදු සියයෙන් සියයට මේ රටේ සිදු වෙනවා. ඒකට අපි මුහුණ දෙන්න ලැහැස්තියි කියන ටික විතරක් මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි.

දැන් නීතිය, සාධාරණය බොහොම අකුරට ක්‍රියාත්මක වෙන හැටි කිව්වා. "අපි යුක්තිය පසිඳලනවා, අධිකරණ පිහිටුවනවා, දෙන්නම් බැටේ" කියලා චණ්ඩි පාට් දමලා තමයි පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා කථා කරන්නේ.

මිනීමරු කොටි සංවිධානය අවුරුදු තිහක් මේ රටේ පැවතුණා. සිංගප්පූරුවේ තිබෙන්නේ වර්ග කිලෝමීටර් 1,000යි. උතුරු, නැඟෙනහිර තිබෙන්නේ වර්ග කිලෝමීටර් 18,800යි. ඒ අනුව, සිංගප්පූරුව වාගේ රටවල් 18ක අණසක පිහිටුවලා, කාත්තන්කුඩි පල්ලියේ යාඥා කරමින් සිටි මුස්ලිම් මිනිස්සු සමූල ඝාතනය කරපු, ශ්‍රී මහා බෝධිය ළඟ සිල් අරගෙන හිටිය උපාසක අම්මලාගේ සුදු සිල් රෙදි රතු රෙදි බවට පත් වෙන්න ඔවුන්ට වෙඩි තියපු, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මහනුවර භාරව හිටපු කාලයේ දළදා මාළිගාවට බෝම්බ ප්‍රහාර එල්ල කරපු, තර්ජිත ගම්මානවල නිදි පැදුරුවල හිටපු මිනිස්සු කිතු කීතුවලට කපලා මරපු, ඉන්දියාවට ගිහිල්ලා රජීව් ගාන්ධි මරපු, රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ආමර් වීදියේදී කුඩු කරලා මරපු, ලලිත් ඇතුලත්මුදලි සහ ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමන්ලා මරපු, අප්පාපිල්ලෙ අමිර්තලිංගම් සහ ලක්ෂ්මන් කදිරගාමර් මැතිතුමන්ලා මරපු, සී.වී. ගුණරත්නලා, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේලා මරපු එල්ටීටී සංවිධානයේ ත්‍රස්තවාදයට එක ආණ්ඩුවකටවත් විසඳුමක් දී ගන්න බැරිව ඉන්නකොට, සේනාධිනායකයා ලෙස එකතු කළ හැකි සියලු බල වේග එකතු කරලා ප්‍රභාකරන්ට ගහලා රටේ මිනිසුන්ට ජීවත් වෙන්න අයිතිය ලබා දුන්න ජාතික වීරයාගේයි ප්‍රජා අයිතිය අහෝසි කරන්න ඕනෑ කියන්නේ, ITN එකට සල්ලි ගෙව්වේ නැහැ කියලා. මේක පුදුම රටක්! මේක තමයි ඉතිහාසය පුරාම අපට වෙලා තිබෙන නස්පැත්තිය. කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව, මාතෘ භූමිය -රට- බේරා ගත්ත මිනිස්සු තුට්ටු දෙකට දමලා, ඒ මිනිසුන්ගේ ආත්මවලට මෙවැනි ප්‍රහාර එල්ල කරන රටක තමයි අවාසනාවට අපි ඉපදිලා තිබෙන්නේ. එවැනි රටක පාර්ලිමේන්තුවක් තමයි අපට නියෝජනය කරන්න ලැබිලා තිබෙන්නේ.

එදා මේ රට ආරක්ෂා කරනවා කියලා දිවුරලා ජනාධිපති ධුරය ගත්ත රණසිංහ ප්‍රේමදාස යුගයේ, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හැටියට හිටපු ආර්. පාස්කරලිංගම් මහත්මයා, බදු ගෙවන ජනයාගේ මුදල් කෙළින්ම කොටියාට දුන්නා. එතකොට කොහොමද නීතිය? බදු ගෙවන ජනයාගේ මුදල් එලෙස ගෙවීමට සම්බන්ධ රහසිගත ලේඛන තිබෙනවා. ආර්. පාස්කරලිංගම්, ST. ඔහු තමයි වියදම් අනුමත කරන නිලධාරියා. ඔහු අත්සන් කරනවා. අත්සන් කරලා, එසේ ගෙවන ලද මුදල් පිළිබඳ සියලු රිසිට් පත් මා සතුව තිබෙනවා.

"හදිසි - රහස්‍ය වියදම් ගෙවීම් (මහා භාණ්ඩාගාරය)

(මුදල් ලේකම් - ආර්. පාස්කරලිංගම් නමට)

1989.08.09. ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.09.15 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.09.27 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.11.01 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

1989.11.30 ගෙවූ මුදල රුපියල් මිලියන 5යි.

මේ විධියට මුදල් ගෙවපු රිසිට් පත් මම **සභාගත*** කරනවා.

අද කෝ ඒ, ආර්. පාස්කරලිංගම්? ඒ, ආර්. පාස්කරලිංගම් තමයි, සුපිරිසිදු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධාන ආර්ථික උපදේශක. ඒ කාලයේ සිදුවූ දේ මම කියවන්නම්.

"රජය කොටින්ට අවි දීම වැරදියි"

-ඉන්දීය අගමැති.

"ශ්‍රී ලංකා රජය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට 'අවි සැපයීම' වැරදි සහගත ක්‍රියාවක් බව ඉන්දීය අගමැති නරසිංහ රාඕ මහතා 'මලයාල මනෝරාමා' 'ද වීක්' සහ 'මැගසින් ටුඩේ' යන පුවත් පත් සමඟ පවත්වා ඇති සාකච්ඡාවකදී පවසා ඇත."

මේ තමයි ආයුධ දීම සම්බන්ධව සඳහන් දේ.

එතකොට අග්‍රාමාත්‍යතුමා මොකක්ද කිව්වේ? ඒ සම්බන්ධ ඉතිහාසය දන්නේ නැතිනම් දැනගන්න.

"අවි දුන්නේ ජ.වි.පෙ හා ද්‍රවිඩ හමුදා මර්දනය කරන්න"

-රනිල් වික්‍රමසිංහ.

"දෙමළ කොටි සංවිධානයට ආයුධ ලබා දීම රහසක් නොවන බවත්, ජ.වි.පෙ. ත්‍රස්තවාදය මර්දනයට ශ්‍රී ලංකා හමුදාව දකුණේ තබා ගන්නා අතරතුර කොටි සංවිධානය ලවා දෙමළ ජාතික හමුදාවට පහර දීම අරමුණ වූ බවත්, සභානායක, කර්මාන්ත විද්‍යා හා තාක්ෂණ ඇමති රනිල් වික්‍රමසිංහ මහතා කැලණිය, පෙතියාගොඩ සමුපකාර ප්‍රජා ශාලාවේදී පැවැති කැලණිය එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩල රැස්වීමකදී ප්‍රකාශ කළා."

එතකොට, ඒ කාරණය අගමැතිතුමා පිළිගත්තා.

ලංකාවේ පුවත් පත්වල පමණක් නොවෙයි. මුළු ලෝකයේම පුවත් පත්වල මේවා සඳහන් වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මේ පිළිබඳව පුවත් පතක මෙසේ සඳහන් වුණා:

"කොටින්ට අවි ආයුධ ලබා දීමෙන් ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය කඩා ඇත.

ලලිත් ඇතුලත්මුදලි."

මේ තමයි, කොටින්ට ආයුධ දීපු, සල්ලි දීපු මිනිහා. ඔහු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධාන ආර්ථික උපදේශකයා වෙලා අදත් යහතින් ඉන්නවා. නමුත්, මහින්ද රාජපක්ෂයි, ගෝඨාභය රාජපක්ෂයි හිරගෙට යවනකම් නින්ද යන්නේ නැහැ කියන මිනිස්සු ඉන්න රටක තමයි අපි ඉන්නේ. මේක තමයි රට!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ දේශපාලන කොමිෂන් දාලා ගත්ත ඕනෑ තරම් නිර්දේශ තිබෙනවා. බටලන්ද කොමිසමේ වාර්තාව මම අද ගෙනාවේ නැහැ. මේ අභියෝගය නිසා මම අනෙක් දවසේ මේ පාර්ලිමේන්තුවට බටලන්ද කොමිසමේ වාර්තාව ගෙනැල්ලා ඒක සම්පූර්ණයෙන්ම කියවනවා. ඒක මතක තියා ගන්න. බටලන්ද කොමිසම පිළිබඳ රජයේ මුද්‍රලින් මුද්‍රණය කරලා තිබෙන වාර්තාව මම පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ මෙතැනට ගෙනැල්ලා කියවනවා. මේ කරන කුප්පිඩු දේශපාලනයට උත්තරයක් දෙන්න ඕනෑ. ඒ නිසා ඊළඟ විවාදය තිබෙන්නේ කුමන මාතෘකාවක් යටතේ වුණත්, ඒ විවාදයේදී බටලන්ද කොමිසමේ වාර්තාව මම සම්පූර්ණයෙන්ම කියවනවා. පුළුවන් නම් ඊට ඉස්සෙල්ලා මා මරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 ජුලි 04වැනි බ්‍රහස්පතින්දා "දිනමිණ" පත්තරේ මුල් පිටුව කියවන්න. එහි මෙහෙම සඳහන් වෙනවා:

"කෝටි 247ක වාහන ගැන කරා බහින් කැබිනට් රැස්වීම උණුසුම් වෙයි.

ගෙන්වා අතුරුදන් වූ වාහන දහ අට ගැන ඇමතිවරු ජනපතිනියගෙන් ප්‍රශ්න කරති."

ඒ යටතේ වැඩි දුරටත් සඳහන් මෙසේ වෙනවා.

"චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ පරිහරණය සඳහා පසුගිය රජයේ අවසන් දෙවසර තුළ ගෙන්වන ලද රුපියල් කෝටි 247කට ආසන්න වටිනාකමින් යුතු වෙඩි නොවදින වාහන 48ක් ගැනද, ඉන් අතුරුදන් වූ වාහන 13 පිළිබඳවද පැන නැඟුණු වාද විවාදවලින් ඊයේ රාත්‍රී පැවැති ඇමති මණ්ඩල රැස්වීම දැඩි උණුසුම් ස්වභාවයක් ගත් බව කැබිනට් මණ්ඩල ආරංචි මාර්ග සඳහන් කරයි."

එතකොට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග කෝටි 247ක වාහන ගෙන්වපු එකට දඬුවම් දුන්නාද? ඒ යුක්තිය ඉෂ්ට වුණාද? සාධාරණයක් ඉටු කළාද? ඒ වාහන කෝ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අනගාරික ධර්මපාලතුමාටත් මේ විධියටම රටේ මිනිස්සු හොරා, වංචාකාරයා, දූෂිතයා කියලා දිගින් දිගටම මාධ්‍යවලින් එළව එළවා බොරුවට ගැහුවා. එහෙම ගැහුවත් බොහෝ දේ දරාගෙන සිටි අනගාරික ධර්මපාලතුමා ඉන්දියාවට ගියා. ගිහින් එතුමා බුද්ධගයාව බේරා ගත්තා; මූලගන්ධ කුටි විහාරය හැදුවා. එතුමා සිරි දේවමිත්ත නමින් පැවිදි වෙලා සිටියදී අත් අකුරෙන් ලිව්වා, "මා මළ පසු මාගේ මෘත කලේබරයේ හිසවත් ශ්‍රී ලංකාව පැත්තට දාන්න එපා." කියලා. අපි ඒ තරම් අකෘතඥ මිනිස්සු කියලා උන්වහන්සේ දැනගෙන හිටියා. ඒ තමයි අනගාරික ධර්මපාලතුමාට කරපු දේ. ජීවතුන් අතර සිටියදී එතුමාට ඒ විධියට ගහලා, ගහලා මැරුණාට පස්සේ එතුමාගේ පිළිරූ රට පුරාම හදලා තිබෙනවා. මේ අපේ ජාතික වීරවරයෙක් කියලා දළදා මාලිගාව ළඟ, විහාරමහාදේවී උද්‍යානයේ එතුමාගේ පිළිරූ හදලා තිබෙනවා. ඒ නිසා එවැනි ජාතික වීරයන්ට ගහන්න එපා. රටක ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කරපු මිනිසුන්ට ගහන්න එපා. මිනිස්සු අතර අඩු පාඩු තිබෙන්න පුළුවන්; වැරදි තිබෙන්න පුළුවන්. අපි හැමෝම වැරදි තිබෙන "black and white" මිනිස්සු. අපි හැමෝම අත වැරදි තිබෙන්න පුළුවන්. රටක ඉතිහාසයක ගමන් මඟ වෙනස් කරපු මිනිස්සු තුට්ටු දෙකට දාලා ප්‍රහාර එල්ල කිරීමේ නින්දිත ප්‍රයත්නයෙන් අඩු තරමින් උත්තරීතර සභාව කියන මේ පාර්ලිමේන්තුවේදීවත් මිදිය යුතුයි කියලා තමයි මම විශ්වාස කරන්නේ. මොකද, මේ රටේ ජාතික නායකයෝ විවිධ අඩු පාඩු, දුෂ්කරතා යටතේ වුණත් යම් දෙයක් කළා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා කොටින්ට ආයුධ දුන්නා; කොටින්ට මුදල් දුන්නා. නමුත්, එතුමා මේ රටේ දුප්පත්කම නැති කරන්න, දුප්පත් මිනිසුන්ට මොකක් හරි කරන්න ඒ කාලයේ යමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි 2008 -2014 කාලය තුළ සිදුවූ බැඳුම්කර වංචා සොයනවාය කියන එක. "අත්තනෝමතික තීන්දුවලට බැඳුම්කර නිකුතු සිදු කරලා. එය පිරමීඩ වංචාවකට සමානයි." මේකනේ මේ අය කියන්නේ. 2015දී සිදු වූ බැඳුම්කර සොරකම වහන්න, 2008 සිට 2014 දක්වා සිදු කළ බැඳුම්කර පිළිබඳවත් සොයනවා කියලා අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී කියනවා. එයින් ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය මොකක්ද? ලංකාව නිකුත් කරන බැඳුම්කරවලට මෙච්චරකල් කිව්වේ, "ස්වෛරීත්ව බැඳුම්කර" - Sovereign Bonds - කියලායි. දැන් ලෝකය පුරාම කියන්නේ "Black Bonds" කියලායි; "කළු බැඳුම්කර" කියලායි කියන්නේ. ඒවා කවුරුවත් ගන්නේ නැහැ. ලබන අවුරුද්දේ ඇති වෙන මූල්‍ය අර්බුදය මොකක්ද කියලා බලන්න. ආණ්ඩුවම කියනවා, "රජය වෙනුවෙන් මේ බැඳුම්කර නිකුත් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව" කියලා. ශ්‍රී ලංකා මහ බැංකුව තමයි රජයේ බැංකුකරු; මුදල් නියෝජිතයා; මූල්‍ය උපදේශකයා. දේශපාලනඥයෝ නොවෙයි බැඳුම්කර නිකුත් කරන්නේ. එතකොට ඒ නිකුත් කරපු බැඳුම්කර හොරට නම් නිකුත් කරලා තිබෙන්නේ, රජය වෙනුවෙන් භාණ්ඩාගාරය, මේ මහා බැංකුව මොකක්ද කරලා තිබෙන්නේ? ඒ ආයතන තමයි මුදල් නෝට්ටු අච්චු ගහන තැන; මුදල් නෝට්ටු අච්චු ගහන්න ඒකාධිකාරී බලය තිබෙන තැන; සියයට සියයක් සම්පූර්ණ මහජන විශ්වාසය රඳන තැන. එසේ තිබියදී දේශපාලනඥයෝ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, "2008 සිට 2014 දක්වා ලෝකයේ ගනුදෙනුවෙමින් තිබෙන ලංකාවේ බැඳුම්කර හොර ඒවා." කියලා.

ලංකා ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ කියනවා නම්; ඒ රටේ අග්‍රාමාත්‍යතුමා, ඒ රටේ ඇමතිවරු කියනවා නම් 2008 සිට 2014 දක්වා ගනුදෙනු වෙලා තිබෙන්නේ හොර බැඳුම්කර කියලා, මේ බැඳුම්කරවලට දාපු සියලුම මුදල් විදේශිකයෝ ආපසු ඉවත් කර ගෙන යනවා. මහ බැංකුවේ මහ දවල් සිදු වූ මහ මුදල් මංකොල්ලයෙන් පස්සේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4ක් අරගෙන ගියා. අරගෙන යනකොට ඒක නවත්වන්න හිටපු මුදල් අමාත්‍ය, රවි කරුණානායක මහතා අය වැය යෝජනාවක් ගෙනාවා. විදේශිකයන්ට සියයට 12ක් බැඳුම්කර ගන්න පුළුවන්කම තිබුණු එක එතුමා සියයට 10ට අඩු කළා. මොකද, ඔක්කොම ටික ගෙඩිය පිටින් ඇද්දොත් ජාත්‍යන්තර සංචිත - Foreign-Exchange Reserves- ටික කඩාගෙන වැටෙනවා. එහෙම කඩාගෙන වැටුණොත් රට වැටෙනවා. දැන් මේකෙන් වෙන්නේ මේ ආර්ථිකය ගෙනයන්න බැරි වෙන එකයි. ගෙනයන්න පුළුවන් එකම ක්‍රමය මේකයි. 2008-2014 දක්වා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ මේ බැඳුම්කර වංචාව සිදු වුණාය කියා උඩ පැන පැන කියනවා නම්, පාර්ලිමේන්තුවේ අනෙක් සියලු කටයුතු වහාම නතර කර, මේ පිළිබඳව විතරක් තේරීම් කාරක සභාවක් පත් කර මෙය නිවැරදි කළ යුතුයි. එහෙම

නැත්නම් ආර්ථිකය ගෙනයන්න බැහැ. අනෙක් වැඩ සියල්ල නතර කර, මාසයක් ඇතුළත මේ වැඩේ කරන්නය කියලා කියන්න මේ කොමිසමටම පුළුවන්. ලංකාව 2008 සිට 2014 දක්වා ලෝකය පුරා නිකුත් කර තිබෙන බැඳුම්කර වංචා සහගත ඒවාද, නැද්ද කියා ප්‍රකාශ කරන්න කියලා කියන්න මේ කොමිසමට පුළුවන්. ඒ සඳහා තේරීම් කාරක සභාවක් පත් කරන්න. පාර්ලිමේන්තුව හා රට වෙනුවෙනුයි මා මෙම ඉල්ලීම කරන්නේ. රටේ මුදල් ක්‍රමය කඩාගෙන වැටුණොත් අපි කාටවත් ගොඩ ගන්න බැහැ. පොඩි ගණනක් ගැන නොවෙයි මේ කියන්නේ.

මම නැවතත් එම කරුණු පෙන්වන්නම්. රුපියල් බිලියන 4,702ක ගනුදෙනු විනිවිද නැහැ කියලා අග්‍රාමාත්‍යතුමා කියා තිබෙනවා. බිලියන 4,702ක් කියන්නේ කෝටි හාරලක්ෂයක්. කෝටි හාරලක්ෂයක් ගැන කියන්නේ. මහින්ද රාජපක්ෂ යුගයේ මේ භාණ්ඩාගාර බැඳුම්කර වැරැදි නම්, එයට මමත් වග කියන්නට ඕනෑ. මොකද, මමත් ඒ කාලයේ කැබිනට් ඇමතිවරයෙක්. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් ඒ කාලයේ කැබිනට් ඇමතිවරයෙක්. එතුමාත් එයට වග කියන්නට ඕනෑ. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමාත් එදා කැබිනට් ඇමතිවරයෙක්. එහෙම නම් එතුමාත් එයට වග කියන්නට ඕනෑ. ඒ වාගේම ගරු සරත් අමුණුගම ඇමතිතුමාත් වග කියන්නට ඕනෑ; ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත් වග කියන්නට ඕනෑ; අපි ඔක්කොම වග කියන්නට ඕනෑ. මොකද, එහෙම වග කියන්නට බැරි ඇමතිවරු සාමූහික වග කීම යටතේ කැබිනට් මණ්ඩලයක ඉඳලා වැඩක් නැහැ නේ. මේ බිලියන 4702 ක මුදල මහින්ද රාජපක්ෂගේවත්, බන්දුල ගුණවර්ධනගේවත්, රවි කරුණානායකගේවත් පෞද්ගලික මුදල් නොවෙයි නේ. මේවා ලංකා ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කර තිබෙන්නේ. ලංකා ආණ්ඩුවේ බැඳුම්කර මහ බැංකුව හොරට නම් නිකුත් කර තිබෙන්නේ, මේ ගරු සභාවේ අපි ඉතාම උස් හඬින් ඉල්ලා සිටිනවා, වහාම මේ ගැන තේරීම් කාරක සභාවක් පත් කරන්නය කියා. අනෙක් සියලුම කටයුතු නතර කර මේ ගැන විතරක් හොයන්න. ගෙන්වන්න පුළුවන් හැම කෙනෙකුම ගෙන්වන්න. දෙන්න පුළුවන් හැම දඬුවමක්ම දෙන්න. මේකේ ශත පහක් හෝ වංචා කර තිබෙනවා නම්, මුළු කැබිනට් එකේම ඉන්න ඔක්කොම හිරේ දමන්න කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරනවා. මේ ඒකට දීපු උත්තරය.

දෙවන කාරණය. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
The Hon. (Dr.) Harsha De Silva )
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. (Dr.) Harsha De Silva.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් මට තත්පර තිහක කාලයක් දෙන්න කියා ඉල්ලා සිටිනවා. වැදගත් කාරණයක් - [බාධා කිරීමක්] මට කරුණාකර තත්පර තිහක කාලයක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ නැති පුද්ගලයකු වන ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ගැන කිව්වා. ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා කළු සල්ලිවලින් එංගලන්තයේ මහ ලොකු බිල්ඩිමක් අරගෙන තිබෙනවාය කියලා කිව්වා. මම එතුමාට දැන් කථා කළා. එතුමා කිව්වා, ඒක සම්පූර්ණ අසත්‍යයක් බව. ඒක නිවැරදි නැහැ. එතුමාට මෙතැනට එන්න විධියක් නැති නිසා ඒක නිවැරදි කරන්න කියලා එතුමා මට කිව්වා. එහෙම මිනිසුන්ට අපහාස කරන එක සම්පූර්ණයෙන්ම වැරැදියි. එතුමා Commonwealth Secretariat එකේ, Deputy-Director of the Secretary-General වශයෙන් සිටි කාලයේ එතුමාට දීලා තිබුණු ගෙයක්. එතුමා ඒ මුළු බිල්ඩිමේම නොවෙයි ඉඳලා තිබෙන්නේ. එතුමා ඒ බිල්ඩිමේ එක flat එකක ඉඳලා තිබෙන්නේ. දැන් එතුමා Finchleyවල පොඩි flat එකක සිටින බව සඳහන් කරන්න කියලා එතුමා මට කිව්වා. මොකද, එය අසාධාරණ ප්‍රකාශයක්, ඒ ගැන පැහැදිලි කරන්න එතුමාට මෙතැනට එන්න බැරි නිසා. බොහොම ස්තුතියි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම එහෙම තොරතුරක් ගැන කියලා නැහැ. මම යම් තොරතුරක් පිළිබඳව සඳහන් කරනවා නම් එහෙම කරන්නේ අදාළ ලේඛන සියල්ල අතේ තියාගෙනයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා එහෙම කිව්වේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, ඒක එතුමාත් එක්ක බේරා ගන්න.

ඊළඟට, මහ බැංකුවේ මෙම බැඳුම්කර සිද්ධියට අදාළව ප්‍රශ්නය පටන් ගත් දවසේ සිටම මම පාර්ලිමේන්තුව වෙනුවෙන් මුදල් පිළිබඳ යුතුකම ඉෂ්ට කිරීම විතරයි කළේ. පෞද්ගලිකව කිසිදු ඇමතිවරයකු හෝ අග්‍රාමාත්‍යතුමා සමඟ මගේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මේ රටේ හැම දාම ශ්‍රී ලංකා මහ බැංකුව තිබුණේ මුදල් ඇමතිවරයා යටතේ බව අපි දන්නවා. මුදල් ඇමතිවරයා සහ මහ බැංකුවේ අධිපති තමයි මුදල් නෝට්ටුවලට අත්සන් කරන්නේ. මූල්‍ය නීති පනත අනුව මේ සියලුම වග කීම් පැවරෙන්නේ මුදල් විෂය භාර අමාත්‍යවරයාට.

ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට, මේ මුදල් අමාත්‍යවරයාගෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අරගෙන අග්‍රාමාත්‍යතුමා යටතේ ගැසට් කළා. ඒක කළේ අග්‍රාමාත්‍යතුමායි. එතුමා දෙවනුව මහ බැංකු අධිපති ධුරයට විදේශිකයකු පත් කළා. ලංකාව කියන්නේ ආර්ථික විද්‍යාව පිළිබඳව, ගණකාධිකරණය පිළිබඳව, මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳව, බැංකු පිළිබඳව පළපුරුදු නිලධාරින්, බුද්ධිමතුන් දස දහස් ගණනක් සිටින රටක්. එදා ජෝන් එක්ස්ටර් මේ බැංකුව හදන කොට ලංකාවට බැංකුවක් තිබුණේ නැහැ. මුදල් තිබුණේ නැහැ. අපේ රුපියල ඉන්දියානු රුපියලත් එක්ක සම්බන්ධ කරලා තිබුණේ. ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයෙන් තමයි මුදල් නිකුත් කළේ. ඇමෙරිකානු ජාතික ජෝන් එක්ස්ටර් තමයි මුදල් ක්‍රමය පිළිබඳ මේ මූල්‍ය නීති පනත හැදුවේ. එය හදපු අවස්ථාවේ ඔහු මහ බැංකු අධිපති වුණා. ඒ කාලයේ අපි පූර්ණ නිදහස් රටක් නොවෙයි. අපිට හමුදාවක් තිබුණේ නැහැ. නාවික හමුදා කඳවුර ත්‍රිකුණාමලයේ තිබුණා. ගුවන් හමුදා කඳවුර කටුනායක තිබුණා. අපි බ්‍රිතාන්‍යයට යටත්ව හිටියේ. අපට පූර්ණ නිදහස ලැබුණේ 1956දී ඒ කඳවුරු අයින් කළාට පසුවයි. ඊට පසුව කවදාවත් මහ බැංකුවට විදේශිකයකු පත් කරන්න ඕනෑ වුණේ නැහැ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අපි හිතමු, එහෙම කෙනෙක් පත් කළාය කියලා. එහෙම පත් කරන කොට ඔහු අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165වන ව්‍යවස්ථාව අනුව දිවුරුම් දීමක් කරන්න ඕනෑ. අගමැතිතුමාට තිබුණා, ඔහුට දිවුරුම් දෙන්න කියලා කියන්න. නමුත් කිව්වේ නැහැ. මොකද ඔහුට දිවුරුම් දෙන්න බැහැ. ඇමෙරිකන් පුරවැසියකුට -ගෝඨාභය රාජපක්ෂට- පුළුවන් වුණා ලංකාවට ඇවිත් ආරක්ෂක ලේකම් ධුරය දරන්න. ඇයි? ඇමෙරිකා එක්සත් ජනපදය dual citizenship කියන එක අනුමත කරනවා. නමුත් සිංගප්පූරුවේ dual citizenship කියන එක පිළිගන්නේ නැහැ. සිංගප්පූරු පුරවැසියාට කිසිම වෙලාවක වෙනත් රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකිනවා කියා දිවුරුම් දීමක් කරන්න බැහැ. එම නිසා ඔහු දිවුරුවේ නැහැ. අපි විදේශිකයකුගේ සේවය ලබාගන්නවා නම්, රජයේ ආයතන සංග්‍රහයේ 7.2 වගන්තිය යටතේ ඒ සඳහා ඇමතිවරයාගේ ලිඛිත අනුමැතියක් තියෙන්න ඕනෑ. මා හිතන විධියට වජිර අබේවර්ධන අමාත්‍යවරයා එහෙම ලිඛිත අනුමැතියක් දීලාත් නැහැ. මහ බැංකු අධිපතිවරයා පත් කිරීම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165වන ව්‍යවස්ථාව අනුව නීත්‍යනුකූල නැහැ. ඔබතුමන්ලා 165වන ව්‍යවස්ථාව කියවා බලන්න. ඒකට වෙන කාගේවත් නමක් කියලා -වෙන රටක dual citizenship ගන්න පුළුවන් ගෝඨාභය රාජපක්ෂ වැනි කෙනෙකුගේ- උදාහරණ ඉදිරිපත් කළාට වැඩක් නැහැ. මොකද සිංගප්පූරු පුරවැසියාට විතරයි තවත් රටක පුරවැසිකම ලබන්න බැරි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකිනවා කියලා කියන්න බැරි මනුස්සයෙක් කොහොමද සල්ලි කොළයට අත්සන් තබන්නේ? ඒ මුදල් නීත්‍යනුකූලද? මේ ප්‍රශ්නය ගැන කවුරු හෝ කථා කරන්න ඕනෑ නේද? ඒ අනුව 2015 ජුනි මාසයේ 3වැනි දා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ප්‍රශ්නය අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කළා. අපිට විපක්ෂයක් නැහැ නේ. මෙහි තිබෙන්නේ හීන විපක්ෂයක් හා "deal විපක්ෂයක්". ජනතාවගේ විපක්ෂය වශයෙන් 2015 ජුනි මාසයේ 03වැනි දා අපි මේ පිළිබඳව ඇහුවාම, අගමැතිතුමා මෙසේ කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජුනි 03වැනි දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 388හි මෙසේ සඳහන් වෙනවා:

> "සමහරු දැන් තමන්ට හිතවත් මාධ්‍ය උපයෝගි කර ගනිමින්, අර්ජුන මහේන්ද්‍රන් මහතා නිසා ජාත්‍යන්තර ප්‍රශ්න ඇති වී ඇති බවට ප්‍රචාර යවනවා. නමුත්, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සිදු කෙරෙන මහ බැංකු ගනු-දෙනු විමසීමේදී ඒ බවක් පෙනී යන්නේ නැහැ. රාජපක්ෂ රෙජිමයේ හෙංචයියලා ලංකා බැංකුවට හා මූල්‍ය ආයතනවලට බලපෑම් එල්ල කරන බව අප දන්නවා. නමුත්, ඒ කිසිවක් සාර්ථක වී නැහැ....
>
> විදේශ පුරවැසියන් සම්බන්ධ කර ගෙන රාජ්‍ය සම්පත් මං කොල්ල කද්දී, කොමිස් කුට්ටි ගණන් ගසා කද්දී, දූෂණයේ යෙදෙද්දී, වංචා කරද්දී ඔබතුමන්ලා කට පියාගෙන සිටියා. එහෙත් විදේශ පුරවැසියෙක් යොදාගෙන දූෂණ වංචා තුරන් කරද්දී, මූල්‍ය විනයක් ඇති කරද්දී, රාජ්‍ය සම්පත් ආරක්ෂා කරද්දී ඔබතුමන්ලා ඊට විරුද්ධයි."

අන්න, අගමැතිතුමා මේ හොරු රැක්ක විධිය. "දූෂණයේ යෙදෙද්දී, වංචා කරද්දී ඔබතුමන්ලා කට පියාගෙන හිටියා" කියලා එතුමා කිව්වා. එහෙත් විදේශ පුරවැසියකු -විදේශ පුරවැසියා කියන්නේ අර්ජුන මහේන්ද්‍රන් - යොදාගෙන දූෂණ වංචා තුරන් කරද්දී, මූල්‍ය විනයක් ඇති කරද්දී, රාජ්‍ය සම්පත් ආරක්ෂා කරද්දී ඔබතුමන්ලා ඊට විරුද්ධයි කියලාත් අගමැතිතුමා කිව්වා.

එතුමා කියන්නේ, දූෂණ නැති කරන්න ආපු එක්කෙනා අර්ජුන මහේන්ද්‍රන් කියායි. ඉතිහාසයේ පළමුවැනි වතාවට අභ්‍යන්තර තොරතුරු තමන්ගේ බෑනාට දීම තුළින් අර්ජුන මහේන්ද්‍රන් වැරැද්දක් කර තිබෙනවා. මේක නේ, අපරාධ වැරැද්දක් වෙන්නේ. අභ්‍යන්තර තොරතුරු, වෙළෙඳ පොළේ ප්‍රාථමික ගැනුම්කරුවකුට - primary dealer කෙනෙකුට- දීලා ඒ තුළින් කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත ලාභ ලබන්න හදනවා. එතකොට ඒ අය ඒ මූල්‍ය විනය ඇති කරන හැටි. ඒවාට අනෙක් ඔක්කොම අයත් පැටළුණා. එහෙම පැටළුණාට පස්සේ අගමැතිතුමා මේ ගරු සභාවේදී මෙහෙම කියනවා.

2015 මාර්තු 17 වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 66හි මෙසේ සඳහන් වෙනවා:

> "... මුදල් අමාත්‍යවරයා, මහාමාර්ග අමාත්‍යවරයා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මහ බැංකුවේ අධිපති හා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ඇතුළු නිලධාරීන් පෙබරවාරි 26 වැනිදා රැස් වී මේ ගැන සාකච්ඡා කළා. බිලියන 15ක් කඩිනමින් අවශ්‍ය බවට ඒගොල්ලන් එදා තීරණය කළා. ඒ වන විටත් රුපියල් බිලියන එකක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වෙනුවෙන් මහ බැංකුව දැන්වීම් පළ කර තිබුණා."

ඒ කියන්නේ මුදල් අමාත්‍යවරයායි, මහාමාර්ග අමාත්‍යවරයායි, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයායි, මහ බැංකු අධිපතියි. මුදල් අමාත්‍යවරයා විතරක් නොවෙයි. තව කට්ටිය තමයි පෙබරවාරි 26 වැනිදා හම්බ වෙලා රුපියල් බිලියන 15ක් ඕනෑ කියලා කිව්වේ.

අගමැතිතුමා තවදුරටත් මෙහෙම කියනවා:

> " රුපියල් බිලියන 20කට අධික භාණ්ඩාගාර බිල්පත් සඳහා මිල ගණන් ඉදිරිපත් කර අනතුරුව බිලියන 10ක් දක්වා මිල ගණන් තෝරා ගන්නා ලෙස ඔහු ප්‍රසිද්ධ ණය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට උපදෙස් දුන්නා. ඒ ටෙන්ඩර් එක දීලා තිබෙනවා. මහ බැංකුවේ අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියලා කරුණු නැහැ."

අග්‍රාමාත්‍යතුමා තමයි මෙහෙම කියන්නේ. එතුමා 2015 මාර්තු 17 වැනිදා මේ ගරු සභාවට බොහොම පැහැදිලිව කියනවා, මහ බැංකු අධිපතිවරයා මේකට සම්බන්ධ වුණාය කියලා කරුණු නැහැයි කියලා. කරුණු නැත්නම් මේ පිටු ගණන්වල කියලා තිබෙන්නේ සෘජුවම මේ තොරතුරු අරගෙන කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත අලාභ කරන්න චූදිතයා තමන්ගේ බෑණාට ඉඩ ප්‍රස්ථා ලබා දුන්නා කියන එකයි. ඒ චූදිතයා ගැන අගමැතිතුමා කියනවා, "නැහැ, නැහැ එහෙම එකක් කරලා නැහැ"යි කියලා. එතුමා ඒක කරන්නේ නැහැ. අපටයි කියන්නේ.

ගරු අගමැතිතුමා තවදුරටත් මෙහෙම කියා තිබෙනවා. එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 69හි මෙසේ සඳහන් වෙනවා:

> "ඔබතුමන්ලා කී දෙනෙක් bond market එක ගැන දන්නවාද? කී දෙනෙක් "Brooke Bond" ගැන දන්නවාද? කී දෙනෙක් "James Bond" ගැන දන්නවාද? ඉතින් එහෙම නම් අපි සුදුසු නැහැ. එහෙම නම් අපි Primary Dealersලා මෙතැනට දමන්න ඕනෑ . ඔබතුමන්ලාට ඕනෑ නම් අපි විශේෂඥ දැනුම ලබා දෙන්නම්. ඔබතුමන්ලා ඒ දැනුම අර ගන්න, අපි ඒකට උදව් කරන්නම්. මට ඕනෑ, Parliamentary Budget Office එකකුත් පටන් ගන්න. ඉතින් මේ මොකක්වත් වහන්න වුවමනා නැහැ.
>
> ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අදටත් COPE එකේ වැඩ කටයුතු හොඳට කර ගෙන යනවා. ඒ කමිටුවේ සභාපති වෙන්න ඔබතුමාට තිබුණ විශේෂ දැනුම මොකක්ද? පාර්ලිමේන්තුවේ ඉන්න අපි දන්නවා, කොහොමද මේ වැඩ කටයුතු කරන්න ඕනෑ කියලා."

එතකොට එතුමා බොහොම පැහැදිලිව ඩිව් ගුණසේකර මහත්තයාගෙන් අහනවා, ඔබතුමා Bonds ගැන දන්නේ මොනවාද කියලා. මේ මොනවාවත් කරලා නැහැ. මම නොවෙයි, අග්‍රාමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේදී මෙහෙම කියලා තිබෙන්නේ. මේ හැන්සාඩ් වාර්තා කියවන්න.

ඊට පස්සේ කොමිසම ඉදිරියේ සාක්ෂි දෙනවා. එතැන බිලියන 15ක් කියනවා.

2017 සැප්තැම්බර් 25 වැනි සඳුදා "ලංකාදීප" පුවත්පතේ මෙසේ සඳහන් වෙනවා:

"බිලියන 75ක් ඉල්ලා හිටපු ඇමති රවි ඉදිරිපත් කළ ලිපිය නිල ලිපියක්. ව්‍යාජ ලිපියක් බවට කරන චෝදනාව මා ප්‍රතික්ෂේප කරනවා."

බිලියන 15ක් කියලා අගමැතිතුමා පාර්ලිමේන්තුවට කියනවා. මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් කියනවා, බිලියන 75ක් අවශ්‍යයි කියලා රවි කරුණානායක මැතිතුමා ලියුමක් දුන්නාය කියලා. මම නොවෙයි, මේ කොමිසමට දිවුරලා කියන සාක්ෂි. අපි දන්නේ නැහැ.

"අන්තෝ ජටා - බහි ජටා" කියනවා වාගේ මේ ඔක්කොම ඇවිල්ලා කියනවා, "බිලියන 12ක අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා තමයි කියන්නේ. දැන් ඒකේ ප්‍රශ්නයක් නැහැ, ඒ මුදල් බැංකුවේ තිබෙනවා"ය කියලා. ඒවා අමු බොරු. එහෙම කොහොමද බැංකුවේ මුදල් තිබෙන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිලියන 12ක් නම් -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා ඒ විධියට කථා කරන්න එපා. මොකද, දැන් පොඩ්ඩකට කලින් ගරු අගමැතිතුමා කිව්වා, ඒ මුදල් freeze කරලා තිබෙනවා කියලා මහ බැංකු අධිපතිතුමා කිව්වා කියලා. ඒවා තිබෙනවා. මහ බැංකුවේ තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මහ බැංකුවේ ඒ මුදල් තියා ගෙන මොකටද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ තර්කය ඒක නොවෙයි. මම අහන්නේ මේ හොරකමේ අලාභය බිලියන 12ක් නම් ඒ ගනුදෙනුව ඉවර වුණු දවස 2016 -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක නොවෙයි නේ, ඔබතුමා කිව්වේ. බිලියන 12 නැහැයි කියලා නේ. ඔබතුමා කිව්වා බිලියන 12 නැහැ කියලා. මම කියන්නේ බිලියන 12 තිබෙනවාය කියලා මහ බැංකු අධිපතිවරයා සනාථ කර තිබෙනවා කියන එකය. එච්චරයි මම කියන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, බිලියන 12ක් තිබෙනවා. අහවල් එකටද, බිලියන 12ක්. අය වැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට බිලියන 203ක් වෙන් කළා. වියදම් කළේ කීයද? බිලියන 65යි. ඉතිරි කීයද? බිලියන 138යි. එහෙම නම් බිලියන 138ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන්නේ. මේ බිලියන 12 මොකක්ද? ඒක කුණු කූඩයට දමන්න බැරියැ. අර බිලියන 138ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන්නේ. බිලියන 203ක් වෙන් කළා, 65ක් වියදම් කළා, ඉතිරි 138යි.

සියයට 32යි වියදම් කළේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ බිලියන 138ක් තිබෙනවා. ඒක ගන්න බැරියැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
2016 වර්ෂයේ මාර්තු මස 31වැනි දිනෙන් පසුව, කොමිසම වැහුවාට පසුව මෙම සමාගම රුපියල් බිලියන 5,729ක ප්‍රාග්ධන ලාභ ලබලා තිබෙනවා. රුපියල් බිලියන 6,365ක ලාභ ලබලා තිබෙනවා. එතැන විතරක් රුපියල් බිලියන 12,094ක ලාභයක් තිබෙනවා. මේ කොමිසම වැහුවාට පස්සේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන සිදුවී තිබෙන අලාභය කොපමණද කියලා මම ගණනය කරලා තිබෙනවා. භාණ්ඩාගාර බිල්පත් පොලී වක්‍රය වෙනස් වීමෙන් වූ පාඩුව රුපියල් බිලියන 144.5යි. විදේශිකයන් ආපසු රැගෙන ගිය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4යි; එනම් රුපියල් බිලියන 360යි. කොටස් වෙළෙඳ පොළේ සිදුවූ අලාභය රුපියල් බිලියන 369යි. විදේශ විනිමය අනුපාතය නිසා සිදු වූ අලාභය රුපියල් බිලියන 450යි. රාජ්‍ය ණය පැටවී ගැසීමෙන් රුපියල් බිලියන 571යි. ණය පොලී අනුපාතය, රාජ්‍ය ණය පොලී වැඩි වීමෙන් වූ අලාභය රුපියල් බිලියන 289යි. සෘජු විදේශ ආයෝජන අඩු වීම රුපියල් බිලියන 271යි. ඔක්කොම අලාභය, ආවස්ථික අලාභය - opportunity loss එක - ඒ කියන්නේ ලබා ගත හැකිව තිබී නැතිවූ අලාභය රුපියල් බිලියන 2,000යි. ගණනය කරපු ආකාරය සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා. ඒ සියල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මට සඳහන් කරන්න තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය තුළ අභ්‍යන්තර අර්බුදයක් එළියට ඇවිත් තිබෙනවා කියන එකයි. 2018 පෙබරවාරි මස 05වැනි දින "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

"...... "අර්ජුන් ඇලෝසියස් හා තමා අතර පුද්ගලික හෝ ව්‍යාපාර හෝ නිල වශයෙන් හෝ සම්බන්ධයක් නොතිබුනු" බවට කරුණානායක කළ දිවුරුම පදනමේ සිට ඔහුට එරෙහිව පියවර ගැනීමට කටයුතු කරන ලෙස අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවට ද උපදෙස් ලැබී ඇත. මෙසේ උපදෙස් ලැබී ඇත්තේ "සාවද්‍ය සාක්ෂි" ලබා දීම අරඹයා කරුණානායකට එරෙහිව පියවර ගන්නා ලෙසට නීතිපති දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු උපදෙස්වලට අමතරවය.

පසු ගිය අඟහරුවාදා එක්සත් ජාතික පක්ෂ නායක, අගමැති රනිල් වික්‍රමසිංහ, අරලියගහ මන්දිරයේ පැවැති සාකච්ඡාවකට කරුණානායක කැඳවුවේය. අඩුම තරමින් මෙම ගැටලු විසඳා ගන්නා තෙක් පක්ෂයේ උපනායක තනතුරින් ඉල්ලා අස් වන ලෙසට ඔහු කරුණානායකගෙන් ඉල්ලා සිටියේය. සන්ඩේ ටයිම්ස් හට....."

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද මේ කරන්නේ? බොරුවට පත්තරවල තිබෙනවා කියලා බොරු කථා කියනවා. මොනවාද මේ කියන්නේ? මේ වාගේ මොකුත් කරලා නැහැ. [බාධා කිරීමක්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික පුවත් පතක තිබෙන දෙයක් මේ සභාවේ කියන්න මට අයිතියක් නැද්ද? [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා පුවත් පත කියවන්න. ඒ එක්කම කථාව අවසන් කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම පුවත් පත කියවන්නේ. ගරු මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. මම මේ පුවත් පතින් කියවන්නේ.

"සන්ඩේ ටයිම්ස් හට දැන ගැනීමට හැකි වූ ආකාරයට, පක්ෂ නායකයාගේ ඉල්ලීම කරුණානායක මුලින්ම ප්‍රතික්ෂේප කර තිබේ. මෛත්‍රීපාල සිරිසේන බලයට පත් කිරීමටත්, පක්ෂ නැවත බලයට ගෙන ඒමටත් තමා අතිශයින් වෙහෙස වූ බවත්, ඒ නිසා මේ අවස්ථාවේ -"

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේකේ හොඳ ටිකක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරන්න දෙයක් නැහැ. ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට තේරෙන්නේ නැහැ. සිංහල තේරෙන්නේ නැද්ද, දෙමළ තේරෙන්නේ නැද්ද, ඉංග්‍රීසි තේරෙන්නේ නැද්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම "ලංකාදීප" පුවත් පතේ මෙම කොටස ඇතුළත් ඡායා පිටපතක් **සභාගත*** කරනවා. එතකොට බලන්න පුළුවන්. පත්තරයකින් කියවන්න බැහැ කියලා කොහේද තිබෙන්නේ? කොහේද තිබෙන්නේ පත්තරයකින් කියවන්න බැහැ කියලා. මොකක්ද තිබෙන Standing Order එක?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
රටක් බේරා ගත්ත ජාතික නායකයාට එළවා එළවා ගහන්න මෙතුමන්ලාට පුළුවන්. රටක් වෙනස් කරපු මිනිසුන්ට ගහන්න පුළුවන්. හොරකම් කරලා, වංචා කරලා, දූෂණ කරලා, අක්‍රමිකතා කරලා ජනාධිපතිතුමාටයි, ඔක්කොමලාටයි නැඟිටින්න පුළුවන් නම්, එහෙම කොහොමද? තමුන්නාන්සේට තිබෙන අයිතියමයි මටත් තිබෙන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට. [බාධා කිරීමක්]

***එකල්හි වේලාව අ.භා. 4.00 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2018 පෙබරවාරි මස 19වන සඳුදා පූ.භා. 10.00වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது பி.ப. 4.00 மணியாகிவிடவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற் கிணங்க 2018 பெப்ருவரி 19, திங்கட்கிழமை மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது*

*It being 4.00 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 10.00 a.m. on Monday, 19th February, 2018 pursuant to the Resolution of Parliament of this Day.*

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.